★ # වෙනස පිණිස

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ මැදින් අව එකොළොස්වක ලත් බුධ දින | කාණ්ඩය 112 | පත්‍රය 96 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 07 බදාදා

# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

## සමඟ

සාරභූමියේ හරිතානන්දය

# පැලැස්ස

කෘෂිකර්මාන්තය සහ සංචාරයට ලැදි ඔබට

## බදාදා කියවන්න

LAKE HOUSE

ලේක්හවුස් ප්‍රකාශනයක්

# වෙසක් කමිටුව නාගදීපයේදී රැස් වෙයි: උත්සවයට එන මහ පිරිසට පහසුකම් දෙන්න සැලැසුම්

**උතුරු පළාත් විශේෂ-රසුල දිල්හාර ගමගේ**

මෙවර රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වෙන යාපනය නාගදීප රාජමහා විහාරස්ථානයේදී ඉකුත් 5 දා වෙසක් කමිටු රැස්වීමක් පැවති අතර එහිදී එම උත්සවයට සහභාගී වන පිරිසට අවශ්‍ය පහසුකම් සපයා දීම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කරනු ලැබීය.

ජාතික වෙසක් සතිය මැයි මස 23 දා සිට 28 වැනිදා දක්වා පැවැත්වෙන අතර 24 වැනිදා පැවැත්වෙන උත්සවයට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු අමාත්‍යවරුන් රැසක් සහභාගී වීමට නියමිතව තිබේ.

මෙම වෙසක් සතිය නිමිත්තෙන් පවැත්වෙන පින්කම්වලට දිවයිනේ නන් දෙසින් විශාල ජනකායක් සහභාගි වන් බැවින් ඔවුන්ට අවශ්‍ය ආහාර පානීය ජලය සනීපාරක්ෂක පහසුකම් ඇතුළු දේ සලසා දෙන ආකාරය පිළිබඳවද මේ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළහ.

යාපනය දිසාපති කනපතිපිල්ලේ මහේසන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මේ සාකච්ඡාවට වෙසක් කමිටුවේ නායක හිමිවරුද නාවික හමුදාවේ සහ සෙසු ආරක්ෂක අංශවල ප්‍රධානීහුද සහභාගී වූහ.

# මාතර බාලදක්ෂයෝ පැළ සිටුවීමේ සංග්‍රාමයක



ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය ක්‍රියාත්මක කළ පැළ ලක්ෂයක් සිටුවීමේ ජාතික වැඩසටහනට සමගාමීව මාතර දිස්ත්‍රික්ක බාලදක්ෂ සංගමය හා ඇක්සස් රියල් එස්ටේට් ආයතනය එක්ව හක්මන දෙනගම වැව අසලදී කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ සහභාගිත්වයෙන් පැළ සිටුවීම පසුගියදා සිදු කෙරිණි. එහිදී කතානායකවරයා පැළයක් සිටුවූ අයුරු. මාතර දිස්ත්‍රික් බාලදක්ෂ කොමසාරිස් ඉන්දික ප්‍රසන්න, ඇක්සස් රියල් එස්ටේට් ආයතනයේ සාමාන්‍යාධිකාරී මංගල පෙරේරා, එම ආයතනයේ දකුණු පළාත් අලෙවි කළමනාකරු ඉන්දික වික්‍රමරත්න මහත්වරු මෙහි වෙති.

# කොරෝනාව පාලනයට යාපනයේ දැඩි සෞඛ්‍ය රෙගුලාසි

**උතුරු පළාත් විශේෂ-රසුල දිල්හාර ගමගේ**

කොරෝනා රෝගය ව්‍යාප්ත වීම නිසා යාපනයේ දැනට වසා දමා ඇති කලාප තුන යළි විවෘත කිරීම සම්බන්ධයෙන් අද (7) යාපනය දිසාපති කාර්යාලයේ පැවැත්වෙන සාකච්ඡාවේදී තීරණය කරන බව යාපනය දිසාපති කනපතිපිල්ලේ මහේසන් මහතා ඊයේ (6) දා පැවැසීය. යාපනයේ වසා දමා ඇති යාපනය නගරය තිරුණවේලි වෙළඳ පොල කලාපය හා කන්කසන්තුරේ පාර ප්‍රදේශය උත්සව සමය නිසා යළි විවෘත කිරීම කෙරෙහි යාපනයේ සෞඛ්‍ය බලධාරීන් එතරම් කැමැත්තක් නොදක්වන බවද දිසාපතිවරයා පැවැසීය.

මේ කලාප වල සිටින පුද්ගලයයින්ගෙන් 80% ක් පමණ මේ වන විට පී.සී.ආර්.පරීක්ෂණ වලට ලක් කොට වාර්තා ලබා ගෙන ඇති බවත් එම වාර්තාවක් නොමැති කිසිම ව්‍යාපාරිකයෙකුට සිය ව්‍යාපාරික ස්ථාන යළි විවෘත කෙරෙන දිනයක විවෘත කිරීමට ආවිසර ලබා නොදෙන බවත් දිසාපතිවරයා පැවැසීය.

එමෙන්ම යාපනයේ එම වෙළෙඳසැල්වල සේවය කරන සේවකයන්ට යළි ව්‍යාපාරික ස්ථාන වල සේවය කිරීමට අවස්ථාව සලසා දෙන්නේ පී.සී.ආර්.පරීක්ෂණ වාර්තාව ළග ඇත්නම් පමණක් බවද දිසාපතිවරයා සදහන් කළේය.

# හෙරොයින් ග්‍රෑම් 25ක් සමඟ සැකකරුවෙක් දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත**

හෙරොයින් ග්‍රෑම් 25 මිලි ග්‍රෑම් 720ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේදී පෙරේදා (05) කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් පිරිසක් විසින් සිදුකළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන ඇත.


අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41ක් වූ මරදමුනේ 03ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. සැකකරු ඊයේ (06) මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

# කාබන් විරහිත බලශක්තියට පරිවර්තනය වීමට ශ්‍රී ලංකාව දරන වෑයම ඇමැති ගම්මන්පිල පහදයි

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් වසංගතය මඟින් රටේ ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල වී තිබෙන කාල සීමාවකදී පවා, කාබන් විරහිත බලශක්තියට පරිවර්තනය වීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්න සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතය දිරිගැන්වීම සඳහා දේශීය සන්දර්භය තුළ හඳුන්වා දෙන ලද මූලාරම්භයන් පිළිබඳව බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා බර්ලින්හි පැවැති 7 වන බලශක්ති සංක්‍රාන්ති සංවාදයට අන්තර්ජාලය ඔස්සේ සහභාගී වෙමින් සදහන් කෙළේය.

මෙම සංවාදයට බලශක්ති ඇමැතිවරයා සහභාගී වූයේ ජර්මන් විදේශ ඇමති හෙයිකෝ මාස් සහ ජර්මනියේ ආර්ථික කටයුතු හා බලශක්ති පිළිබඳ ඇමැති පීටර් අල්ට්මයර් මහත්වරුන්ගේ ආරාධනයකට අනුවය. 'දේශගුණික කවය ක්‍රමවත් කිරීම - වසංගතය තුළින් පාඩම් ඉගෙනීම' මෙම සංවාදයේ තේමාව විය.



වේල්ස් හි අනාගත පරපුර පිළිබඳ කොමසාරිස් සොෆී හෝවේ, උගන්ඩාවේ 'අනාගතය සඳහා සිකුරාදා' ව්‍යාපාරයෙහි දේශගුණික ක්‍රියාකාරිනී හිල්ඩා ෆ්ලේවියා නකාබුයි, ජෝර්ජියාවේ පරිසර ආරක්ෂණ හා කෘෂිකර්ම නියෝජ්‍ය ඇමැති නිනෝ ටැන්ඩිලාෂ්විලි සහ දකුණු කොරියාවේ තානාපති සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස පිළිබඳ නියෝජ්‍ය ඇමැති යෙඔන්-චුල් යූ මහත්ම මහත්මීහු මෙම සාකච්ඡාවට සහභාගි වූහ.

බර්ලින් බලශක්ති සංක්‍රාන්ති සංවාදය යනු බලශක්ති අංශයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා ආරක්ෂිත, දැරිය හැකි සහ පරිසර හිතකාමී පිරිසිදු බලශක්තිය පිළිබඳව ඔවුන්ගේ අත්දැකීම් සහ අදහස් බෙදාහදා ගැනීම සඳහා වන ප්‍රමුඛ පෙළේ අන්තර්ජාතික සංසදයකි.

# යාපනයේ නගරාධිපතිගේ ආශ්‍රිතයන් තවත් පස්දෙනකුට කෙරෝනා

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

යාපනය නගරාධිපතිවරයා කොරෝනා රෝගයට ලක්ව සුවය ලැබූවද යාපනය මහ නගර සභාවේ සේවකයන් හා ඔවුන් ආශ්‍රය කළ පිරිස අතරින් කොරෝනා පොකුරක් වර්ධනය වී 5 දා තවත් රෝගීන් පස් දෙනෙකු හමු වී තිබේ.

උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා පැවසුවේ 5 දා උතුරු පළාතෙන් කොරෝනා රෝගීන් 16 දෙනෙකු හමු වූ අතර ඉන් 15 දෙනෙකුම යාපනයේ පදිංචිකරුවන් බවයි.

උතුරු පළාතෙන් හමු වූ ඉතිරි පුද්ගලයා හමු වී ඇත්තේ වවුනියාවෙනි.

යාපනය මහ නගර සභාව ආශ්‍රිත ප්‍රදේශ වල පුද්ගලයින් 761 දෙනෙකු හා නගරාධිපතිවරයා කොරෝනා රෝගයට ලක් වීමෙන් පසුව ප්‍රදේශයේ පදිංචිකරුවන් රැසක් පී.සී.ආර්.පරීක්ෂණ වලට ලක් කොට තිබේ.

# අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ ජාවාරමක් ඇල්ලූ නිලධාරීන්ගේ සේවය ඇගයේ

**බුද්ධිකා ඉඹුලාන**

අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට තහනම් ද්‍රව්‍ය රැගෙන එන මහා පරිමාණ ජාවාරමක් අනාවරණය කරගත් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බළකායේ (බන්ධනාගාර බුද්ධි අංශය) නිලධාරීගේ සේවා ඇගයීමක් පසුගියදා බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතාගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යංශයේදී සිදු කෙරිණි.

එම බළකාය වෙත ලද තොරතුරකට අනුව බන්ධනාගාර බුද්ධි අංශය අධිකාරිවරයා ගේ අධීක්ෂණය යටතේ පසුගිය මස 19 වන දින සිදු කළ සෝදිසියකදී අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට දර රැගෙන එන ලොරියක් තුළ දර කොටන් ඇතුළත සූක්ෂ්ම ලෙස අසුරා රැගෙන විත් තිබූ ජංගම දුරකථන, දුම්කොළ සුරුට්ටු, දුරකථන බැටරි, දුරකථන ආරෝපණ ඇතුලු තවත් තහනම් ද්‍රව්‍ය සමග අදාල සැකකරුවන් අත්අංගුවට ගැනීමට මෙම නිලධාරින් තටයුතු කර තිබ්ණි.

මේ අවස්ථාව සඳහා බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වී.ආර් ද සිල්වා මහතා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දේණිය, අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ටී.අයි. උඩුවර , බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) චන්දන ඒකනායක මහත්වරු සහභාගී-වූහ.



# කඩුවෙල බැංකු සායනයට ව්‍යවසායක සහභාගිත්වය ඉහළින්ම

**මහින්ද අලුත්ගෙදර**

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති කඩුවෙල ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලීය කුඩා ව්‍යපාර සංවර්ධන අංශය මඟින් සංවිධානය කළ බැංකු සායනික වැඩසටහනක් කඩුවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලිය ශ්‍රවණාගාරයේ දී පසුගිය දා පැවැත්විණි.

රජයේ සියලු නිරෝධායන නීතිවලට අනුකූලව පැවැත්වූ මේ වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 115ක් පමණ සහභාගි සිටි අතර එම වැඩසටහන බෙහෙවින්ම සාර්ථක විය.

මෙම වැඩසටහන පැවැත්වීමේ අරමුණ වුයේ බහුතරයක් ව්‍යවසායකයන් අතර පවතින ව්‍යාපාරික මුල්‍යමය ගැටලුවලට සහය ලබාදීම සහ බැංකු උපදේශන සේවය මගින් ව්‍යවසායකයන් සහ බැංකු අතර බැඳියාව වැඩි කිරිම වන අතර එහිදී ව්‍යවසායකයෝ මුහුණ දී සිටින ගැටලු සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගත්හ.

මේ සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, NDB බැංකුව, SDB බැංකුව, සෙලාන් බැංකුව, DFCC බැංකුව, ලංකා බැංකුව වැනි රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බැංකු සහභාගි වී සිටි අතර ව්‍යවසායකයන් මුහුණ දෙන ගැටලු සඳහා සෘජුවම පිළිතුරු ලබාගැනීමට හැකිවීම විශේෂත්වයකි.

කඩුවෙල ප්‍රාදේශීය ලේකම් චතුර මිහිදුම් මහතාගේ හා කොළඹ දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන සහකාර අධ්‍යක්ෂ නන්දනී ගුණවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන ආරම්භ වූ අතර කඩුවෙල කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරිනී මහේෂිකා ගුණරත්න මහත්මිය වැඩසටහන සංවිධානය සහ සම්බන්ධීකරණය කළාය.

# ජෛව ආරක්ෂණ නිෂ්කාශන නිල වෙබ් අඩවිය විවෘත වෙයි



**පරිසර අමාත්‍යංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, ශ්‍රී ලංකා ජෛව ආරක්ෂණ නිෂ්කාශණ වෙබ් අඩවිය ආරම්භ කළ අවස්ථාව.**

**බුද්ධිකා ඉඹුලාන**

ශ්‍රී ලංකා ජෛව ආරක්ෂණ නිෂ්කාශන නිල වෙබ් අඩවිය පසුගිය දා පරිසර අමාත්‍යංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

භාෂා තුනෙන්ම ක්‍රියාත්මක වෙබ් අඩවියක් වන ශ්‍රී ලංකා ජෛව ආරක්ෂණ නිශ්කාශනය පිළිබඳ නිල වෙබ් අඩවිය රෙගුලාසි, මාර්ගෝපදේශ, විශේෂඥයන්, අවදානම් තක්සේරු කිරීම, දැනුම්වත් කිරීම සහ ඊට සම්බන්ධ කර ගත යුතු පුද්ගලයන් පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. එමෙන්ම ජෛව ආරක්ෂාව සම්බන්ධ තොරතුරු මෙහි අන්තර්ගත වේ. මෙම අවස්ථාවට සහභාගි වෙමින් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පැවැසුවේ ශ්‍රී ලංකාව සතුව ජෛව විවිධත්වයේ විශාල වත්කමක් තිබෙන අතර වර්ග කිලෝමීටරයකට වැඩිම ජෛව විවිධත්වයක් ඇති රට වශයෙන් අපේ රට ප්‍රකට බවයි. එම කරුණු මත පදනම්ව ශ්‍රී ලංකාව ලෝකයේ "ජෛව විවිධත්වය වැඩිම ස්ථාන (Hotspot) " වලින් එකක් ලෙස නම් කර තිබෙන බවද අනිල් ජාසිංහ මහතා මෙහිදී කීය. 1994 දී ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය (CBD) අනුමත කළ පළමු රටවලින් එකක් ලෙස ශ්‍රී ලංකාව දැක්වියහැකියි.

ශ්‍රී ලංකා ජෛව ආරක්ෂණ නිෂ්කාශන වෙබ් අඩවිය මගින් රටේ ජෛව විවිධත්වය සම්බන්ධව තොරතුරු ලබා ගත හැකි දත්ත ගබඩාවක් වශයෙන් පවත්වාගෙන යන ලෙස එම ඒකකයට දැනුම් දුන් බවදජාසිංහ මහතා පැවසීය.

# පිටි කළ අලිගැටපේර හා වට්ටක්කා ශ්‍රී ලංකාවෙන් ජෝර්දානයට

**මහින්ද අලුත්ගෙදර**

පිටි කළ අලිගැටපේර හා පිටි කළ වට්ටක්කා අපනයනය කිරීමට රජය පියවර ගෙන තිබේ.

ඒ අනුව පිටිකළ අලිගැට පේර සහ පිටි කළ වට්ටක්කා වැනි ශ්‍රී ලංකාවේ නව සුපිරි ආහාර නිෂ්පාදන, ජෝර්දානය වෙත අපනයනය කිරීමේ වැඩපිළිවෙළක් සකස් කර තිබෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් හඳුනා ගනු ලැබ ඇති ටීටෝක් සමාගම මෙම අපනයනය සඳහා හවුල් වී සිටින අතර ප්‍රධාන වශයෙන් ලංකා තේ අපනයනය කිරීමෙන් අනතුරුව විවිධාංගීකරණය වූ ටීටෝක් සමාගම මේ වනවිට නව්‍ය අගය එකතුකළ ශ්‍රී ලාංකික නිපැයුම් නිෂ්පාදනය කරන අතර, වැනිලා කරල් ආකාරයෙන් ජෝර්දාන් වෙළෙඳපොළට අපනයනය කිරීම ද ආරම්භ කොට ඇති බව කියා සිටී.

මෙතෙක් ජෝර්දානයට ඇතුළු නොවූ ශ්‍රී ලංකා නිෂ්පාදන රැසක් ටීටොක් සමාගම හරහා ජෝර්දානයට යැවීමට අපේක්ෂා කරන අතර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, සක්‍රීය ලෙස ශ්‍රී ලංකා අපනයන ජෝර්දානයට ගෙන යෑම සඳහා වන ඔවුන්ගේ ක්‍රියාකාරී වාණිජ කටයුතුවල කොටසක් ලෙස, මීට පෙර ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ සාම්ප්‍රදායික වෙළඳපොළක් ලෙස සලකනු නොලැබූ ජෝර්දානයෙ වෙත තවත් නව නිෂ්පාදන ගෙන ඒමට පියවර ගෙන තිබේ.

ටීටෝක් සමාගම පසුගිය වසරේ පෙබරවාරි මස ශ්‍රී ලාංකික අපනයනකරුවන් ජෝර්දාන් වෙළෙඳපොළ වෙත හුරුපුරුදු කරවීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති ශානිකා දිසානායක මහත්මිය විසින් සංවිධානය කරන ලද පුරෝගාමී ළෙළඳ නියෝජිත කණ්ඩායමට අයත් වූ එක් සමාගමක් බවද ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පවසයි.

# කොවිඩ් අවසන් වෙද්දී නව ව්‍යාපාර අවස්ථා

**ජයසිරි මුණසිංහ**

පශ්චාත් කොවිඩ් 19 වසංගත සමය නව ව්‍යවසායක පෙලඹුමකට කදිම වේලාව බව සියලුදෙනා අවබෝධ කරගත යුතු යැයි ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළෙඳපොළ සමීක්ෂණ ආයතනය වන පෙපර්කියුබ් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරි අතීක් මරික්කාර් මහතා දන්වා සිටියි.

වසර 2019 අග භාගයේ චීනයෙන් ඇරඹි කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා මේ වන විට මෙරට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ව්‍යාපාර ඇතුළු අංශ ගණනාවක මන්දගාමී වර්ධන තත්ත්වයෙන් මිදී ඉදිරියට යා යුත්තේ කෙසේදැයි පැහැදිලි කරමින් අතීක් මරික්කාර් මහතා මේ බව කීය.





මෙම දත්ත ලබාගැනීම නවීන තාක්ෂණය සහ ලොව පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සිදුකරන බව ද සඳහන් කළේය. මෙහිදී අදහස් දැක්වූ

**පෙපර්කියුබ් ආයතනයේ විධායක අධ්‍යක්ෂ උදයන සෙනවිරත්න මහතා** - පළාත් මට්ටමෙන් වෙළෙඳපොළ දිනාගනිමින් ඉදිරියට එන වෙළෙඳ ආයතන හා නිෂ්පාදන ජාතික මට්ටම සහ ජාත්‍යන්තරය දිනාගන්නා තැනට වර්ධනය කිරීමේ ක්‍රියාවලියේදී පාරිභෝගික එදිනෙදා අවශ්‍යතා, ඔවුන්ගේ රුචි අරුචිකම් පිළිබඳව කිසියම් වූ පැහැදිලි චිත්‍රයක් ව්‍යවසායකයන්ට පෙන්වා දීමට කටයුතු කළ යුතු බව වැඩිදුරටත් සඳහන් කළේය.

# ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ ප්‍රකාශය ගැන පරීක්ෂණයක් පැවැත්වෙනවා

## සම කැබිනට් ප්‍රකාශක, ඇමැති, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

පොල්තෙල්වලට අමතරව පිළිකාකාරක අඩංගු තවත් ආහාර තිබෙන බවටත්, සමාගම් බිඳවැටෙන බැවින් ඒ පිළිබඳ හෙළි නොකරන බවටත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විද්‍යුත් නාලිකාවක් සමග පැවැති සම්මුඛ සාකච්ඡාවකදී කර ඇතැයි කියන ප්‍රකාශය සම්බන්ධයෙන් මේ වන විට පරීක්ෂණයක් පැවැත්වෙන බව ජනමාධ්‍ය ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පැවසීය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (6) පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු මේ සම්බන්ධයෙන් මතු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

අධ්‍යක්ෂ ජනරාල්වරිය දක්වා ඇති මතය රජය අනුමත නොකරන බව කී ඇමැතිවරයා, ඉදිරියේදී ප්‍රමිති ආයතනයේ නිලධාරීන් සමග සාකච්ඡා කර රජය අදාළ තීන්දු තීරණ ගන්නා බවද සඳහන් කළේය.

# ලංකාදීප චිත්‍ර ශිල්පී ජයශාන්තගේ මව අභාවප්‍රාප්ත වෙයි

ලංකාදීප පුවත්පතේ කාටූන් ශිල්පී සහ ග්‍රැෆික් නිර්මාණ ශිල්පී නිමල් ජයශාන්ත මහතාගේ මෑණියන් වන එච්.ඒ සුමනාවතී මහත්මිය අභාවප්‍රාප්ත වූවාය.

මිය යන විට අසූ වැනි වියෙහි පසු වූ සුමනාවතී මහත්මිය පස් දරු මවකි. දේහය වෙදවත්ත මීගහතැන්න මතුගම නිවසේ තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු අද (7) සවස 6ට මීගහතැන්න ආදාහනාගාරයේ දී සිදු කෙරෙයි.

# නන්දනීට පිහිට වෙන්න

පන්නිපිටිය, මොරකැටිය, ඇරැව්වල පාරේ පිහිටි අංක 113/3 නිවෙසේ පදිංචි නන්දනී පරනමාන (61) මහත්මිය දරුණු වකුගඩු රෝගයකින් පෙළෙයි.

ඒ මහත්මියගේ ජීවිතය බේරා ගැනීම සඳහා බී පොසිටිව් (B +) හෝ ඕ පොසිටිව් (O +) වකුගඩුවක් ඉතා ඉක්මණින් බද්ධ කළයුතු බවට වෛද්‍යවරු නිර්දේශ කර තිබේ.

ඒ අනුව පරනමාන මහත්මියගේ ජීවිතය බේරා ගැනීම සඳහා වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමැති වයස අවුරුදු 30ත් 55 ත් අතර අයෙක් වේ නම් 0714619741 හෝ 0701781298 දුරකතන අංක වෙත දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කරයි.

# ‘ස්පුට්නික්-V’ එන්නත් මාත්‍රා මිලියන 6ක් රුසියාවෙන් ගන්නවා

## ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි,**

'ස්පුට්නික්-V' එන්නත් මාත්‍රා මිලියන 06ක් රුසියාවෙන් මිලදී ගැනීමට රජය තීරණය කළ බව ජනමාධ්‍ය ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

රජය මේ සඳහා ඩොලර් මිලියන 69.65ක මුදලක් වෙන් කර තිබෙන බවද ඇමැතිවරයා කියයි.

සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට පෙරේදා (5) පැවැති ඇමැති මණ්ඩල රැස්වීමේදී අනුමැතිය හිමිවූ බවද ඇමැතිවරයා සඳහන් කරයි.

ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (6) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී ය.

ඇමැති මණ්ඩලය පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශය පරිදි ස්පුට්නික් -V එන්නත් මිලියන 7ක්, එක් එන්නත් මාත්‍රාවක් අමෙරිකානු ඩොලර් 9.95ක් බැගින් ඩොලර් මිලියන 69.65ක මුදලකට මිලදී ගැනීම සඳහා පසුගිය මාර්තු 23 වන දින පැවති ඇමැති මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. මේ එන්නත් තොගයට අමතරව එම මිලටම මෙම ස්පුට්නික් -V එන්නත් මාත්‍රා මිලියන 6 මිලදී ගැනීමට නියමිත ය.

මේ අනුව, කලින් ගෙනා එන්නත් මාත්‍රා මිලියන 7ත්, අලුතින් මිලදී ගැනෙන එන්නත් මාත්‍රා මිලියන 6ත් සමග මෙරටට ලැබෙන එන්නත් මාත්‍රා ප්‍රමාණය මිලියන 13ක් බවට පත් වන බවත්, ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා කීය.

# සෞඛ්‍ය උපදෙස් දැඩිව පිළිපදින්න

## ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

උත්සව සමයේ සෞඛ්‍ය උපදෙස් දැඩි ලෙස පිළිපදින ලෙස ජනමාධ්‍ය ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා ජනතාවගෙන් ඉල්ලා සිටී.

ඇමැතිවරයා මෙම ඉල්ලීම සිදු කළේ, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (06) පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී ය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ, අලුත් අවුරුද්ද වෙනුවෙන් ජනතාව විශාල වශයෙන් වෙළෙඳසල්වලට ඒකරාශී වීම හේතුවෙන් කොවිඩ් වසංගත තත්ත්වය නැවත උත්සන්න වීමට ඉඩ ඇති බැවින් එම තත්ත්වය වැළැක්වීම සඳහා රජය ගන්නා පියවර කුමක්දැයි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (6) පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු විසින් මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් මාලාවක් සෞඛ්‍ය අංශ, මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් හා පොලිසිය වෙත මේ වන විටත් ලබා දී අවශ්‍ය දැනුම්වත් කිරීම් සිදුකිරීමට රජය පියවර ගෙන ඇති බවත් ඇමැතිවරයා එහිදී පැවසීය.

# රටේ වන විනාශයට එරෙහිව ජාත්‍යන්තරය දැනුම්වත් කරනවා

## එජාප සභාපති වජිර අබේවර්ධන

**ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**

සිංහරාජය ඇතුළු රටේ වනාන්තර විනාශ කරමින් ගෙනයන ක්‍රියාමාර්ගවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා අතර එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තරය දැනුවත් කිරීමට එක්සත් ජාතික පක්ෂය පියවර ගෙන තිබෙන බව එම පක්ෂයේ සභාපති හිටපු ඇමැති වජිර අබේවර්ධන මහතා ප්‍රකාශ කළේය.

වජිර අබේවර්ධන මහතා මෙම අදහස් පළ කළේ රටේ පරිසර විනාශයට එරෙහිව කොළඹ තුන්මුල්ල මංසන්ධියේදී එක්සත් ජාතික පක්ෂය ඊයේ (6) සංවිධානය කර තිබූ විරෝධතා ව්‍යාපාරයකට එක්වෙමිනි. ගහකොළ වලින් ලැබෙන ඔක්සිජන් නිසා මිනිසාගේ පෙනහැල්ල රඳා පවතින බවත් යම් අයෙක් ගහකොළ විනාශ කරන්නේ නම් ඔහු එමගින් තමන්ගේ පෙනහැල්ල ඉවත්කර ගැනීමක් ලෙස සැලකිය යුතු බවත් හෙතෙම කීය.

පරිසරය ආරක්ෂාකර දෙන ලෙස ඉල්ලමින් එක්සත් ජාතික පක්ෂය සංවිධානය කළ මෙම උද්ඝෝෂණයට විශාල පිරිසක් සහභාගී වූ අතර ඔවුන් පරිසර විනාශයට එරෙහිව විවිධ සටන් පාඨ කියමින් පැය දෙකකට ආසන්න කාලයක් උද්ඝෝෂණයේ නිරත වූහ.

# පළාත් සභා ඡන්දය අවසන් තීරණය 19 දා

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

පළාත් සභා මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීම සඳහා ලබන 19 වනදා අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන්සාකච්ඡාවක් කැඳවීමට තීරණය කර තිබේ.

පක්ෂ නායක රැස්වීමෙන් පසු පළාත් සභා පවත්වන දිනය පිළිබඳ තීරණය ගනු ඇති බවත් පළාත් සභා ඉක්මනින් පැවැත්විය යුතු බවත් ඇමැති එස්. එම්. චන්ද්‍රසේන මහතා 'දිනමිණ' ට ඊයේ (06) පැවැසීය. පළාත් සභා පැවැත්වීම සම්බන්ධව සාකච්ඡා කිරීමට සියලුම පක්ෂ නායකයන් කැමැත්ත පළකර ඇති බව ද ඇමැතිවරයා අවධාරණය කළේය.

# සාතිශය සංවේගය



## වේලායුතන් ශිවඥාණසෝති

**B.A. (Econ) Hons, MSc. (Bradford) UK, FCMA (London), FCA (Sri Lanka), Chartered Accountant**

**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධනය හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්,**

**මානව හිමිකම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ ලේකම් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරමින් සිටි**

**V. ශිවඥාණසෝති මහතා 2021 අප්‍රේල් මස 05 වන දින අභාවප්‍රාප්ත විය.**

නැසීගිය නීතිඥ K. වේලායුතන් මහතා සහ පොන්නම්මා මැතිණියගේ ආදරණීය පුත් වූ, නැසීගිය සිවසුබ්‍රමනියම් මහතා හා කුමුදුනි මහත්මියගේ බෑණා වූ, කුරමගල් මහත්මියගේ ආදරණීය ස්වාමිපුරුෂයා වූ, නීතිඥ තෙවසෙනාතිපති මහත්මයා සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල් වන සුන්දරේස්වරන් මහත්මයාගේ ආදරණීය සහෝදරයා වූ V. ශිවඥණසෝති මහතාගේ නිසල දේහය මහජන ගෞරවය උදෙසා

**බොරැල්ල ජයරත්න මල් ශාලාවේ දී 2021 අප්‍රේල් මස 07 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා ද අප්‍රේල් මස 08 වන දින ජයරත්න මල් ශාලාවේ 'රෙස්පෙක්ට්' ශාලාවේ දී පෙ.ව. 9.00 සිට තැන්පත් කරන අතර ප.ව. 4.00 ට දේහය පිළිබඳ අවසන් කටයුතු කිරීමට යෙදී තිබේ.**

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන අමාත්‍යාංශය, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානය පිළිබඳ අමාත්‍යාංශය, වතු යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධනය අමාත්‍යාංශය යන අමාත්‍යාංශ ගණනාවක ම ලේකම් ධූරය දැරූ ඒ මහතා උතුරු සහ නැගෙනහිර පළාත් සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ ලේකම් ලෙස ද කටයුතු කළේය.

එතුමා මිය යන විට මානව හිමිකම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසමේ ලේකම් ලෙසද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය.

ඔහු කොළඹ රාජකීය විද්‍යාලයේ, යාපනය ශාන්ත ජෝන් විද්‍යාලයේ සහ යාපනය හින්දු විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකි.

**වැඩිදුර විස්තර සඳහා,**

| | |
|---|---|
| **කුරමගල් (බිරිඳ)** | **0779007623** |
| **තෙවසෙනාතිපති (සහෝදරයා)** | **0771133400** |
| **සුන්දරේස්වරන් (සහෝදරයා)** | **0773850841** |

# 03 වැනි පිටුවෙන්...

## කිරුළ යළිත් ...

2021 ලෝක විවාහක රූ රැජන තරගාවලියට සහභාගි වන මෙරට රූමතිය තේරීම සඳහා වන තරගය නෙළුම් පොකුණ රඟහලේ දී පැවැති අතර එහි ජයග්‍රාහී කිරුළ පුෂ්පිකා ද සිල්වා මහත්මියට හිමිවූවාය.

ලෝක විවාහක රූ රැජින ලෙස 2020 වසරේ දී කිරුළ පැළඳූ කැරලොයින් ජූරි මහත්මිය විසින් පුෂ්පිකා ද සිල්වා මහත්මියට හිමි කිරුළ පැළඳවූ නමුත් ඉන් සුළු වේලාවකට පසු පුෂ්පිකා ද සිල්වා දික්කසාද වූ අයකු වන බැවින් කිරුළ හිමිවන්නේ දෙවැනි ස්ථානය දිනා තිබූ තරගකාරියට යැයි පැවසූ අතර ඒ අනුව පුෂ්පිකාට පැළඳවූ ජයග්‍රාහී කිරුළ ඇගෙන් ඉවත් කොට දෙවැනි ස්ථානය දිනාගත් ආසියා බස්නායක මහත්මියට පැළඳවූවාය.

කෙසේ වුවද තමා දික්කසාද වූ කාන්තාවක් නොවන බවට සිය මුහුණු පොතේ සටහනක් තබමින් පුෂ්පිකා ද සිල්වා මහත්මිය පවසා තිබෙන අතර ජයග්‍රාහී කිරුළ ඇයට හිමිවන බවට මේ තරගාවලියේ මෙරට අධ්‍යක්ෂ චන්දිමාල් ජයසිංහ මහතා ප්‍රකාශ කළේය.

අවසන් තරගයේ දී ඇතිවූ මේ සිද්ධිය සම්බන්ධයෙන් ලෝක විවාහක රූ රැජන තරගාවලියේ සංවිධායකයන් අද නිවේදනයක් නිකුත් කරන ලද අතර 2020 ලෝක විවාහක රූ රැජන ලෙස කිරුළ පැළඳවූ කැරලොයින් ජූරි මහත්මියගේ හැසිරීම සම්බන්ධයෙන් සිය කනස්සල්ල පළකරන බවයි. එම හැසිරීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර අවශ්‍ය පියවර ගන්නා බවද ඔවුන් සඳහන්කර තිබේ.

## උපකාරක පන්ති...

කොවිඩ් - 19 වයිරසය මර්දනය කිරීමේ සෞඛ්‍ය මාර්ගෝපදේශන්යට අනුකූලව නැවත මෙම උපකාරක පංති ආරම්භ කළ හැකි බවත් පංතියක සිටිය හැකි උපරිම සංඛ්‍යාව ළමයින් 100ක් බවත් ඇමැතිවරිය පැවසුවාය.

සභාව කල් තබන අවස්ථාවේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගුණපාල රත්නසේකර මහතා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇමැතිවරිය මේ බව කියා සිටියාය.

මේ වන විට බස්නාහිර පළාත තුළ කොවිඩ් මර්දන සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව පාසල් ආරම්භ කර ඇති බවත් බස්නාහිර පළාතේ පාසල් ආරම්භ කර සති දෙකකට පසුව උපකාරක පංති ආරම්භ කළ හැකි බවත් ඇමැතිවරිය පැවසුවාය.

## විදෙස්ගතව සිට ...

ඒ සම්බන්ධයෙන් නිවේදනයක් නිකුත් කරමින් මේ බව කියා සිටි යුද හමුදාපතිවරයා මීට අදාළ උපදෙස් සියලු තානාපති කාර්යාල වලට දැනුම් දී ඇති බවත් කියා සිටියි.

කොවිඩ් වෛරස ව්‍යාප්තිය හේතුවෙන් පනවා තිබූ නීති වලට අනුව විදේශ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමේදී අපහසුතා ඇති වන බවට ලැබුණු පැමිණිලි වලට අනුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ලද උපදෙස් ප්‍රකාරව මේ පියවර ගත් බවද යුද හමුදාපතිවරයා කියා සිටියේය.

දිනපතාම විදේශයේ සිට ශ්‍රී ලාංකිකයන් රැගෙන එන බව කියා සිටි ඒ මහතා ගුවන් යානා අනුමැතිය සමග මෙරටට පැමිණීමට හැකි බවද ඒ මහතා කියා සිටියේය.

## පාස්කු ප්‍රහාරයේ ...

එහිදී ඇමැතිවරයා මෙසේද කීය. මෙම සැකකරුවන් දෙදෙනා මේ වන විට අත්අඩංගුවට ගෙන බන්ධනාගාර ගත කර තිබෙනවා. නවුෆර් මව්ලවි නමැත්තා 2014 වසරේදී අයි.එස්. ත්‍රස්තවාදී මත ප්‍රචාරය කර තිබෙනවා. පාස්කු ප්‍රහාරයේ විමර්ශන පිළිබඳ සැඟවීමට කිසිදු අවශ්‍යතාවක් නැහැ. මේ සම්බන්ධව දැනටමත් පුද්ගලයන් 32කට නඩු පවරා තිබෙනවා. මීට අමතරව පුද්ගලයන් 211ක් රක්ෂිත බන්ධනාගාර ගත කර තිබෙනවා. 75 දෙනකු රැඳවුම් නියෝග මත රඳවා තිබෙනවා.

## බොදු බල සේනා ...

ශ්‍රී ලංකා සමාජය ජාතිය හා ආගම පදනම් කරගෙන බෙදී ඇති බැවින් එය වෙනස් කළ යුතු වන්නේ ආකල්පමය වෙනසකින් මිස නීතියෙන් නොවන බව ද අමාත්‍ය මණ්ඩල අනු කමිටුව නිර්දේශ කර ඇත.

ජනාධිපතිවරයා විදෙස් ගතව සිටින විට සහ අග්‍රාමාත්‍යවරයා වැඩබලන ආරක්ෂක අමාත්‍යවරයා නොවන අවස්ථාවකදී සියලු ජාතික ආරක්ෂක තොරතුරු අග්‍රාමාත්‍යවරයාට දැනුම් දීම අනිවාර්ය බවට වන නිර්දේශය ද එම අනු කමිටුව විසින් අනුමත කර තිබේ. එමෙන්ම පොලිස්පතිවරයා ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයා වෙත දිය යුතු බවට ද එම අනු කමිටුව නිර්දේශ කර තිබේ. මද්‍රසා අධ්‍යාපනය උපරිම සංඛ්‍යාව 50කට සීමා කිරීම සහ අතිරික්ත සිසුන් 2023 වනවිට පොදු අධ්‍යාපන ක්‍රමයට අන්තර්ගත කිරීමට ද අනු කමිටුව තීරණය කර තිබේ.

## අලුත් අවුරුද්දෙන්...

දැඩි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද යටතේ එලෙස විශ්වවිද්‍යාල ආරම්භ කිරිමට තීරණය කර ඇති බව ද මහාචාර්යවරයා සඳහන් කෙළේය.

## නැකැත් සීට්ටුව ...

චිරාගත පිළිවෙත් අනුව අඬබෙරකරු සමඟ පැමිණි නැකැත්කරු රැගෙන ආ නැකැත් සීට්ටුව ජාතික උරුම, ප්‍රසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා විසින් ජනාධිපතිවරයා වෙත පිළිගැන්වීය.

අලුත් අවුරුදු උදාව, පුණ්‍ය කාලය, ආහාර පිසීම, ලිප ගිනි දැල්වීම, ආහාර අනුභවය, හිසතෙල් ගෑම සහ නව වසරේ රැකියා සඳහා පිටත්ව යාම ආදී සුබ මුහුර්තයන් නැකත් සීට්ටුවට ඇතුළත්ය. බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන, ජාතික උරුම, ප්‍රසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නිශාන්ති ජයසිංහ, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ තරණි අනෝජා ගමගේ මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

## රු.1000 ...

ඒ අනුව වතු කම්කරු ජනතාව වෙනුවෙන් රුපියල් දහසේ වැටුප් වැඩිකිරීම ලබාදීම සඳහා සියලුම වතු සමාගම් නෛතිකව බැඳී සිටින බව ද අමාත්‍යවරයා කීය.

නියං සමයේ කුඩා තේ වතු හිමියන්ට ලබා දී ඇති සහනාධාර සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී වරුණ ලියනගේ මහතා වාචික පිළිතුරු අපේක්ෂාවෙන් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇමැතිවරයා මේ බව සඳහන් කළේය. රුපියල් දහසේ වැටුප් වැඩිකිරීම ලබානොදෙන වතු රජයට පවරා ගැනීමක් සිදු නොවන අතර එම වැටුප් වැඩිකිරීම ලබාදීම වෙනුවෙන් සියලුම වතු සමාගම් නෛතිකව බැඳී සිටින බව ද ඇමැතිවරයා අවධාරණය කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍ය රමේෂ් පතිරණ මහතා සඳහන් කළේ තේ, රබර්, පොල් සහ සුළු වැවිලි කර්මාන්ත සහ අපනයන භෝග වෙනුවෙන් රුපියල් බිලියන 1.5ක මුදලක් මෙවර අයවැයෙන් වෙන්කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර ඇති බවයි.

## පිටකොටුවේ පාවෙන ...

2015න් පසු භාවිතා කිරීම ක්‍රමානුකූලව අතහැර දමන ලද පාවෙන වෙළෙඳ සංකීර්ණය අලුත්වැඩියා සහ ප්‍රතිසංස්කරණය කර යළි ජනතා අයිතියට පත් කෙරෙන්නේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ නාගරික සංවර්ධන හා නිවාස ඇමැති,අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් සහ මගපෙන්වීම අනුවයි.

පාවෙන වෙළෙඳ සංකීර්ණය සහ අවට ප්‍රදේශය යළි ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා රජය වැය කරන ලද මුදල රුපියල් මිලියන 35 කි.

කොළඹ පිටකොටුව පාවෙන වෙළෙඳ සංකීර්ණය යළි ජනතා අයිතියට පත් කිරීමේ අවස්ථාවට ඇමැතිවරුන් වන ගාමිණී ලොකුගේ, දිනේෂ් ගුණවර්ධන, විමල් වීරවංශ, රියර් අද්මිරාල් සරත් වීරසේකර, බන්දුල ගුණවර්ධන, උදය ගම්මන්පිල, රාජ්‍යඇමැතිවරුන් වන ආචාර්ය නාලක ගොඩහේවා, ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ආචාර්ය විජයදාස රාජපක්ෂ, ජගත් කුමාර, ප්‍රදීප් උඳුගොඩ, ප්‍රේමනාත් සී දොලවත්ත, මධුර විතානගේ යන මහත්වරුන් ඇතුළු පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට නියමිතව තිබේ.

ඊට අමතරව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති, වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, වරලත් නගර නිර්මාණ ශිල්පී ප්‍රසාද් රණවීර යන මහත්වරුන් ඇතුළු පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගී වීමට නියමිතව ඇත.

වර්තමාන ජනාධිපති එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව ඉදිකෙරුණු කොටුව පාවෙන වෙළෙඳ සංකීර්ණය විවෘත කළේ 2014 වර්ෂයේ අගෝස්තු 25 වනදාය.

# බීමත් රියදුරන් අල්ලන්න රට පුරා මෙහෙයුම් 10 වැනිදා සිට ක්‍රියාත්මකයි



රක්ෂණ ශ්‍රියන්ත

ලබන 10 වැනි දා සිට බීමත් රියදුරන් අත්අඩංගුවට ගැනීමේ දීප ව්‍යාප්ත මෙහෙයුමක් පොලිසිය ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. මේ වන විටත් සියලුම පොලිස් ස්ථාන වෙත අවශ්‍ය තරම් ස්වසන වායු උපකරණ නිකුත් කර ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය. මෙම මෙහෙයුමේදී බීමත් රියදුරන් පමණක් නොව ගංජා, හෙරොයින් අතැළු අනෙකුත් මත් ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන පුද්ගලයන් පිළිබඳ ද විශේෂ පරීක්ෂාවෙන් සිටීමට පොලිස් නිලධාරීන්ට උපදෙස් දී තිබේ. එසේම බීමත් රියදුරන් පමණක් නොව අනෙකුත් රථ වාහන වැරැදි සම්බන්ධවද පොලිසිය මෙම මෙහෙයුමේදි නීතිය දැඩිව ක්‍රියාත්මක කරයි.

විශේෂයෙන්ම මෙම සිංහල අවුරුදු සමයේ අප්‍රේල් 10 දින සිට 20 දක්වා රිය අනතුරුවල සෑම වසරකම වැඩිවීමක් දක්නට ඇති හෙයින් රිය අනතුරු වළක්වා ගැනීම සඳහා මෙම රථවාහන මෙහෙයුම සිදුකරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

## පන්නල ගලයායේදී යතුරුපැදි දෙකක් ගැටී තරුණයෙක් මිය යයි

ගිරිඋල්ල සමූහ - ඩබ්ලිව්. සරත්

පන්නල මාකඳුර වැවේ නෑමට ගොස් යතුරු පැදි දෙකකින් ආපසු පැමිණෙමින් සිටි තරුණයන් සිව් දෙනකු පෙරේදා (4) පන්නල ගලයායේදී එකිනෙක ගැටීමෙන් ඉදිරිපස යතුරු පැදිය පෙරළී එහි පසුපස ගමන් ගත් තරුණයකු මිය ගොස් ඇත.

යතුරු පැදිය පැදවූ තරුණයා බරපතළ තුවාල ලබා කුලියාපිටිය රෝහලට ඇතුළත් කර ඇතැයි ද පන්නල පොලීසිය පැවසීය.

මෙම අනතුරින් මියගොස් ඇත්තේ පන්නල කොටුවැල්ල පදංචිව සිටි ආර්. පී. ජීවන්ත තිලිණ චතුරංග නැමති 18 හැවිරිදි තරුණයෙකි. යතුර පැදිය පැද වූ එම්.ඒ. අවිශ්ක මධුසංඛ (23) කුලියාපිටිය රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී.

පන්නල දෙස සිට ගමන් කළ ලොරි රථයක් අනතුර සිදු වූ ස්ථානයෙන් දකුණු පස අතුරු මාර්ගයකට හරවා ඇති අතර, එම අවස්ථාවේදී ඉදිරියෙන් පැමිණි යතුරු පැදි ලොරිය පසුකර යෑමට උත්සාහ කිරීමේදී එකක් පසුපස අනෙක ගැටී ඇති බව පොලීසිය පැවසීය.

ලොරි රථ රියැදුරු හා පසුපස යතුරු පැදියේ ගමන් ගත් දෙදෙනා අත්අඩංගුවට ගත් බවද පොලීසිය පැවසීය.

පන්නල පොලිස් ස්ථානාධිපති උපුල් ආරියරත්න මහතාගේ මෙහෙයවීමෙන් රථවාහන අංශයේ පොලිස් පරීක්ෂක රත්නායක, සැරයන් සමරතුංග, කොස්තාපල් තෙන්නකෝන් නිලධාරීහු පරීක්ෂණ මෙහෙයවති.

## හොර දුම්වැටි 1,200ක් සමග සැකකරුවෙක් දැලේ

රක්ෂණ ශ්‍රියන්ත

තීරු බදු රහිතව මෙරටට ගෙන් වූ සෞඛ්‍යමය, රූපමය අවවාද රහිත දුම්වැටි 1,200ක් අලෙවි කිරීම සඳහා වෙළෙඳසලක් තුළ තබාගෙන සිටි පුද්ගලයකු මට්ටක්කුලිය පොලිස් වසමේ පර්ගියුසන් පාර ප්‍රදේශයේදී පෙරේදා (5) පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් පිරිසක් කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වැඩි දුර විමර්ශනය සඳහා මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙත භාරදී තිබේ.

පොලිස් විශේෂ කාර්ය බළකා මූලස්ථාන කඳවුරේ මෙහෙයුම් අංශයේ නිලධාරීහු මෙම වැටලීම සිදු කළහ.

## පොලිස් වෙස් ගත් කොල්ල කල්ලියක් රට පුරා: අවධානයෙන් සිටින්න

### පොලිසිය ජනතාවට කියයි

රක්ෂණ ශ්‍රියන්ත

පොලිස් නිලධාරීන් ලෙස පවසමින් හෝ වෙනත් ආධාර එකතු කරන්නන් ලෙස හෝ පවසමින් නිවෙස්වලට පැමිණ කොල්ලකෑම් සිදු කරන සංවිධානත්මක පිරිසක් සිංහල අලුත් අවුරුදු සමයේ කටයුතු කරන හෙයින් ඒ ගැන අවධානයෙන් පසුවන ලෙස පොලිසිය ඉල්ලා සිටී.

වව්නියාව වව්ලන්කුලම ප්‍රදේශයේදී පෙරේදා (5) ව්‍යාජ ලෙස පොලිස් නිලධාරීන් ලෙස පෙනී සිටිමින් නිවෙසකට පැමිණි පුද්ගලයන් පිරිසක් එම නිවෙසේ තිබූ රුපියල් 108,000ක මුදලක් කොල්ලකා පලා ගොස් ඇත.

තම්පනේ පුලියන්කුලම ප්‍රදේශයේ නිවෙසකට පෙරේදා (5) පොලිස් නිලධාරීන් බව පවසමින් පැමිණි පුද්ගලයන් පිරිසක් එම නිවෙසේ තිබූ රුපියල් ලක්ෂ තුනක මුදල් සහ භාණ්ඩ කොල්ලකා පලා ගොස් තිබේ. සිද්ධිය සම්බන්ධයෙන් වව්නියාව පොලිසිය විමර්ශනයක් ආරම්භ කර තිබේ.

නිවෙසකට පොලිස් නිලධාරීන් යැයි පවසමින් කවුරුන් හෝ පැමිණියහොත් ඔවුන්ගේ නිල හැඳුනුම්පත ඉල්ලා පරීක්ෂා කිරීමට අයිතියක් ඇති බව කී පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පොලිස් නිලධාරියකුගේ නිල හැඳුනුම් පතේ ඔහුගේ ඡායාරූපය, පොලිස් ලාංඡනය සහ අනෙකුත් කාරණා ඇතුළත් අතර, එය ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය භාවිතයෙන් සෑදූ හැඳුනුම්පතක් බවත් එම කරුණු ගැන සුපරික්ෂා කාරීව බලන ලෙසත් ජනතාවට දන්වා සිටී.

## නිරෝධායන රීති කැඩූ 11ක් කොටු වෙති

රක්ෂණ ශ්‍රියන්ත

නිරෝධායන රීති කැඩූ පුද්ගලයන් 11 දෙනකු ඊයේ (6) උදෑසන 6න් අවසන් පැය 24 තුළ අත්අඩංගුවට ගෙන තිබේ.

නිරෝධායන රීති කැඩූ පුද්ගලයන් 3425ක් මේ වන විට අත්අඩංගුවට ගෙන ඇති බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

සිංහල අලුත් අවුරුදු සමයේ සියයට සීයක්ම නිරෝධායන රීතිවලට අනුගතව කටයුතු කරන ලෙසත් නිරෝධායන රීතීන්ට පටහැණිව කටයුතු කළ හොත් ඔබට සිංහල අලුත් අවරුද්ද සතුටින් සැමරීමට නොහැකි වී කොවිඩ් රෝගියකු වීමට ඉඩ ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පෙන්වා දෙයි.

## ශ්‍රීකාන්තගේ ප්‍රීදූපත



• මට රකින්න කවුරුවත් නෑ කියල ප්‍රමිති ආයතනයෙ සභාපති කියනව බං !

• ඇත්තනෙ සර්, අඩුම තරමෙ ප්‍රමිතියවත් රැකගෙන නෑනෙ !

## අවුරුද්දට ගමට යන්න අමතර බස් - දුම්රිය

සුභාෂිණී සේනානායක

සිංහල හා දමිළ අලුත් අවුරුද්දට ගම්බිම් බලා යන ජනතාවට අපහසුතාවකින් තොරව තම ගමන් පහසුකම් සැලසීමට වැඩි බස් රථ ප්‍රමාණයක් යෙදවීමට අවශ්‍ය උපදෙස් ලබා දුන් බව ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මහතා පැවැසීය. මේ අනුව මඟී ජනතාවට බාධාවකින් තොරව ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා ලංගම බස්රථ සේවකයන්ගේ නිවාඩු ද අවලංගු කිරීමට පියවර ගෙන ඇති බව කියා සිටි රාජ්‍ය ඇමැතිවරයා, පෞද්ගලික බස් රථ වැඩි ප්‍රමාණයක් ධාවනය සඳහා යොදවන බවද කියා සිටියේය. අවුරුදු සමයේ ප්‍රවාහන පහසුකම් සැපයීමට අදාළව ප්‍රවාහන බලධාරීන් සමග සාකච්ඡාවක් ද පැවැත් වූ බව කියා සිටි ඒ මහතා, මඟීන්ගේ ගමන් පහසුව වැඩි කිරීම සඳහා පියවර රැසක් ගෙන ඇති බවද කීවේය.

අලුත් අවුරුදු සමය වෙනුවෙන් විශේෂ දුම්රිය ගමන් වාර කිහිපයක් ක්‍රියාත්මක බවද දුම්රිය දෙපාර්තමේන්තුව කියා සිටි අතර, ඒ අනුව ප්‍රධාන මාර්ගය හා මුහුදුබඩ මාර්ගය ඇතුළු සියලුම මාර්ගවල විශේෂ දුම්රිය ගමන්වාර කිහිපයක් හෙට (8) සිට ක්‍රියාත්මක කෙරෙන බවත්, අනිද්දා (9) සිට 18 වැනිදා දක්වා විශේෂ දුම්රිය ගමන්වාර ක්‍රියාත්මක බවත් කියා සිටියේය.

## රට පුරා රිය අනතුරුවලින් ඊයේත් මරණ නවයක්

රක්ෂණ ශ්‍රියන්ත

රට පුරා සිදු වූ රිය අනතුරුවලින් පුද්ගලයන් 9 දෙනකු ඊයේ (6) උදෑසන 6න් අවසන් වූ පැය 24 තුළ මිය ගොස් ඇති බව පොලිසිය පැවසීය.

එම මරණ වලින් 7ක් පෙරේදා (5) දින සිදු වූ රිය අනතුරුවලින් වන අතර, අනෙක් මරණ 2 මීට කලින් සිදු වූ රිය අනතුරුවලින් බරපතළ තුවාල ලබා රෝහල්ගතව සිටි පුද්ගලයන් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය. එම රිය අනතුරුවලින් යතුරු පැදිවල ගමන් කළ පුද්ගලයන් 4දෙනකු, ත්‍රිරෝද රථවල ගමන් කළ 3ක් සහ පදිකයන් 2ක් මෙසේ මියගොස් ඇත. රිය අනතුරු වළක්වා ගැනීමට සෑම දෙනාම උත්සාහ කළ යුතු බවත් මාර්ග නීතිවලට අනුගතව ප්‍රවේශමෙන් රිය පදවන ලෙසත් මඟීන්ද පදිකයන්ද සැලකිලිමත්ව කටයුතු කරන ලෙසත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා දන්වා සිටී.

### ඈ නෑ ත්ත

බන්දුල ඇමැති බඩු මිල ගැන නඟන — හඬ
කදිමයි ඉටු වුණොත් හරියට නොකර — කඩ
අපටත් ලබා දී අවුරුදුවලට — ඉඩ
තව තව හැඩ වෙයන් ගීයට කොවුලා — තුඩ

නැති බැරි අහිංසක දුප්පත් — ජනයාගේ
සුළු පටුවේ ඉස්මතු වන — බලවේගේ
ඉසුරින් පිරුණ හොත් මේ මව් බිම — මාගේ
ඉඩ දිය හැකිය කන්නට බැඳගත් — දීගේ

රටේමුල්ලේ මුදන්නායක

### ගිනි කාස්සා

මෙතුවක් කලක් අරගන්නට — අවදානේ
මතු විය චරිත එක සතියට එක — ගානේ
ඊයේ ආ කෙනා අද කරළියෙ — නෑනේ
පෑයූ සැණින් ආයෙත් බැස — යනවානේ



හස්මන් හෝනා






දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 අප්‍රේල් 07 බදාදා

# ෆාම් තෙල් - කටුපොල් තහනම !

ෆාම් තෙල් ආනයනය තහනම් කිරීමට ද කටුපොල් වගාව තහනම් කිරීමට ද රජය පියවර ගෙන තිබේ. මෙය පවතින සමාජ ආර්ථික ගැටලු ගණනාවකට විසඳුමක් ලෙස සැලැකිය හැකිය. පිරිසුදු පොල් තෙල් පිළිබඳ ගැටලුවට මෙයින් එක්තරා විසැඳුමක් ලැබේ. කටුපොල් වගාව තහනම් කිරීම නිසා ප්‍රදේශ ගණනාවක පාරිසරික ප්‍රශ්නවලට විසැඳුමක් ලැබෙනු ඇත. ඒ හැරෙන්නට පොල්, රබර් වැනි සාම්ප්‍රදායක වගාවන්ට ද මේ මගින් හොඳ කලක් උදාවනු ඇත. 1977 විවෘත ආර්ථිකය ස්ථාපිත වීමත් සමඟ විදේශයන්හි නිෂ්පාදිත භාණ්ඩ වර්ග විශාල ප්‍රමාණයක් රටට කඩා වැදුණේය. එයින් දේශීය කර්මාන්ත බිඳ වැටුණු අතර සාම්ප්‍රදායක වගාවන්ට ද මරු පහරක් වැදිණි. විවෘත ආර්ථිකයේ ආනයන ප්‍රතිපත්තිය රටේ ආර්ථිකය විකෘති කර තිබේ.

ෆාම් ඔයිල් සාමාන්‍ය ජනතාව අතර ප්‍රකට එළවළු තෙල් හැටියටය. එළවළු තෙල් යැයි කියූව ද ඕනෑම ශාකයකින් ගනු ලබන තෙල් ෆාම් තෙල් ලෙස හැඳින්විය හැකිය. ෆාම් තෙල් මෙරටට ගෙන්වීම ආරම්භ වන්නේ 1985 දීය. එවක් පටන් ෆාම් තෙල් ආහාර නිෂ්පාදනය සඳහා යොදාගත් අතර, පසු කලෙකදී පොල්තෙල් සමග කලවම් කරන්නට පටන් ගත්තේය. පිරිසුදු පොල්තෙල් පිළිබඳ ගැටලුව මතුවන්නේ ෆාම් තෙල් කලවම් කිරීමත් සමඟය. පසුගිය කාලය පුරාවට ෆාම් තෙල් ආනයනය උනන්දු කරන ලෙස බදු ප්‍රතිපත්ති වෙනස් විය. ඒ අනුව පොල්තෙල්වලට ප්‍රධාන ආදේශකය ලෙස ෆාම් තෙල් පැවැතිණි. ෆාම් තෙල්වල ප්‍රමිතිය සොයා බලන පරීක්ෂණ ද නොපැවැත්විණි.

1940 ගණන් වන විට ලෝකයේ හොඳම පොල්තෙල් නිෂ්පාදකයා බවට කීර්ති නාමයක් දිනා ගන්නට ශ්‍රී ලංකාව සමත් විය. එවකට කොළඹ වරායෙන් ලොව හොඳම පොල්තෙල් පිටරටට බෙදා හැරිණි. එහෙත් 1980 ගණන් වන විට එම තත්ත්වය වෙනස් විය. පසු කලෙකදී රටේ පරිභෝජනයට අවශ්‍ය පොල්තෙල් ප්‍රමාණය නිෂ්පාදනය කිරීමට අපි අපොහොසත් වී ඇත්තෙමු. මේ අනුව පොල්තෙල් ආනයනය කිරීමට සිදුවිය. පොල්තෙල් පමණක් නොව, පොල් ගෙඩි ආනයනය කළ අවස්ථා කිහිපයක් ද තිබේ. පොල් වගාවට සැලැකිය යුතු හානියක් සිදුකළේ කටුපොල් වගාවය. එක අතෙකින් රබර් හා පොල් ඉඩම් කටුපොල් වගාව සඳහා යොදා ගැනිණි. තව අතෙකින් කටුපොල් යොදා ගෙන ෆාම් තෙල් නිෂ්පාදනය ආරම්භ කැරිණි.

ශ්‍රී ලංකාව තුළ මුලින්ම කටුපොල් වගාව ආරම්භ වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේය. ගාල්ලේ නාකියාදෙණිය ඇතුළු ප්‍රදේශ කිහිපයක කටුපොල් වගාව ව්‍යාප්ත විය. එය කෙතරම් ව්‍යාප්ත වූයේද යත්, හෙක්ටයාර් 2000ක් පුරා කටුපොල් වගාව පැතිරිණි. මේ වගාව නිසා බරපතළ පාරිසරික හානි සිදුවන බව හෙළිදරව් වූයේ පසු කලෙකදීය. කටුපොල් වවන ප්‍රදේශවල ජල උල්පත් සිඳී යයි. කටුපොල් ආශ්‍රයෙන් ෆාම් තෙල් නිෂ්පාදනය කරන කම්හල් නිසා අවට පරිසරය අපවිත්‍ර වෙයි. කටුපොල් වගාව ඇති සෑම ප්‍රදේශයක්ම කෙමෙන් ශුෂ්ක ප්‍රදේශයක් බවට පත්වනු නොවැළැක්විය හැකිය. මේ ගැටලු පැවැතිය ද කටුපොල් වගාව නතර වූයේ නැත. ෆාම් තෙල් ආනයනය නතර වූයේ ද නැත.

ආනයනික පොල්තෙල්වල පිළිකා කාරක විෂ රසායන අඩංගු බව හෙළිදරව් කරගත්තේ පසුගියදාය. එහෙත් මීට පෙර ගෙන්වන ලද පොල්තෙල් විද්‍යාත්මක පරීක්ෂණවලට ලක්කොට ඒවායෙහි විෂ රසායන ඇති බවට කරුණු හෙළිදරව් කරගෙන තිබුණේ නැත. ප්‍රමිති ආයතනය ඇතුළු රාජ්‍ය ආයතන රැසක් ආනයනික ආහාර ද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳ සොයා බැලිය යුතු වුව එවැන්නක් සිදුවූ බවට ප්‍රසිද්ධ සඳහනක් නැත. එක්කෝ පරීක්ෂණ නිසි අයුරින් සිදුවී නැත. නැතහොත් දේශපාලන බලය යොදා ගෙන ව්‍යාපාරිකයන් තම අරමුණු දිනාගෙන ඇත. මෙවර සිදුවූ හෙළිදරව්වෙන් පසු ආනයනික ආහාර ද්‍රව්‍ය ගැන නැවත සිතා බලන්නට ජනතාව පෙලැඹී සිටිති. එය වැදගත්ය. පිටරටින් එන ඕනෑම කුණුගොඩක් භාර ගැනීම හා මහ ඉහළින් පිළි ගැනීම අප සිදුකරගත් බලවත් වැරැද්දකි.

මේ වැරැද්දේ මුල විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හා එහි ආනයන වැඩපිළිවෙළ යැයි කිව හැකිය. 1977න් පසු අපේ වෙළෙඳපොළ පිටරට බඩුවලින් පිරී ගියේය. ආහාර ද්‍රව්‍ය, විසිතුරු භාණ්ඩ, ඇඳුම්, වාහන, ඉලෙක්ට්‍රොනික භාණ්ඩ පමණක් නොව, සෙල්ලම් බඩු පවා ඒ අතර තිබිණි. සරුංගල් ද පිටරටින් ආනයනය කැරිණි. මෙහි භයානක ප්‍රතිඵල කිහිපයක් තිබේ. එක ප්‍රතිඵලයක් වන්නේ ව්‍යාපාරිකයන්ට ප්‍රමිතියෙන් තොර බාල භාණ්ඩ ගෙන් වීමට අවස්ථාවක් ලැබීමය. දෙක විෂ රසායන සහිත ආහාර ද්‍රව්‍ය දේශීය වෙළෙඳපොළට නිකුත් වීමය. තුන, දේශීය ගොවියා ස්වකීය භාණ්ඩ අලෙවි කර ගත නොහැකිව අන්ත අසරණ තත්ත්වයකට පත් වීමය. මේ ක්‍රමය නිසා ගොවියා විනාශ විය. පාරිභෝගිකයා අසරණ විය. තෘප්තිමත් වූයේ ව්‍යාපාරිකයා පමණි.

වත්මන් ආණ්ඩුව බලයට පත්වන්නේ දේශීය ගොවියා සුරක්ෂිත කරන බවට ද දේශීය ආර්ථිකය ශක්තිමත් කරන බවට ද පොරොන්දුවක් දෙමින්ය. මෙහි එක් පියවරක් වූයේ ආනයන සීමා කිරීමය. දේශීය වශයෙන් වගා කළ හැකි ධාන්‍ය, කුළුබඩු ඇතුළු භාණ්ඩ කිහිපයක් ආනයනය කිරීම තහනම් කැරිණි. මේ අනුව වෙළෙඳපොළ තුළ තාවකාලික ලෙස භාණ්ඩ හිඟයක් ඇති විය හැකිය. මිල ඉහළ යෑමක් ද ඇති විය හැකිය. එහෙත් ඒ දෙකම තාවකාලිකය. කහ ප්‍රශ්නය නිදසුනක් ලෙස ගත හැකිය. කහ ආනයනය තහනම් කළ සැණෙන් භාණ්ඩ හිඟයක් ඇති විය. මිල ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. එහෙත් රටේ සෑම තැනකම කහ වවන්නට පටන් ගැනිණි. මේ වන විට කහ මිල පහත බැස තිබේ. ලබන වසරේ අස්වැන්න ලැබෙන විට කහ ගැටලුව මුළුමනින්ම විසැඳී තිබෙන්නට පුළුවන.

නිවැරැදි ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආර්ථික ගැටලු බොහොමයක් පහසුවෙන්ම විසඳාගත හැකිය. අලුත් අවුරුදු සමයේ පොල්තෙල් ගැටලුව නිසා සැලැකිය යුතු කැලැඹීමක් ඇති විය. දේශීය පොල්තෙල් නිෂ්පාදකයා ශක්තිමත් තැනෙක පසුවූයේ නම්, මේ ගැටලුව මතු වන්නේ නැත. දේශීය පොල්තෙල්වල පිළිකාකාරක විෂ රසායන නැත. රටට අවශ්‍ය තරම් පොල්තෙල් නිෂ්පාදනය කිරීම සඳහා එම කර්මාන්තකරුවන් දිරිගැන්විය යුතුය. කටුපොල් වගාව තහනම් කිරීම ද ෆාම් තෙල් ආනයනය තහනම් කිරීම ද මේ අතින් බලනවිට අතිශය වැදගත් පියවරකි. එයින් දේශීය පොල්තෙල් නිෂ්පාදකයා දිරිගැන්වෙනු ඇත.

### දුල්රූගෙ සිව්පද

| | |
|---|---|
| මුව ආවරණයක් දාගෙන මූණ | වටේ |
| තරඟෙට යන්න හැක කෙල්ලෙක වුණත් | හැටේ |
| ලකයක් නැතත් ඒ තරමට මූණේ | කටේ |
| අවුරුදු කුමාරිය වුණ හැකි මෙදා | පොටේ |

# භාණ්ඩ මිල පාලනයට සැලසුම් සහගත ක්‍රමවේදයක්



අලුත් අවුරුද්ද යනු නෑදෑකම් අලුත් වන කාලයකි. එමෙන්ම වෙළෙඳ ලෝකයේ වෙළෙඳුන්ට සරුසාර කාලය උදා වන්නේ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සමඟය. ඇඳුම් පැලඳුම් පමණක් නොව ආහාර වෙළෙඳපොළට ද වැඩියෙන්ම ලාභ ලැබෙන්නේ මේ කාලයේදීය. සහල්, ආහාර ද්‍රව්‍ය මෙන්ම කුකුළු මස්, මාළු වැනි ආහාර ද්‍රව්‍යවලට ලැබෙන්නේ ද ඉහළ ඉල්ලුමකි. දැන් එළැඹෙමින් ඇත්තේ එවැනි උත්සව කාලයකි. පසුගිය වසරේ ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම නිසා අවුරුදු ජයට සැමරීමට හැකියාව නොලැබුණි. එමනිසා මෙවර අලුත් අවුරුදු උනන්දුව තවත් ඉහළ ගොස් තිබේ.

අවුරුදු කාලයේ නිවෙසට යන එන අමුත්තන්ට තේ පැන් සංග්‍රහයකට අමතරව බත් වේලක් සූදානම් කිරීම ශ්‍රී ලාංකිකයන්ගේ සිරිතය. අවුරුදු සමරන්නට පෙර නිවැසියන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිවෙස්වල එක්රැස් කරන්නේ එබැවිනි. මේ තත්ත්වය තුළ වැඩි වන ඉල්ලුමට සරිලන සැපයුමක් කළ නොහැකි වීම තුළ භාණ්ඩ හිඟයක් ඇති වීම ස්වාභාවිකය. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යෑමය. එහෙත් අවුරුදු කාලයේදී වැඩි මිලකට හෝ තමන්ට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය මිල දී ගැනීමට පාරිභෝගිකයෝ උනන්දුවක් දක්වති. වෙළෙඳපොළ තත්ත්වය අනුව උත්සව කාලයේදී කුකුළු මස් සහ බිත්තර මිල වැඩි වීමට ඇති ඉඩ වැඩිය. එයට හේතුව වන්නේ සැපයුම අඩු වීම සහ මේ එයට සාපේක්ෂව ඉල්ලුම ඉහළ යෑමය. සත්ව පාලනයෙහි නිරත ගොවිපොළ හිමියන් සඳහන් කරන පරිදි සතුන්ට සපයන ආහාර ප්‍රමාණවත් නැත. පාරිභෝගික අවශ්‍යතා සපුරන වෙළෙඳාමකට කලින් සත්ත්ව ආහාර ප්‍රශ්නය විසඳා ගත යුතුය. එමගින් මාංශ අස්වැන්න වැඩි කර ගත හැකිය.

## මාෆියාවක් බව හුවා දැක්වීම

රට තුළ කෙරෙන ආහාර නිෂ්පාදනය ප්‍රමාණවත් නැත. නිපදවනු ලබන ඇතැම් දේ වෙනුවෙන් අවශ්‍ය කරන මූලික ද්‍රව්‍ය මෙරට නැත. ඒවා ගෙන්වීම පාලනය කර තිබේ. මෙම පරිවර්තන කාලසීමාව තුළ කැපවීමක් අවශ්‍යය. මාෆියාවක් බව හුවා දැක්වීම පහසුය.


මාෆියාවක් හෙවත් ඒකාධිකාරියක් ඇති වීමට ප්‍රධාන හේතුවක් වන්නේ සුළු පිරිසක් වෙත වෙළෙඳපොළ මෙහෙය වීමට අවස්ථාව හිමි වීමය. අද සහල් මිල පාලනය ඉන් ගිලිහී යෑමට හේතු වී ඇත්තේ මේ තත්ත්වය මතය.

මාෆියාව යන වචනය පාවිච්චි කිරීම පහසුය. සහල්, සීනි, එළවළු, පොල් තෙල් සහ ආදී වශයෙන් මාෆියා හඳුන්වන අවස්ථා තිබේ. මෙම ගණයට කුකුළු මස් මාෆියාවක් ඇති වීමට ද ඉඩක් මතුව තිබේ. එමගින් හඳුන්වනු ලබන්නේ සංවිධානාත්මක අපරාධකරුවන්ගෙන් සමන්විත කල්ලි වේ. අද අප රට තුළ ඒ ආකාරයේ සංවිධානාත්මක වෙළෙඳ මාෆියාවක් ක්‍රියාත්මක වනවා යැයි සඳහන් කිරීමේ සාධාරණත්වයක් තිබේ. සහල් වෙළෙඳපොළ කටයුතු පාලනය කළ නොහැකි වන අවස්ථාවේදී එය මාෆියාවක් සේ හුවා දක්වන අතර සීනි වෙළෙඳපොළ හැසිරවීමේදී යම් සිද්ධියක් ද එසේ දක්වන්නට නොපැකිලෙති.

අස්වැන්න නෙළන අවස්ථාවේදී අඩු මිලට වී මිල දී ගෙන ගබඩා කළ හැකිය. එහෙත් ආරක්ෂා කර ගත හැකි කාල සීමාවක් තිබේ. එමෙන්ම එහිදී ඇති වන තවත් තත්ත්වයක් වන්නේ වී මිලදී ගැනීමට රජය මිලක් නියම කර තිබියදී ඒ මිලට වඩා වැඩි මිලක් ගෙවා පෞද්ගලික අංශය ගොවියාගෙන් වී මිල දී ගැනීමය. මෙරට නිපදවන කැකුළු සහල් සඳහා විදේශ ඉල්ලුමක් ද නැත. අපනයන අවස්ථා සඳහා විශාල ධනයක් වැය කර වී මිල දී ගෙන ගබඩාවල සිරකර තැබීම අපරාධයකි. එහෙත් අද බොහෝ ගබඩාවල ප්‍රමාණයටත් වඩා වී ගබඩා වී තිබේ.ඒවා ප්‍රමිතියකට අනුව දිගු කලක් ගබඩා කිරීම ගැටලු සහගතය. එම නිසා වී ගබඩා කිරීම, වී මිලදී ගැනීම මෙන්ම ඒවා නිසි ප්‍රමිතියකින් ගබඩා කිරීම සහ බෙදා හැරීම ද සිදු කළ යුතුය. ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ තරගයක් තිබිය යුතුය. එමගින් සහනයක් සැලසෙන්නේ කුකුළු මස් සහ බිත්තර පාරිභෝගිකයාටය.

රජයේ වී මිල දී ගැනීම නිෂ්පාදනයෙන් සියයට දහයක ප්‍රතිශතය නොඉක්මවයි. පෞද්ගලික අංශය සහමුලින්ම පාලනය කරන විට යම් යම් පරස්පරතා ඇති කළ හැකිය.

අද සහල් මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇත්තේ රජය සතු පංගුවට වඩා කිහිප ගුණයක පංගුවක් පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන් කිහිප දෙනකු අතර බෙදී යෑමය. එහි ප්‍රතිඵලය වී ඇත්තේ රජය පනවන ගැසට් පත්‍රයට ද අභියෝග කිරීමට වී මෝල් හිමියන් සුළුතරයකට හැකියාව ලැබීමය. එමෙන්ම මේ කාලයේ වඩාත් කතාබහට ලක් වන කුකුළු මස් නිෂ්පාදනය සහ බිත්තර නිෂ්පාදනය ද සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශය මෙහෙයවන ව්‍යාපාරයක් වී තිබේ. මෙරට ප්‍රධාන වශයෙන් බිත්තර නිෂ්පාදනය කරන්නේ කිහිප දෙනෙකි. පැටවුන් නිෂ්පාදනය ප්‍රධාන ආයතන හතරක් උසුලයි. කොටසක් විදේශයෙන් ආනයනය කෙරේ. මස් හා බිත්තර වෙළෙඳාම ද ප්‍රධාන සමාගම් කිහිපයක අණසකට යටත්ය. මහා පරිමාණයෙන් කරන නිෂ්පාදන සමඟ තරඟ කරන්නට සුළු නිෂ්පාදකයන් අසමත්ය. ඔවුන් සපයන පැටවුන් මිල දී ගෙන එම නඩත්තු ක්‍රමවේද අනුව කරගෙන යන ගොවිපොළවල වියදම දරාගත නොහැකි වී තිබේ.



අවසානයේදී මහා පරිමාණ ගොවිපොළ ඉතිරි වන අතර සුළු නිෂ්පාදකයෝ ගොවිපොළ අතහැර දමති. එහි අවසාන ප්‍රතිඵලය බවට පත්වන්නේ කුකුළු මස් වැනි අත්‍යවශ්‍ය නිෂ්පාදන මිල ඉහළ යෑමය. එය මෙවැනි උත්සව කාලයකදී නිතරම සිදු වන දෙයකි. එනිසා එය පාලනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම බලධාරීන්ගේ වගකීමකි.

සත්ත්ව ගොවිපොළ කුඩා පරිමාණයෙන් පවත්වා ගෙන යෑම ග්‍රාමීය මට්ටමේ පුද්ගලයන්ට හොඳ ආදායමක් ලැබිය හැකි මාර්ගයකි. අප රට තුළ මෙම ක්‍රමය විශාල ලෙස ප්‍රචලිතව නැතත් අප්‍රිකාවේ බොහෝ රටවල ගැමියන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත්ව ඇත්තේ කුඩා පරිමාණයේ ගොවිපොළ පවත්වා ගෙන යෑමය.

වාර්තා වන ආකාරයට අප්‍රිකානු කලාපයේ ගැමි පවුලක මාසික දිවි පැවැත්මට කුකුලන් සහ කිකිලියන් පස් දෙනකු ප්‍රමාණවත්ය. එමෙන්ම වාර්ෂිකව එම පවුලකට තම ජීවන තත්ත්වය පවත්වා ගෙන යා හැකි ආදායමක් ලබා ගත හැකිය. අප රට තුළ ද මේ තත්ත්වය ප්‍රචලිත කළ හොත් ගැමි ආදායම් මාර්ග ඉහළ යන අතර සත්ත්ව නිෂ්පාදන කෙරෙහි ඇති ව්‍යාපාරිකයන් කිහිප දෙනකුගේ ආධිපත්‍ය ද නැති කළ හැකිය.

## මහා පරිමාණ නිෂ්පාදකයන්

එහෙත් මෙම තත්ත්වය නිවැරැදිව ක්‍රියාත්මක නොවීම නිසා සුළු ව්‍යවසායකයෝ අසරණ වී සිටිති. මහා පරිමාණ නිෂ්පාදකයෝ විශාල ප්‍රචාරයක් සහිතව බිත්තර හා මස් අලෙවි කරති. පාරිභෝගිකයන් ද ඒවාට යොමු වන අතර සාමාන්‍ය නිෂ්පාදකයන්ට මෙම තත්ත්වය තුළ සහනයක් ලැබෙන්නේ නැත.

ජනතාවගේ ප්‍රෝටීන පරිභෝජනය පසුගිය වසර විසි පහ තුළ වෙනස් වී තිබේ. ඒ ගැන රජයේ සංඛ්‍යා ලේඛන දක්වන පරිදි මෙරට ධාන්‍ය ප්‍රෝටීන පරිභෝජනය අඩු වී තිබේ. මස් පරිභෝජනය වැඩි වී ඇත. මාළු ආහාරයට ගැනීම සීමා වී තිබේ. එය වෙළෙඳපොළ අනුව සිදුවූ නැඹුරුවකි. ධාන්‍ය ආහාරයට ගැනීම අඩු වන හේතුව ගැටලු සහගතය. කාර්ය බහුල පරිසරයක් තුළ උදෑසන නිවෙස කලබලකාරීය. එහි ප්‍රතිඵලය බවට පත්වන්නේ ක්ෂණික අතුරු පසක් බේකරියෙන් මිල දී ගැනීමය. එය ගෘහණියට පහසුවකි.

අනෙක ධාන්‍ය මිල වැඩිය. අද වන විට ධාන්‍ය මිල විශාල ලෙස ඉහළ ගොස් තිබේ. මෙරට ගොවියන් අවශ්‍ය තරමට ධාන්‍ය වර්ග නිපදවන්නේ නැත. එයට ගැළපෙන වැඩපිළිවෙළක් කෘෂිකර්ම බලධාරීහු නිර්මාණය නොකරති. දිගටම වී වගා කරන්නන් මුං ඇට හෝ කුරක්කන් වගා කරන්නේ නැත. සත්ත්ව පාලනයෙහි නිරත පිරිස් දක්වන අන්දමට කුකුළු ආහාර වශයෙන් බඩ ඉරිඟු සපයා ගැනීම පවා ගැටලු සහගතය. පිටරටින් ගෙන්වීම තහනම් කර ඇති පසුබිමක රට තුළ ධාන්‍ය නිෂ්පාදනය වේගවත් කළ යුතුය.

මෙහිදී ඇතිවන තවත් තත්ත්වයක් බවට පත්ව ඇත්තේ ආහාර නිෂ්පාදන අංශය නියාමනය කිරීමට නොහැකි තත්ත්වයක් තිබීමය. ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ හැසිරෙන අන්දම හා පාරිභෝගික රුචි අරුචිකම් ගැන දත්ත ඇත. එහෙත් ඒවා ගැන නිසි අවධානයක් යොමු වී ඇද්ද යන්න ගැටලු සහගතය.

දැන් කළ යුතුව ඇත්තේ රට තුළ ආහාර නිෂ්පාදනය ඉහළ දැමීමත් එම නිෂ්පාදන ගොවියාගෙන් නිසි ලෙස මිල දී ගෙන පාරිභෝගිකයා වෙත ගලා යෑමට අවශ්‍ය ජාලයක් සකස් කිරීමය. එසේ නොකර ගොවියා කෙතරම් නිෂ්පාදනය ඉහළ දැමුව ද ගොවියාට හෝ නිෂ්පාදකයාට ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැත. එනිසා සිදු කළ යුත්තේ රාජ්‍ය වෙළෙඳ ජාලය සහ මිලදී ගැනීමේ ජාලය ශක්තිමත් කිරීමය. අද වන විට ආණ්ඩුව මේ ගැන අවධානය යොමු කර ඇති බව පෙනී යයි.

දැනටමත් සතොස සහ සමූපකාර වෙළෙඳ ජාලය ඔස්සේ රජය පොදු පාරිභෝගිකයාට සහන ලබා දීම ආරම්භ කර තිබේ. මේ තත්ත්වය තුළ පෞද්ගලික අංශය තරගකාරී ලෙස පාරිභෝගිකයන් දිනා ගැනීමට කටයුතු කරන බවක් දක්නට ඇති අතර එහි අවසාන ප්‍රතිඵලය වන්නේ මෙතෙක් කල් වෙළෙඳුන් කිහිප දෙනකු අත පැවැති වෙළෙඳ මාෆියාව බිඳ වැටීමය. එය පොදු පාරිභෝගිකයාට ලැබෙන අති මහත් වාසියකි.

**උදිත ගුණවර්ධන**



# සෑම ගමකම සිහින එගොඩ කිරීමට පාලම් 5000ක් හදනවා

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ සභාපති ඩී.පී.එම්. චන්ද්‍රන

"සෞභාග්‍යයේ දැක්ම" රජයේ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ මේ වන විට දිවයින පුරා විශාල සංවර්ධන ව්‍යාපෘති ගණනාවක්ම ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන යටතේ ග්‍රාමීය ජනතාවට සෙත සැලසීමේ අරමුණින් හඳුන්වා දී තිබෙන දිවයින පුරා ග්‍රාමීය පාලම් 5000 ඉදි කිරීමේ වැඩපිළිවෙළ ද මේ වන විට ආරම්භ කර තිබේ. එම වැඩසටහන දිවයින පුරා සිදු කරන ආකාරය සහ ඉන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ සභාපති ඩී.පී.එම්. චන්ද්‍රන මහතා සමඟ කරන ලද සාකච්ඡාවකි.







**● පාලම් 5000ක් ග්‍රාමීය ජනතාව වෙනුවෙන් ඉදි කිරීමේ රජයේ වැඩපිළිවෙළ බාර දී තිබෙන්නේ ඔබගේ ආයතනයට. එම වැඩපිළිවෙළ සිදු කෙරෙන්නේ කොහොම ද?**

"සෞභාග්‍යයේ දැක්ම" රජයේ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ හඳුන්වා දී තිබෙන දිවයින පුරා ග්‍රාමීය පාලම් ඉදි කිරීමේ වැඩපිළිවෙළ යටතේ පාලම් 5000ක් ඉදි කෙරෙනවා. දරුවන් ඒදඬු පාලම්වලින් යන ස්ථාන, ජනතාවට කෘෂි භෝග ප්‍රවාහනය කර ගැනීමට අපොහොසත් ස්ථාන සඳහා කුඩා පාලම් අවශ්‍යයි. රට පුරා ඇති එවැනි අත්‍යවශ්‍ය ස්ථාන හඳුනාගෙන ඒවා ඉදි කිරීමේ කටයුතු මෙහිදී සිදු කරනවා. මෙම පාලම් ඉදි කරන්නේ ග්‍රාමීය මාර්ග හා අවශේෂ පහසුකම් අමාත්‍යාංශය මඟින්. එම අමාත්‍යාංශයේ ඇමතිවරයා වන්නේ නිමල් ලන්සා මහතායි. මෙහි ලේකම් ලෙස කටයුතු කරන්නේ මහාචාර්ය රංජිත් දිසානායක මහතා.

**● පාලම් අවශ්‍ය ස්ථාන හඳුනා ගන්නේ කොහොම ද?**

එය සිදු කරන්නේ අමාත්‍යාංශය මඟින් සහ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින්. සංවර්ධන අධිකාරිය මඟින් අදාළ ස්ථානයේ අවශ්‍ය සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරනවා. එහි ඉදි කිරීම් කටයුතු සිදු කරන්නේ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවෙන්.

**● මේ වන විට පාලම් කොපමණ ප්‍රමාණයක් ඉදි කර තිබෙනවා ද?**

දැනට අපි පාලම් 150ක ඉදි කිරීම් ආරම්භ කළා. මේ වෙන කොට ඒවායේ කටයුතු සිදු කරමින් පවතිනවා.

**● මෙම පාලම් 150 ඉදි කරන්නේ දිවයිනේ කුමන ප්‍රදේශවල ද?**

දිවයිනේ හැම ආසනයකටම එක පාලමක් බැගින් හදන්න අපි ගිය සතියේ වැඩ ආරම්භ කළා. උදාහරණයක් විදියට ගම්පහ දිස්ත්‍රික්කයේ ආසන සංඛ්‍යාව හඳුනාගෙන හැම ආසනයකටම එක පාලමක් හදනවා. දැනට ගම්පහ මිනුවන්ගොඩ, ජාඇළ සහ හම්බන්තොට, කුරුණෑගල, අනුරාධපුරය, පොලොන්නරුව යන දිස්ත්‍රික්කවල හැම ආසනයකම වැඩ පටන් ගත්තා. මේ ආකාරයට ඉදිරියේදී දිවයින පුරාම පාලම් හදන්න පටන් ගන්නවා.

**● ඔබ පවසන ආකාරයට මේ වැඩපිළිවෙළ මේ වන විට ශ්‍රී ලංකාව පුරාම ආරම්භ කරලා තිබෙනවා?**

ඔව්. මේ අවුරුද්දේ පාලම් 1000ක් ඉදි කිරීමට සැලසුම් සකස් කර තිබෙන්නේ. මින් මුල් පියවර ලෙස පළමු පාලම් 150 මාස 3ක් ඇතුළත නිම කරන්නට අප බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මාසයකට පාලම් සියයක වැඩ කටයුතු ආරම්භ කිරීමටයි අපේ සැලැස්ම. ඒ කියන්නේ මුලින් පටන් ගන්න පාලම් 150 මාස තුනකින් ඉවර කරලා, ඊළඟ මාසයේ පටන් ගන්න ඒවා ඉදිරි මාස 3 ඇතුළත නිම කරනවා. මේ ආකාරයට සෑම මාසයකටම පාලම් 100ක වැඩ අරඹනවා. ඒ වගේම මාස තුනෙන් තුනට පාලම් 100ක වැඩ නිම වෙමින් යනවා.

**● මෙම පාලම් 5000 ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණය කොපමණ ද?**

රජය මඟින් රුපියල් මිලියන 9500ක් මේ වර්ෂය සඳහා වියදම් කිරීමට වෙන් කොට තිබෙනවා. ඉදිරි වසර හතර තුළ සියලු ඉදි කිරීම් නිම කිරීමට රුපියල් බිලියන 45ක් පමණ වැය කිරීමට රජය බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා සියලු මුදල් මේ වෙන කොට වෙන් කර අවසන්.

**● හැම ආසනයකටම හදන පාලම් තෝරා ගන්නා ක්‍රමවේදය කුමක් ද? මෙහිදී පාලමක් අත්‍යවශ්‍යම ස්ථානයක් නිවැරදිව හඳුනාගැනීමක් සිදු කරනවා ද?**

මුලින්ම මාර්ග සංවර්ධන අධිකාරිය සහ මහාමාර්ග අමාත්‍යාංශය මඟින් එවැනි ස්ථාන සඳහා කැඳවීම් කරනු ලබනවා. අදාළ ප්‍රාදේශීය ලේකම්තුමා මඟින් සහ පළාත් පාලන ආයතන මඟින් සහ අදාළ දේශපාලන අධිකාරිය මඟින් තමයි මේ කැඳවීම් කරනු ලබන්නේ. ඉල්ලීම් විශාල ප්‍රමාණයක් පැමිණ තිබුණා. අපි පාලම තෝරා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනවා. ඒ කියන්නේ මේ අලුත් පාලම් නිසා කෘෂි කර්මාන්තය පැත්තෙන් ආර්ථිකය නංවාලීම සඳහා කොපමණ ඉඩම් අක්කර ප්‍රමාණයක් ලබා ගත හැකිද, මේ පාලම ඉදි වූයේ නැතිනම් ඒ වටා සිටින ජනතාවට ඊළඟ පාලම තෙක් යෑමට තිබෙන දුර ප්‍රමාණය සහ නව පාලමෙන් ප්‍රතිලාභ හිමි වන පවුල් සංඛ්‍යාව වැනි නිර්ණායක කිහිපයක් හඳුන්වා දී තිබෙනවා. එම නිර්ණායක අනුවයි තෝරා ගැනීම සිදු කරන්නේ.

**● පාලමක් අත්‍යවශ්‍යම ජනතාවක් සිටින ප්‍රදේශයකට පාලමක් ලැබෙනවා ද?**

අනිවාර්යයෙන්ම.

**● පොල් කොටවලින් තැනූ ඒදඬු පාලම් තිබෙන ස්ථාන හඳුනාගෙන මාධ්‍ය මඟිනුත් මේ පිළිබඳව දැනුම්වත් කරනවා. එවැනි ස්ථානවලටත් කිසියම් ප්‍රමුඛතාවක් ලැබෙනව ද?**

ඔව්. ඇත්තටම එසේ සිදු කරනවා. ළඟදි ගුවන් විදුලියෙත් විකාශය වුණා අනුරාධපුරයේ පාසල් ළමයින් යන ස්ථානයක් පිළිබඳව. වසර ගණනාවක සිට එම ස්ථානයේ අනතුරු සිදු වෙනවා කියලා. එම ස්ථානයත් මෙම පාලම් 5000 යටතට ගන්න කියලා අමාත්‍යාංශයෙන් අපට දැනුම් දීලා තිබෙනවා. රට පුරා තිබෙන එවැනි සංවේදී ස්ථාන පිළිබඳව ජනමාධ්‍ය මඟින් පෙන්වා දෙනවා නම් එම ස්ථාන මෙම ව්‍යාපෘතියට ඇතුළත් කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කරනවා.

**● මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන්නේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහනට සමගාමීව ද?**

ඔව්. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළේ කිලෝමීටර් ලක්ෂයක් කාපට් කිරීම සහ ග්‍රාමීය මාර්ග 5000ක් අලුතින් ඉදි කිරීම යන ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති කිහිපයක් මාර්ග සංවර්ධනයට යටත්ව හඳුන්වා දී තිබුණා. ඒ වගේම මෙවර එතුමාගේ අයවැය ප්‍රකාශනයේත්, නිදහස් දින ජාතිය අමතා කළ ප්‍රකාශයේත් එතුමා මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කළා. මේ වැඩසටහන ආරම්භ කිරීමේදී "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන යටතේ බැසිල් රාජපක්ෂ මැතිතුමා තමයි මේ වැඩසටහන හඳුනා ගත්තේ. ඉන්පසුව තමයි ජනාධිපතිතුමා විසින් මේ වැඩසටහන සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළට ඇතුළත් කළේ.

**● පසුගිය කාලයේ හදපු ඇතැම් පාරවල්වල කොන්ක්‍රීට් තට්ටුව ඉතා ඉක්මනින් කැඩී යනවා අප දුටුවා. පාලම්වලත් එහෙමයි. මේ අලුත් පාලම්වල ප්‍රමිතිය කොහොම ද? මේවායේ ඉදිකිරීම් සඳහා සුදුසුකම්ලත් ඉංජිනේරුවන් මඟින් ද වැඩ කටයුතු කෙරෙන්නේ?**

ඇත්තටම රාජ්‍ය ඉංජිනේරු හා නිර්මාණ නීතිගත සංස්ථාව කියන්නේ වසර 50කට වැඩි රජයේම ආයතනයක්. අපි පසුගිය කාලය පුරාම දිවයින පුරා මාර්ග ඉදි කිරීම් සහ පාලම් ඉදි කිරීම් විශාල සංඛ්‍යාවක් සිදු කළා. මෙතැනදී අපි රජයේ ආයතනයක් විදියට ලාභයට එහා ගිහින් නිසි ප්‍රමිතියකින් නිසි වේලාවට නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම අපි දරනවා.

**● මේවායේ නිරීක්ෂණ කටයුතු සිදු කරන්නේ කොහොම ද?**

දිස්ත්‍රික්කයට අදාළ වරලත් ඉංජිනේරුවන් අපට සිටිනවා. ඒ වගේම මේ පාලම් ව්‍යාපෘතිය සඳහාම බඳවා ගත් උපාධිධාරී ඉංජිනේරුවන් තමයි මෙහි අධීක්ෂණ කටයුතු සිදු කරන්නේ. හැම පාලමකටම අධීක්ෂණ නිලධාරීන් ද පත් කර තිබෙනවා. ඒ වගේම මේ පාලම්වල කොන්ක්‍රීට්වල ප්‍රමිතිය, කම්බි කැඩෙනවද, ඒවායේ ප්‍රමිතිය ආදි සියලු දේ සොයා බලනවා. විශාල පාලම් ඉදි කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදයම මෙහිදීත් අනුගමනය කරනවා.

**● මේ පාලම් 5000ම වැඩ නිම කරන්න බලාපොරොත්තු වෙන්නේ කොපමණ කාලයකින් ද?**

වසර 2025 වෙන කොට ජනාධිපතිතුමාගේ පළමු ධුර කාලය අවසන් වෙනවා. ඒ වෙන කොට මේ පාලම් 5000ත් හදා නිම කරන්නයි අපි බලාපොරොත්තු වෙන්නේ.

**● මෙවැනි විශාල ව්‍යාපෘතිවලදී අත යට ගසා කෑම් සිදු වෙනවා. මෙහිදී ඔබට විශ්වාසද එසේ වන්නේ නැහැ කියලා?**

ඔව්. එහෙම වෙන්න අවශ්‍යතාවක් නැහැ. හේතුව මෙය සම්පූර්ණයෙන්ම රජයේ ආයතනවලින් කෙරෙන්නේ. මාර්ග සංවර්ධන අධිකාරියත්, රාජ්‍ය ඉංජිනේරු සහ නිර්මාණ සංස්ථාව කියන්නෙත් රාජ්‍ය ආයතන. මේ නිසා මේ සියලු වැඩ කටයුතු කෙරෙන්නේ රජයේ මැදිහත් වීමෙන්. පාලම තෝරා ගැනීම, නිර්මාණ, සැලසුම් සහ ඉදිකිරීම් සියල්ලටම සම්බන්ධ වී තිබෙන්නේ රජයේ ආයතනයි.

අධිවේගී මාර්ගයක් හදන්න කිලෝමීටරයකට රුපියල් බිලියන 2.5 සිට බිලියන 4.5 තෙක් පසුගිය කාලයේ වියදම් කර තිබෙනවා. මෙතැනදි ජනාධිපතිතුමා ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය දියුණු කරන්න, දුප්පත්කම ගමෙන් තුරන් කරන්න ප්‍රමුඛත්වය දී තිබෙනවා. විශාල ජන කොට්ඨාසයකට මේකෙන් ප්‍රතිලාභ ලැබෙනවා. පවුල් 25-50ක් පමණ සිටින ප්‍රදේශවල සිටින අයගේ ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කරන්න, එතැනදි ක්ෂුද්‍ර මූල්‍ය ආර්ථිකය ඉලක්ක කරගෙන ග්‍රාමීය ආර්ථිකය වැඩි දියුණු කිරීම යන සංකල්ප ඉලක්ක කර ගෙන දිවයින පුරා සිටින ජනතාවට ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘතියක් ලෙස මෙය හඳුන්වා දෙන්න පුළුවන්. මෙය ඉතාම සාර්ථකව ජනතාවටත් ඒ අවශ්‍ය ප්‍රතිලාභ ලැබෙන ආකාරයට නියමිත ප්‍රමිතියට සහ නියමිත කාලයට නිම කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**චතුමී පිටිපන**
**ඡායාරූප - ප්‍රභාත් විතානාච්චි**

**සංවර්ධන අධිකාරිය මඟින් අදාළ ස්ථානයේ අවශ්‍ය සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරනවා**

**ඉදිරියේදී දිවයින පුරාම පාලම් හැදේවි**

**සෑම මාසයකම පාලම් 100ක වැඩ අරඹනවා**

**බැසිල් රාජපක්ෂ මැතිතුමා තමයි මේ වැඩසටහන හඳුනා ගත්තේ**

**විශාල පාලම් ඉදි කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදයම මෙහිදීත් අනුගමනය කරනවා**




## ෂොපින් සිහින ඇතුළත සැඟවුණු පශ්චාත් කොවිඩ් අවදානම



පසුගිය දින කිහිපයේ ට්විටර් ඇතුළු සමාජ මාධ්‍ය කිහිපයක අතිශය ජනප්‍රිය ඡායාරූප කිහිපයක් විය. ඉන් එකක, නුවර නගරයේ ප්‍රකට ඇඳුම් වෙළෙඳ සලක අයකැමි කවුන්ටරය අසල මී මැසි පොදියක් සේ රොද බැඳි සෙනඟ සමූහයකි. අනෙක අගනුවර තවත් ප්‍රකට ඇඳුම් වෙළෙඳ සලක ඇතුළත දර්ශනයකි. එහි එකම හිස් ගොඩකි. මුව ආවරණ නිසියාකාරව පැළැඳි අය සේම අවිධිමත්ව මුව ආවරණ පැළැඳි අයත් ඒ අතර විය. මෙවන් ස්ථානවල දුරස්ථකරණය පවත්වා ගැනීම කළ නොහැක්කකි. සීමිත ඉඩකඩක අසීමිත පිරිසක් එක් රොක් වූ පසු අත්විය හැකි භයානක තත්ත්ව බොහොමයකි. අත්දැකීම්වලින් ඉගෙන ගැනීම, වැරැදිවලින් ඉගෙන ගැනීම පසෙකලා හුදෙක් ආශාවන්ට ඉඩ දීමෙන් මේ කරමින් සිටින වැරැද්ද සුළුපටු නොවේ. ඇඳුම් ආයිත්තම් සහ තවත් බොහෝ භෞතික දේ අත්පත් කර ගැනීමේ මිනිස් ආශාව විසින් වසංගත අවදානම පසෙක හෙළා ඇති සැටියකි.

මේ උමතුව කුමක්දැයි ඇසීමෙන් පලක් නැත. අපේ රටේ ජනගහනයෙන් අඩකට වඩා ඒ උමතුව වැලඳී ඇත. කොවිඩ් යනු අතිශය භයානක රෝග තත්ත්වයක් බව හොඳාකාරව දැන මෙලෙස හැසිරීමේ අරුත කුමක්දැයි තම, තමතමන්ම අසා දැනගත යුතුය. වෙළෙන්දන්ගේ අරමුණ සහ අභිප්‍රාය ලාභ ලැබීමය. මේ ලාභාපේක්ෂිත පාරේ ගමන් කරන විට ආචාර ධර්ම ආදිය සුළුවෙන් නොසලකා හරිමින් පටන් ගත් ගමන කෙටි කලකින්ම අධි වේගයකට හැරෙයි. සිංහල-දෙමළ අවුරුද්ද යනු නැවත කිසි දින උදා නොවන උත්සවයක් ද නොවේ. චිරාත් කාලයක් මුළුල්ලේ ජයටම අවුරුදු කෑ ලාංකිකයාට මේ වසරේ ඉවසීම ප්‍රගුණ කිරීම අපහසු වී ඇත්තේ මන්ද? ආගමික ශික්ෂණයකින් යුක්ත රටක්යැයි අප පාරම්බෑව ද සැබෑවටම ඒ ශික්ෂණය ක්‍රියාවට නැංවෙන විට අප තවමත් සිටින්නේ ප්‍රාග් ඓතිහාසික යුගයකයැයි සිතේ.

සිංහල-දෙමළ අවුරුද්ද සැමරීමට අත්‍යවශ්‍ය නම් කළ හැකි ආරක්ෂිත උපක්‍රම බොහොමයකි. ඔන්ලයින් සාප්පු සවාරිය ඉන් එකකි. අගනුවර මෙන්ම අගනුවරින් බැහැර බොහෝ ඇඳුම් වෙළෙඳ සල් අති බහුතරයටම ඔන්ලයින් ස්ටෝරු ඇත. ඔන්ලයින් මිල දී ගැනීම් කරන විට වැඩි වට්ටම් ද ලැබේ. භාණ්ඩ හා සේවා නිවෙසටම ගෙනැත් දීමේ සේවා ද ඔවුන් සතුය. බොහෝ ස්ටෝරුවල ඇඳුම් ආයිත්තම් සහ සෙසු භාණ්ඩවල ත්‍රීඩී අනු රූ දක්නට නොලැබුණත් සෑහීමට පත් විය හැකි වර්ගයේ ද්විමාන අනු රූ දක්නට ඇත. බොහෝ සන්නාම වෙනුවෙන් තනන ඇඳුම් ගැන පූර්ව අවබෝධයක් ඇත්නම් මේ ද්විමාන අනුරුව මිල දී ගැනීමට සෑහේ. එහෙත් මේ සියල්ලට පයින් ගසා වෙළෙඳ සලටම ගොස් ඇඳුම් ආයිත්තම් ස්පර්ශ කර බලා, වෙනත් ඒවා සමඟ සසඳා, ඇඟලා බැලීමෙන් පසු මිලදී ගැනීමට බහුතරයක් ආශා කරන සැටියකි. මේ සුළු ආශාව වෙනුවෙන් ඔවුන් ලංසු තබන්නේ තමන්ගේ ජීවිතය වීම කනගාටුදායකය.

වැලඳුණොත් සුව වීමේ ප්‍රතිශතයක් සේම මරණයට පත්වීමේ ද සම්භාවිතාවක් ඇති කොවිඩ් වසංගතය සමඟ කෙරෙන මේ මරණීය සෙල්ලම කළ යුත්තක්ද?

තවත් පෞද්ගලික රෝහලකදී කෙරුණු කතාබහකදී අසන්නට ලැබුණේ ඔවුන් අවුරුදු උත්සවයක් සංවිධානය කරන බවකි. අයකුගේ ප්‍රශ්නය වූයේ ඒ පවත්වන්නේ ඔන්ලයින් ආකාරයෙන් ද කියාය. ලැබුණු පිළිතුර පුදුම එළවන සුළුය. "දැන් කොරෝනා නෑ නෙ." ඒ පිළිතුර සමඟ මද දුරක් ගිය හොත් දැන් කොරෝනා නැතැයි මේ පුද්ගලයා පවසන විටත් රෝහලට ඇතුළු කරගන්නා සියලු රෝගීන්ට පීසීආර් පරීක්ෂණයක් හෝ ඇන්ටිජන් පරීක්ෂාවක් කෙරේ. කොරෝනා නැතැයි මහත් විශ්වාසයෙන් ඒ පුද්ගලයා පවසන විටම ඊට ප්‍රතිවිරුද්ධ යමක් රෝහලෙන් සිදු වේ. මිනිස් මනස මේ ආකාරයට රැවටීමේ සමත්කම ස්වයංව ලබා දෙමින් අප විසින් අපව රවටා ගැනීම කෙතරම් අඥානද?

එතැනින් තවත් ඔබ්බට ගියහොත් මේ ස්පර්ශය මත පදනම් වූ වැඩකිරීමේ පිළිවෙත නූතනයට කෙතරම් ගැළපේ ද? කන්තෝරු බහුතරයක මිනිස් ශ්‍රමයෙන් වැඩ කිරීම මිස යන්ත්‍ර භාවිතයෙන් සේවා සැපයීමට හුරු කිරීම අතිශය අපහසුය. කොටින්ම පරිගණකයෙන් ලියූ දෑ යළිත් මුද්‍රිතව ලබා ගෙන පිරික්සා, කොළ මත හරි වැරැදි ලකුණු කර යළිත් පරිගණකයට එම හරි වැරැදි කැවීමේ විකාර ක්‍රියා පිළිවෙතට පවා සේවකයන් පුරුදුව ඇත. මේ පසුගාමී ජීවන ලක්ෂණය ආයතනගත වූ විට සමස්තයටම අත්වන්නේ අවැඩකි.

වසරක කොවිඩ් පරිසරයෙන් අපට උගැනීමට බැරි වූ දේ කොපමණ ද? අතත්‍ය අවකාශයක වැඩ කිරීම ඉන් ප්‍රධානය. ඒත් සාම්ප්‍රදායික ආයතනගත සේවකයන්ගෙන් කුමන ප්‍රතිශතයක් ඊට හැඩගැසීද? ඔන්ලයින් වැඩ කිරීමේ ක්‍රියාවලියට කිසිසේත්ම දායක නොවූ පිරිස කෙතරම්ද? කොළ පුරවමින්, කොළ ඔසවාගෙන තව දුරටත් යන්න තැත් කරන ගමන කොතරම් පසුගාමී ද? දත්ත පද්ධති සකසා ඒවාට දත්ත කවා ඕනෑම තැනක සිට වැඩ කිරීමේ පහසු පිළිවෙතට අනුගත නොවන්නෝ වඳ වී යන්නෝ යැයි පැවසුවොත් අවි අමෝරාගෙන එන්නෝ කොපමණද? අන් පිළිසරණක් නොමැති විට පමණක් ඔන්ලයින් වැඩ කිරීමට එකඟ වූවෝ ඒ පිළිවෙත් ලිහිල් කළ සැණින් සියල්ල අමතක කර දමා පැරැණි පුරුදු කාලය අනුභව කරන ගොළුබෙලි ගමනට පිවිසීම කෙතරම් කනගාටුදායක ද? පරිගණකයෙන් වැඩ කිරීම ප්‍රතික්ෂේප කර, නැවත ගල් යුගයට යෑමට තැත් කරන කාර්යාල සේවකයන් සමඟ කුමන ඉදිරි ගමනක් ද? කොවිඩ් වසංගතය විසින් විවර කළ ඒ පහසු මාර්ගයේ නොයා අවදානම් සහගත පැරැණි මාර්ගයේ යෑමෙන් ඔවුන් අත්පත් කරගන්නට තැත් කරන්නේ වැඩ පහසුවෙන් කිරීමේ ක්‍රමයට වඩා අමාරුවෙන් වැඩ කිරීමෙන් ස්වයං ප්‍රමෝදයක් ලැබීමට විය හැකිය. ඔන්ලයින් ඇඳුම්, ආයිත්තම් සේම සකලවිධ දේම මිලදී ගැනීමට හැකිව තිබියදී මෙලෙස රැස්කමින්, පොදි ගැහෙමින් වධ විඳින්නේ වේදනාවේ අප නොදන්නා සෞන්දර්යයක් ද? අවදානමේ අපේ ඇස නොගැසී ප්‍රදේශයක් ද? එසේත් නැත්නම් මිනිසුන් තවම ඔන්ලයින් වෙළෙඳාම විශ්වාස නොකරන නිසා ද? ස්පර්ශය කෙරෙහි ඇති ලොල් බව නිසා ද? මේ ලෝලත්වය ඔබව සතුටු උයනකට ගොස් අත නොහරින බව හොඳාකාරවම දැන, දැන ඒ කරා ඇලීම එක්තරා පුදුමයකි.

ඒ අතරම ඔන්ලයින් වෙළෙඳාම කෙරෙහි මහජනතාව කෙරෙහි ඇති බිය සහ සැකසංකා සහිත බවද මෙයට තවත් එක් හේතුවකි. ඔන්ලයින් ගත වංචා ද බොහොමයකි. ඇණවුම් කරන භාණ්ඩය වෙනුවට කිසිසේත් අදාළ නැති වෙනත් භාණ්ඩයක් ලැබීමේ අවදානමක් නැත්තේ නොවේ. විශේෂයෙන්ම මෑතකාලීනව බිහිවූ අතොරක් ඔන්ලයින් ස්ටෝරු හිමිකරුවන් වෙත ලැබෙන අපවාද බොහොමයකි. අසාධාරණ මිලට භාණ්ඩ හා සේවා සැපයීම ඉන් එකකි. පසුගිය කොවිඩ් කාලවකවානුව තුළ එවන් පැමිණිලි රාශියක් ලැබී තිබුණි. බොහෝ විට මේ පැමිණිලි සහ අසාධාරණකම් බහුතරයකින් මිල දී ගන්නාට සහනයක් හෝ සාධාරණයක් ඉටු වූ අවස්ථා අල්පය. මෙවන් ක්‍රියා හේතුවෙන් මිනිසුන් ඔන්ලයින් මිල දී ගැනීම් සඳහා යොමු වීමට පසුබට වනවා විය යුතුය. එහෙත් විය හැකි අකටයුත්තක් වෙනුවෙන් අඩියක් පස්සට ගැනීම මෙවන් කාලයක එතරම් නුවණක්කාර නොවේ. කොවිඩ් රැලි කිහිපයකින් පසුව සාමාන්‍ය තත්ත්වයට පත් වන්නට උත්සාහ කරන රටකට එය කිසිසේත්ම යහපත් තත්ත්වයක් නොවේ. අනෙකකු අවබෝධය ලබා දෙන තෙක් නොසිට තනි තනියෙන් ගත යුතු මේ තීරණය ගැනීමට තවමත් ප්‍රමාද නැත.

**කාංචනා අම්ලානි**



LAKE HOUSE
දැයේ දූ පුතුනට පත්තර මහගෙදරින්
අධ්‍යාපනික
ප්‍රකාශන රැසක්
1 මුතු අහුර ශ්‍රේණිය දරුවන් සඳහා
2 මුතු අහුර ශ්‍රේණිය දරුවන් සඳහා
3 මුතු අහුර ශ්‍රේණිය දරුවන් සඳහා
4 මුතු අහුර ශ්‍රේණිය දරුවන් සඳහා
5 මුතු අහුර ශ්‍රේණිය දරුවන් සඳහා
Grade 1 English Muthu Ahura
Grade 2 English Muthu Ahura
Grade 3 English Muthu Ahura
Grade 4 English Muthu Ahura
Grade 5 English Muthu Ahura
6 ශ්‍රේණිය 6 සිත්මිණ
7 ශ්‍රේණිය 7 සිත්මිණ
8 ශ්‍රේණිය 8 සිත්මිණ
9 ශ්‍රේණිය 9 සිත්මිණ
10 ශ්‍රේණිය 10 සිත්මිණ
11 ශ්‍රේණිය 11 සා/පෙළ සිත්මිණ
මිහිර
බුදුසරණ දහම් පාසල
குட்டி சுட்டி
முன்பள்ளி சிறுவர், சிறுமியருக்கானது
අතුරු මිතුරු
Athuru Mithuru
විදුනැණ
විශේෂිත වර්ණවත් මුද්‍රණය
පාසල් විෂය නිර්දේශය මුළුමනින්ම ආවරණය කෙරෙන
ප්‍රවීණ ලේඛක මණ්ඩලයකින් සම්පාදිතය
රජයේ මාධ්‍ය ආයතනයකින් නිකුත් කරන එකම අධ්‍යාපනික ප්‍රකාශන



# පාස්කු දා ප්‍රහාරය වැළැක්වීමට කටයුතු නොකළ එදා ආණ්ඩුවේ පිරිස් නඩු ප්‍රමාදය ගැන කියන කතා විහිළුවක්

## ● ඇමැති චමල් රාජපක්ෂ

**පහන් විජේසේකර**

පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකළ එදා ආණ්ඩු පක්ෂයේ සිටි පිරිස් අද නඩු පැවරීමේ ප්‍රමාදයක් ගැන කතා කිරීම විහිළුවක් යැයි වාරිමාර්ග කැබිනට් ඇමැති හා ජාතික ආරක්ෂාව, ආපදා කළමනාකරණ හා අභ්‍යන්තර කටයුතු රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතා පැවැසීය.

චමල් රාජපක්ෂ මහතා මේ බව පැවසුවේ පාස්කු කොමිෂන් සභා වාර්තාවේ ඉදිරි කටයුතු පිළිබඳ දැනුම්වත් කිරීමේ විශේෂ මාධ්‍ය සාකච්ඡාවකට ඊයේ (6) සහභාගි වෙමිනි.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ හෙතෙම මෙසේ ද කීය.

පසුගිය ආණ්ඩුවේ අමාත්‍යවරයකු ලෙස කටයුතු කළ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා මේ අන්තවාදී සංවිධාන ගැන පාර්ලිමේන්තුවේදී දීර්ඝ ප්‍රකාශයක් සිදු කළා. ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් පැවැති රජය නිසි පරිදි ක්‍රියාමාර්ග ගත්තාද? වගකිවයුතු පාර්ශ්වයන් ඒ පිළිබඳව මගහැරීමක් සිදු කළාද? එදා විජයදාස රාජපක්ෂ කරපු ප්‍රකාශය ගැන සැලකිල්ලක් දැක්වූයේ නැහැ. විපක්ෂය එදා ආණ්ඩු පක්ෂයේ සිටි කාලයේදී මේකට සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි. සාමූහිකව වගකියන ඇමැති මණ්ඩලයක එක් ඇමැතිවරයෙක් මේ ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළ පසු අනිත් සියලු ඇමැතිවරු ඔහුගේ ප්‍රකාශය පිළිබඳ දැඩි අවධානයක් යොමු කර නීතිමය අංශ මෙහෙයවන්න තිබුණා. ඒ වගකීම පැහැර හැරල තියෙනවා. ඒ නිසා තමයි අතිවිශාල විනාශයක් වුණේ. මොහොමඩ් ඉබ්‍රහිම්ට මුදල් ඉපැයීමට ආධාර අනුබල දුන්නේ කවුද? ඒ මුදල් කොහොමද බෙදිලා ගියේ. ඒ අරමුදල් දේශපාලන පක්ෂවලට දීලා තියෙනවා. එවැනි පුද්ගලයෙක් 2015 මැතිවරණය සඳහා ජාතික ලැයිස්තුවෙන් නම් කරනවා නම් ඔහු පිළිබඳ ඉතා දැඩි විශ්වාසයක් තියෙන්න ඕනේ. ඔහුගේ දරුවන් හා පවුලේ අය මේවාට සම්බන්ධ වෙලා තියෙනවා නම් පොඩි හෝ ආරංචියක් ඒ පක්ෂවලටත් තියෙන්න ඕනේ. ඔවුන්ගේ පාලනයෙන් එහා ගිහිල්ලා නම් ඔවුන්ගේ වගකීම තමයි අපරාධ විමර්ශන ඒකකවලට දැනුම් දීම. ඔවුන් ගැන තොරතුරු සඟවා සිටීමත් ලොකු වරදක්. ඒ ගැන සොයන්න කියලා අපිට නිර්දේශ කරන්න සිද්ධ වෙනවා.

ඒ වගේම අපරාධ විමර්ශන අංශයේ දැනට ඉන්න නිලධාරීන් විශාල ප්‍රමාණයක් අලුත් නිලධාරීන්. සී. අයි. ඩී.ය බොහෝම දක්ෂ කීර්තිමත් නිලධාරීන් සේවය කරපු තැනක්. දැන් ඒ අය විශ්‍රාම ගිහින් සිටින්නේ. රට වෙනුවෙන් ඔවුන්ගේ දැනුම, පළපුරුද්ද විදෙස් බුද්ධි අංශ සමග තිබූ සම්බන්ධකම් පිළිබඳව දැන් සිටින නිලධාරීන්ට හඳුන්වා දීමට අපි යෝජනා කරනවා. අප්‍රේල් 21 දා සිද්ධියෙන් පසුව පොලිසිය මොකක්ද කළේ? මේ සිද්ධිය කාගේ අතපසුවීමකින් ද වුණේ? ඇයි ආරක්ෂාව සංවිධානය නොවුණේ? අනාගතයේදී මෙවැනි සිද්ධීන් යළි සිදු නොවීමටත්, ඒ සඳහා ආරක්ෂක අංශවලට දිය යුතු පුහුණුව දීමට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. අනිත් පැත්තෙන් නීතිපති දෙපාර්තමේන්තුව හැකි ඉක්මනින් ඒ



## නඩු දැමීම ප්‍රමාද කළේ ජනාධිපති කොමිසමේ වාර්තාව එන කල්

### ● ඇමැති, ආචාර්ය සරත් වීරසේකර



## පාස්කු දා ප්‍රහාරය දැවැන්ත දේශපාලනීකරණයට ලක් වෙලා

### ● ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල

## ත්‍රස්තවාදීන්ට එරෙහිව නවීන තාක්ෂණය යොදා ගන්නැයි අමාත්‍ය මණ්ඩල අනුකමිටුව යෝජනා කර තිබෙනවා

### ● ඇමැති ප්‍රසන්න රණතුංග මහතා



අවශ්‍ය සාක්ෂි හා පොලිසිය සිදු කරපු විමර්ශන වාර්තා කඩිනම් කරගෙන ජනතාව අපේක්ෂා කරපු අවශ්‍ය නීතිමය කටයුත්ත සිදු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**මහජන ආරක්ෂාව පිළිබඳ ඇමැති රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර මහතා-** පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කමිටු විශාල ප්‍රමාණයක් තිබුණා. බෝම්බ ප්‍රහාර 8 සම්බන්ධයෙන් උද්ධෘත ගොනු 8ක් (විමර්ශන හා සාක්ෂි අඩංගු) දැනටමත් නීතිපතිවරයාට ඉදිරිපත් කර තියෙනවා. එහි 32ට විරුද්ධව මනුෂ්‍ය ඝාතන හා සාමයට විරුද්ධව කුමන්ත්‍රණය කිරීම සඳහා වූ සාක්ෂි ගොනු ඉදිරිපත් කර තියෙනවා. නීතිපතිවරයා ඔවුන්ට විරුද්ධව නඩු දැමීම කල් දැම්මේ ජනාධිපති කොමිසමේ වාර්තාව එනකල්. දැන් නීතිපතිවරයා නීතිඥවරු 12 සමන්විත කණ්ඩායමක් යොදවා සාක්ෂිවල පරස්පරතාවන් විමර්ශනය කරනවා. ඉදිරියේදී නීතිපති විසින් අවශ්‍ය පුද්ගලයින්ට එරෙහිව නඩු පවරන්නට කටයුතු කරයි.

එතකොට මේ සිද්ධියට සෘජුව සම්බන්ධ වූ සැකකරුවන් 32කට විරුද්ධව නඩු පවරන්න අවශ්‍ය සාක්ෂි පොලිසිය විසින් ඉදිරිපත් කරල තියෙනවා. නමුත් විමර්ශන තවත් ඉදිරියට කරගෙන යනවා. පෙරේදාත් දෙදෙනෙක් අත්අඩංගුවට ගත්තා. අයි.එස්. පන්ති පවත්වපු හා ඊට මුදල් යොදවපු අය ගැන විමර්ශන කරගෙන යන නිසා අද වන විට 75 දෙනෙක් රැඳවුම් නියෝග මත තබාගෙන සිටිනවා. 211ක් රිමාන්ඩ් භාරයේ ඉන්නවා. 75 දෙනා සම්බන්ධ විමර්ශන කටයුතු අවසන් වනවාත් සමග ඒ අයටත් නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කරනවා.

නීතිපතිවරයා මත තමයි සම්පූර්ණ වගකීම තියෙන්නේ. ජනාධිපති කොමිසමේ සාක්ෂි සහ පොලිසිය විසින් ඉදිරිපත් කරපු සාක්ෂි, උද්ධෘත ගොනු හොඳට පරීක්ෂා කරල අවශ්‍ය පුද්ගලයින්ට නඩු පවරන්න පුළුවන්.

සාරා ජස්මින් තැනැත්තිය මැරුණ ද නැද්ද කියලා අපිට තවම කියන්න බැහැ. මොකද පලවෙනි DNA ප්‍රතිඵලවලින් ඒක සනාථ වුණේ නැහැ. සාරාගේ මවගේ DNA සමග සැසඳුණේ නැහැ. ශරීර කොටස් විශාල ප්‍රමාණයක් තියෙනවා. සාරා මැරිලා නැත්නම් ඉන්ටර්පෝල් එක හරහා රතු නිවේදන නිකුත් කරනවා. නැවත වතාවක් DNA පරීක්ෂණවලින් සනාථ කරගන්න උත්සාහ කරනවා.

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේදී නීතිපතිවරයා බලන්නේ හොඳම විදියට නීතියේ හිඩැස් ඇති නොවන අයුරින් නඩු පැවරීමට කටයුතු කරන්නයි. සමස්ත ජනතාව බලාගෙන ඉන්නේත් ඒ ගැන. සහරාන්ට පඩි ගෙවපු කතාව සම්පූර්ණ සාවද්‍ය ප්‍රකාශයක්. කාටහරි ඒ ගැන සාක්ෂියක් තියෙනවා නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙන්න. සහරාන්ට විතරක් නෙමෙයි කාටවත් රජයේ වේතනයක් දීලා නැති බව ඉතාම වගකීමෙන් කියනවා.

**ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා-** පාස්කු ප්‍රහාරය සම්බන්ධව දැවැන්ත දේශපාලනීකරණයක් වෙමින් පවතිනවා. විශේෂයෙන්ම මෙතෙක් ගත්ත ක්‍රියාමාර්ග ගැන සෑහීමකට පත් නොවන බව කියනවා. දේශපාලන නාටකයක් බවට පත් කිරීමේත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. පාස්කු ප්‍රහාරයේ හංගන්න කිසිම දෙයක් අපට නැහැ. අපිට එහෙම කිසිම අවශ්‍යතාවයක් නැහැ. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වූ අයට නීතිය ක්‍රියාත්මක කිරීමටයි අපට අවශ්‍ය වන්නේ. මෙවැනි දෙයක් නැවත සිදු නොවීමේ වගකීම පවතින රජයක් හැටියට අපට තිබෙනවා.

අපේ කවුරුහරි කෙනෙක් වරදක් කරල තියෙනවා නම් දඬුවම් දෙන්න ඕනේ. රජයකට කියන්න බැහැ අරයට නඩු දාන්න, මෙයාට නඩු දාන්න කියලා. පසුගිය යහපාලන යුගයේදී අරලියගහ මන්දිරයේදී තීන්දු කළා කාටද නඩු දාන්නේ කියලා. ඒ ක්‍රමය වෙනස් කරන්න තමයි හැටනව ලක්ෂයක් මේ ආණ්ඩුවට ඡන්දය දුන්නේ. ඒ නිසා මෙවැනි කරුණකට අපි කිසිම විදියකට සම්බන්ධ වෙන්නෙත් නැහැ. ඒ සම්බන්ධයෙන් අපේ දායකත්වයක් දක්වන්නේ නැහැ. කොමිෂන් සභා වාර්තාවේ යම් නිර්දේශ ඇතුළත් වෙනවා නම් ඒවා ක්‍රියාත්මක කිරීමට අයිතිය තිබෙන්නේ නීතිපතිවරයාට. ඒ සම්බන්ධව අපේ කිසිදු අකුල් හෙළීමක් නැහැ.

**සංචාරක කටයුතු ඇමැති ප්‍රසන්න රණතුංග මහතා -**

ත්‍රස්තවාදීන්ට එරෙහිව නවීන තාක්ෂණය යොදා ගන්න කියා මේ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවෙන් යෝජනා කර තියෙනවා. ඒ අනුව ඊට අදාළ අණපනත් සකස් කර පාර්ලිමේන්තුවට භාරදෙන්න කියා ආරක්ෂක අමාත්‍යාංශයට යෝජනා කළා.

# ශ්‍රී ලංකාව - නේපාලය අතර වෙළෙඳ සහයෝගිතාව තර වෙයි

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාව සහ නේපාලය අතර වෙළෙඳ හා ව්‍යාපාරික සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා දෙරටේ රජයන් පියවර ගෙන තිබේ.

මේ පිළිබඳ වෙබිනාර් සාකච්ඡාවක් පවත්වා තිබෙන අතර නේපාලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා ලංකා වානිජ්‍ය මණ්ඩලය එක්ව මෙම සාකච්ඡාව සංවිධාන කර තිබෙන බවද ව්‍යාපාරික විශ්වාසය ඉහළ නැංවීම සහ පෞද්ගලික අංශයේ සහයෝගීතාව සඳහා පවතින අවස්ථා හඳුනා ගැනීම මෙම වෙබිනාර් සාකච්ඡාවේ අරමුණ වී තිබෙන බවද විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

මෙම වෙබිනාර් සාකච්ඡාවේ දී අදහස් දැක්වූ නේපාලයේ ශ්‍රී ලංකා තානාපති හිමාලි අරුණතිලක මහත්මිය සඳහන් කර තිබෙන්නේ නේපාලයේ සිට ශ්‍රී ලංකාවට අපනයන කළ හැකි වෙළෙඳ භාණ්ඩ පිළිබඳ ඉතා අඩු අවධානයක් පවතින බවයි. දෙරටේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස සංචාරක ව්‍යාපාරය දියුණු කළහැකි බව ද මෙහිදී සාකච්ඡා කෙරෙණි.

පංචකන්යා සමූහයේ කළමනාකාර අධ්‍යක්ෂ සහ නේපාල වාණිජ හා කර්මාන්ත සම්මේලනයේ (FNCCI) හිටපු සභාපති ප්‍රදීප් කුමාර් ශ්‍රෙෂ්තා මහතා සහ සමුන්ද්‍ර සමූහයේ සභාපති හා නේපාල ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ලේකම් රාම් රාජා ආචාර්යා මහතා නේපාලයේ සම්පත්දායකයන් ලෙස සහභාගී වී තිබේ. ඔවුහු නේපාල ආර්ථිකය, ආයෝජන වාතාවරණය සහ අවස්ථාවන් මෙන්ම සංවර්ධනය කළහැකි වෙළෙඳ භාණ්ඩ පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබාදී තිබෙන අතර, ශ්‍රී ලංකාවේ සිට, අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්මික නිෂ්පාදන පිළිබඳ වැඩබලන අධ්‍යක්ෂ හර්ෂ පත්බේරිය මහතා ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කළ අපනයන නිෂ්පාදන පිළිබඳ සහ නිෂ්පාදන හා අපනයන සේවා සඳහා දිවයිනේ පවතින උපායමාර්ගික වාසි පිළිබඳ කරුණු දක්වා තිබේ.

ජල විදුලිය, කෘෂිකර්මය හා කෘෂි නිෂ්පාදන, සංචාරක කටයුතු, ඉදිකිරීම්, පතල් හා ඛනිජ ද්‍රව්‍ය, මූල්‍ය සේවා, සෞඛ්‍ය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල සහයෝගීතාවය සඳහා අවස්ථා පවතින බව මෙහි දී අවධාරණය කර තිබෙන අතර ද්විපාර්ශ්වික වෙළෙඳාම සඳහා වන ප්‍රවාහන අභියෝග සහ සෘජු ගුවන් සම්බන්ධතාවක් තිබීමේ යෝග්‍යතාව හඳුනා ගන්නා අතරම, නිෂ්පාදන රාශියක වෙළෙඳාම සම්බන්ධ අපේක්ෂාවන් පිළිබඳ ද සාකච්ඡා කර ඇත.

ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ 50කට අධික පිරිසක් මෙම වෙබිනාර් සාකච්ඡාවට සහභාගී වූ අතර, ඔවුන්ගේ විමසීම් ඉදිරිපත් කරමින් සාකච්ඡාවේ දී ක්‍රියාකාරීව නිරත වූහ. පසු විපරමක් ලෙස අන්තර් ව්‍යාපාර රැස්වීම් සඳහා පහසුකම් සැලසීම පිණිස තානාපති කාර්යාලය ලංකා වාණිජ මණ්ඩලය සමග සම්බන්ධීකරණය කර තිබෙන අතර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා නේපාලයේ ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ක්‍රියාකාරී සහයෝගය ඇතිව ලංකා වාණිජ මණ්ඩලයේ මූලිකත්වයෙන් මෙම වෙබිනාර් සාකච්ඡාව සංවිධාන කර තිබේ.

# 'හුස්ම දෙන තුරු' වැඩසටහනින් ඉකුත් මාස 4ට පැළ 107,000ක් සිටුවූවා

## ● ඇමැති මහින්ද අමරවීර



**බුද්ධිකා ඉඹුලාන**

තම සංකල්පය මත ආරම්භ කළ 'හුස්ම දෙන තුරු' රුක්රෝපණ වැඩ සටහන යටතේ පසුගිය මාස 4ට පැළ 107,000ක් රට පුරා රෝපණය කළ බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවසීය.

මෙම ජාතික රුක් රෝපණ වැඩ සටහන මේ වන විට අතිශය ජනප්‍රියව ඇති බවත්, බොහෝ පාර්ශ්ව මෙම රුක් රෝපණ වැඩපිළිවෙළ අගයමින් එම වැඩපිළිවෙළ අනුගමනය කර වැඩ සටහන් ආරම්භ කර ඇතැයිද අමරවීර මහතා කීවේය.

ඇමැති මහින්ද අමරවීර මහතා මෙම අදහස් පළ කළේ අගුණකොළපැලැස්ස ප්‍රදේශයේ පැවැති රුක්රෝපණ වැඩ සටහනකට සහභාගී වෙමිනි. ඇමැතිවරයා එම ප්‍රදේශයේ ජනතාවට පැළ බෙදාදීම ද සිදු කළේය

එහිදී වැඩි දුරටත් අදහස් පළ කළ ඇමැතිවරයා මෙසේ ද කීය- මා පරිසර ඇමැතිවරයා වශයෙන් වැඩ කටයුතු ආරම්භ කළාට පසුව 'හරිත හෙටක්' නමින් විසි වැදෑරුම් පාරිසරික වැඩපිළිවෙළක් හඳුන්වා දුන්නා. එහි ප්‍රධාන රුක්රෝපණ වැඩපිළිවෙළ තමයි 'හුස්ම දෙන තුරු' ජාතික රුක්රෝපණ වැඩ සටහන. මේ යටතේ ඉදිරි වසර හතර තුළ පැළ මිලියන දෙකක් අප රෝපණය කරන්න ඉලක්ක කර තිබෙනවා.

ගත වූ මාස හතරක කාලය තුළ අප පැළ 107,000ක් රෝපණය කර තිබෙනවා. මේ සඳහා රජයේ මුදල් රුපියලක්වත් වැය කළේ නැහැ. සියලුම මුදල් අපට ලබා දුන්නේ මේ රටේ පුද්ගලික අංශයයි. අප මෙම වැඩසටහන පටන් ගන්නා විට කිසිම කෙනෙකුගෙන් සහයෝගයක් ලැබුණේ නැහැ. සමහරු මග හැරියා. නමුත් 'හුස්ම දෙන තුරු' යන හිතට වදින නමත් එක්ක අප මේ කටයුතු ආරම්භ කළාට පසුව විශාල පිරිසක් අපට සහයෝගය පළ කළා. ඒ නිසා ඉදිරි වසර හතර තුළත් අප රජයේ මුදල් වැය කිරීමකින් තොරව මෙම කටයුතු සිදු කරනවා.

අපේ 'හුස්ම දෙන තුරු' දැන් බොහෝ දෙනෙක් අනුගමනය කරනවා. ඒ අයත් 'හුස්ම' කියන නම ඇදාගෙන වැඩ සටහන් ආරම්භ කර තිබෙනවා. ගසක් කියන්නේ අපූරු ජීවියෙක්. අප මිනිස්සු වශයෙන් මහපොළවට දමන කැළිකසළ පොහොර කර ගෙන මිහි මව අපට ගස් ලබා දෙනවා. ඒවායේ මිහිරි පලතුරු විතරක් නොවෙයි අපට ආශ්වාස කරන්න අවශ්‍ය පිරිසුදු ඔක්සිජන් වාතය අපට ලබා දෙනවා. ඒ නිසා තමයි, අප මේ වැඩ සටහන 'හුස්ම දෙන තුරු' යනුවෙන් නම් කළේ.

මිනිසකුට ජීවත්වන්න දවසකට ඔක්සිජන් ලීටර් 550ක් අවශ්‍ය වනවා. බර වශයෙන් ගත්තොත් කිලෝග්‍රෑම් 2.5ක් පමණ වනවා. එක් අයකුට මේ හුස්ම දෙන්න, අඩු තරමින් ගස් 10ක්වත් ඔක්සිජන් නිෂ්පාදනය කළයුතුයි. දිනකට ගස් 10ක් නිපදවන ඔක්සිජන්වලින් ජීවත් වන සමහර මිනිස්සු අඩුම තරමින් තමන්ගේ ජීවිත කාලයටම එක් ගහක්වත් රෝපණය කරන්නේ නැහැ.

අපේ අතීත මුතුන් මිත්තන් මෙම කාරණය දැනගෙන සිටි නිසා තමයි වෘක්ෂ වන්දනාව කළේ.

අපට හුස්ම දෙන ගස් කපා දමමින් මිනිස්සු සල්ලි පස්සේ දුවනවා. "රතු ඉන්දියානු නායක සියැටල් කියා තිබෙන්නේ මිනිසා අවසාන ගසත් කපා දමා, අවසාන මාලුවාත් ආහාරයට ගෙන අවසන් ජල බිඳුවත් පානය කළාට පසුව සල්ලි ආහාරයට ගත නොහැකි බව තේරුම් ගන්නවා ඇත" කියලා.

කවුරු හරි වනවිනාශය සිදු කරනවා නම් ඔහු මිනීමරුවෙක් හා සමානයි. ඒ නිසා අප නව ජාතික පාරිසරික පනත යටතේ පරිසරය වනසන්නට දෙන දඬුවම් දෙගුන කරනවා. ඒ වගේම දඩ මුදල දැන් තිබෙන ප්‍රමාණවලට වඩා දහගුණයකින් ඉහළ දමනවා. ඒ වගේම පරිසර සුරකින පිරිස් ඇගයීමට ලක් කරනවා. ඔවුන්ට ජාතියේ ප්‍රණාමය පිදීමට සම්මාන ප්‍රදානෝත්සවයක් පවත්වන්න කටයුතු කරනවා.

# ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් පුවත්පත් කලාවේදී පඩිපාලක සභාවට ඇතුළත් කළ යුතුයි

## ● කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා

**අනුර ප්‍රේමලාල්**

මෙරට ජනමාධ්‍ය, ක්ෂේත්‍රයේ විශාල කාර්යභාරයක් ඉටු කරන ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් ද පුවත්පත් කලාවේදී පඩිපාලක සභාවට ඇතුළත් කළ යුතු බවට කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා යෝජනා කරයි. එසේම පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවට මෙතෙක් ඇතුළත් වී ඇත්තේ මුද්‍රිත මාධ්‍යට අයත් ජනමාධ්‍යවේදීන් පමණක් බැවින් රූපවාහිනී ගුවන් විදුලිය හා වෙබ් මාධ්‍යවේදීන් ද මීට ඇතුළත් වන ලෙසට පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභා ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ඇමැතිවරයා කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාට දැනුම් දුන්නේය.



ඇමැතිවරයා මේ බව කියා සිටියේ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජිත පිරිසක් සමග පසුගියදා අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදීය. මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය සම්මේලනයේ ප්‍රධාන ලේකම් ධර්මසිරි ලංකාපේලි මහතා ප්‍රමුඛ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය කරමින් ප්‍රාදේශීය මාධ්‍යවේදී නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් මෙම සාකච්ඡාව පැවැත්විණි.

මෙහිදී ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ඉල්ලා ඇමැතිවරයාගෙන් ඉල්ලා සිටියේ තමන්ට කිසියම් ආකාරයක වෘත්තීය තත්ත්වයක් ලබාදීම සඳහා රජයට මැදිහත් වන ලෙසත්, එසේම තමන්ගේ වෘත්තීය හා අනාගත ආර්ථික සුරක්ෂිතතාවය වෙනුවෙන් කිසියම් ආකාරයක සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් ඇරඹීම සඳහා රජයට මැදිහත් වන ලෙසයි.

තවදුරටත් මෙහි දී කරුණු පැහැදිලි කළ මාධ්‍ය සේවක වෘත්තීය සම්මේලනයේ ප්‍රධාන ලේකම් ධර්මසිරි ලංකාපේලි මහතා කියා සිටියේ, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මෙන්ම ආයතනගත මාණ්ඩලික මාධ්‍යවේදීන්ගේ ද විශේෂයෙන් පෞද්ගලික ජනමාධ්‍ය ආයතනවල සේවය කරන මාධ්‍යවේදීන්ගේ අනාගත සුරක්ෂිතතාවය සඳහා නිශ්චිත සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙලක් නොමැති බැවින් ඒ පිළිබඳවද අවධානය යොමු කරන ලෙසයි.

මෙම අවස්ථාවට කම්කරු අමාත්‍යාංශයේ ලේකම් මාපා පතිරණ මහතා, කම්කරු කොමසාරිස් ජෙනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා, අමාත්‍ය මාධ්‍ය ලේකම් හා පුවත්පත් කලාවේදීන්ගේ පඩි පාලක සභාවේ නියෝජිත උපුල් ජනක ජයසිංහ මහතා සමඟ ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වන කරුණාරත්න ගමගේ, ඩග්ලස් නානායක්කාර, පී.සසිකරන්, අසිත වීරවර්ධන, ක්‍රිෂ්නි ඉෆාම් මහත්මිය, සමන් දිසානායක, ඇතුළු ප්‍රාදේශීය මාධ්‍යවේදීහු රැසක්ම එක් වූහ.

# වාන්ඇළ විහාරගල රක්ෂිතයේ ගැටලු සොයා බැලීමට ආණ්ඩුකාරවරිය යයි



**නුවන් හෙට්ටිආරච්චි**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙතෙක් තමන් පදිංචිව සිටි ඉඩම්වලින් බලහත්කාරයෙන් ඉවත් කළ බවට චෝදනා කරමින් මේ දිනවල මහත් ආන්දෝලනයක්ව පවතින කන්තලේ වාන්ඇළ විහාරගල රක්ෂිතයේ ඉඩම් වල සිටි පුද්ගලයන්ගේ ගැටළු සොයා බැලීම සදහා නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය පසුගියදා ඔවුන් දැනට නවාතැන් ගෙන සිටින වාන්ඇළ විහාරගල රජමහා විහාරය වෙත ගියාය.

අනතුරුව ආණ්ඩුකාරවරිය ඔවුන්ගේ ඉඩම් ගැටලු විසඳීම සඳහා අවශ්‍ය මැදිහත්වීම සිදු කරන බවද පැවසුවාය. ඉන් පසුව එම ජනතාව ජීවත්ව සිටි බව පවසන ඉඩමේ නිරීක්ෂණ චාරිකාවකටද එක් වූවාය.

# ආමි සුරංග ඝාතන සිද්ධියට පොලිසියේ 2ක් සැකකරුවන් ලෙස නම් කරයි

**සුභාෂිණී සේනානායක**

"ආමි සුරංග" නැමැත්තාගේ ඝාතන සිද්ධියට අදාළව පොලිස් නිලධාරීන් තිදෙනෙකු සැකකරුවන් ලෙස නම් කරන ලෙස නීතිපතිවරයා විසින් උපදෙස් හා නියෝග ඊයේ 06 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ලබා දී තිබේ. ඒ අනුව පොලිස් පරීක්ෂක ලසන්ත රත්නායක, පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, පොලිස් කොස්තාපල් හේමකුමාර යන නිලධාරීන් "ආමි සුරංග" ඝාතන සිද්ධියේ සැකකරුවන් ලෙස නම් කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනි රජයේ අධි නීතිඥ නිශාරා ජයරත්න මෙනවිය පැවසුවාය.

ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ මූලික පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි අනාවරණය වී ඇති බව ද නීතිපතිවරයා දැනුම් දුන් බවත් එසේ මූලික පරීක්ෂණයක් පැවැත්විය යුත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය යටතේ මිනීමැරීමට හා මිනීමැරීමට උත්සාහ කිරීමේ යන වරද යටතේ බව නීතිඥ නිශාරා ජයරත්න මෙණෙවිය වැඩිදුරටත් පැවසුවාය.

# අලුත් අවුරුද්දට ගම්-බිම් බලා යන්න වැඩි දුම්රිය සහ බස් රථ ප්‍රමාණයක්

**සුභාෂිණී සේනානායක**

සිංහල හා දමිළ අලුත් අවුරුද්ද සඳහා ගම්බිම් බලා යන ජනතාවට අපහසුතාවයකින් තොරව තම ගමන් පහසුකම් සැලසීමට හැකි වන පරිදි වැඩි දුම්රියන් සහ බස් රථ ප්‍රමාණයක් යෙදවීමට ප්‍රවාහන අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ඒ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ 1192ක් අමතර දුම්රිය 21ක් මෙන්ම අමතර දුම්රිය ගමන්වාර 58 ක් සහ අමතර පෞද්ගලික බස් රථ 1800ක් යෙදවීමට පියවර ගෙන ඇති බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා ඊයේ 06 පැවැසීය.

ලබන 09 වනදා සිට 16 දක්වා මෙම විශේෂ බස් රථ සහ දුම්රිය සාමාන්‍ය කාලසටහන් වලට අමතරව යොදා ඇති බවද ඇමැතිවරයා කියා සිටියේය.

ජනතාවට බාධාවකින් තොරව ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා ලංගම බස්රථ සේවකයන්ගේ නිවාඩු ද අවලංගු කිරීමට පියවර ගෙන ඇති බවත් ධාවනය කෙරෙන සියලු බස් රථ ඔවුන්ට අපහසුතාවයක් නොවන පරිදි ධාවනයේ යෙදවීම සිදු කරන ලෙස උපදෙස් දී ඇතැයි ද කියා සිටි ඒ මහතා ලංගම දුම්රිය සහ පෞද්ගලික බස් රථ වලට අදාළ කටයුතු කරන සභාපති වරුන් නිලධාරීන් මෙම වැඩසටහන නියාමනය කිරීම සඳහා කොටුව ප්‍රධාන බස් නැවතුම්පොළ පිහිටුවා ඇති ප්‍රධාන කාර්යාලයේ රැඳී කටයුතු කරන බවදැ කියා සිටියේය.

සාමාන්‍ය අවුරුදු සමයකදී යොදවන බස් රථ වලට වඩා දෙගුණයකින් බස් රථ ප්‍රමාණය මෙවර කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් වැඩි කර ඇති බව මෙම මාධ්‍ය හමුවට එක්ව සිටි ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා කියා සිටි අතර ජනතාව වඩා ප්‍රවේශම්කාරි ආරක්ෂා කාරි අයුරින් තම ගමන් පහසුකම් සලසා ගන්නා ලෙසද මගීන්ගෙන් ඉල්ලා සිටියේය.

පවතින කොවිඩ් තත්ත්වය හමුවේ සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් බස් රථ වලට ගොඩ වන ලෙසත් ආසන ගණනට සේවා සපයා ගන්නා ලෙසත් මගී ජනතාවගෙන් ඉල්ලා සිටි රාජ්‍ය ඇමැතිවරයා නොසැලකිලිමත් ලෙස බස් රථ භාවිතා නොකරන ලෙසත් මගීන්ගේ ජීවිත ආරක්ෂා වෙන අයුරින් රිය පදවන ලෙසත් රියදුරන්ගෙන් ඉල්ලා සිටියේය.

කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් බස් රථ ගාස්තුව වැඩි කළා. බස් රථවල ආසන ගණනටයි මගීන් ගෙන යා යුතු වන්නේ.වැඩිපුර ගෙන යන්න බැහැ. මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙස අප රථවාහන නියෝජ්‍ය පොලිස්පති වරයාට දන්වා තිබෙනවා. මේක දුම්රිය මගීන්ගේ ක් වගකීමක්. ඇතැම් මගීන් පසුපස එන බස් රථ තිබියදී හිටගෙන යන්න නගිනවා. මේ සම්බන්ධයෙන් බස් රථ 150 බලපත්‍ර අත්හිටුවා තිබෙනවා.ජකතාවත් ප්‍රවේසම් කාරී ලෙස තම ගමන්වාරය සලසා ගත යුතුය.උත්සව සමයේ එකම දින සියලුම දෙනා ගමන් කරන්න ගත්තොත් සියලුම බස් දැම්මොත් මදිවේවි යැයි කියා සිටි රාජ්‍ය ඇමැතිවරයා සියලු බස් ඩිපෝ වලට ඇති කාලසටහන පරීක්ෂා කිරීමෙන් අනතුරුව තම ගමන් පහසුකම් ලබා ගන්නා ලෙස ඉල්ලීමක් කළේය. මේ අවස්ථාවට ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති ශෂී වෙල්ගම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති නීතිඥ කිංස්ලි රණවක, වැඩබලන දුම්රිය සාමාන්‍යාධිකාරී ඩබ්ලිව් ඒ ඩී එස් ගුණසිංහ මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් සහභාගී වී සිටියහ.

# ත්‍රිපෝෂ විධිමත්ව ලබා දීමට කෝටි 150ක් වෙන් කරලා

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

මෙරට දරුවන් සඳහා ලබා දෙන පෝෂණ අතිරේකයක් වන ත්‍රිපෝෂ ප්‍රමාණවත්ව සහ විධිමත්ව ලබා දීමට රජය කටයුතු කරන බවත් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා මෙවර අයවැයෙන් රුපියල් මිලියන 1500ක මුදලක් වෙන් කර ඇති බවත් කාන්තා හා ළමා සංවර්ධන, පෙරපාසල් හා ප්‍රාථමික අධ්‍යාපන රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (06) ප්‍රකාශ කෙළේය.

එමෙන්ම මෙම වසරේදී (2021) දී ත්‍රිපෝෂ මෙට්‍රික් ටොන් 31000 ක් නිෂ්පාදනය කිරීම රජයේ ඉලක්කය බවද ඇමැතිවරයා පැවැසීය. විශේෂ ගුණාත්මක බවකින් යුතු බිස්කට් වර්ගයක් ත්‍රිපෝෂ සමාගම මඟින් නිෂ්පාදනය කර පාසල් ළමයන් අතර බෙදා හැරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව ද ඇමැතිවරයා සඳහන් කෙළේය. පාර්ලිමේන්තු මන්ත්‍රී බුද්ධික පතිරණ මහතා කුඩා දරුවන්ගේ පෝෂණ ඌනතාවය දුරු කිරීමට රජය ගෙන ඇති පියවර සම්බන්ධයෙන් යොමුකරන ලද වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් රාජ්‍ය ඇමැතිවරයා මේ බව සඳහන් කෙළේය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේ , දරුවන් පාසල් නොඑන ප්‍රධාන ගැටළු 02ක් පවතින බවත් ඇතැම් මව්පියන්ට උදෑසන ආහාරය ලබා දීමට නොහැකි වීම සහ ගැහැණු දරුවන්ගේ සනීපාරක්ෂක ගැටළු ඊට තවත් හේතුවක් වී ඇති බවයි.

# රුක්රෝපණ නැකතට සිටුවීමට පරිසර ඇමැති අතින් පැළ ලබා දීම අද ලේක්හවුස් හි දී

**බුද්ධිකා ඉඹුලාන**

අප්‍රේල් මස 16 දින පෙරවරු 6.40ට යෙදෙන ජාතික රුක්රෝපණ නැකතට පැළ සිටුවීම සඳහා පරිසර අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන 'නැකතට පැළයක්' වැඩසටහන සඳහා නොමිලයේ පැළ ලබා දීම පරිසර ඇමැති මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් ලේක්හවුස් ආයතනයේදී අද(07) පෙරවරුවේ දී සිදුකෙරේ.

මෙහිදී ඇමැතිවරයා විසින් ලේක්හවුස් ආයතන එළිමහන් පරිශ්‍රයේදී නා පැළයක් රෝපණය කිරීමටද නියමිතය.

'නැකතට පැළයක්' වැඩසටහන සඳහා දායක වීමට ,ලේක්හවුස් සේවක සේවිකාවන් වෙනුවෙන් පැළ 1000ක් නොමිලේ පරිසර අමාත්‍යාංශය මගින් ලබා දීමට නියමිතය.මේ අවස්ථාවට ලේක්හවුස් ආයතනයේ සභාපති ,කළමනාකාර අධ්‍යක්ෂ ,ජනාධිපති නීතිඥ ඩබ්ලිව් .දයාරත්න මහතා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයද මේ අවස්ථාවට එක්වෙති.

# සොකරි නාටකය රඟ දැක්වීමක් කෑගල්ල, තුංතොට දී 9දා

වියැකෙමින් පවතින සාම්ප්‍රදායික ප්‍රාසංගික කලාවන් සුරක්ෂිත කර අපේ උරුමයන් නැවත ජනගත කිරීමට මෙන්ම ප්‍රාසංගික කලා ශිල්පීන් ධෛර්යමත් කිරීමේ අරමුණින් පවත්වන සාම්ප්‍රදායික සොකරි නාටකය රඟ දැක්වීමක් ලබන (09දා) පස්වරු 06.00 සිට කෑගල්ල, තුංතොට, මැණික්කඩවර දී පැවැත්වීමට නියමිතය.

ජාතික උරුම ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රි ලංකා කලා මණ්ඩලය එක්ව සංවිධානය කරන මෙම වැඩසටහනේ ප්‍රධාන සංවිධාන කටයුතු කලා මණ්ඩල සභාපති සම්මානිත මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරේ.

# රාජ්‍ය සාහිත්‍ය දේශනය අද පදනම් ආයතනයේදී

**උපාලි කරුණාරත්න**

රාජ්‍ය සාහිත්‍ය උත්සවයට (2020) පූර්වගාමීව පවත්වනු ලබන රාජ්‍ය සාහිත්‍ය දේශනය අද (07) පස්වරු 2.00ට ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත් වේ.

සිංහල ශබ්ද කෝෂයේ හිටපු ප්‍රධාන කර්තෘ මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන මහතා මෙහි ප්‍රධානත්වය දරන අතර ජාතික උරුම, ප්‍රසංග කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා ද මෙම අවස්ථාවට සහභාගි වේ. මෙහිදී සාහිත්‍ය විචාරය හා සමාජය, නව න්‍යායික ප්‍රවේශයන්හි අවශ්‍යතාවය සහ අභියෝග යන මැයෙන් මුඛ්‍ය දේශණය පවත්වනු ලබන්නේ මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා විසිනි.

# කොළඹට අද හිරු මුදුන් වේ

**උපාලි කරුණාරත්න**

කොළඹ, මල්වාන, කොස්ගම, සීතාවක, මල්දෙනිය, රොසැල්ල, තලවකැලේ, සීතාඑලිය, ඇටම්පිටිය, පස්සර, වරලන්ද සහ පලාඩි කළපුව ප්‍රදේශවලට අද (07) දහවල් 12.13ට හිරු මුදුන්ව පවතී. මෙම 05 සිට 14 දක්වා දිනවල ශ්‍රී ලංකාවට හිරු මුදුන්ව පවතින අතර අද දිනයේ බස්නාහිර, සබරගමුව, මධ්‍යම, පළාත් වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත් ස්ථාන ස්වල්පයක සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකිය.

# මඩකලපුව-වවුනියාව-යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීමට කැබිනට් අනුමැතිය

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

මඩකලපුව, වවුනියාව හා යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීම සඳහා කැබිනට් අනුමැතිය හිමි වී තිබේ. කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත.

මේ අනුව එම විශේෂ ආර්ථික මධ්‍යස්ථානයන්හි පරිපාලනය සඳහා කළමනාකරණ භාර පිහිටුවීමත්, විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් එකී ආර්ථික මධ්‍යස්ථානයන්හි ව්‍යාපාර පරිශ්‍ර වෙන් කර දීමත් සිදු කෙරෙනු ඇත. ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවි කර ගැනීමටත්, තරගකාරීත්වය තුළින් වඩාත් කාර්යක්ෂම ලෙස මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක කරවීමටත් හැකි වන පරිදි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන වැඩපිළිවෙළ ආරම්භ කොට ඇති අතර මේ වන විට එවැනි ආර්ථික මධ්‍යස්ථාන 15ක් දිවයින පුරා ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව, මඩකලපුව හා වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ පළමු අදියරෙහි ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කොට ඇත.

# වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශයට තාප්පයට ඉහළින් තහනම් ද්‍රව්‍ය පාර්සලයක්

**බුද්ධිකා ඉඹුලාන**

වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශය තුළට පිටතින් විසිකරන ලද ජංගම දුරකතන ,චාජර්, ඇතුළු තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් බන්ධනාගාර නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රැඳවූවන් ඉවත් කර නිරෝධායන මධ්‍යස්ථානයක්ව තිබූ වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශය පසුගිය 4 වන දින සිට නැවතත් කාන්තා රැඳවූවන් රැඳවීමට යොදා ගෙන තිබිණි.එසේ ආරම්භ වූ පසුගිය 4 දා රාත්‍රියේ වනාතමුල්ල ප්‍රදේශයේ සිට සීමා තාප්පයට ඉහළින් බන්ධනාගාරය තුළට තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් විසිකර ඇති අතර එසේ විසිකරන ලද පාර්සලය බන්ධනාගාර තාප්පයට ඉහළින් යොදා ඇති දැල් ආවරණ මත රැඳී ඇත.

පසුදින එනම් පෙරේදා(5 )දින රාත්‍රී 11.45 ට පමණ තහනම් ද්‍රව්‍ය අඩංගු තවත්පාර්සල් 2 ක් කාන්තා අංශයට ඉහළින් ඇති දැල් ආවරණය මත රැඳී තිබියදී හා තවත් එක් පාර්සලයක් ඒ අසල බිම වැටී තිබියදී ද අත්අඩංගුවට ගෙන ඇත.



අත්අඩංගුවට ගන්නා ලද පාර්සල් තුළ ජංගම දුරකථන 9 ක්, ජංගම දුරකථන සිම්පත් 5 ක්,ජංගම දුරකතන බැටරි 14ක්, ජංගම දුරකථන චාජර් 8ක්, දුම්කොළ 10 ක් ,බුලත් කොල 20ක් හා පුවක් කැබලි 20 සමඟ බුලත් විට සඳහා ගන්නා හුනු පැකට් එකක්, ඊයම් කොළ 4ක්, ගිනි පෙට්ටි 2 ක් තිබූ බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශ චන්දන ඒකනායක මහතා කීය. අත්අඩංගුව ගන්නා ලද ද්‍රව්‍ය වැඩිදුර විමර්ශන කටයුතු සඳහා බොරැල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

# සිරිමල්වත්තේ වී බුසල් 50ක ගොයමට ගිනි තබලා



ගින්නට පෙර ගොයම



ස්වර්ණා ජයවර්ධන



**කුණ්ඩසලේ සමූහ**

කුණ්ඩසාල, පහතදුම්බර, සිරිමල්වත්ත බමුණැල්ල යායේ සම්බා වී බුසල් 50ක බැතකට කිසියම් සංවිධානාත්මක පිරිසක් පසුගියදා (31) රාත්‍රියේ ගිනි තබා විනාශ කර ඇත.

සිරිමල්වත්ත, බමුණැල්ල ගොවි සමිතියේ හිටපු ලේකම්වරියක වන ස්වර්ණා ජයවර්ධන (අවු: 72) මහත්මියට අයත් වී බුසල් එකහමාරක් පමණ වගාවකින් ලැබෙන, බුසල් 50ක පමණ අස්වැන්නක් මේ ගින්නෙන් මුළුමනින්ම විනාශව ඇත.

මේ පිළිබඳ ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන නිලධාරී හා කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරී දැනුම්වත් කළ ද ඊයේ (04) දක්වා ඔවුන් මේ ගැන පරීක්ෂා කිරීමට හෝ අලාභය ගණනය කිරීමට කුඹුරට නොපැමිණි බව ඇය දිනමිණට ප්‍රකාශ කළාය.

ගොවීන්ට වසරේ වැඩිම අස්වැන්නක් ලැබෙන්නේ මේ මහ කන්නයෙනි. බැතට ගිනි තැබීම නිසා ඇය මහත් අසරණභාවයටත්, ශෝකයටත් පත්ව ඇත.

ප්‍රවේණි ඉඩමක් වන මෙම වෙල් යායේ ගොයම් කැපීම කෙරෙන්නේ සම්ප්‍රදායික ක්‍රමයට දැකැති මගිනි.

ඉකුත් 31දා ඇය ඇතුළු පවුලේ උදවිය ගොයම කපා ගනු ලැබුව ද, වී හුළං කර ගැනීමට කාලය මදිවීම නිසා බැත කුඹුරේම තිබෙන්නට ඇර ඇත. එදින රාත්‍රියේ 9.30ට පමණ අසල්වැසියන් ගේ දැනුම්දීමට අනුව කුඹුරට දිවගිය ඔවුන්ට දැක ගැනීමට ලැබී ඇත්තේ, තමන් ඉකුත් නොවැම්බරයේ සිට ඉමහත් මහන්සියෙන් ගොඩට ගත් අස්වැන්න දැවෙන ආකාරයයි.

මේ ගැන කළ දැනුම්දීමකට අනුව වත්තේගම පොලිස් ස්ථානාධිපතිවරයා සිදුවීම පරීක්ෂා කිරීමට වහා නිලධාරීන් යොමු කර ඇති අතර ඔවුන් මේ පිළිබඳ ප්‍රකාශයක් ගෙන ඇත. සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කෙරෙයි.

ඡායාරූප - කුණ්ඩසලේ සමූහ

# ටෙලි නළුවා පුතුන් දෙදෙනාට නඩත්තු ගෙවන බවට අධිකරණයට පෙරොන්දු වෙයි

**රාගම සමූහ**

පසුගිය 2016 වසරේ සිට පුරා වසර හයක් මුළුල්ලේ තම බාලවයස්කාර පිරිමි දරුවන් දෙදෙනාට නඩත්තු මුදල් ගෙවීම පැහැර හැර අධිකරණය මගහැර සිටි සුප්‍රකට ටෙලිනාට්‍ය නළු ගයාන් ප්‍රසාද් වික්‍රමතිලක පසුගිය 31වනදා කඩවත මහර අධිකරණය ඉදිරියේ පෙනී සිටිමින් තම පුතුන් දෙදෙනාට ගෙවීමට ඇති ලක්ෂ විස්සකට අධික වන්දි මුදලින් රුපියල් 30,000ක්වූ එක් මාසික ගෙවීමක් අධිකරණය ඉදිරියේදී ලබාදෙමින් මින් පසුව අඛණ්ඩව ගෙවීම් සිදුකරන බව පැවසීය .

වයස අවුරුදු 11/12 වයස් කාණ්ඩවල පසුවන පිරිමි දරුවන් දෙදෙනා පාසල් අධ්‍යාපනය ලබන බවත් රැකියාවක් නොකරන බැවින් දරුවන් දෙදෙනෙකු නඩත්තු කරමින් අධ්‍යාපනය ලබාදීම තමාට කළ නොහැකි බවත් පවසමින් පසුගිය 2012 වසරේදී අග භාගයේදී දරුවන්ගේ මව විසින් මහර අධිකරණය ඉදිරියේ මෙම නඩුව ගොනුකර තිබිණි.

අගතියට පත් පාර්ශවය වෙනුවෙන් අධිකරණය ඉදිරියේ කරුණු දැක්වූ නීතිඥ සුදර්ශන වික්‍රමරත්න මහතා වසර හයකට පසුව විත්තිකරු මෙලෙස එක් මසකට ගෙවිය යුතු රුපියල් 30,000ක මුදල් ගෙවීම් සිදුකළ නමුත් වසර හයකට ආසන්න කාලයක හිග මුදල් ගෙවීමට ඇති බවත් 2013 වසරේදී පූර්වගාමී විනිසුරු වරයෙකු විසින් එක්දරුවෙකු වෙනුවෙන් නියම කළ රුපියල් 15,000ක මුදල වර්තමානයේ පවතින ජීවන වියදම ඉහළ යෑමත් සමග ප්‍රමාණවත් නොවන බවත් අධිකරණයට කරුණු පැහැදිලි කළේය.

2013 වසරේ සිට 2016 දක්වා අඛණ්ඩව නඩත්තු මුදල් ගෙවා ඇති අතර 2016 සිට 2021 දක්වා මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් හිග මුදල් පිළිබඳ ගරුවිනිසුරු තුමාගේ අවධානය යොමු කරන මෙන් නීතිඥ සුදර්ශන වික්‍රමරත්න මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේය. කරුණු සැලකිල්ලට ගත් මහර අංක 1 අධිකරණයේ වැඩ බලන මහේස්ත්‍රාත් කේමින්ද පෙරේරා මහතා හිඟ මුදල් සම්බන්ධව රෙජිස්ට්‍රාර් වාර්තාවක් කැඳවන ලෙස නියෝග කළ අතර ගෙවන මුදල වැඩි කිරීම සම්බන්ධව ඉදිරි නඩුවාරයකදී සලකා බලන බවත් පැවසීය. මහේස්ත්‍රාත් වරයා මෙම නඩුව අප්‍රේල් මස 28 වනදා යළි කැඳවීමට නියෝග කළේය.



# යහපාලන රජයේ අදූරදර්ශී මූල්‍ය කළමනාකරණය නිසා

# අද ආනයනයන් සීමා කිරීමට සිදු වෙලා

## වෙළෙඳ ඇමැති ආචාර්ය **බන්දුල ගුණවර්ධන**

## පාර්ලිමේන්තුව

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

පසුගිය යහපාලන රජයේ අදූරදර්ශී මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද හේතුවෙන් අද වන විට බොහෝ ආනයනයන් සීමා කිරීමට සිදු වී තිබෙන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේ දී (06) ඊයේ ප්‍රකාශ කළේය.

කොවිඩ් වසංගතය හේතුවෙන් ලෝකයේ බොහෝ රටවල භාණ්ඩ නිෂ්පාදනය, බෙදාහැරීම සහ පරිභෝජන ක්‍රියාවලිය විශාල බලපෑමකට ලක් වී ඇති අතර අපේ රටට ද එය සෘජුව බලපා ඇති බව ද ඇමැතිවරයා පැවසුවේය.

අපනයනය කිරීම සඳහා අවශ්‍ය කන්ටේනර් බහාලුම් පවා සොයා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති අතර, බහාලුම් කන්ටේනරයකට අය කළ ගාස්තු ද අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇතැයි ද ප්‍රකාශ කළේය.

ආනයන හා අපනයන පනත යටතේ වන රෙගුලාසි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන නියමයන් සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනයට අදාළ යෝජනාව ඇතුළු කරුණු අටක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දී ඊයේ (06) පැවැති විවාදයට එක්වෙමින් ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

**වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා -**

මේ කාලයේදී ලොවටම අතිශය භයංකර තත්ත්වයක් ඇති වී තිබෙනවා. කොරෝනා වසංගතය හමුවේ ලොව පුරා මනුෂ්‍ය ජීවිත විසිඅට ලක්ෂයක් පමණ අහිමි වී තිබෙනවා. ප්‍රංශය වැනි බලවත් රටවල් පවා මාසයකට නැවත වසා දමා තිබෙනවා. ලෝකයේ ප්‍රධාන රටවල නිෂ්පාදන රටාව පවා බිඳ වැටිලා. එනම් ලෝකයේ ප්‍රධාන රටවල ඔත්පල වීම අප රටටත් බලපෑමක් ඇති කර තිබෙනවා. ඛනිජ තෙල් මිල වැඩි වී තිබෙනවා. ගෑස් මිල වැඩි වෙලා. සැපයුම් ජාලය අඩපණ වූ පසුව ලෝකයටම ඇති වන බලපෑමෙන් ශ්‍රී ලංකාවට නිදහස් වන්නට හැකියාවක් නැහැ. ලෝක පරිමාණ ව්‍යසනයේ දේශීය බලපෑම අප තේරුම් ගත යුතුයි. දෙවන ලෝක යුද්ධයට වඩා කොරෝනා වසංගතය නිසා ලෝකයට බලපෑමක් ඇති වී තිබෙන බව ආර්ථික විශ්ලේෂකයන් කියනවා. චීනය හැර අනෙක් සියලුම රටවල ආර්ථිකය කඩා වැටී තිබෙනවා. අපේ පාර්ලිමේන්තුව සිල්ලර දේවල් පිළිබඳව කතා කරමින් නොසිට වර්තමාන ලෝක අර්බුදය පිළිබඳව පුළුල් සංවාදයක් ඇති කරගැනීමට අවධානය යොමු කළ යුතුව තිබෙනවා. අද දිළිඳුකම වැඩි වීම මන්දපෝෂණය ආදිය ලෝක ප්‍රශ්නයක් බවට පත් වී තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල කොරෝනා තුන්වන රැල්ලක් ඇති වී තිබෙනවා. ලංකාවත් කොරෝනා තුන්වන රැල්ලකට ගොදුරු වුවහොත් තත්ත්වය මීටත් වඩා බරපතළ වෙනවා. එමනිසා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම ජනතාව අනුගමනය කළ යුතුව තිබෙනවා. ඩොලර් එන්නේ නැතිනම් අපට භාණ්ඩ ආනයනය කරන්නට ණයවර ලිපි නිකුත් කරන්නට බැරි වෙනවා. මෙරට නිෂ්පාදනය කළ හැකි සෑම දෙයක්ම රට ඇතුළේ නිෂ්පාදනය කරගත යුතුයි. එය ආණ්ඩුවට පමණක් කරන්නට බැහැ. පෞද්ගලික අංශය මෙන්ම සියලු ජනතාව ඊට මැදිහත් විය යුතුව තිබෙනවා. පෞද්ගලික අංශයත් දිරිගන්වා වැඩි වැඩියෙන් රටක නිෂ්පාදන කාර්යය සිදු කළහොත් රට සෞභාග්‍ය කරා ගෙන යා හැකි වෙනවා. වගා නොකරන ඉඩම් නැවත වගා කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳව සැලසුම් කළ යුතුයි. වර්තමානයේ රට මුහුණ දෙන බේදනීය ආර්ථික තත්ත්වය ඇති කිරීම සඳහා පසුගිය රජය වගකිව යුතුව තිබෙනවා. ජනප්‍රිය තීන්දු ගැනීමට නොහැකි තත්ත්වයක් වර්තමානයේ නිර්මාණය වී ඇත්තේ මේ ඇයි ඒ යහපාලන රජය සමයේ ආර්ථිකය විනාශ මුඛයට ඇදගෙන ගොස් තිබූ නිසායි. ඛනිජ තෙල්, ගෑස් ආදී භාණ්ඩවල මිළ ඉහළ ගොස් තිබෙනවා. ඒ අනුව දේශීය බලපෑමක් සිදුව තිබෙනවා. චීනය හැර අනෙක් සියලුම රටවල් අද කඩා වැටිලා. ලෝකයේ ඇති වී තිබෙන මෙම තත්ත්වය සම්බන්ධයෙන් ජාත්‍යන්තර කතිකාවක් ඇති කර ගත යුතුයි. අපේ රට නිරෝධායන ක්‍රියාවලිය අනුගමනය කරමින් කොවිඩ් වසංගතය සාර්ථක ලෙස පාලනය කිරීමට කටයුතු කර තිබෙනවා. රජය සියලු ආනයනය අපනයන පාලනය කර ඇත්තේ කැමැත්තකින් නෙවෙයි. අපි අභියෝග රැසක් මැද රට නිවැරැදි දිශාවට ගෙන යනවා. නිදහසින් පසු ලංකා ඉතිහාසයේ කිසිම රජයක් නොකළ ආකාරයෙන් තමයි පසුගිය රජය කටයුතු කර තිබෙන්නේ. යහපාලන රජය අවසාන මාස 18 දී ජාත්‍යන්තර වෙළෙඳපොළට ගොස් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කර ඩොලර් බිලියන 6.5ක ගිනි පොලියට ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් මුදල් ගෙන තිබෙනවා. මෙය ඉතා විශාල මුදල් ප්‍රමාණයක්. මෙය අපේ රට වැනි රටකට ඔරොත්තු දෙන එකක් නෙවෙයි. ඒ අනුව යම් යම් දිරි ගැන්වීම් දෙමින් වැඩි වැඩියෙන් රට තුළ නිෂ්පාදනය ඇති කළ හොත් පමණක් රටට ඉදිරියට යා හැකියි.

**මාතර දිස්ත්‍රික් මන්ත්‍රී බුද්ධික පතිරණ මහතා (සජබ) -**

පාර්ලිමේන්තුවේ නම් ස්වාභාවික කිරි සහ කල් කිරි දෙන බව ප්‍රකාශ කර තිබෙනවා. ඒකෙන් නොකියා කියන්නේ පිටි කළ කිරි අහිතකර බව ද? මේ හේතුව නිසා මම පාර්ලිමේන්තුවේ කිරි නොබීමට තීරණය කළා. පාර්ලිමේන්තුවෙන් පිට අය පිටි කළ කිරි බොද්දී අප නැවුම් කිරි බොන්නේ කෙසේද? පසුගිය වසර දහය ඇතුළත සුප් කැට සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ආවා. පිටිකළ කිරිපිටි සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ආවා. සැමන්වල ආසනික් ප්‍රශ්නයක් ආවා. හාල්, රම්පෙ, කරපිංචා ආදිය ගැන ප්‍රශ්න ආවා. සැමන්, පරිප්පු, මිරිස් ආදියේ වස තිබෙන බව කියනවා නම් එතනින් එහාට කතා කරන්නට තිබෙන්නේ මොනවාද? අද ලංකාවේ ගාන සමහර සබන් විදේශ රටවල පාවිච්චි කරන්නේ බල්ලන් නෑවීම සඳහායි. කපා විකුණන කොස් පොළොස්වලට වැසිකිළි හෝදන රසායන ද්‍රව්‍ය යෙදූ අවස්ථා පිළිබඳව පුවත්පත් වාර්තා කර තිබුණා. ෆාම් ඔයිල් නතර කිරීමේ තීරණයත් හරක් මැරීමේ තීරණය වගේ නොවේවායි අප ප්‍රාර්ථනා කරනවා. එමෙන්ම ෆාම් ඔයිල් ආශ්‍රිත නිෂ්පාදන ද නතර කළ යුතුයි.

(නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණියේය)

**බුද්ධික පතිරණ මහතා -**

පිටරටින් අපිරිසිදු පොල්තෙල් ගෙනැවිත් ක්ලෝරීන් දමා මෙරට විකුණනවා. එය ඉතා අහිතකරයි. ලංකාවට පොල් තෙල් ගෙන්වූ පසුව පරිභෝජනය කරනවා ද එසේ නැතිනම් කාර්මික වැඩවලට භාවිත කිරීමට සුදුසුද යන්න ලේබල් කළ යුතුයි. අහඹු පරීක්ෂණ කටයුතු වැඩි කළ යුතුව තිබෙනවා. අද ප්‍රමිති ආයතනය කුජීත වී තිබෙනවා. වස චුට්ටක් තිබුණාට කමක් නෑ කියා ප්‍රමිති ආයතනය කියනවා. ඔවුන්ගේ දැක්ම එයයි. ප්‍රමිති ආයතනය පරීක්ෂණ හරියට නොකළත් ප්‍රමිති ආයතන නිලධාරීන්ට ඇගයීම් දෙන්න රුපියල් ලක්ෂ 70 ක් වියදම් කර තිබෙනවා.

දිවා ආහාරයෙන් පසුව නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණියේය.

**බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර මහතා -**

රෙදිපිළි කොතරම් නිෂ්පාදනය කළත් දේශීය අත්යන්ත්‍ර රෙදිපිළිවලට තරගකාරිත්වයක් දෙන්න බැරි වෙනවා. සාරියේ සිට සියලු රෙදිපිළි පිටරටින් ගෙන්වනවා. මෙරට අත්යන්ත්‍රයක් තුළින් සාරියක් සකසා රුපියල් 3000 කට විතර අලෙවි කරන විට පිටරටින් ඒ සාරිම රුපියල් 800 කට විතර ගෙනැවිත් අලෙවි කරනවා. ඒ නිසා මෙරට අත්යන්ත්‍ර රෙදිපිළි නොගන්නා තත්ත්වයක් උදා වෙලා තිබුණා. දේශීය කර්මාන්තකරුවා ශක්තිමත් කිරීමට අපි වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා. එච්. එස්. කෝඩ් පවා අපි හදා තිබෙනවා. විදේශයෙන් ගේන රෙදි නතර කිරීමට අපි පියවර ගෙන තිබෙනවා. එමගින් දේශීය රෙදිවලට විශාල වෙළෙඳපොළක් ලැබෙයි. වාර්ෂිකව සාරි 76,000 ක් ඕන වෙනවා. දහම් පාසල්වලට එහෙම දෙන්න ඕන සාරි මේවාට අයිති වෙනවා. මේ සාරිත් ගෙන්නුවේ පිටරටින්. පළමු වතාවට අපි ගිය වසරේ මේ සාරි 76,000 මෙරටදීම වියන්න කටයුතු කළා. දේශීය රෙදිපිළි කර්මාන්තය ශක්තිමත් කරන්න පියවර ගෙන තිබෙනවා.

**සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත භෝග වගා, තේ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා -**

මෙරට මෙතෙක් කාලයක් තිබූ යැපුම් ආර්ථිකය වෙනුවට දේශීය ආර්ථිකය නගා සිටුවීමට පියවර ගෙන තිබෙනවා. දේශීය නිෂ්පාදන වැඩි කළ යුතු බවට ලෝකයේම ආර්ථික විශේෂඥයන් මේ කොවිඩ් කාලයේ හඳුනා ගත්තා. අපනයන ආනයන බදු වැඩි කිරීමට, රෙගුලාසි දැමීම වැදගත්. රටේ අපනයන ආර්ථිකය ගොඩනැඟීමට කණ්ඩායමක් විදියට සහාය දිය යුතුයි. අපේ රටේ භාණ්ඩවලට විශාල ඉල්ලුමක් ලෝක වෙළෙඳපොළේ තිබෙනවා. ඉල්ලුමට සරිලන සැපයුමක් අපට දෙන්න නොහැකියි.

**පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා (ජා.ජ.බ.) -**

මෙරටට භාණ්ඩ ආනයනය කිරීමේදී ඒවා නියාමනය කිරීම රජය කළ යුතුයි. ප්‍රමිති ආයතනය අයත් වන්නේ ජනාධිපතිවරයාගේ විෂය පථයට. සෞඛ්‍ය අමාත්‍යාංශය තමයි පොල්තෙල්වල විෂ තිබෙන බවට පළමුවෙන්ම හෙළි කළේ. ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂවරිය කළ ප්‍රකාශය ඉතා බරපතළයි. පොල්තෙල්වල පමණක් නොව තව බොහෝ ද්‍රව්‍යවල පිළිකාකාරක තිබෙන බවට ඇය ප්‍රකාශ කළා. ඒවා ප්‍රකාශයට පත් කළොත් ඒවා ගෙන එන ආයතන අපහසුතාවට පත් වෙනවා. මේ ප්‍රකාශය කළ අධ්‍යක්ෂවරිය ගැන රජය ගත් පියවර මොකද්ද? මෙරටට ආහාර ද්‍රව්‍ය ගෙන එන විට ඒවා පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් සකසන්න ඕන.

**පශු සම්පත් ගොවිපළ ප්‍රවර්ධන හා කිරි බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය ඇමැති ඩී. බී. හේරත් මහතා -**

මහින්ද මහතා මේ රට යහපාලන ආණ්ඩුවට භාර දෙන විට විදේශ සංචිත බොහොමයක් තිබුණා. නමුත් වසර හතර හමාරක කාලය තුළදී විදේශ සංචිත කඩා වැටුණා. රුපියල අවප්‍රමාණ වුණා. කොරෝනා උවදුරත් සමඟ ලෝකයේම ආර්ථිකය කඩා වැටුණා. ගෝලීයකරණයට ලක්වූ මෙරටට ජාත්‍යන්තරයත් සමඟ අනුගත වීමට සිදු වෙනවා. රටේ ආර්ථික ගැටලුවට විසඳුමක් දිය යුතුයි. දේශපාලන ක්‍රියාවලිය තුළ කතා කරන්නේ නම් අපේ පක්ෂය හැදූ නිර්මාතෘ බැසිල් රාජපක්ෂ මහතා ගමට ගොස් ගමේ අවශ්‍යතාවන් ගැන සෙව්වා. දේශීය නිෂ්පාදනයන් නගා සිටුවීමට අවශ්‍ය බව එහිදී ජනතාව පැවසුවා. ඊට අනුගතව තමයි සෞභාග්‍යයේ දැක්ම ඉදිරිපත් කළේ. මෙරටට උකු කිරි ආනයනයේදී රස කළ උකු කිරි ආනයනය කරන්න යෙදෙනවා. කිරිවලින් ස්වයංපෝෂිත වෙන්න ජනතාව දැනුවත් කරන වකවානුවක මෙරටට අවශ්‍ය උකු කිරි මිල්කෝ ආයතනයෙන් සකස් කරගෙන යනවා. කිරිපිටි ආනයනය කරන්න බොහෝ මුදල් අපි වැය කරනවා. ලංකාවට පිටරටින් ආනයනය කරන කිරිවල ගුණාත්මක බව පරීක්ෂා කිරීමට ද කාලය එළැඹ තිබෙනවා.

*(පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතා මුලසුනට පැමිණියේය.)*

**පත් කළ මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතා (ස.ජ.බ.) -**

මෙරට අල්ලස දූෂණය ගැන ජනතාවට කියන්න දෙයක් නැහැ. එය ජනතාව දන්නවා. වංචා දූෂණ අවම කරන්න කොමිෂන් සභාවක් තිබෙනවා. මේ කොමිෂන් සභාවට පත් කරන නිලධාරීන්ට ගණිතය, තාක්ෂණය වගේ විෂයන් ගැන නිපුණතාවක් තිබිය යුතුයි.

**කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී ජේ. සී. අලවතුවල මහතා (ස.ජ.බ.) -**

සීනි බදු අඩු කිරීමේ වාසිය ජනතාවට ලැබුණා ද කියන එක ගැන මෙතෙක් පරීක්ෂණයක් කර නැහැ. සිංහල හින්දු අවුරුද්දට තව තිබෙන්නේ සතියයි. මේ අවුරුදු සමයේ මෙරටට ගෙනැවිත් තිබෙන පොල්තෙල් විෂ සහිතයි. ඒවා විෂ සහිත නොවන බව රජය ජනතාවට හඟවන්න උත්සාහ කරනවා. නමුත් ඒවායේ පිළිකා කාරක තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ අය ජනතාවගේ පැත්තෙන් කතා කරන්නේ නැහැ. ආණ්ඩුවේ ගජ මිතුරන්ට උදව් කරන්න අද ඇතැම් නිලධාරිනුත් එක් වෙලා සිටිනවා. ඒ ගැන කනගාටුයි.

**සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා**

පාරිභෝගිකයාගේ ආරක්ෂාව ගැන පක්ෂ විපක්ෂව අද උදෑසන සිට කතා කළා. බුද්ධික පතිරණ මන්ත්‍රීවරයා අභියෝග ගැන ඉතා තර්කානුකූලව කතා කළා. විපක්ෂයේ අනෙක් අයත් ඔහු කී දේ මුල් කරගෙන කතා කළොත් රටට යහපතක් උදා කළ හැකියි. රාජ්‍ය ඇමැතිවරුන්ගේ කාර්යභාරය ගැන අවබෝධයකින් තොරව දේශපාලන වාසි ලබා ගැනීම සඳහා අසත්‍ය තොරතුරු විපක්ෂයෙන් ඉදිරිපත් කිරීම සිදු වුණා. මේ කතාබහ තුළින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා උපදෙස් අපට ලැබුණේ නැහැ. මෙරට පාරිභෝගිකයාගේ ආරක්ෂාව ගැන ජාතික ප්‍රශ්නයක් තිබෙනවා. නිදහසෙන් පසුව විවිධ ආණ්ඩු මෙරට ස්ථාපිත වුණා. පාරිභෝගික ආරක්ෂාව වෙනුවෙන් වෙනම රාජ්‍ය අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීමට ජනාධිපතිවරයා කටයුතු කළා. ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි එවැනි දෙයක් සිදු වුණේ. මේ ප්‍රශ්නයේ බරපතලකම එයින්ම පේනවා. මේ ප්‍රශ්න අද ඊයේ ඇති වූවක් නොවේ. දශක ගණනාවක් තිස්සේ තිබූ ගැටලු තමයි ඒවා. රේගුවේ එච්. එස්. කෝඩ් වර්ග 7200 ක් තිබෙනවා. ඉන් 1200 යි රට තුළට ගන්නේ. ඉතිරි 5800 ම බලන්නේ නැහැ. ඒවා කන්ටේනරයෙන් ලංකාවට ගෙනාවා. එහෙම්මම වෙළඳපොළට දානවා. ඒ දේ තමයි අතීතයේ සිට සිදු වුණේ. ආනයනික භාණ්ඩ 1200 ක අඩුපාඩු තිබෙනවා ද කියලා බලන්න රේගුව කටයුතු කරනවා. එසේ බලන්නේ නැතිව වෙළඳපොළට නිකුත් කළ භාණ්ඩ 5800 ක් නියාමනය සඳහා අපි වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. මෙරට තිබෙන නීතිය කුමක්ද? ප්‍රමිති ආයතනය නීති සකස් කර තිබෙනවා. පොල්තෙල් ඒකක මිලියන 1000 කට ඇෆ්ලටොක්සින් අංශු 10 ක් තිබිය හැකි බව ප්‍රමිති ආයතනය කියනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය කියනවා මිලියන 1000 කට අංශු 30 ක් තිබෙන්න පුළුවන් කියලා. මෙරට රාජ්‍ය ආයතන දෙකක් පොල්තෙල් ගැන නියාමනය කර තිබෙන්නෙ ඒ විදියටයි. මේ නිර්ණායක අතර ගැටලුවක් තිබෙනවා. පොල් සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා කියනවා මේ පොල්තෙල්වල විෂ නැහැ කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කියන දේ අනුව තමයි එතුමා එසේ පවසන්නේ. මේ දේවල් ගැන ඉතාම අවබෝධයෙන් අපි කටයුතු කළ යුතුයි. හිතාමතා ජනතාවට වහ කවන්න කිසිම රජයක් කටයුතු කරන්නේ නැහැ. අපි වංචා දූෂණවලට විරුද්ධයි. සීනි වංචාව ගැන ඕනෑම විවාදයකට එන්න. මේ ගැන අපි ඇත්ත කතා කරන්නම්. කොහොමද වංචාව වුණේ කියලා පාර්ලිමේන්තුවට කියන්න. එහෙම නැතිව වංචාවක් වුණා කියලා විතරක් කීවාට මදි. ඒවා ගැන තොරතුරු ඉදිරිපත් කළොත් අපිට ඒ ගැන සත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්. මිශ්‍ර කළ පොල්තෙල් අලෙවියට හැකි බව 2016 ගැසට් කළා. කිසිදු මිශ්‍රණයක් වූ දෙයක් අලෙවි කළ නොහැකි බවට වූ ගැසට් එක ඉදිරියේදී අපි නිකුත් කරනවා. පොල්තෙල් සාම්පල් 125 ක් ගෙන අපේ රජයෙන් තමයි ඒවා පරීක්ෂාවට යොමු කළේ. රේගුවෙන් අදාළ සාම්පලය ගෙන ඒ අයගේ ගුදම්වලට ගෙන යාමට අවසර දීම පසුගිය දශක දෙකක පමණ කාලයක් තුළ සිදු වූ දෙයක්. මේ දේ නිවැරදි විය යුතුයි.

**පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොළවත්ත මහතා (පො.ජ.පෙ.) -**

රාජ්‍ය යාන්ත්‍රණය තුළ වැටුප් වැඩිවීමක් අවශ්‍ය වෙලා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අය එදා යහපාලනය යොදා ගත්තේ වැරදි දේවල් සඳහා. නිලධාරීන් මේ දේවල් සඳහා යොමු වනුයේ ඔවුන්ගේ වැටුප් අඩුවීම නිසාද කියන ගැටලුව තිබෙනවා. ඒ නිසා සේවා තෘප්තිය උදෙසා ඔවුන්ගේ වැටුප් වැඩි කළ යුතුයි. අල්ලස් හෝ දූෂණ විමර්ශන සභාවේ සභාපතිවරයාගේ වැටුප් වැඩි කිරීම අනිවාර්යයෙන් කළ යුතුයි. ඒ තනතුරට වරප්‍රසාද හිමි විය යුතුයි. රණවිරුවන්ට අවශ්‍ය විශ්‍රාම වැටුප ලබා දිය යුතුයි. ඒ මතයේ අපි සිටිනවා.

**ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා (ස.ජ.බ.) -**

වස විසෙන් තොර ආහාර ජනතාවට ලබාදීමේ වැඩපිළිවෙළ ගැන සෞභාග්‍යයේ දැක්ම තුළින් කතා කළ ආකාරය අපිට මතක් වෙනවා. එහෙම කී රජය යටතේ මේ සිංහල අවුරුදු කාලය උදා වන විට සැකයකින් තොරව කැවුමක් බැදගෙන, උළුදු වඩයක් බැදගෙන කන්න බයක් ඇති වෙලා තිබෙනවා. ප්‍රමිති ආයතනය තම වගකීම නිසි අයුරින් ඉටු කළා නම් විෂ සහිත පොල්තෙල් රට තුළට ඒමට නොහැකියි.

**මාතර දිස්ත්‍රික් මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා (පො.ජ.පෙ.) -**

මේ රටේ බල්ලෝ මරලා හරි මුදල් සොයන ක්‍රමවේදයක් විවෘත ආර්ථිකය තුළින් ස්ථාපිත කළා. ඒ වගේ ක්‍රමවේදයක් තුළ විෂ සහිත ආහාර රට තුළට පැමිණීම සිදු වෙනවා. කටුපොල් වගාවෙන් දැවැන්ත පරිසර හානියක් වෙනවා. පසුගිය රජය එය නතර කරන්න කටයුතු කළේ නැහැ. ෆාම් ඔයිල් නතර කරන්න කටයුතු කිරීම ගැන ජනාධිපතිවරයාට අපි ස්තුතිවන්ත වෙනවා.

**කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී අශෝක් අබේසිංහ මහතා (ස.ජ.බ.) -**

කොප්පරා මෙරටට ආනයනය කරන්න රජය කටයුතු කරනවා. ඒවායේ පුස් තිබුණොත් මේ පිළිකා කාරක ඇති වෙනවා. මේ අවුරුදු කාලය තුළ පොල්තෙල් ජනතාවට අවශ්‍ය වෙනවා. පොල්තෙල් ගැන විවිධ මතවාද තිබෙනවා. මේ මතවාද සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු ජනතාවට ලබාදිය යුතුයි.

**මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී වේලු කුමාර් මහතා (ස.ජ.බ.) -**

පොල්තෙල්වල ප්‍රශ්නයක් තිබෙන විට ෆාම් තෙල් තහනම් කරන බවට රජය පවසනවා. මොකද්ද මේක. එය විසඳුමක් ද? බදු සහන ලබාදීමත් කූට ව්‍යාපාරයක් විදියට මේ රජය සිදු කරනවා.

**කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා (පො.ජ.පෙ.) -**

මට පෙර කතා කළ මන්ත්‍රීවරයාගේ කතාව අසා සිටීමෙන් අපට හිතෙන්නේ කොටි හඬට සවන් දුන්නා වගේ. රණවිරුවන් මිනී මැරුවා කියලා මේ සභාවේ කියන විට ඊට එරෙහිව නැඟී සිටින්න විපක්ෂයේ කිසි කෙනෙකුට කොන්දක් නැහැ. මෙරටට අවශ්‍ය පොල්තෙල් රට තුළදී ම නිෂ්පාදනය කළ නොහැකියි. ඒ නිසා පිටරටින් පොල්තෙල් ගෙන්නුවා. ඒවා පිරිපහදු නොකළ ඒවා. ගඳක්, සුවඳක් ඇෆ්ලටොක්සින්වල නැහැ. පරීක්ෂාවට ලක් කළ යුතු දෙයක් ලෙස අපේ රජය පොල්තෙල් නම් කළා. ඒ නිසා තමයි පොල්තෙල්වල මේ විෂ හඳුනා ගැනීමට හැකි වුණේ.

**පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි -**

රටක නිදහස කියන්නේ ආහාර සුරක්ෂිතතාවයටයි. 2010, 2015 ආණ්ඩුවල විශාල ප්‍රශ්න ඇති වුණා. මෙරටට ගෙන්වන පොහොරවල ආසනික් ඇතුළු බැරලෝහ අඩංගු වෙන බවට ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලින් පවා පෙන්වා දුන්නා. පිළිකා, වකුගඩු රෝගීන් මෙරට වැඩි වෙලා තිබෙනවා. මේකට හේතුව තමයි ආහාර සුරක්ෂිතතාව නොමැති වීම.

**සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා -**

මෙරට දේශීය ආර්ථිකයන් ගොඩනැගෙන විට දේශීය ගොවියා ලාභයක් ලබන විට විපක්ෂය උත්සාහ කරනවා දේශීය නිෂ්පාදනවල විශ්වාසය නැති කරන්න. අපේ ආණ්ඩුව පොහොර සහනාධාරය ලබා දෙනවා. යහපාලන ආණ්ඩුව එහෙම කළේ නැහැ. රුපියල් 55 ට වී තොග අපි ගන්නවා. මේ ගොවි ආර්ථිකයට විපක්ෂය මඩ ගහනවා. මෙරට ග්‍රාමීය ආර්ථිකය දැන් ශක්තිමත් වෙලා. ගොවියා නැගිටින විට ගොවියා කෙරෙහි තිබෙන විශ්වාසය කඩන්න විපක්ෂය උත්සාහ කරනවා. කුලියාපිටියේ වොක්ස්වැගන් කර්මාන්ත ශාලාව හදන බවට එදා යහපාලන ආණ්ඩුව පැවසුවා. එහෙම එකක් හැදුවොත් නැහැ. ඒකට වෙන් කළ මුදලුත් නැහැ. එහෙම කරලා දැන් උත්සාහ කරනවා රටේ දේශීය ආර්ථිකය කඩා දමන්න.

**පාර්ලිමේන්තුව අද (07) උදෑසන 10.00 ට නැවත රැස් වේ.**



## රෙදි කර්මාන්තය ශක්තිමත් කළ යුතුයි

රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර



## රාජ්‍ය යාන්ත්‍රණය තුළ වැටුප් වැඩිවිය යුතුය

ප්‍රේමනාත් සී දොළවත්ත



## ජනතාව පිටි කිරි බොද්දී අපි නැවුම් කිරි බොන්නේ කොහොමද?

බුද්ධික පතිරණ



## භාණ්ඩ ආනයනය නියාමනය කළ යුතුයි

විජිත හේරත්

# කණුගහවැව ඒකාලෝක කළ අලුත් අරුණැල්ල



නිවෙසක හිමිකම ලබා දෙමින්

ශ්‍රී ලාංකේය සියලු ජාතීන්ට මහත් හිසරදයක්ව පැවැති එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය සම්පූර්ණයෙන්ම නිමාවට පත් කරමින් සාමයේ පරෙවියන් රට තුළ ඉගිල වූ ඓතිහාසික අවස්ථාවට මේ වන විට වසර දොළහක් පමණ ගත වී තිබේ. දශක තුනකට ආසන්න කාලයක් මේ රටේ උතුරු හා නැඟෙනහිර ප්‍රදේශයන්හි පැවැති ත්‍රස්තවාදය හේතුවෙන් අහිංසක ජීවිත දහස් ගණනක් මේ මාතෘ භූමියට අහිමි වූ අතර බිලියන ගණනක් වටිනා දේපළ ද විනාශයට පත් විය. කෙසේ නමුත් වීරෝදාර රණවිරුවන්ගේ උදාරතර කැපකිරීම සහ දැඩි අධිෂ්ඨානය හේතුවෙන් ත්‍රස්තවාදය මුළුමනින්ම අවසන් කොට සාමය උදා කර ගැනීමට හැකිවීම සමස්ත ජාතියටම නිදහසේ හුස්ම ගැනීමට අවස්ථාව ලබා දීමකි.

ශ්‍රී ලංකාව තවත් අභියෝගයකට මුහුණ දෙමින් සිටින පසුබිමක මේ ඓතිහාසික සිදුවීම සම්බන්ධයෙන් කතා කළ ද ත්‍රස්තවාදය පරාජය කරමින් ජාතිය ලද ජයග්‍රහණය සැමදා සිහිපත් කළ යුතුය. 1975 ජූලි 27 වැනි දා එවක යාපනය නගරාධිපති ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා මහතා, නල්ලූර් කෝවිල වෙත යමින් සිටියදී වෙඩි ප්‍රහාරයකට ලක්ව ඝාතනය වීම මෙරට තිස් වසරක යුද්ධයේ පළමු අඳුරු මතකය වනු ඇතැයි එදා කිසිවකු හෝ සිතුවේ නැත. එම සිද්ධියෙන් ඇරඹි ත්‍රස්තවාදයේ අඳුරු සෙවනැලි 1983 දී එල්.ටී.ටී.ඊය හමුදා සෙබලුන් 13 දෙනකු ඝාතනය කිරීමේ සිද්ධියත් සමඟින් රට පුරා පැතිර ගියේය. ඒ කළු ජූලිය නමැති කළු පැල්ලම මෙරට ඉතිහාසයට එක් කරමිනි.

80 දශකයේ ත්‍රස්තවාදය ආරම්භ වී ගෙවුණු දශක දෙකක කාලය තුළ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය විසින් මෙරට ආගමික නායකයින්, රාජ්‍ය නායකයින්, දේශපාලනඥයින්, රණවිරුවන් පමණක් නොව සිවිල් වැසියන් ද දහස් ගණනින් අමු අමුවේ ඝාතනය කරන ලද්දේ ලොව ප්‍රබලම ත්‍රස්තවාදී සංවිධානය බවට පත්වෙමිනි. 2001 වසරේදී එවකට ශ්‍රී ලංකා රජය සමඟ සටන් විරාම ගිවිසුමකට එළැඹුණත් එල්.ටී.ටී.ඊ.ය දිගින් දිගටම එය කඩ කරමින් සිය ම්ලේච්ඡ අරමුණ වෙනුවෙන් සටන් වැදුණු අතර ගොවි ජනතාවට ජලය සපයන නැඟෙනහිර මාවිල්ආරු සොරොව්ව වසා දැමීම එහි උච්ඡතම අවස්ථාව විය.

ඒ අනුව නැඟෙනහිර ගොවි ජනතාව වෙනුවෙන් 2006 ජූලි 21 වැනිදා මාවිල්ආරු සොරොව්ව මුදා ගැනීමට ආරක්ෂක හමුදා දියත් කළ මෙහෙයුම සිවිවන ඊළාම් යුද්ධයේ ආරම්භය විය. එවක ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මඟපෙන්වීම යටතේ එවක යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකාත්, නාවික හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ, ගුවන් හමුදාපති එයාර් මාෂල් රොෂාන් ගුණතිලක කොටි ත්‍රස්තවාදයට එරෙහි මෙහෙයුම් දියත් කළ අතර රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතාගේ නායකත්වයෙන් යුත් සිවිල් ආරක්ෂක බළකායත්, පොලිස්පති ජයන්ත වික්‍රමරත්න මහතාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා පොලිස් සේවයත් ඊට නොමඳ සහායක් ලබා දුන්නේය.

මෙලෙස සියලු පාර්ශ්වයන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් දිනා ගත් නිදහස අද වන විට සියලු ජාතීන් භුක්ති විඳින බව නොරහසකි. කෙසේ වුවද යුද්ධය පැවැති කාලයේ නිරන්තරයෙන් ත්‍රස්තවාදීන්ගෙන් බැට කෑ ගම්මානයක් ලෙස කැබිතිගොල්ලෑව නම් කළ හැකිය. 2006 වසරේ ජුනි මස 15 වන දින හල්මිල්ලවැටිය ග්‍රාමයේදී, කැබිතිගොල්ලෑව බස් රථය කොටි ත්‍රස්තවාදීන්ගේ බෝම්බ ප්‍රහාරයට ලක් වීමෙන් කණුගහවැව සහ අවට ගම්වල 68 දෙනෙක් ජීවිතක්ෂයට පත් වූහ. 1995 සිට 1998 දක්වාත්, 2006 සිට 2008 දක්වාත් මේ ගම්මානවල වැසියන්ට ත්‍රස්තවාදී භීෂණය නිසා කඳවුරුගතව ජීවත් වීමට සිදු විය.

එකී උවදුර අවසන් වුවද ඔවුහු බරපතළ ආර්ථික, සමාජයීය ප්‍රශ්න රැසකට මුහුණ පා සිටියහ. ඔවුන්ගේ ඉඩම් ගැටලු විසඳීම, වැව් ඇළ වේලි පිළිසකර කිරීම, ප්‍රධාන සහ අතුරු මාර්ග සංවර්ධනය, සෞඛ්‍ය, අධ්‍යාපන හා ප්‍රවාහන ඇතුළු ගැටලුවලට කඩිනම් විසඳුම් අවශ්‍ය විය. කෙසේ වුවද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක "ගම සමඟ පිළිසඳර" වැඩසටහන අද වන විට සාර්ථක ලෙස රට පුරා ක්‍රියාත්මක වන බව අපි දනිමු. කැබිතිගොල්ලෑව "ගම සමඟ පිළිසඳර" වැඩසටහනේදී ජනතාවගෙන් ඉදිරිපත් වූ දුක් ගැනවිලිවලට සවන් දීමෙන් පසු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කළ ඉල්ලීම අනුව ගුවන් හමුදාව ඉදි කළ "කණුගහවැව ආදර්ශ ගම්මානය" අද වන විට ජනතාවගේ අවශ්‍යතා සඳහා විසඳුම් රැසක් ලබා දෙන්නට සමත්ව තිබේ.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් සෘජුවම දායක වනවා සේම රටේ ආර්ථික සමෘද්ධිය වෙනුවෙන් ද ඉටු කරනුයේ අනුපමේය මෙහෙවරකි. මෙවන් මෙහෙවරක නිරත ශ්‍රී ලංකා ගුවන් හමුදාව අද වන විට සමෘද්ධිමත් දේශයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් සිටී. ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 අභිමානවත් සංවත්සරයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව, කණුගහවැව ප්‍රදේශය සංවර්ධනය කිරීමට පියවර ගත්තේය.

පසුගිය දෙසැම්බර් මස 30 වන දින පැවැති "ගම සමඟ පිළිසඳර" සිව් වැනි වැඩසටහන සඳහා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කණුගහවැව ගම්මානය තෝරා ගෙන තිබුණි. ඒ කැබිතිගොල්ලෑව, එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ගේ භීෂණයට නිතර ගොදුරු වූ ප්‍රදේශයක් වූ බැවිනි. කෙසේ වුවද ගුවන් හමුදාවේ 70 වන සංවත්සරය නිමිත්තෙන් කණුගහවැව ග්‍රාමයේ නිවාස ඇතුළු අවශ්‍යතා සංවර්ධනය ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ මහතා විසින් බාර ගන්නා ලද අතර එම ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කොට ඒ වෙනුවෙන් සැලසුම් ඉදිරිපත් කිරීමේ වගකීම ගමේ විහාරාධිපති හිමියන්ට, ප්‍රාදේශීය ලේකම්වරයාට, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට සහ ග්‍රාම නිලධාරීවරයාට පවරනු ලැබීය.

අඩුපාඩුකම් රැසකින් සමන්විත කණුගහවැව ගම්මානය සෑම අතින්ම දියුණු කරමින් ගම්වාසීන්ගේ අවශ්‍යතා උපරිමයෙන් ඉටුකරන්නට ශ්‍රී ලංකා ගුවන් හමුදාව පියවර ගෙන තිබීම එම ගම්වාසීන්ට සැනසුම උදා කර දීමකි. නිවෙසක් නොමැතිව පැල්පත්වල වාසය කරන පවුල් 70 ක් තෝරා ගෙන ඔවුන්ට අංගසම්පූර්ණ නිවෙසක් ලබා දීමට පියවර ගෙන තිබෙන අතර මෙලෙස ඉදි කළ නිවාස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකර තිබීම විශේෂත්වයකි. ඊට අමතරව අනෙකුත් වියදම් වෙනුවෙන් එක් නිවෙසක් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වැය කර තිබෙන මුදල රුපියල් ලක්ෂ පහළොවක් පමණ වේ. ඒ අනුව නිවාස 70 ක් සඳහා පමණක් වෙන් කරන මුදල රුපියල් ලක්ෂ 1050 කි. නිවෙසක් ඉදි කර ගැනීම යනු සිහිනයක් යැයි සිතූ ගම්වාසීන්ට අංග අංගසම්පූර්ණ නිවසක හිමිකම ලබා දීම සැබැවින්ම ආශ්චර්යයක් වන්නේය.

කණුගහවැව ග්‍රාමයේ නිවාස ඉදිකිරීම පමණක් නොව වෛද්‍ය සායනයක් පැවැත්වීම, මාර්ග සංවර්ධනය, අලි වැට ඉදිකිරීම, අභිනවාරාම විහාරස්ථානයට අවශ්‍ය සියලු අංග ලබා දීම, පානීය ජල අවශ්‍යතාව ලබා දීම, විදුලිය ලබා දීම ඇතුළු යටිතල පහසුකම් රැසක් ලබා දීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව පියවර ගෙන තිබේ. මෙම ව්‍යාපෘති යටතේ පැවති වෛද්‍ය සහ දන්ත සායනය වෙනුවෙන් අතිවිශාල ජනතා සහභාගීත්වයක් තිබීම මෙහි සාර්ථකත්වය ඉහළින්ම කියාපෑමකි.

පහසුකම් රැසක් සපයා දෙමින් ජනතා අවශ්‍යතා හැකි උපරිමයෙන් ඉටු කර තිබෙන "කණුගහවැව ආදර්ශ ගම්මානය" ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා (04) දහවල් ජනතා අයිතියට පත් කළේ ප්‍රදේශයේ ජනතාවට සැනසුම උදා කර දෙමිනි. කණුගහවැව ගම්මානය වෙත ගොස් පළමුව අභිනවාරාම විහාරස්ථානය වෙත ගොස් ආගමික වතාවත්වල නිරතවීමෙන් පසු විහාරාධිපති හිමියන් බැහැ දැක සුහද පිළිසඳරක නිරත වී යෝජිත වෙහෙර වහන්සේ ඉදි කෙරෙන භූමිය, අභිනවයෙන් ඉදි කෙරුණු බෝධිඝරය, ආවාස ගෙය සහ වැඩ අවසන් කෙරුණු ඝණ්ඨාර කුළුණ ජනාධිපතිවරයාගේ නිරීක්ෂණයට ලක් කෙරිණි.

කණුගහවැව ප්‍රාථමික විද්‍යාල භූමියේ ඉදි කර ඇති නව නිවාස 12 ක සහ "ගුරු නිවාසයෙහි" යතුරු නිවාස හිමිකරුවන්ට සහ විදුහල්පතිවරයාට බාර දුන් අතර ගුවන් හමුදා සේවා වනිතා ඒකකය මඟින් පාසල් දරුවන්ට නිල ඇඳුම් සහ පාසල් උපකරණ ප්‍රදානය කෙරිණි. කණුගහවැව ප්‍රාථමික විද්‍යාලයේ ක්‍රීඩා පිටිය, ආදර්ශ ගෙවතු වගා ව්‍යාපෘතිය, ගුරු නිවෙස සහ ජංගම අක්ෂි රෝහලේ සිදු කළ අක්ෂි සැත්කම් නිරීක්ෂණයට ද මෙහිදී ජනාධිපතිවරයා එක් විය.

හිමිකමක් නොමැතිව මෙතෙක් රජයේ ඉඩම් භුක්ති විඳිමින් සිටි පවුල් වෙත දීමනා පත්‍ර ප්‍රදානය සිදු කෙරෙමින් තිබෙන අතර කණුගහවැව ග්‍රාමයේ ඉඩම් ඔප්පු අහිමි අය අතරින් පස් දෙනකුට ඔප්පු ප්‍රදානය සංකේතාත්මකව සිදු කෙරිණි. අනතුරුව කණුගහවැව ආදර්ශ ගම්මානය වෙත ළඟා වූ ජනාධිපතිවරයා අලුතින් ඉදි කළ නිවෙසක් සහ ආදර්ශ ගම්මානයේ අලුතින් ඉදි කළ කිලෝමීටර් 15ක් දිග අලිවැට ද නිරීක්ෂණය කළේය. එම ප්‍රදේශයේ නිවෙසකට ගිය ඒ මහතා නිවැසියන් සමඟ සුහද කථා බහක නිරත වෙමින් තොරතුරු විමසුවේය.

ඇමැති එස්.එම් චන්ද්‍රසේන, රාජ්‍ය ඇමැතිවරුන් වන දුමින්ද දිසානායක, ශෙහාන් සේමසිංහ, ජන්න ජයසුමන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන කේ.එච්. නන්දසේන, කේ.පී.එස් කුමාරසිරි, උතුරුමැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්, ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ යන මහත්වරු ද, ගුවන් හමුදා නිලධාරීහු ඇතුළු පිරිසක් ද මේ අවස්ථාවට ජනාධිපතිවරයා සමඟ එක්ව සිටියහ. අඩුපාඩුකම් රැසක් පැවැති කණුගහවැව ග්‍රාමයේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම මඟින් ඔවුන්ගේ බලාපොරොත්තු ඉටු වූවා පමණක් නොව අනාගත පරපුරේ හෙට දවස වෙනුවෙන් නව ජීවයක් එක් කිරීමට සමත්ව තිබේ.

ජනතාව සමඟ නිතර ගැටී, ඔවුන්ගේ සිත් දිනා ගෙන යම් ප්‍රායෝගික වැඩපිළිවෙළකට ජනතාව නිරායාසයෙන් පිවිසෙන ආකාරයේ පෙළඹවීමක් ජනතාව තුළ ඇති කරවීමට හැකියාව තිබේ නම් සෑම ගමකම සෑම අයකුම රටේ සංවර්ධනයට ප්‍රායෝගිකව දායක වනු ඇත. එහිදී ජනතාව දිරිමත් කිරීම හා පහසුකම් සැපයීමත්, ඇගයීම් හා නියාමනත් මනාව ක්‍රියාත්මක විය යුතුව තිබේ. මේ තත්ත්වය හොඳින් හඳුනාගත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සිය දායකත්වය ගමේ සංවර්ධනය වෙනුවෙන් ලබා දී තිබේ. ගම්වාසීන්ගෙන් කිසිදු මුදලක් අය නොකර ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරන්නට පියවර ගෙන තිබීම සැබවින්ම ප්‍රශංසනීයය.

රටක සංවර්ධනය අපේක්ෂා කරන්නේ නම් එය ග්‍රාමීය මට්ටමේ සිට ආරම්භ කළ යුතුය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් ප්‍රමුඛ වත්මන් රජය ඒ තත්ත්වය මනාව අවබෝධ කර ගෙන තිබෙන බව පෙනේ. ඒ අනුව රට සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමය ග්‍රාමීය මට්ටමින් ඇරඹී තිබෙන අතර එවැනි දැවැන්ත වැඩපිළිවෙළකදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ලැබෙන දායකත්වය අතිශය ප්‍රශංසනීයය. රටේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටි ගුවන් හමුදාව අද වන විට ජාතික සංවර්ධනය වෙනුවෙන් දායක වී සිටීම සියලු පාර්ශ්වයන්ගේ ආදරයට, ගෞරවයට පාත්‍ර විය යුතුය.

**මහින්ද අලුත්ගෙදර**
ඡායාරූප
ජනාධිපති මාධ්‍ය අංශය,
ගුවන් හමුදා මාධ්‍ය අංශය




ගෙවතු වගා ව්‍යාපෘතියක්



සංඝරත්නයේ ආශිර්වාදය ලබමින් සහ ආගමික වතාවත්



සංඝරත්නය සමඟ පිළිසඳරක



ගම්වැසියන්ට බීමට ජලය







නිරීක්ෂණ චාරිකාවේ යෙදෙමින්







නව නිවෙසක්



පැරැණි නිවෙසක්

නොනැවතී හමා යනු පිණිස

නො: 35. ඩී.ආර්. විජයවර්ධන මාවත,
දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
kavi.dinamina@lakehouse.lk

## බිත්තරය

මේ රාජධානියේ
හිරු බසින්නේ නැත
සුදුමැලි ඕවලාකාර අහස යට
කිසිවකුට
ඇතුළු වීමක් හෝ
පිටවීමක් නැත
මෙහි මුහුදක් තිබුණත්
උදම් රළ නොනගී

ගොවිපොළෙහි
මඩුව නම් මන්දාකිණියේ
මුදුව දිදුලන
මේ බිත්තරයම සඳකි

හැන්දක බියකරු ගිගිරුම
ඇසෙන තෙක්
පළමු පැල්මේ ලා අකුණු සර
වදින තෙක්
එය සුරක්ෂිතය

Linda Pastan
පරිවර්තනය
හෙල්මලී ගුණතිලක



## නිහඬතාවය

සුළැඟිල්ල පවා අත හැරෙන
වෙළී ගිය නිහැඬියාවක
සමවැදින
උරහිසටත් වඩා තදින
පපුතුරට බර දැනුණි එදින
නික්මිය යුතුව තිබුණි ඈ හෙට
අතීතය මුහුදුබඩ දුම්රියට
යට කොට

බොහෝ වේලා කතා කොට
අවසානයක් ගත නොහැකි
තැන අපට
හිරු නිවී ගියා දුරක
තැඹිලි පෑ සිතිජයේ
නිසොල්මන් කෙළවරක

එරී ගිය මුත් පියවර
තබා ආවත් බෝ දුර
රළක් ඇවිදින්
පඩුපුල් වෙරළ කෙළවර
එය මකා යන හැටි
බලා සිටියා
රඳා ගන්නට බැරිව
දෙඅත් කැටිකොට
.............
දෑ වසක් ගතව ගිය
දුෂ්කරම අවධියක
ගගනතත් සයුරත් රළත්
හද පෙළන්නා වූ සමයක
ඈ නමින් මා ලියූ
සියලු කවි අළු කොට
දුර ඈත කඳු අතර
සිත රඳමි ඉඳහිට

ජීවිතය ලිහා ගන්නට
වැඩපලට එන විට
ඇගේ සැමියා හමුවෙනවා
දුම්රියේදී මට....!

අර්ජුන රණසිංහ

## ඇය හා ඉතා සමීපව සිටින පින්තූරයක් එවූ අයකුට

ඇත්තටම ඇය
කොයි තරම් නම්
ලස්සනද එතන
මං ළඟ හිදිනවාට වැඩිය

දාහයෙන් නිවී ගිය දෙකොපුල්
නීතියෙන් ලිහී ගිය කෙහෙරැල්
ප්‍රීතියෙන් පිපී ආ හසරැල්
පසුතලය පවා එහි කෙළිලොල්

කෙලෙස අමතක කරන්නද
ගෙවුණු කාලය මුළුල්ලේ
මුරුගසං වැසිවලටම
දිව යමින් උන්නා මිස
පුංචි හෙවනකවත් ඇය
තබන්නට බැරි වුණු බව

පැලැඳිය යුතුම නොවන්නෙද
කවර හෝ පිරිමි ප්‍රාණියකු
මේ ඉතා කෙටි ගමනෙහි
ගැහැනියක මුවගෙහි සිනහව

නන්නාඳුනන මිතුර
ස්තූතියි, නුඹට

ඇත්තටම ඇය
කොයිතරම් නම් ලස්සනද එතන

චින්තක සමන් හේරත්



## පරසතු කුසුමක්

ලොවට නොපෙනුන
රහස් නිම්නයක
නුඹේ සෙනහස
සැඟව යන්නැති

එහෙව් ප්‍රේමයක
කඳුළකින් සුපිපුණු
පරසතු කුසුමක්
ඒ නිම්නයේ
විකසිතව සැමදා
පවතිනවා ඇති

ප්‍රියාශා රන්වල

## මකරුන් මනඃකල්පිත නැති

හීනි ඇස් තවත් කුඩා කර
උන් එති සිනාලාගෙන
සෙනෙහසේ දෑත් දිගු කර

නොඅගනේද
රක්ත පෑ ධජයක
පීත තරු පොකුර

හදවත් විවර කර
වපුරන සිනා යායකි
හොඳ හිත ඉහළ අගයක
ණයකටත් සැහෙති
කහ දිලෙන සම යට
සඟවගෙන කොරපොතු ඇති

එළඹ ඇති ගිවිසුම්
එකකට එකක් නොදෙවෙනි
හීනි ඇස් මකරුන්
තව දුරටත්
මනඃකල්පිත නැති
ඉතිං උන්ටත් හැකිනම්
පිඹින්නට ගිනි.......???

හර්ෂණී මහත්මා ආරච්චි

## මේෂ

මේෂ කූටයක පැහැදුල්
විදුලි ලතා මෙන් කළුගල්
මතුයෙහි දිලියෙන සුරතල්
රූබරී මගේ

කොමල නයන යුග ඉඳුනිල්
කියූ පෙම් කතා මනලොල්
රුවන් ලිය මහද බැඳි කල්
අප්සරාවියේ

නුඹට පිදු පෙමට නිකැලැල්
තිළිණ වුණි දුකම හැමකල්
හද දවන වියෝ ගිනිදැල්
දරාගනු කෙසේ

සෙල් බිතක තබා රුවදුල්
කලත් පිය රජිඳු රැකවල්
මිදී සිහ ගිරෙන් සුවිසල්
පා තබනු වහා

කලා වැව් තෙරෙන් මනකල්
හෙළා සුරත රැඳි නිලුපුල්
වලා රොදක නැග දුහුලැල්
එන්න මා සොයා

අනුරාධා කොබ්බෑකඩුව





# කොරෝනා කාලේ කොළ තිත්

## කෙටි කතාව

දෑවසක දෙකක නිවාඩුවක් ඉන් පසු ඇඳිරි නීතිය සමඟම දින නියමයක් නැති රික්ත කාලයක් සේ මේ සමයං සමය උදා විය. ලදරම් බස් එකක් නැවතෙනවා වගේ රට ලෝකේ එහෙම නැවතෙනකොට ඕනෑම කෙනකුට, ඕනෑම තැනනට ගිහින් ගාල් වෙන්න තරම් කාලයක් තිබ්බා. මාත් ඉතින් බෝඩිම වහලා ගමට පා වෙලා ආවා. කොරෝනා කොයිතරම් භයානක ලෙස ලොව බිලි ගනිමින් තිබුණත් දිග වසන්තයක් හරි මොකක් හරි ලස්සනයි කියන්න පුළුවන් කාලයක් මගේ හිත ඇතුළේ ඉපදුණා. ඒක නවත්තන්න ටීවී නිව්ස්වල කිව්ව කොරෝනා මරණ ගාණටවත් ක්‍රමයෙන් රතු පාට වන කොරෝනා ලෝක සිතියමටවත් බැරි වුණා.

මම ගෙදර ආවම අඳින්න තිබ්බ ඇඳුම් ටික අතෑරලා පරණ ගවුම් අඳින්න ගත්තා. ඒවා පරණ වෙන්න, කබල් වෙන්න මම ගෙදර ගෙනත් ගොඩගහපු රෙදි. නයි ඉනිමං සෙල්ලමක නයෙක් දිගේ පල්ලම් බහින ලතාවට මාව පරණ කාලයකට ගිහින් වැටුණා. වැඩි කාලයක් ආපස්සට නෙවෙයි, අවුරුදු දෙක තුනකට වගේ.

මේ වෙද්දි ආගන්තුක බව මඟ ඇරිලා මටම ගෙදර වැඩ ටිකක් පංගරාර්තු වෙලා තිබ්බෙ ගෙවල් අතුගාන්න හවසට තේ හදන්න වගේ. හැම දේකටම ඇති තරම් කාලය තිබුණා. ඇති තරම් කියන්නේ වෙනදා කවර කවදාවත් තිබ්බෙ නැති තරම් කාලයක් හැමදේටම.

ෆේස්බුක් එකේ හැම යාළුවෙක් ඉස්සරහම පුංචි කොළ පාට තිත තිබුණා. ඉතින් දිගටම එෆ්බී ඔන් එකේ තියාගෙන හිටියා. හරියට මට නම් හිතුණෙ අපි ජීවතුන් අතර ඉන්න බව පෙන්නන්න මේ කොළ එළිය පත්තු කරන් ඉන්න ඕනෑ දෙයක් විදිහට.

මම එකපාරටම මගේ හිටපු හතර වැනි පෙම්වතා හොයාගෙන යන්න තීරණය කළා. එහෙම ගිහින් පුළුවන් වුණොත් පොඩ්ඩක් කොනිත්තලා මොකක් හරි විනෝදයක් ලබන්න ආසාවක් යටි හිතේ උලක් වගේ ඇනුණා. ඒකට හේතුවක් තිබුණා. මීට තුන් හාර මාසෙකට කලින් එයා බැන්දා කියලා ආරංචිය ආවා. අති අසාර්ථක පස් වැනි ප්‍රේමයත් ඉවර කරලා මම හිටියෙත් හිස්තැනක ඒ වෙනකොට. ඒත් මම එයාගෙ ෆේස්බුක් යාළුවෙක් නෙවෙයි. අපි වෙන් වුණේ ෆේස්බුක් අන්ෆ්‍රෙන්ඩ් කරලා. මම නම ගහලා හොයලා හොයලා එයා හොයාගත්තා. එයා මැද නම මුලට අරන් සිංහලෙන් නම ලියලා එකවුන්ට් එක වෙනස් කරගෙන හිටියා.

'Home sweet home' කියලා ෆොටෝ එකක් එක්ක මුලින්ම දාලා තිබ්බා ඒක නිකන් සාලෙක ඉඳන් ගහපු සෙල්ෆි එකක්. එයාගෙ නෝනා සැහැල්ලුවට කොණ්ඩෙ කඩාගෙන තුරුලු වෙලා වගේ හිටියා. ඒ ගොල්ලන්ගේ ගෙදර කෙහෙල් දලු පාට බිත්ති තිබ්බා. ටිකක් රළුවට රවුල වැවිලා අමුතු ලස්සනකට හිටියා එයා. ගොඩක් අය එකට ලව් රියැක්ෂන් දාලා තිබ්බා. එක යාළුවෙක් කෝ යකෝ මීටරේ පරතරේ? කියලා අහලා තිබ්බා. "තෙරුවන් සරණයි ඔය දෙන්නට" කියලා නැන්දා කෙනෙක්ද කොහෙද දාලා තිබ්බා.

මම එයාගෙ පරණ ෆොටෝ බැලුවා. මඟුල් පොටෝ ප්‍රී ශූට් ෆොටෝවලට පස්සෙ එහෙමට කියලා මොකුත් දාලා කරලා තිබ්බෙ නෑ.

බොලට දක්වා දිග දම් ගවුමක් ඇඳන් ඒක වට්ටිය වගේ වනාගෙන ඉන්න කෙල්ල ළඟ එයා හිටියෙ ඩෙනිමයි මල් මල් සර්ට් එකයි ඇඳන්. දිය ඇල්ලක් ළඟයි, රබර් වතු පාරකයි ඒ ගොල්ලො ප්‍රී ශූට් කරලා තිබ්බා. තොල් සිපගන්න වගේ ගොඩක් අනුරාගී ඉරියව් පෙන්නන්න තරම් ඒ ගොල්ලො දියුණු වෙලා තිබ්බෙ නෑ. ඒත් ඒ දෙන්නා හිටියෙ ටිකක් අමුවෙන් වගේ හරියට අපිට ඕනිවට ලව් කරන අම්බලන්ගොඩ රූකඩ දෙකක් වගේ.

මඟුලට නම් පොතේ හැටියට මුල් ඇඳුම ඇදලා උඩරට මනාලිට ගැළපෙන්න. කැතම කැතයි නිකන් ආභරණ ගොඩකුයි සී කුවින්ස් ගොඩකුයි වගේ. කැමරාකාරයත් ඒක තව බොම්බයි මොටයි කරලා. ඒ ෆොටෝවල කමෙන්ට්වලට උත්තර දෙනවා ඇරෙන්න වෙන වැඩක් කරලා නෑ වගේ කොරෝනා එනකන්.

ඒත් මම යාළු ඉල්ලීමක් යැව්වේ නෑ තාම. ආයෙ ඒක අනුමත නොකළොත් කියලා හිත හිතා හිටියා. අනික ගිය එව්වන්ගේ ආඩම්බර මොකට බලනවද, මම හිතුවෙ එහෙම.

අම්මයි මායි අද පෑන් කේක් හැදුවා. ඒත් ෆොටෝ අරන් ෆේස්බුක් එකේ දැම්මෙ නෑ. ඒත් ෆොටෝ එකක් ගත්තා. ඒ වෙනකොට ගොඩක් අය තමන් උයපු කොස්, දෙල්, අල බතල රෝල්ස් කට්ලට්, පැටිස් රූප බෙදාහදා ගනිමින් හිටියෙ. කෙනෙක් කොස් ඇට තම්බලා පොල් එක්ක රූපයක් දාලා තිබ්බා. ඒකට නම් කෙළත් ගිලුණා.

මම කොරෝනා ගැන අහුවෙන හැම පෝස්ට් එකක්ම ශෙයාර් කළා. ආන්ඩුවට බැන්නා. ඉදහිටක ආන්ඩුවට හොඳ කියන ඒවත් බෙදා ගත්තා වැරැදීමකින් වගේ. ඒකට එයා ඒවා මොකුත් නෑ. විහිළු විතරයි ඇඟ බේරගන්න වගේ තමයි හැමදේම. ඉදලා හිටලා දළදා වහන්සෙගේ පිහිටින් අපේ රට කොරෝනා උවදුරින් නිදහස් වේවා වගේ පෝස්ට් පවා ශෙයාර් කරලා තිබ්බා. මට හිතුණා ඒවාට සාදු සාදු කියලා කමෙන්ට් එකක් දාන්න.

මම අද කණ්ණාඩියෙන් මූණ බැලුවා හරියට වැඩට යන දවසක් වගේ. දවස් ගාණකින් ලිප්ස්ටික් ගෑවෙ නෑ අයිබ්‍රෝ හැදුවේ නෑ . කිසිම මේක්අප් එකක් නැතිව මගේ ඇත්ත මූණ කෘත්‍රිමයි වගේ කියලා මටම හිතුණා. ළා රෝස පාට තොල් සනව වැවීගෙන එන ඇහි බැමි. නානවා මූණ හෝදනවා විතරයි මේ ටිකේ. දවසක් දෙකක් නම් යන්තන් පිපිඤ්ඤා පෙති දෙකක් නම් ඇස් උඩ තියාගෙන හිටියා. කාලයක් අපි කෘත්‍රිමකම ඇත්ත විදිහට පිළිඅරන් හිටියම ආයෙ ඇත්තම ඇත්ත මූණ පේන්නෙ මළ විකාරයක් වගේ. කොහොම වුණත් මේ කර කියාගන්න දෙයක් නැතිකම වහගන්න ලස්සන වචනයක් අපිට තියනවා 'නැචුරල් බියුටි' කියලා.

සැලූන් වහපු එකට පිරිමි එක එක කතා හදලා පෝස්ට් වැහි වැහුණා. සමහරු කියලා තිබ්බා සැලූන් වහපු එකෙන් ගෑනු ඉබේම ගෙවල්වලින් එළියට බහින එක අඩු වෙනවා කියලා. එහෙම එකකට "සැලූන් නැතිව ගෑනු ඔය හැටි වෙනස් වෙනව නම් කොච්චර හොඳයිද? එතකොට වෙනම චරිතයක් වෙලා පරණ කොල්ලන්ව මඩවන්න පුළුවන්නෙ" කියලා මම දාපු කමෙන්ට් එකකට ලයික් හැටකුයි ලව් පහළොවකුයි 'හා හා' රියැක්ෂන් එකසිය එකක් ඇවිත් තිබ්බා.

අද නැගිටින කොට අහස බරවෙලා. ළා ඉර එළියක් එක්ක තිබ්බෙ මුස්පේන්තු පාටක්. මම ඇදේ ඉඳන්ම ඩේටා ඔන් කළා. මුලින්ම දැක්කෙ ජීවන්ති අක්කා දාපු ෆේස්බුක් පෝස්ට් එක.

"ජීවිතේ කෙටියි. සෙමින් සිපගන්න. උමතුවෙන් මෙන් සිනාසෙන්න. සැබෑ ලෙස පෙම් කරන්න. ඉක්මනින් සමාව දෙන්න."

-පාවුලෝ කොයියෝ

කළු පසුබිමක සුදු අකුරෙන් තිබ්බ ඒ වදන් පෙළ උළු කැටයක් හිල් වෙලා ගලන එළි ඉරක් වගේ දවස ආරම්භ කරන හේතු පාඨය වුණා. මම ඇඳෙන් පැන්නේ ජීවිතේ කෙටියි කියලා කෑ ගහගෙන හිතින්.

මම ආයෙත් මිතුරු ඇරයුමක් එයාට යවන්න තීරණය කළා. ඇත්තටම අපි බොහොම ටික කාලයයි ආදරේ කළේ. කිසි හැල හැප්පිල්ලක් නැති අඹරැල්ල ගෙඩියක කොස්ස ළඟ තියනවා වගේ කුඩා රහක් තිබ්බ කාලයක් ඒක. බෝඩිං ගෙදරක ඇති වන බැඳීමක් වගේ ඕනම වෙලාවක දාලා වෙන තැනකට යන්න පුළුවන් එකක් ඒක. ඒත් කසාද බඳිනවා වගේ දේවල් නොහිතුවට මට හිතුණේ එයා කවදාවත්ම බඳින්නෙ නැති කව්බෝයි කොල්ලෙක් වෙමින් යන ගමනක ඉන්නවා කියලා. එවාගෙ අච්චුවට හරියන්න ටික කලක් කව්බෝයි කෙල්ල වෙන්න මට තිබ්බෙ. පුදුම නිදහස් ජීවිතේක පිනුම් ගහන බවක් තමයි පෙන්නුවෙ. එහෙව් එකෙක් මෙහෙම රෙදි හත්පොටක් ඔතාගෙන දිලිසෙන නිලමේ හැට්ටයක් ඇඳන් ඉන්න කොට අර කොනිත්තන ආශාව තවත් උඩු දිව්වා. පපුව ඇතුළෙ පුපුරු ගැහුවා.

කොහොම වුණත් එදා දවස ඒ තීරණේ එක්ක උඩ යට යමින් ගත කළා හවස් වෙනකන්. හවස අම්මා පන්සල් යන්න කතා කළා.

මම ටිකක් පරණ ගවුමක් අඳින්න තෝරගත්තා. ඒක සුදු පසුබිමක දෙකේ කාසි විතර කළු බෝල තියන රෙද්දකින් මහපු එකක්. ඒක එච්චර ඇඟට ඇලිලා හැඩ නිල පෙන්නන එකක් නෙමෙයි. බෝට්ටු කර අත් වැලමිටට පොඩ්ඩක් යටට. ඒ ගවුම ගන්න මට බල කෙරුවෙ මේ එකකටවත් වඩා මේ පාට සංකලනයට කිසිම සම්බන්ධයක් නැති සිවුරු පාට පටියක් කර වටේ විතරක් නෙමෙයි සායෙ වාටියටත් අල්ලලා තිබ්බ එක. මම ඒක ඇඳගෙන මිදුලේ සේපාලිකා මල් කඩලා වට්ටියක අහුරගෙන එතනම ඉඳන් සෙල්ෆියක් ගැහුවා. බිම වැටිච්ච සේපාලිකා මල් එක්ක මගේ ගවුම කලවම් වෙලා අමුතු ලස්සනක් එකේ තිබ්බා. සෙල්ෆිවල කොහොමත් අමුතු ලස්සනක් එන්නෙ බිම පේන හින්දා. ගවුමේ පාටයි, බිම වැටුණු තැඹිලි නටුවක් තියන මලත් එක්ක මේක චිත්‍රයක් වගේ වුණා. මම ඒක ටක් ගාලා ෆේස්බුක් අප්ලෝඩ් කළා 'පන්සල් යන්න' කියලා මාතෘකාවක් දාලා. ඒ එක්කම අරයගෙ පේජ් එකට ගිහින් ඇඩ් ෆ්‍රෙන්ඩ් ක්ලික් කළා. එතකොට වෙලාව තුනයි තිස්පහයි.

ඒ වේගෙන්ම ඩේටා ඕෆ් කරලා ලාච්චුවට දැම්මා. කොහොමත් අම්මා කලින් පන්සල් යද්දි නම් ඔය බඩකඩේත්තුව ගෙදර දාලා මිසක් එන්න එපා කියලා තිබ්බෙ.

පන්සල් ගමන ඉවර කරලා ගෙදර එද්දි හඳ පායලා. හතේ ප්‍රවෘත්ති යනවා. මම ගවුමෙන්ම දවස ඉවර කරන්න හිතාගෙන ආවේ. අත් හෝදලා මුලින්ම කළේ කාමරේට ගිහින් ෆෝන් එක ඔන් කරපු එක. එක පාරටම ඩේටා ඔන් කළාම රතු පාට ෆේස්බුක් පණිවිඩ ටිංටිං ගාලා වැටුණා. එකසිය ගාණක්ද කොහෙද. මගෙ ෆොටෝ එකට ලයික් එකසිය පනහයි, ලව් හැටයි.

කොමෙන්ට්ස් ගණන් කරන්න බැරි තරම්. 'සේපාලිකා මලයි සුදු පාට මීදුමයි' කියලත් දාලා තිබ්බා එකෙක්. මේ හදිස්සි ප්‍රතිචාර අතර හැංගිලා තිබ්බා එයා මගේ ඇරයුම පිළිගත්ත බව කියන රතු දැන්වීම. මම ඒ සැණින් බැලුවෙ එයා ඔන්ලයින් ඉන්නවද කියලා. නියමයි, එයා ගාව පුංචි කොළ තිත වැටිලා තිබ්බා.

මම 'ස්තූතියි' කියලා හිනා මූණක් යැව්වා.

තත්පර පහක් යන්න ඇති එයත් හිනා මූණක් එව්වා.

"කොහොමද? මාව මතකද?"

"ඔව් ...ඒ ගවුම මතකයි තාම."

"මොන ගවුමද?"

"ඔය ඇඳන් ඉන්න බෝල බෝල ගවුම. මම ඔයාව මුලින්ම දකිනකොට ඔයා ඇඳන් හිටියේ ඒක."

"අනේ. මට එහෙම මතකයක් තිබ්බෙ නෑ."

ඒක කොටලා මම මගේ ගවුම දිහා බැලුවා. ආයෙත් කණ්ණාඩියෙන් හැඩ බැලුවා. වටයක් කැරකුණා.

ආයෙත් ෆෝන් එක ඇරගත්තා.

"මම නම් ඔයා මතක තියාගත්තේ වෙන විදිහකට. ඒක සුවඳක්, ඔයාගෙ කොණ්ඩෙන් ආවෙ ඒ සුවඳ. මම දන්න කියන කාගෙවත් ඔළුවකින් එහෙම සුවඳක් හැමුවෙ නෑ. මම හිතුවෙ ඒක ඔයාටම ආවේණික ඔයාගෙ සුවඳ කියලා. සුවඳක් වචනවලින් විස්තර කරන්න බෑ අයියෝ. ඒත් දවසක් චතුරංගයා මගේ කොම්පියුටර් එගේ අවුලක් වෙලා මම පුටුවෙ ඉද්දිම ඒක හදන්න පාත් වෙනකොට උගේ ඔළුව හරිය මගේ මූණට කිට්ටු වුණා. මෙන්න යකෝ ඔයාගෙ සුවඳ එයාගෙනුත් හමනවා. ඒක පිරිමි හෙයාර් ක්‍රීම් ජාතියක සුවඳක් කිව්වේ චතුරංග. මම විලවුන් කඩ පීරලා හොයාගත්තා ඒ කොණ්ඩ ක්‍රීම් බඳුන ටික කලක් මගෙ ළඟ තිබ්බා. ඊට පස්සෙ මම යාළු වෙච්චි කෙනාට (ඒ කියන්නෙ ඔයාට පස්සෙ) දුන්නා මගේ පළමු තෑග්ග විදිහට. එයාට මට ක්‍රීම් දෙකයි දෙන්න වුණේ. ඒත් මම ඉස්සරහටත් යාළු වෙන හැම කොල්ලන්ටම ඒවා අරන් දෙනවා. සමහර විට ඒ ක්‍රීම් ජාතියෙ සුවඳ, බෝතලේ පාට ටික ටික වෙනස් කරයි. ඒත් ඒවට මම හුරුවෙයි, මට මඟඇරෙන එකක් නෑ. අන්තිමට ඔයා ක්‍රීම් බෝතලයක් වුණා, මට ඕනිම කඩේකින් ගන්න පුළුවන්, බොරැල්ලෙ, මරදානෙ, බිබිලේ, හොරොව්පතානේ ඔය කොහේ කොතන ගියත්. "

ඒ හැල්ල ලියලා සෙන්ඩ් කළාට පස්සෙ මට අමුතු සැහැල්ලුවක් දැනුණා.

මම බෝල බෝල ගවුම ඇඳන් කැරකුණා. පියාපත් ආවා. ෆේස්බුක් පාට නිල් පියාපත්. මම පුළුවන් උඩටම ඉගිලුනා? අහසක. පහළ ලෝකය දිහා බැලුවම පෙනුණෙ රතු සහ කොළ තිත් තිත් ගොඩක්. රතු තිත් කොරෝනා තිත්. ඒවා අඩුවෙන් බස්නාහිරට වැඩියෙන් වෙන්න පැතිරිලා. කොළ තිත් චැට් තිත්. ඒවා රට පුරාම පැතිරිලා. හරියට රතු කොළ පබලු ගොඩක් හැලිලා වගේ ලෝකයම. රතු නිවෙනවා පත්තු වෙනවා කොළ දිලිසෙනවා. සමහර ඒවා නිමෙනවා. අලුත් ඒවා පත්තු වෙනවා. අවදානම හඟවන සයිරන් නළා හඬ. වෙන්ටිලේටර්වල ක්‍රීං ක්‍රීං සද්ද. පණිවිඩ එනවා කියන ටිං ටොන් සද්ද. අකුරු අමුනන ටයිප් රයිටර් සද්ද එකට මුහු වෙනවා. මිනිස් කටහඬක් නැති ලෝකයක් මේක. හැමෝම ඩිජිටල් තිරවල කොටනවා, අරිනවා, වහනවා. ඒ සියුම් සද්ද එකතු වෙලා මහා ඝෝෂාවක් වෙනවා. බටහිර චිත්‍රපටියක ලෝකය විනාශ කරන්න එන දැවැන්ත තිරිසන් සතෙක් වගේ එකෙක් මහ පොළොව මත අඳුරේ වර්ධනය වෙනවා, ඒ තිරිසන් යෝධයා ටික ටික ලොකු වෙනවා. කොළ රතු එළිවලට උගේ දතක්, නියපොත්තක්, ලොම් ගහක් පෙනුණට හරියටම හිතාගන්න බෑ ඒකා මොනතරම් විශාලද කියලා. ඊට පස්සේ ඌ කන් බිහිරි කරන ගෙරවිල්ලක් නගනවා. ඒ සද්දෙට මම මගේ කන් අත්වලින් වහ ගන්නවා. මගේ අත්තටු දියවෙනවා. අන්ධකාර අකාසෙන් බිමට වැටෙනවා අඳුරු දෝනාවක් දිගේ පහළට ඇදී එනවා වගේ. පුංචි කොළ පාට තිත් බොඳවෙනවා, දියවෙලා යනවා.

සුසන්ත මූණමල්පේ

# කොට්ඨාස නිර්ණය කිරීමෙන් පසු කඩිනමින් පළාත් ඡන්ද තියන්න රජය තීරණය කළා

ඇමැති, සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය, **කෙහෙලිය රඹුක්වැල්ල**

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

මනාප ක්‍රමය ඉවත් කර, සමානුපාතික හා කොට්ඨාස ක්‍රමයේ නියෝජනවල ප්‍රතිශතය මෙන්ම, කොට්ඨාස නිර්ණය කෙරෙන ආකාරය පිළිබඳ තීරණයකට එළැඹීමෙන් පසු හැකි ඉක්මනින් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට කැබිනට් මණ්ඩලයේ අවධානය යොමු වූ බව ජනමාධ්‍ය ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පැවසීය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් පැහැදිලි තීන්දුවක් ගැනීමට කැබිනට් මණ්ඩලය කටයුතු නොකිරීමෙන් පෙනී යන්නේ තවදුරටත් පළාත් සභා මැතිවරණය කල් යාමක්දැයි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (6) පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

'පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය පැහැදිලි තීන්දුවක් ගෙන තිබෙනවා. ඒ තමයි අපේ මැතිවරණ ප්‍රකාශය අනුව, මනාප ක්‍රමය ඉවත් කරන්නත්, වසර 15ක් තිස්සේ සාකච්ඡා වූ සියයට 70, 30 නියෝජනයේ එකඟතාව සම්බන්ධයෙන් හා කොට්ඨාස නිර්ණය කිරීම සිදුකරන්නේ කුමන ආකාරයට ද යන්න සම්බන්ධයෙන් කඩිනමින් තීන්දුවකට පැමිණ හැකි ඉක්මනින් පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතුයි කියන ස්ථාවරය සම්බන්ධයෙනුත් තමයි කැබිනට් මණ්ඩලය පෙරේදා (5) සාකච්ඡා කළේ' යනුවෙන් ද ඇමැතිවරයා එහිදී පැවසීය.

මෙහිදී මාධ්‍යවේදීන් මතුකරන ලද ප්‍රශ්න කිහිපයකට ඇමැතිවරයා මෙසේ පිළිතුරු දුන්නේය.

**මාධ්‍යවේදියා-** දිස්ත්‍රික් කමිටු රැස්වීම්වල මාධ්‍ය ආවරණ කටයුතු අවහිර කර තිබෙනවා කියලා ජාතික පුවත්පතක ප්‍රවෘත්තියක් පළ වුණා. යම් කිසි හේතුවක් මත ද දිස්ත්‍රික් කමිටුවල රැස්වීම් ආවරණයට මාධ්‍යයට තහංචි වැටෙන්නේ?

**ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා-** අප එවැනි තහංචියක් දමා නැහැ. උදාහරණයක් විදිහට අපි ඒ රැස්වීම්වල කාල වේලාව පැයකට සීමා කරනවා අනෙකුත් කටයුතු නිසා. එවැනි අවස්ථාවල යම් යම් බාධාවන් ඇතිව තිබෙනවා. එහෙත් ඉන්පසුව සභාපති සහ අදාළ නිලධාරීන්ට පුළුවන් මාධ්‍යවේදීන් අමතන්න. ඒ හැර රජයේ ප්‍රතිපත්තියක් විදිහට කිසිම වාරණයක් නෑ.



**මනාප ක්‍රමය ඉවතට සමානුපාතික හා කොට්ඨාස ක්‍රමයේ නියෝජනයක්**

**මාධ්‍යවේදියා-** තව දින කිහිපයක් පමණයි සිංහල හා හින්දු අලුත් අවුරුද්දට තිබෙන්නේ. මේ වනවිට සහල් මිල විශාල ලෙස ඉහළ ගිහින්. මුංඇට වගේ ධාන්‍ය වර්ගවල මිල ගණන් විශාල ලෙස ඉහළ ගිහින් තිබෙනවා. මේ උත්සව සමයේ රජයට ජනතාව වෙනුවෙන් ලබා දෙන්න පුළුවන් සහනය කුමක්ද?

**ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා-** මේ කතාව වැරදියි. මේ වනවිට සතොස, සමුපකාර අලෙවිසල්වල රුපියල් 97ට, 98ට සහල් ගැනීමට තිබෙනවා සුලබව. ඒ වගේම, සුපිරි වෙළෙඳසල්වලත් මේ වනවිට එකඟතාවයකට පැමිණ තිබෙනවා.

**මාධ්‍යවේදියා-** ජල සම්පාදන මණ්ඩලයේ සේවකයන්ගේ වැටුප් 25%කින් වැඩිකරන යෝජනාවක් විෂය භාර ඇමැති වාසුදේව නානායක්කාර මහතා ඉදිරිපත් කර තිබුණා. ඒ සඳහා ඇමැති මණ්ඩල අනුමැතිය ලැබී තිබෙනවාද?

**ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල-** එය නිරීක්ෂණය සඳහා මුදල් අමාත්‍යාංශයට යොමු කළා.

---

**කැබිනට් තීරණ**

## තේ වගාවට දෙන සහනාධාර මුදල් සංශෝධනය වෙයි

තේ වගාව සඳහා උනන්දු කිරීම පිණිස දැනට ගෙවනු ලබන සහනාධාර මුදල් සංශෝධනය කිරීමට වැවිලි ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් මණ්ඩල අනුමැතිය හිමි වී තිබේ.

ඒ අනුව, තේ නැවත වගා සහනාධාර මුදල හෙක්ටයාරයකට නව වගා සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපියල් 400,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කෙරේ.

2019 වර්ෂයේදී මුළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 300ක් වූ අතර, ඉන් 75%ක් වන කිලෝග්‍රෑම් මිලියන 225ක් පමණ නිෂ්පාදනය කර ඇත්තේ කුඩා තේ වතු අංශයයි. තේ නිෂ්පාදනය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යෑම සඳහා කුඩා තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

තේ නැවත වගාව මගින් ආදායම් ඉපැයීම සඳහා වසර 4ක පමණ කාලයක් ගත වීමත්, ඒ සඳහා වැය වන පිරිවැය අධික වීම නිසාත් නැවත වගාව සහ අලුතින් වගාව සඳහා දක්වන උනන්දුව ප්‍රමාණවත් නොවන බැවින් 2025 වර්ෂය වන විට තේ කිලෝග්‍රෑම් මිලියන 360ක නිෂ්පාදන ඉලක්කය අත්කර ගැනීම සඳහා ප්‍රමාණවත් දිරිගැන්වීම් ලබා දිය යුතුව තිබේ.

## ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය එයි නව සංචාරක පනතකට කෙටුම්පතක්

නව සංචාරක කටයුතු පනතක් සඳහා කෙටුම්පතක් සකස් කිරීමට කැබිනට් අනුමැතිය හිමිවිණි. එමගින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය ඒකාබද්ධ කර 'ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය' නමින් නව අධිකාරියක් ස්ථාපිත කිරීමත් සිදු කෙරේ. සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මෙම යෝජනාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ.

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත අහෝසි කෙරෙනු ඇත. 2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන අනුව සමස්ත සංචාරක අංශය ප්‍රධාන ආයතන 4කට බෙදා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ස්ථාපිත කර ඇත.

එහෙත් සමස්ත සංචාරක අංශය ආයතන 4කට බෙදා තිබීම හේතුවෙන් එම ආයතන සම්බන්ධීකරණය කිරීමේදී ගැටලු පැන නැගීම හා සම්පත් නාස්තිය වැනි අයහපත් බලපෑම් සිදු වන බව පෙනී ගොස් තිබේ. ඒ අනුව, මෙම නව සංචාරක කටයුතු පනත සකස් කරනු ඇත.

## ජාතික ලේඛනාගාරයට ඩිජිටල් කෝෂ්ඨාගාරයක්

ජාතික ලේඛනාගාරය සඳහා ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කිරීමට කැබිනට් අනුමැතිය හිමිවී තිබේ.

මෙම යෝජනාව සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, එම ඩිජිටල් ලේඛනවල විශ්වාසවන්තභාවය සහ අව්‍යාජභාවය සහතික කිරීම සඳහා ඩිජිටල් සංරක්ෂණය පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතිය අනුගමනය කරමින් ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කෙරෙනු ඇත.

1640 වර්ෂයේ සිට ලන්දේසි හා බ්‍රිතාන්‍ය පාලන සමයන්හි සහ නිදහසින් පසු නිර්මාණය වූ වටිනා අධිලේඛන සහ 19 වැනි ශත වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කළ පුවත්පත් ඇතුළු සියලුම ප්‍රකාශනවල නීතිමය තැන්පතුව ජාතික ලේඛනාගාරයේ තැන්පත් කර ඇත. මෙයට දෛනිකව විශාල ලේඛන තොගයක් එකතු වෙමින් පවතින අතර, ඒ තුළ ඩිජිටල් ප්‍රකාශන හා ලේඛන, ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන, වෙබ් අඩවි සහ විද්‍යුත් තැපැල ආදිය ද ඇතුළත් වේ.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවට අනුමැතිය

2021/2022 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ආහාර ද්‍රව්‍ය සැපයීම පිණිස කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා අධිකරණ ඇමැති අලි සබ්රි මහතා ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් අනුමැතිය හිමි වී තිබේ.

2021/2022 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ආහාර ද්‍රව්‍ය සැපයීම පිණිස කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවා ඇති අතර ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි 2021 අප්‍රේල් මස 16 සිට 2022 අප්‍රේල් 15 දින දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා තෝරා ගත් සැපයුම්කරුවන් වෙත අදාළ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සිදු කෙරේ.

**බුද්ධිකා සහ සිතාරා**

---

## 'බත්-කරි Indicator' අද එළිදක්වයි

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලාංකිකයන්ගේ ආහාරවල මිල ගණන් ඉතා පහසුවෙන් හඳුනා ගැනීම සඳහා වන 'බත් Curry Indicator' අද (7) එළිදැක්වේ.

Advocata ආයතනය හඳුන්වාදෙන බත් - කරි Indicator" එළි දැක්වීමට සමගාමීව Advocata ආයතනයේ යූ ටියුබ් සහ ෆේස්බුක් පිටුවල එය සජීවී ලෙස විකාශය කිරීමට ද පියවර ගෙන තිබේ.

සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ උද්ධමනය අඩු අගයක පැවතිය ද ආහාරවල උද්ධමනය පසුගිය වසරට සාපේක්ෂව ඉහළ ගොස් තිබෙන අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයට අනුව, 2020 ජනවාරි සිට 2021 ජනවාරි දක්වා කාලය තුළ සමස්ත මිල ගණන් සියයට 3.7කින් ඉහළ ගිය නමුත් ආහාර උද්ධමනය සියයට 5.9කින් ඉහළ ගොස් තිබේ.

මෙය මහජනයාගේ අවධානයට ලක් විය යුතු කරුණක් වන නමුත්, කහ සහ මුං ඇට වැනි ද්‍රව්‍යවල මිල ඉහළ නැඟීම පිළිබඳ පමණක් බොහෝ විට අවධානය යොමුවන අතර, ශ්‍රී ලාංකිකයන් රසවත් ආහාර වේලක වටිනාකම (බත් සහ ව්‍යංජන පිඟානක්) නිතරම අගය කරන නමුත් රසවත් ආහාර වේලක් සකස් කර ගැනීමට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල පිරිවැය සාකච්ඡා කිරීම බොහෝ දුරට දැක ගත නොහැක.

'බත් කරි indicator' යනු සියලුම ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ ආහාරවල මිල ගණන් හඳුනාගත හැකි දර්ශකයක් වන අතර Advocata ආයතනයේ 'බත් Curry Indicator' (BCI), 'ද ඉකොනොමිස්ට් (The Economist magazine) සඟරාවේ' සුප්‍රකට 'බිග් මැක්' දර්ශකය (Big Mac Index) ම වෙනත් මුහුණුවරකින් එළිදක්වීමකි. එය හුදෙක් ශ්‍රී ලංකාවේ එදිනෙදා පරිභෝජනය කරන සීමිත ආහාර භාණ්ඩ ප්‍රමාණයක (භාණ්ඩ කූඩයක) මිල ගණන් නිරීක්ෂණය කරන අතර, කාලයත් සමඟ ප්‍රධාන ආහාර මිල ගණන් කොතරම් දුරට වෙනස් වී ඇත්ද යන්න පිළිබඳ දිශානතියක් සපයන බව Advocata ආයතනයේ පර්යේෂණ කළමනාකාරිනී අනීතා වරුසවිතාරණ මහත්මිය පවසයි. BCI ("බත් කරි Indicator') එළි දැක්වීමේ අවස්ථාවට එම දර්ශකය නිර්මාණය කිරීම සහ එම දර්ශකය ප්‍රතිපත්ති විශ්ලේෂණයේ දී භාවිතා කිරීමට ඇති හැකියාව සහ විභවය පැහැදිලි කිරීම පිළිබඳ විද්වත් සාකච්ඡාවක් ද පැවැත්වෙන අතර, ආර්ථික විශේෂඥ දෙශාල් ද මෙල්, ආර්ථික පර්යේෂක රෙහානා තව්ෆීක් සයින් සහ Advocata සමීක්ෂණ පපර්යේෂක නකියා ෂිරාස් මහත්ම මහත්මීහු සහභාගි වෙති.

මෙම සාකච්ඡාව Advocata ආයතනයේ පර්යේෂණ කළමනාකාරිනී අනීතා වරුසවිතාරණ මහත්මිය මෙහෙයවයි. Advocata Institute යනු ශ්‍රී ලාංකික ස්වාධීන ආර්ථික ප්‍රතිපත්ති සම්පාදන ආයතනයක් වන අතර ශ්‍රී ලංකාව තුළ නිදහස් සමාජයක් බිහිකිරීම උදෙසා යෝග්‍ය ප්‍රතිපත්ති, අදහස් ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පවත්වයි.

## අලුතින් 10,500ක් රේගුවේ ඊ-ලියාපදිංචි ලබති

**නුවන් හෙට්ටිආරච්චි**

ශ්‍රී ලංකා රේගුවේ නව ඊ-ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ ආයතන සහ පුද්ගලයන් 10,500ක් ලියාපදිංචි වී තිබේ.

ශ්‍රී ලංකා රේගුවේ දැනට පවතින භාණ්ඩ ප්‍රවාහනය විධිමත් සහ සුරක්ෂිත කිරීම සඳහා මෙම විද්‍යුත් ලියාපදිංචිය ආරම්භ කර ඇති බවත් නව යන්ත්‍රණයෙන් රේගු ලියාපදිංචිය අනිසි ලෙස භාවිතය තුරන් කිරීම, නීත්‍යානුකූල වෙළෙඳාමට පහසුකම් සැලසීම, ඵලදායී ලෙස දත්ත කළමනාකරණය සහ කඩදාසි භාවිතය අවම කිරීම යන ප්‍රතිඵල රේගුව අපේක්ෂා කරයි.

2020 ඔක්තෝබර් 31 වැනිදායින් මෙම ලියාපදිංචිය අවසන් කිරීමට නියමිතව පැවතුණද කොවිඩ් 19 දෙවැනි රැල්ල හේතුවෙන් එම දිනය නොවැම්බර් 14 වැනිදා දක්වා දීර්ඝ කළ බවත් මෙම කාලසීමාව තුළ ද සිය ලියාපදිංචිය තහවුරු නොකළ, එතෙක් රේගුව සමඟ ගනුදෙනු කළ තවත් සමාගම් සහ පුද්ගලයන් 1000ක පමණ ලියාපදිංචිය ස්වයංක්‍රීයව අක්‍රිය වී ඇති බවත් ශ්‍රී ලංකා රේගුව සඳහන් කරයි.

## පාම් ඔයිල් ආනයනය තහනම් කරන ගැසට්ටුව කාලීන අවශ්‍යතා මත වෙනස් වේවි

ඇමැති **කෙහෙලිය රඹුක්වැල්ල**

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

පාම් ඔයිල් ආනයනය තහනම් කිරීම සඳහා නිකුත් කිරීමට නියමිත ගැසට් නිවේදනයේ කාලීන අවශ්‍යතා මත යම් වෙනස්කම් සිදු වීමට ඉඩ ඇති බව ජනමාධ්‍ය ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක, ආචාර්ය රඹුක්වැල්ල මහතා පැවසීය.

මෙම ගැසට් නිවේදනය සම්බන්ධයෙන් ඇමැතිවරුන් අතර විවිධ මත පවතින බවත්, එහෙයින් බොහෝ දුරට මෙම වෙනස්කම් සිදුවීමට ඉඩ ඇති බවත් ඇමැතිවරයා කියයි.

ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (6) පැවති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු ප්‍රශ්නයක් යොමු කරමින්, පාම් ඔයිල් ආනයනය තහනම් කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගෙන ඇති තීරණය හේතුවෙන් හේතුවෙන් වෙළෙඳපොළේ පොල් තෙල් මිල විශාල ලෙස ඉහළ යාමට හේතු වන්නේ නැතිදැයි විමසූ අවස්ථාවේදීය.

එසේම, ආහාරවල අන්තර්ගත විය යුතු 'ඇෆ්ලටොක්සින්' රසායනිකයේ ප්‍රමාණය සම්බන්ධයෙන් රජයේ පාර්ශ්වයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මාධ්‍යවේදියකු නැඟූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇමැතිවරයා පැවසුවේ, ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ රජයේ අවධානය නියත වශයෙන්ම යොමුව තිබෙනවා පමණක් නොව, මෙරටට ගෙන්වන පොල්තෙල් හා සම්බන්ධව යම් යම් රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ වී ඇත්නම් ඔවුන් සම්බන්ධයෙන් ද ක්‍රියාමාර්ග ගන්නා බවයි.

'පැහැදිලිවම මේ ප්‍රශ්නය එහෙන් මෙහෙන් අතගා විසඳා ගන්න පුළුවන් ප්‍රශ්නයක් නෙවෙයි. ඒ වගේම, එක දෙයක් මෙහිදී මතක තියාගන්න ඕනෑ. මේක උන්හිටි ගමන් ආව එකක් නෙවෙයි. අවුරුදු ගණනක් තිස්සේ තිබූ එකක්. සමහර විට කූට ව්‍යාපාරිකයන්, වෙළෙන්දන් කර ගෙන ගිය වැඩපිළිවෙළක්. අපි සතුටු වෙනවා එක පැත්තකින් මේ මොහොත වනවිට. මේක කොහෙන්ද ආවේ කියන එකට වඩා වැදගත් වෙන්නේ මේක දැන් සමාජය ඉදිරියට ඇවිත් තිබීමයි. එය එළියට ඇවිත් තිබෙනවා.

ඒ නිසා මේ සම්බන්ධව සම්පූර්ණයෙන් සවිස්තරව කටයුතු කිරීමට රජය තීන්දු කර තිබෙනවා. මේ නිසා ඒ සම්බන්ධව යම් යම් තීන්දු ගන්නත් තීරණය කර තිබෙනවා. රජයක් ලෙස ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව නියත වශයෙන් ම අවධානය යොමුව තිබෙනවා' යනුවෙන් ද ඇමැතිවරයා පැවසීය.

## දකුණු අප්‍රිකාව තුළ ශ්‍රී ලංකා තේ ප්‍රචලිත කිරීමට වැඩපිළිවෙළක්




**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකා තේ සඳහා අන්තර්ජාතික මට්ටමින් පවතින ඉල්ලුම තව දුරටත් ඉහළ නැංවීම සඳහා දකුණු අප්‍රිකාව තුළ අපේ තේ ප්‍රචලිත කිරීමට පියවර ගෙන තිබේ.

"ලංකා තේ නිරූපණ හා රස බැලීමේ" උත්සවයක් දකුණු අප්‍රිකාවේ බෲක්ලින් සාප්පු සංකීර්ණයේ දී පැවැති අතර එහිදී, තේ අලෙවිකරුවන් නියෝජනය කරමින් දකුණු අප්‍රිකාවේ ප්‍රමුඛ පෙළේ ලංකා තේ සන්නාම ද්විත්වයක් වන 'ඩිල්මා' සහ 'බැසිලූර්' ඔවුන්ගේ නවතම සහ දැනට පවත්නා නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා දූත කාර්යාලය සමඟ අත්වැල් බැඳගෙන ඇත.

රුසියානු තානාපති ඉල්යා රාගචෙෆ්, ඉරාන තානාපති මෙහඩි අගා ජෆාරි සහ මොරිෂස් හි මහ කොමසාරිස් (ආචාර්ය) ප්‍රකාමාර්ජිත් විජේලච්මන් මහත්වරුන් විශේෂ ආරාධිත අමුත්තන් ලෙසින් එම අවස්ථාවට සහභාගි වී තිබෙන අතර ශ්‍රී ලංකා තේ වලට ප්‍රිය කරන බොහෝ පිරිසක් ද එම අවස්ථාවට සහභාගීව, විවිධ ප්‍රභේදයන්ගේ ලංකා තේ රස බැලූ බවද විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

දකුණු අප්‍රිකාවේ තේ පරිභෝජනය සාමාන්‍යයෙන් වසරකට මෙට්‍රික් ටොන් 27,000 පමණ වන අතර, එරට සමස්ත තේ ඉල්ලුමෙන් සියයට 10 ක ප්‍රමාණයක් සපුරාලීම සඳහා ශ්‍රී ලංකාව දායක වේ. දකුණු අප්‍රිකාවේ උණුසුම් පාන වෙළෙඳ පොළෙහි වටිනාකම වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 600 ක් වන අතර, එම වෙළෙඳ පොළෙන් සියයට 5.8ක් තේ හිමිකර ගෙන තිබේ.

ශ්‍රී ලංකාව හැරුණු විට මලාවි, සිම්බාබ්වේ, ටැන්සානියාව සහ කෙන්යාව යන රටවල් දකුණු අප්‍රිකාවට තේ අපනයනය කරන ප්‍රධානතම රටවල් වන අතර, එම රටවල් සියල්ල එක්ව, වසරකට මෙට්‍රික් ටොන් 14,000 සිට 18,000 දක්වා ප්‍රමාණයක් එරටට තේ අපනයනය කරයි. සිලෝන් බ්ලෙන්ඩ් සහ පියෝ සිලොන් බ්‍රේක්ෆස්ට් ටී ඇතුළුතේ ප්‍රභේද ගණනාවකින් සමන්විත, වෙළෙඳ පොළ කොටසෙන් සියයට 50කට වඩා පවතින දකුණු අප්‍රිකාවේ ඉහළම තේ සන්නාමය ෆයිව් රෝසස් වේ.

දකුණු අප්‍රිකානු කලාපයේ ලංකා තේ මුහුණදෙන ප්‍රධාන අභියෝගය වන්නේ, උණුසුම් පාන වෙළෙඳපොළෙහි ආධිපත්‍යය දරන අවම පාරිභෝගික උනන්දුව සහ කෝපි වෙළඳපොළ විසින් ඉන් සැලකිය යුතු කොටසක් සපුරාලන අතර එබැවින් උණුසුම් පාන වෙළෙඳපොළ විනිවිද යෑමට නම්, විවිධ පාරිභෝගික කණ්ඩායම්වල අවශ්‍යතා නංවාලීම සඳහා උපායමාර්ගික ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ.

මෙම කලාපයේ ඒක පුද්ගල ආදායම වැඩිකිරීම මගින් අගය එකතුකළ තේ සඳහා නව වෙළෙඳ පොළ අනුබණ්ඩ විවෘත වියහැකි අතරම, වෙනස්වන ජීවන රටාවන්, ආකර්ෂණීය සහ වෙනස් නිෂ්පාදන සඳහා ඉක්මනින් අනුවර්තනය වීමට ඉවහල් වේ. වාර්ෂිකව මිලියන 25 ක සංචාරක පැමිණීමක් සහිත සංචාරක කර්මාන්තය, ලංකා තේ සඳහා මීළඟ ඉලක්ක වෙළෙඳපොළ විය යුතුය.

**ලංකා බැංකුව**

**පහත සඳහන් ලංකා බැංකු ශාඛාව ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් අවශ්‍යකර ඇත.**

**කුඹුක්ගැටේ සහ මාවතගම**

**යෝජිත ගොඩනැගිල්ල පහත සඳහන් පහසුකම් වලින් සමන්විත විය යුතුය.**

- ගොඩනැගිල්ලේ ඉදිරිපස අවම වශයෙන් පළල අඩි 25 – 40 ක් සහිතව ප්‍රධාන පාරට මුහුණලා නගර මධ්‍යයේ පිහිටා තිබිය යුතු අතර, අවම වශයෙන් පර්චස් 40 ක ඉඩමක පිහිටා තිබිය යුතුය.
- වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ.
- අවම වශයෙන් වර්ග අඩි 2,500 – 3,000 ක බිම් ප්‍රමාණයක් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සතුව 60 AMP තෙකලා විදුලිය, නළ ජලය, ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන සබඳතාවය, කාන්තාවන් හා පිරිමින් සඳහා වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි පහසුකම්, හදිසි පිටවීමේ දොරටුව සහ අනෙකුත් යටිතල පහසුකම් තිබිය යුතුය.
- ගොඩනැගිල්ලේ ගෙබිම සම්පූර්ණයෙන් ටයිල් අතුරා තිබිය යුතුය. (2'X2') .
- විදුලි ජනක යන්ත්‍රය සඳහා ගොඩනැගිල්ලේ පසුපස හොඳින් වාතාශ්‍රය සහිත 10'X10' කාමරයක් තිබිය යුතුය. (මෙම කාමරය යකඩ ග්‍රිල් යොදා ආවරණය කර ආරක්ෂා කර තිබිය යුතුය.)
- ලීටර් 1000 ක ධාරිතාවයක් සහිත ජල ටැංකියක් තිබිය යුතුය.

මේ සම්බන්ධව උනන්දුවක් ඇති ගොඩනැගිලි හිමිකරුවන්, ගොඩනැගිලි සැලසුම, මැනුම් පිඹුර, හිමිකම් ඔප්පුව යන ලේඛනවල පිටපත් සහ අපේක්ෂිත මාසික කුලියද සඳහන් කරමින් දින 14 ක් ඇතුළත පහත සඳහන් ලිපිනය වෙත යොමු කරන්න. ඉල්ලුම් කරනකවරයේ වම්පස ඉහළ කෙළවරේ "**අදාළ ශාඛාවේ නම සඳහන් කර ඒ සඳහා සුදුසු ගොඩනැගිල්ලක්**" යනුවෙන් සඳහන් කළ යුතුය.

**සහකාර මහා කළමනාකරු (වයඹ පළාත)**
**ලංකා බැංකුව, වයඹ පළාත් කාර්යාලය,**
**අංක 18, මිහිඳු මාවත, කුරුණෑගල.**
**දුරකථන : 037-2223618/ 037-2222420,**
**ෆැක්ස් : 037-2223619. ඊ-මේල් : omnwp@boc.lk**

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන්ටැඹ

# කඳු නැඟීමේ ජාතික ශූර එච්.එල්. ක්‍රිෂාන්ත ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ මුල් පුටුවට

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ සභාපති තනතුරට ශ්‍රී ලංකාවේ හිටපු ජාතික ශූර එච්. එල්. ක්‍රිෂාන්ත මහතා තේරී පත් වෙයි. ගාල්ල දිස්ත්‍රික් පාපැදි සංගමය නියෝජනය කරමින් පාපැදි සභාපති පුටුවට තරග කළ ක්‍රිෂාන්ත මහතා සමග තවත් ජාතික ශූරයකු වූ වරාය අධිකාරිය නියෝජනය කළ බී. ජේ. සුමනසේකර මහතා තරග වැදිණි. ක්‍රීඩා අමාත්‍යාංශ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේ පැවැති පාපැදි සම්මේලන නිලවරණයේ සභාපති සටනේදී ක්‍රිෂාන්ත මහතා ඡන්ද 21ක් ලබාගත් අතර සුමනසේකර මහතා ඡන්ද 19ක් ලබා ගත්තේය.

හිටපු ජාතික ශූර එච්. එල්. ක්‍රිෂාන්ත මහතා ශ්‍රී ලංකා ජර්මන් මිත්‍රත්ව ක්‍රීඩා සමාජයෙන් තරග බිමට පිවිස වසර 2000දී හා 2003දී ජාතික පාපැදි ශූරයා කිරුළ දිනාගත්තේය. වසර 2003දී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විදෙස් සංචාර කිහිපයකට එච්. එල්. ක්‍රිෂාන්ත මහතා සහභාගී වූයේ කණ්ඩායම් නායකත්වය ද සමගිනි. එච්. එල්. ක්‍රිෂාන්ත මහතා දැනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ලෙසද කටයුතු කරමින් සිටී.

ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ ලේකම් තනතුරට ගම්පහ දිස්ත්‍රික්කයේ නලීන් අධිකාරී මහතා ඡන්ද 26ක් ලබා තේරීපත් වූ අතර, ඔහු වෙතින් පරාජයට පත්වූයේ ගම්පහ දිස්ත්‍රික්කයේම එච්. ඒ. කරුණාරත්න (ඡන්ද 14) මහතාය. භාණ්ඩාගාරික තනතුරට ජයසේන ගුරුගේ මහතා (ඡන්ද 28) පත් වූ අතර, ඔහු සමඟ තරග කළ ජානක ප්‍රනාන්දු මහතා ඡන්ද 12 ලබා ගත්තේය. උප ලේකම් තනතුර සඳහා ඡන්ද 21ක් ලබා ඒ. එම්. දිසානායක මහතා පත්වූ අතර, ඔහුගේ ප්‍රතිවාදියා වූ උදය කුමාර මොලගොඩ මහතා ඡන්ද 19ක් ලබා ගත්තේය. උපසභාපති තනතුරු 6ක් සඳහා 17ක් තරග කළ අතර, එහිදී එච්. ඩබ්ලිව්. පණ්ඩිතරත්න (ඡන්ද 28), සම්පත් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු (ඡන්ද 24), නිශාන්ත පියසේන (ඡන්ද 20), ප්‍රභාත් ද සිල්වා (ඡන්ද 20), චන්දන කඳනාරච්චි (ඡන්ද 19) හා එන්. එච්. මොල්ලිගොඩ (ඡන්ද 19) ලබා ගත්හ. පාසල් සංගමයෙන් උපසභාපති තනතුරක් සඳහා නම් කර එවන අය ඉදිරියේදී ප්‍රකාශයට පත්වීමට නියමිතය.



# අන්තර් සමාජ එක්දින අර්ධ අවසන් පූර්ව තරග අද

**ෆවුස් මොහොමඩ්**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මෙහෙයවන අන්තර් සමාජ එක්දින තරගාවලියේ අර්ධ අවසන් පූර්ව වටයේ තරග අද (7) පැවැත්වේ. කාණ්ඩ 4ක් යටතේ කණ්ඩායම් 26ක් තරග වැදුණු මේ තරගාවලියේ අර්ධ අවසන් පූර්ව වටයට 'ඒ' කාණ්ඩයෙන් සුදුසුකම් ලැබූ බදුරලිය ක්‍රීඩා සමාජය 'ඩී' කාණ්ඩයේ දෙවැනි තැනට පත් වූ මුවර්ස් ක්‍රීඩා සමාජය සමඟ අද මොරටුවේදී තරග වදින අතර, 'බී' කාණ්ඩයේ පෙරමුණ ගත් රාගම ක්‍රිකට් සමාජය සහ 'සී' කාණ්ඩයේ දෙවැනි ස්ථානය ලැබූ ද්‍රවිඩ සංගම් ක්‍රීඩා සමාජය අතර තරගය අද කටුනායක මේරියන්ස් පිටියේදී පැවැත්වේ.

මේ අතර 'සී' කාණ්ඩයේ පෙරමුණ ගත් එන්සීසී පිල සහ 'බී' කාණ්ඩයේ දෙවැනි ස්ථානය ලැබූ නාවික හමුදා ක්‍රීඩා සමාජය අතර තරගය අද කෝල්ට්ස් පිටියේ දී පැවැත්වෙයි. 'ඩී' කාණ්ඩයේ පෙරමුණට පත් වූ එස්එස්සී පිල සහ 'ඒ' කාණ්ඩයේ දෙවැනි ස්ථානය ලැබූ යුද හමුදා ක්‍රීඩා සමාජය අතර තරගය අද පී.සරා ඕවල් පිටියේදී පැවැත්වෙනු ඇත.

අන්තර් සමාජ එක්දින තරගාවලියේ අවසන් පූර්ව වටයේ තරග අනිද්දා (9) පැවැත්වෙන අතර, අවසන් මහා තරගය 11 වැනිදා එස්එස්සී පිටියේදී පැවැත්වේ.

## ද. ආසියාවේ ක්‍රියාශීලිම රට කිරීමේ අරමුණින්

# 'ෆැමිලි රන් සැටඩේ' 10දා කොළඹින් ඇරඹේ

## අද පාපැදි ක්‍රීඩාවේ ප්‍රබෝධයත් සමඟ වින්කලේට වැඩ වැඩි වෙලා

### ඇමැති නාමල් රාජපක්ෂ

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ක්‍රියාශීලිම රට බවට පත් කිරීමේ වැඩ පිළිවෙළේ තවත් අදියරක් ලෙස 'ෆැමිලි රන් සැටඩේ' දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩ සටහන එළැඹෙන 10 වැනි සෙනසුරාදා පෙරවරු 6.00ට පිලිප් ගුණවර්ධන මාවතේ ක්‍රීඩා අමාත්‍යාංශය ඉදිරිපිටදී ආරම්භ වෙයි.

ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ අදහසක් අනුව දැනට ක්‍රියාත්මක පාපන්දු සිකුරාදා හා පැපැදි ඉරිදා වැඩසටහනට අමතරව මේ 'ෆැමිලි රන් සැටඩේ' දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩ සටහන සෑම සෙනසුරාදාවකම පැවැත්වේ. නිරෝගී පරපුරක් බිහි කිරීමේ අරමුණින් පවුලේ සියලු සාමාජිකයන් ව්‍යායාමයට යොමු කිරීම නවතම වැඩ සටහනේ අරමුණ වේ.

ක්‍රීඩා අමාත්‍යාංශය ඉදිරිපිටින් ආරම්භ වන 'ෆැමිලි රන් සැටඩේ' දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩසටහන මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත ඔස්සේ ශ්‍රී ලංකා පදනම් මාවතට පිවිස, නිදහස් මාවත, මේට්ලන්ඩ් පෙදෙස, බෞද්ධාලෝක මාවත, කිංසිපාර ඔස්සේ ආර්. ජී. සේනානායක මාවතට පිවිස, විජේරාම මාවත, මේට්ලන්ඩ් පෙදෙස, මේට්ලන්ඩ් ක්‍රෙසන්ට් ඔස්සේ පිලිප් ගුණවර්ධන මාවතේ අමාත්‍යාංශය ක්‍රීඩා ඉදිරිපිටින් නිමාවට පත් වේ.

ක්‍රීඩා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය හා ලංකා ස්පෝට්ස් රයිසින් සමග එක්ව 'ෆැමිලි රන් සැටඩේ' දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩසටහන හඳුන්වා දී ඇත. නිරෝගී දිවි පෙවතක්, කාර්ය බහුල ජීවන රටාවකට සම්බන්ධ කර ගැනීම සඳහා ශාරීරික ව්‍යායාම් අත්‍යාවශ්‍ය වන හෙයින් මේ වැඩ සටහන සමාජය තුල උනන්දුවක් ඇති කරනු ඇතැයි ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා විශ්වාසය පළ කළේය.

'ෆැමිලි රන් සැටඩේ' දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩෙසටහන හඳුන්වා දෙමින් පෙරේදා ක්‍රීඩා අමාත්‍යාංශ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේ මාධ්‍ය හමුවක් පැවැති අතර, එහිදී සඳහන් වූයේ මේ මාර්ගය විශේෂ පොලිස් ආරක්ෂාවක් සහිත කිලෝමීටර් 5ක දුරකින් යුක්ත එකක් වන බවය. මේ සඳහා සහභාගී වන අය ලියාපදිංචි වීමක් සිදුකළ යුතු නොමැති අතර, පෙරවරු 6 සිට පෙරවරු 8 දක්වා ඕනෑම අයකුට දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩසටහනට මාර්ගය විවෘතව පවතී.

" අප කලින් ආරම්භ කළ පාපැදි වැඩසටහන ඉතාම සාර්ථක වී තිබෙනවා. පසුගිය ජාතික මහා ක්‍රීඩා උලෙළේ පාපැදි තරග සඳහා වැඩිම ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් එක්වීමෙන් පැහැදිලි වෙනවා පාපැදි ක්‍රීඩාවට දැන් තියෙන උනන්දුව. පාපැදි ක්‍රීඩාවේ ප්‍රබෝධයත් සමග වින්කලේට වැඩ වැඩිවෙලා. ක්‍රීඩා ආර්ථකයක් ගොඩ නැගීමේදී ඒ හා බැඳුණු කාරණාවක් ලෙස එය හඳුන් වන්න පුලුවන්. පාපන්දු සිකුරාදා වැඩ සටහනත් දැන් රටපුරා ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම මව්පියන් හා දරුවන් සම්බන්ධ වීමෙන් අපේ අරමුණ දැන් ඉටුවෙමින් පවතිනවා. මේ අලුත් වැඩසටහනින් අපේක්ෂා කරන්නේ පවුලේ සියලු දෙනා සෑම සෙනසුරාදා දවසක දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩසටහනට සම්බන්ධ කොට ක්‍රියාශීලී මට්ටමට ගෙන ඒමයි" රාජපක්ෂ මහතා පැවැසීය.

දිවීමේ හා ඇවිදීමේ ක්‍රීඩා වැඩසටහනට භූමියේ වැදගත්කමක් නොමැති හෙයින් රටපුරා ඕනෑම අයකුට මේ සඳහා තම තමන්ගේ ප්‍රදේශවල කටයුතු ආරම්භ කළ හැකි බව ද ක්‍රීඩා ඇමැතිවරයා පැවැසීය. ශ්‍රී ලංකා ස්පෝර්ට්ස් රයිසින් ආයතනයේ සභාපති තිලක් වීරසිංහ, ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ අධ්‍යක්ෂ ජෙනරාල් ලාල් ඒකනායක මහත්වරුන් සමඟ ශ්‍රී ලංකා පොලිසියේ රථවාහන අංශය භාර නිලධාරීහු පිරිසක් ද මාධ්‍ය හමුවට එක් වූහ.



ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා මාධ්‍ය හමුවේදී. ශ්‍රී ලංකා ස්පෝර්ට්ස් රයිසින් ආයතනයේ සභාපති තිලක් වීරසිංහ මහතා ද මෙහි සිටී.
*ඡායාරූපය - සුලෝචන ගමගේ*

# බ්‍රසීල ජාතික කොයෙල්ට වසර 4ක් පාපන්දු තහනම්

තහනම් මත්ද්‍රව්‍ය පිළිබඳ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ වරදට තායිලන්තයේ චියැන්ග්‍රායි යුනයිටඩ් ප්‍රහාරක ක්‍රීඩක බ්‍රසීල ජාතික ජජා කොයෙල්ට පාපන්දු සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් වසර 4 කට ආසියානු පාපන්දු සම්මේලනය තහනම් කරයි.

ආසියානු පාපන්දු සම්මේලන චැම්පියන්ස් ලීග් තරගයකදී තහනම් මත්ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණය අසමත් වීමෙන් මෙම සිවු අවුරුදු තහනම පැනවූ බව තායිලන්තයේ චියැන්ග්‍රායි යුනයිටඩ් ක්‍රීඩා සමාජයේ නිලධාරීහු ඊයේ ප්‍රකාශ කළහ.

මෙයට පෙර පසුගිය නොවැම්බර් මාසයේදී ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් පිලට එරෙහි තරගයේදී ද මත්ද්‍රව්‍ය නාශක නීති කඩ කිරීම සම්බන්ධයෙන් කොයෙල් ජජා වරදකරු වූ බව ආසියානු පාපන්දු සම්මේලනය පවසයි. කොයෙල් ජජාගේ මුත්‍රා සාම්පලයේ තහනම් ද්‍රව්‍යයක් හමු වූ අතර වැඩි විස්තර හෙළිකොට නැත.



# අෂාන් සිල්වා මහගස්තොට වාර්තාව අලුත් කරයි



**ගීෂා මුණසිංහ**

නව තරග වාර්තාවක් සමඟ 87 වැනි මාගස්තොට කඳුතරණය මෝටර් රථ හා යතුරුපැදි තරගාවලියෙන් දක්ෂතම රියැදුරා ලෙස කුසලානය අත්කර ගැනීමට අෂාන් සිල්වා සමත් වෙද්දී දක්ෂතම යතුරුපැදි ධාවකයාට හිමි කුසලානය දිනාගැනීමට ඒරන් ගුණවර්ධන සමත් විය. නුවරඑළිය මහගස්තොට දී පසුගියදා තරගාවලිය පැවැත්විණි.

අෂාන් සිල්වා තත්පර 31.699 කින් තරගය නිමා කරමින් නව තරග වාර්තාව තබමින් ඔහු විසින් 2008 වසරේදී තත්පර 32.946 කින් තැබූ වාර්තාව අභිබවා යෑමට සමත් විය. එසේ වුවත් ආනන්ද සම්පත් වීරසිංහ විසින් 2018 වසරේදි තබා තිබූ යතුරු පැදි වාර්තාව අභිබවා යෑමට නම් මෙතෙක් කිසිවකු සමත් නොවීම විශේෂ සිදුවීමකි.

තරගය අතරතුර අෂාන් සිල්වා ආසන්නට පැමිණීමට කිසිවකු සමත් නොවූ අතර, දෙවැනි හොඳම කාලය වාර්තා කිරීමට සමත් වුයේ එස්.එල්./ජී.ටී. තරග කාණ්ඩයෙන්ම තරග කළ දිනේෂ් ජයවර්ධනය.. ඔහු වාර්තා කළ කාලය තත්පර 34.013කි. තුන්වැනි හොඳම කාලය වාර්තා කිරීමට සමත් වුයේ නවීකරණය කරන ලද 1665සී.සී. ෆෝමියුලා තරග කාණ්ඩයෙන් තරග කළ නදීර ජිනසේනය. ඔහු වාර්තා කළ කාලය තත්පර 34.367කි.

ඒරන් ගුණවර්ධන දක්ෂතම යතුරුපැදි ධාවකයා ලෙස කුසලාන දිනා ගත්තේ නවීකරණය කරන ලද 250සී.සී. තරග ඉසව්වෙන්ය. එම තරග ඉසව්වේ දෙවැන්නා වු ඒරන් ගුණවර්ධනට තරගය නිමා කිරීමට 34.957 කාලයක් වැය විය. ඒරන් හා ජේඩින් සොහොයුරන් අතර තරගක් තිබුණු අතර, ඔවුන්ට අභියෝග කිරීමට ද යතුරුපැදි කාණ්ඩයෙන් කිසිවකු සමත් නොවූහ. යතුරු පැදි කාණ්ඩයෙන් තෙවැනි හොඳම කාලය වාර්තා කිරීමට සමත් වුයේ ද ඒරන් ගුණවර්ධනය. ඔහු 600සී.සී. යතුරු පැදි කාණ්ඩයෙන් එම දක්ෂතාව පෙන්නුම් කළේය. තරගාවලියේ විශේෂත්වය වූයේ පැරණි මෝටර් රථ ධාවන තරග ඉසව්වකින් වර්ණවත් වීමය.

මෝටර් රථ තරග ඉසව් 15 ක් හා යතුරු පැදි තරග ඉසව් 17 ක් තරගාවලියට ඇතුළත් වූ අතර, තරගකරුවන් 150 කට වැඩි පිරිසක් සහභාගි වූහ. කොවිඩ් වසංගතය හේතුවෙන් සෞඛ්‍ය අංශ නිකුත් කළ නීතිරෙගුලාසිවලට අනුව සමස්ත තරගාවලිය නරඹන්නන්ට වසා දමා තිබිණි.

තුන්වැනි වරටත් මෙවර තරගාවලියට එස්.එල්.ටී. මෝබිටෙල් (SLT-MOBITEL) ප්‍රධාන අනුග්‍රාහකත්වය ලැබී තිබිණි.

# කනිෂ්ඨ විවෘත ස්කොෂ් ශූරයා ඉල්හාම් ශූරිය යෙහානි





කොවිඩ් වසංගතයෙන් පසු පළමුවරට මෙරට පැවැති ජාතික ස්කොෂ් ශ්‍රේණිගත කිරීමේ තරගාවලිය වූ එස්එල්එස් කනිෂ්ඨ විවෘත ශූරතාවලියේ ශූරතාව දිනා ගැනීමට ඩී.එස්. සේනානායක විදුහලේ ඉල්හාම් අස්මන් සමත් විය. අවුරුදු 19න් පහළ වයස් කාණ්ඩයෙන් බාලක ශූරතාව ශූරතාව දිනා ගනිද්දී බාලිකා ශූරතාව විශාඛා විදුහලේ යෙහානි කුරුප්පු දිනා ගත්තාය.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් 225 දෙනකු සහභාගි වූ මේ තරගාවලියේ අවුරුදු 19න් පහළ බාලක තරග අංශයේ අනුශූරතාව ඩී.එස්. සේනානායක විදුහලේ නෙවිඳු ලක්මන් දිනා ගත් අතර, බාලිකා අනුශූරතාව විශාඛා විදුහලේ චනිත්මා සිනාලිට හිමි විය.

ශ්‍රී ලංකා ස්කොෂ් සංගමය විසින් සංවිධාන කරනු ලැබූ මේ තරගාවලිය දැඩි සෞඛ්‍ය නීතිරෙගුලාසි යටතේ පසුගියදා එස්එස්සී ස්කොෂ් ක්‍රීඩාගාරයේදී පැවැත්විණි.

තරගාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ලංකා බැංකුවේ භාණ්ඩාගාර අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී රජිත් තුෂාන්ත මහතා සහභාගි වූ අතර, එම අංශයේ අමිල බොතේජු මහතා ගෞරවනීය අමුත්තකු ලෙස ඊට එක් විය.




අලි-ඇතුන් මරා ඇත්දළ ජාවාරම් කළ අනුරපුරේ සැකකරු අල්ලයි
පිටුව 18





අවුරුදු වසන්තය ළඟ ළඟම ....
පිටුව 19





ජනතාවට සෙත්පතා ආශිර්වාද අධිෂ්ඨාන පූජාවක්
පිටුව 19


එස්.පී.උබේපාල-කැබිතිගොල්ලෑව සමූහ සහ අනුරාධපුර මධ්‍යම විශේෂ

# උතුරුමැද පළාත් සභාවේ රුපියල් මිලියන 13ක් කොන්ත්‍රාත්කරුවකු යටි මඩි ගහලා

උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ අරමුණින් 2016 වසරේදී සිදු කළ ගිවිසුමකට අනුව උතුරු මැද පළාත් සභාව සතු රුපියල් මිලියන 13කට ආසන්න මුදලක් කොන්ත්‍රාත් කරුවකු විසින් අවභාවිත කර ඇති බව සිදු කළ මූලික පරික්ෂණ අනුව මේ වන විට හෙළිවී ඇති බව උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා ප්‍රකාශ කළේ ය. ඒ අනුව මේ පිළිබඳව නීතිමය කටයුතු සිදු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීමට කටයුතු කරන ලෙස උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ඒ.කේ.එන්. වික්‍රමසිංහ මහතා වෙත දැනුම් දී ඇත.

උතුරු මැද පළාත් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වන පාර්ශ්ව කරුවන්ගේ ආදළ නිලධාරීන් සමග පසුගියදා (05) දා ප්‍රධාන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පැවැති සාකච්ඡාවේ දී උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයා එසේ දැනුම් දී ඇත.

මීට වසර 04කට පෙර 2016 වර්ෂයේ දී උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ අරමුණින් ලක්ෂ 160 කට ආසන්න මුදලක් වියදම් කර වෙබ් අඩවියක් නිර්මාණය කිරීමටත්, උතුරු මැද පළාතේ සංචාරක තොරතුරු ඇතුළත් සීඩී පටයක් සහ ජාත්‍යන්තර මට්ටමේ ග්‍රන්ථයක් සැකසීම සඳහාත් කොන්ත්‍රාත් කරුවකු සමග උතුරු මැද පළාත් සභාව ගිවිසුම් ගතව ඇත.

මේ වන තුරුත් එම කාර්යය ඉටු නොකර මෙම කොන්ත්‍රාත් කරු මුදල් වංචාවක් සිදුකරමින් සැඟව සිට පළාත් සභාව විසින් යවන ලිපි ලේඛන වලට පවා පිළිතුරු නොදමින් සිටන බව පළාත් සභා නිලධාරීන් මෙම සාකච්ඡාවේදී පැවසූහ. ඒ අනුව වැඩ නිම කරමින් එම වෙබ් අඩවිය , සීඩී පටය සහ ග්‍රන්ථය ලබා දෙන ලෙස ඉල්ලා පළාත් සභාව විසින් ලිපි 14 ක් කොන්ත්‍රාත් කරු වෙත මේ වන විට යවා ඇත.

මෙය ඉතා විශාල අවභාවිතයක් බවත් පළාතේ දුප්පත් ජනතවාගේ මුදල් මෙසේ අපහරණය කිරීම විශාල අපරාධ ක්‍රියාවක් බවත් එමෙන්ම අද වන විට අනුරාධපුර පූජා භූමි ප්‍රදේශයේ ඉතාමත් අවධිමත් ලෙස කඩ ඉදිවී ඇති බවත් ඒවා වන්දනාවේ පැමිණෙන බැතිමතුන් හට විශාල හිරිහැරයක් බවත් ඒ පිළිබඳව ජනාධිපතිතුමා දැනුවත් කිරීමට කටයුතු සිදුකරන බවත් පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා එහිදී වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්. ඒ.කේ.එන්. වික්‍රමසිංහ, සහකාර අධ්‍යක්ෂක (සංචාරක) ක්‍රිශාන්ත බෝපගේ මහතා සහ සංචාරක කේෂ්ත්‍රයේ නියැළෙන පිරිසක් ද සහභාගි වූහ.

සීගිරිය විශේෂ

# දැරියකගේ තොල් සපා කෑ සැකකරු මසකට පසු අත්අඩංගුවට

වයස අවුරුදු 10 ක දැරියකගේ තොල් සපා කා යතුරු පැදියකින් පලාගොස් සැඟවී සිටි අයකු පොලිස් උකුසු ඇස නිසා මාසයක කාලයකට පසු 05 දින අත්අඩංගුවට ගත්බව දඹුල්ල පොලිසිය කියයි .

දඹුල්ල ඉබ්බන්කටුව ප්‍රදේශයේ දී මීට මාසයකට පමණ ඉහතදී වයස අවුරුදු 10 ක දැරියකගේ දරුණු ලෙස තොල සපා කා යතුරුපැදියකින් පුද්ගලයකු පලා ගොස් ඇති බව දඹුල්ල පොලිසියට පැමිණිල්ලක් ලැබී තිබිණි .කිසිදු තොරතුරක් හෝඩුවාවක් නොමැතිව මෙය සිදු වී තිබෙන බවත් පොලිසිය දැඩි ලෙස මේ පිළිබඳව සොයා බලන්නට වූ අතර ප්‍රදේශවාසීන්ගේ ද ඒ සඳහා නොමඳ සහායක් ලැබුණු බව පොලිසිය කියයි.කිසිදු හෝඩුවාවක් නොමැති තැන

දඹුල්ල මුලස්ථාන පොලිස් පරීක්ෂක එස් . පී .එදිරිසිංහ මහතා අපරාධ අංශයේ උප පොලිස් පරීක්ෂක ඩබ්ලිව් .එම් කේ. එස්. වන්නිනායක මහතාට පොලිස් සැරයන් 60 355 රාජපක්ෂ මහතාට වහාම මෙම දැරිවියගේ තොල සපා කා පලාගිය පුද්ගලයා පිළිබඳව විමර්ශනය කොට අත්අඩංගුවට ගන්නැයි දැනුම් දී තිබේ.

ඒ අනුව පොලිස් නිලධාරීන් ඉතා සූක්ෂම ලෙස සිද්ධිය සිදුවූ අවස්ථාව පිළිබඳව සොයා බලා සිද්ධිය වූ ස්ථානයේ මාර්ග ඉදිරිපස ප්‍රධාන මාර්ගයේ ඇති ආරක්ෂිත කැමරා පිළිබඳව අවධානය යොමුකොට තිබිණි. දඹුල්ලේ සිට කුරුණෑගල දක්වා ප්‍රධාන මාර්ග වල ඇති ආරක්ෂිත කැමරා පරීක්ෂාවක් කිරීමට මෙම පොලිස් නිලධාරින් දෙදෙනා සමත් වී තිබේ .පසුව යතුරු පැදි කිහිපයක් පිළිබඳව සැකසීති කුරුණෑගල ප්‍රදේශයේ රාත්‍රී කාලයේ පැහැදිලිව පටිගත වන කැමරාවක සහයෙන් එක්කකරා යතුරුපැදියක අංකය සොයා පරීක්ෂණ ආරම්භ කළ බව පොලිසිය කියයි.

පරීක්ෂණ අනුව මේ පුද්ගලයා පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිකරුවකු බවත් ඔහු වැලිවේරිය ප්‍රදේශයේ ඉන්ධන පිරවුම් හලක සේවකයකු බවත් හඳුනාගෙන ඇත.

බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# දීගදන්තු එක දළ ඇතා නැවත ඇවිත්...



අවුරුදු දෙකකට ඉහතදී ද්වන්ධ සටනකින් මියගිය බවට සැක කෙරුණු “දීග දන්තු එක දළ ඇතා” නැවත කලාවැව ජාතික වනෝද්‍යානයෙන් මතුවී ඇති බව කලාවැව ජාතික වනෝද්‍යානය ආසන්නයේ පදිංචිකරුවෝ පිරිසක් අනාවරණය කළ අතර වසර දෙකක පමණ කාලයක් දීග දන්තු එක ඇතා අතුරුදන්ව සිටි බව ගම්වාසීහු පවසති.

2019 වසරේ අගෝස්තු මාසයේ දී කලාවැව සියඹලාගස්පිටිය ප්‍රදේශයේදී සති තුනක පමණ ඉහතදී මියගිය දළ ඇතකුගේ සිරුරක් වනජීවී නිලධාරීන්ට හමුවූ අතර බොහෝ දෙනෙකු ප්‍රකාශ කර සිටියේ මියගිය ඇතා “දීග දන්තු එක" බවයි. තවත් ඇතකු සමග පැවති සටකින් පහර කෑමට ලක්වී බරපතළ තුවාල ලබා ඇතා මිය යන්නට ඇති බව පසුව සිදු කළ පශ්චාත් මරණ පරීක්ෂණයේදී අනාවරණය වී තිබිණි.

මේ වන විට අවුරුදු 28ක් පමණ වයස උඩ් 8ක් පමණ උසැති ඇතා කලාවැව රක්ෂිතයේ සිටින දළ දිගැති ඇතුන්ගෙන් එක් අයෙක් වන අතර දිග දන්තු ඇතාට සමාන තවත් ඇතෙකු සිටි නිසා රක්ෂිතයේ සිටි ඇතුන් දෙදෙනා දීග දන්තු 01 හා 02 වශයෙන් නම් කර තිබිණි.

මිහිර විජේසේකර-මාරවිල සමූහ

# විභාගය ලියමින් සිටි දැරිය හදිසියේ ලෙඩ වී මියයයි

වනාතවිල්ලුව බණ්ඩාරනායකපුර විදුහලේ 9 වසර ඉගෙනුම ලබන සිසුවියක් වාර විභාගයට පෙනී සිටින අතර තුර දී හදිසියේ අසනිපව රෝහල්ගත කිරීමෙන් අනතුරුව මිය ගොස් තිබේ. මෙසේ මරණයට පත්ව ඇත්තේ වනාතවිල්ලුව කාටුපුලියන්කුලම පදිංචිව සිටි රවිෂා ධනංජනී නමැති දැරියකි.

මෙම සිසුවිය වාර විභාගයට පෙනී සිටින අතර තුරදී අසනිප වී තිබේ. පසුව වනාතවිල්ලුව රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා පුත්තලම මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව මරණයට පත්ව ඇත.

කෙසේ නමුත් ඥාතින් චෝදනා කරන්නේ දැරිය වාර විභාගයට පෙනී සිටිමින් පිළිතුරු සැපයිමේදි කොපි කිරිමක් සම්බන්ධව ගුරුවරියක් බැණ වැදීමෙන් පසුව දැරිය එකවර අසනිප වී ඇති බවයි. ඥාතීන් මේ පිළිබඳ පරික්ෂණයක් ඉල්ලා වනාතවිල්ලුව පොලිසියට පැමිණිලි කිරීමට නියමිතය.

සීගිරිය විශේෂ

# බස් රථයක් ඇළට 18ක් රෝහලට



දඹුල්ල ගල්කිරියාගම ප්‍රධානම මාර්ගයේ තෙලදින්නන්වැව ප්‍රදේශයේ දී 6 දින දහවල් පෞද්ගලික මගී බස් රථයක් ඇළකට පෙරළී යාමෙන් එහි ගමන් ගත් මගීන් 18 දෙනෙකු තුවාල ලබා දඹුල්ල මූලික රෝහලට ඇතුළත් කළ බව ගල්කිරියාගම පොලිසිය කියයි.

ගල්කිරියාගම සිට දඹුල්ල බලා ධාවනය වෙමින් තිබූ මෙම බස් රථය එක වරම කාර්මික දෝෂයකට ලක්ව ඇළට පෙරළී ගිය බව එහි රියදුරු සඳහන් කළේය. පසුව ප්‍රදේශවාසීන්ගේ සහාය ඇතිව බස් රථයේ සිරවී සිටි මගීන් ගොඩට ගෙන දඹුල්ල මූලික රෝහලට රැගෙන ගිය බව පොලිසිය කියයි.

මෙම අනතුරින් පිරිමි පුද්ගලයන් පස්දෙනෙකු රෝහල් ගත කොට ඇති අතර කාන්තාවන් 13 දෙනෙකු රෝහලේ ප්‍රතිකාර ලබන බව රෝහල් ප්‍රකාශකයෙක් පැවසීය .

තුවාල ලැබීමෙන් පුද්ගලයන් කිහිප දෙනෙකුගේ තත්ත්වය බරපතළ බව එම ප්‍රකාශකයා වැඩිදුරටත් සඳහන් කළේය.

ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංචාරක සහ විරාජ් අබේසිරි - මාතලේ මධ්‍යම

# මාතලේ බෞද්ධ විදුහලේ ක්‍රීඩා පිටියට පිවිසුම් මාර්ගයක් ඉල්ලා උපවාසයක්



මාතලේ සිංහල බෞද්ධ විදුහලේ දැනට භාවිතා කරන ක්‍රීඩා පිටිය හා පිවිසුම් පාර පාසලට ලබාදෙන ලෙස ඉල්ලා දින කිහිපයක් තිස්සේ පවත්වනු ලබන උපවාසයත් සමග සාමකාමි නිහඬ විරෝධතාවයක් මවුපියෝ විසින් විදුහලේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා ගමන් කර ප්‍රාදේශීය ලේකම් වෙත සංදේශයක් බාරදීම පෙරේදා (05) පෙරවරුවේ සිදුවූ අතර විසදුමක් නොලබුණු නිසා විදුහලේ නිර්මාතෘ අඹලගන්වත්තේ චන්ද්‍රසිරි ස්වාමින් වහන්සේ පාසලේ පිවිසුම් දොරටුව අසල අට්ටාලේ මරාන්තික උපවාසයක් ආරම්භ කළේය.

මෙලෙස උපවාස කළ සිංහල බෞද්ධ විදුහලේ නිර්මාතෘ හා මාතලේ ශ්‍රී විද්‍යානන්ද මහ පිරිවෙනේ විහාරාධිපති අමරපුර මහ නිකායේ සිරිසද්ධම්මයුක්තික පාර්ශ්වයේ මාතලේ මහ දිසාවේ ප්‍රධාන සංඝනායක හා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යන අංශයේ අංශාධිපති ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය්‍ය අඹලගන්වත්තේ චන්ද්‍රසිරිහිමි පානන් වහන්සේ.

“දැනට මෙම විදුහලේ දරුවන් 900ක් පමණ ඉගෙනුම ලබනවා ගරු මණ්ඩලය 80ක් පමණ ඉන්නවා. මෙම පාසල රජය අනුමත උපකෘත පාසලක් විදිහට අයත් පාසලක් රජයෙන් නිල ඇඳුම් ලබාදීම, වැටුප් ලබාදීම සහ අනෙකුත් සියලු පහසුකම් ලබාදෙනවා. ලංකාවේ දැනට ගැසට් කරලා තියෙනවා මෙවැනි පාසල් 80ක් තිබෙනවා ප්‍රධාන පාසල් අතර බෞද්ධ බාලිකා කාන්තා විදුහල සහ මියුසියස් විදුහල මාතලේ පාසල් දෙකක් තිබෙනවා මේ පාසල ලබාදීල තියෙන්නේ බදු පදනම මත ඒ වගේම මෙහි ප්‍රතිඵල ඉතාම ඉහළයි ජනප්‍රිය පාසලක් බවට පත්වෙලා තියෙනවා.

සනත් ගමගේ - ලුණම සමූහ

# ගවයන්ට කෑමට දෙයක් දීමට නොහැකිව කිරි ගොවීහු අසීරුවේ

හම්බන්තොට තෘණ භූමි සංවර්ධනය කිරීමට අදාළ අංශ කල්මරමින් සිටින හෙයින් කිරි කර්මාන්තයේ යෙදෙන කිරි ගොවීන්ට සිය ගවයන්ට කෑම ලබාදීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බව කිරි ගොවීහු පවසති. රුහුණේ මී කිරි කර්මාන්තය යැයි ප්‍රසිද්ධ වී තිබුණත් අද වන විට මී කිරි නිෂ්පාදනය කිරීමට ගවයන්ට අවශය කෑම නොමැති හෙයින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගව හිමියන් සිය ගවයින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඈත ප්‍රදේශ කරා රැගෙන යෑමට සිදු වී ඇති අතර එම ප්‍රදේශවලද සතුන්ට අවශ්‍ය ආහාර නොමැති හෙයින් ගව පට්ටි විකුණා දමා වෙනත් කාර්යයක් කිරීමට සිදු වී ඇති බවද කිරි ගොවීහු කියති.

ප්‍රදීප්කුමාර, කෑගල්ල පොල්වත්ත හා සබරගමුව රම්‍යපාල

# කෑගල්ලේ අපරාධ ගැන කියන්න පොදු දුරකථන අංකයක්



අපරාධ, මත්ද්‍රව්‍ය සම්බන්ධ තොරතුරු හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන තොරතුරු පොලීසිය වෙත ලබා දීම සඳහා කෑගල්ල හා සීතාවක පොලිස් කොට්ඨාසවල පොලිස් ස්ථාන 15ක් ආවරණය වන පරිදි පැය විසි හතර පුරා ක්‍රියාත්මක පොදු දුරකථන අංකයක් ජනතාව වෙත හඳුන්වා දීමේ වැඩසටහනක් කෑගල්ල සීතාවක දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත චන්ද්‍ර සිරි මහතාගේ ප්‍රධානත්වයෙන් 6දා පෙරවරුවේ කෑගල්ලේදී පැවැත්විණි.

035_2222227 යන මෙම දුරකථන අංකය නියෝජ්‍ය පොලිස්පතිවරයා යටතේ ක්‍රියාත්මක විශේෂ ඒකකයක් යටතේ පැය 24 පුරාම ක්‍රියත්මකව පවති. මෙම දුරකතන අංකය පිළිබඳ ජනතාව දැනුවත් කරමින් පොදු ප්‍රවාහන බස් රථවල ත්‍රීරෝද රථවල, රජයේ කාර්යාලවල, පොදු ස්ථානවල ස්ටිකර් ඇලවීමේ වැඩසටහනක් ද පොලිස් ස්ථාන මට්ටමින් සිදු කෙරිණි.

අරණායක පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක බුද්ධික පානාවෙල මහතා ඇතුළු නිලධාරීන් අරණායක නගරයේ දී පොදු ප්‍රවාහන බස් රථවල සහ ත්‍රීරෝද රථවල ස්ටිකර් අලවන අයුරුයි මේ.

සූරියවැව විශේෂ - නුවන් ජයසේකර

# ජංගම දුරකථන අලුත්වැඩියා කරන මුවාවෙන් කුඩු විකුණලා

තංගල්ල කොට්ඨාස භාර ජ්‍යෂ්ඨ පොලිස් අධිකාරි වරයාට ලද තොරතුරකට අනුව සිදුකළ වැටලීමකදී තිස්සමහාරාම නගරයේ ජංගම දුරකථන අලුත්වැඩියා කරන ස්ථානයක් තුළ පවත්වාගෙන ගිය හෙරොයින් අලෙවි කිරීමේ ජාවාරමක් සමග සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගැනීමට තංගල්ල කොට්ඨාස දූෂණ මර්ධන ඒකකයේ නිලධාරීන් පෙරේදා (05) සවස සමත්වී තිබේ.

මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ තිස්සමහාරාම මාදවැලැන පදිංචි 26 හැවිරිදි පුද්ගලයකු හා දෙබරවැව දීපංකර මාවතේ පදිංචි 31 හැවිදි පුද්ගලයෙකි.

සැකකරුවන් සම්බන්ධයෙන් ලද තොරතුරට අනුව තංගල්ල කොට්ඨාස දුෂණ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් දෙබරවැවදී 31 හැවිරිදි සැකකරු හෙරොයින් ග්‍රෑම් 12යි මිලි ග්‍රෑම් 420ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී අනාවරණය කරගත් තොරතුරුවලට අනුව මෙම හෙරොයින් ජාවාරම මෙහෙය වූ බව කියන තිස්සමහාරාම නගරයේ ජංගම දුරකතන අලුත්වැඩි කරන ස්ථානයක්ද වටලා තිබේ.එහිදී එහි 26 හැවිරිදි එහි හිමිකරුද පොලිස් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 33යි මිලි ග්‍රෑම් 620ක් අත්අඩංගුවට ගෙන තිබේ.

පරාක්‍රම ගුණසේකර සූරියවැව සමූහ

# හම්බන්තොට ග්‍රාමීය මාර්ග 42ක වැඩ සාර්ථකයි

"සපිරි ගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට සමගාමීව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 42ක ඉදිකිරීම් වැඩ සාර්ථකව නිම කර ඇත.

කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 30ක මෙම ඉදිකිරීම් සිදුකර තිබේ. ඒ, ඒ, ග්‍රාම නිලධාරි වසම්වල පදිංචි වැඩි ජනතාවකගේ යෝජනාවලට අනුව ගමට අවශ්‍ය පොදු සේවාවක් ගම්වාසින්ගේ සහභාගිත්වය ඇතිව මෙසේ ඉදිකිරීම් සිදුකර තිබේ. ගම්මාන මාර්ග 38ක් කැටගල් අල්ලා ඉදිකර තිබේ. ජුල්ගමුව ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම, සිරිබෝපුර හෙළ බොජුන්හල ගොඩනැගිල්ල ඉදිකිරීම ,බැද්දවල වැව ප්‍රතිසංස්කරණය කිරීම, සහ පතලයාගම පානීය ජල ව්‍යාපෘතිය ඉදිකිරීම, යන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 42ක් ඉතා සාර්ථකව නිමකර ඇත. මෙම ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන දෙකකට වැඩි ජනතා ශ්‍රමය වැයකර ඇති අතර රජය මඟින් රුපියල් මිලියන 60ක් වැයකර ඇති බව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කෞශල්‍යා ගලප්පත්ති මහත් මිය දිනමිණට කීවාය.

පී.ටී.ඒ. ලතීෆ් මඩකළපුව සංවාරක

# බලපත් නැතිව වැලි හෑරූ 4ක් දැලේ

මඩකළපු වවුනදීව් පොලිස් වසමට අයත් කුරුන්තෛයඩි මුන්මාරි ප්‍රදේශයේ නීති විරෝධී ලෙස බලපත්‍ර නොමැතිව වැලි හාරමින් සිටි පුද්ගලයන් හතර දෙනකු සමඟ ට්‍රැක්ටර් රථ දෙකක් වවුනදීව් පොලිස් කණ්ඩායම විසින් අත්අඩංගුවට ගෙන තිබේ. පොලීසියට ලද තොරතුරකට අනුව මඩකළපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුගත් මාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් මඩකළපු එක කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එල්.ආර්. කුමාරසිරි මහතාගේ උපදෙස් මත වවුනදීව් පොලීසියේ ස්ථානාධිපති කේ. ඩී නිසාන්ද මහතාගේ ප්‍රධානත්වයෙන් මේ වැටලීම සිදු කෙරිණි. මෙම අත්අඩංගුට ගත් පුද්ගලයන් හතර දෙනා සමඟ ට්‍රැක්ටර් රථ මඩකලපු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක

# අලි-ඇතුන් මරා ඇත්දළ ජාවාරම් කළ අනුරපුරේ සැකකරු අල්ලයි



දීර්ඝ කාලයක් තිස්සේ සංවිධානාත්මකව අලි ඇතුන් මරා ඇත්දළ ජාවාරමේ නිරත වු කණ්ඩායමක් අනුරාධපුර මූලස්ථාන පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මෙහිදි මෙම ජාවාරම සම්බන්ධ ප්‍රධාන සැකකරු ඇතුළු පුද්ගලයන් පස් දෙනෙකුද පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

අනුරාධපුර පොලිස් කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ නිලධාරින්ට ලැබුණු තොරතුරකට අනුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපතිගේ උපදෙස් මත මෙම වැටලීම සිදු කර තිබේ.

ඉකුත් දෙදින තුළ සිදු කළ මෙම මෙහෙයුමේදී අලි ඇතුන් හතර දෙනෙකුගේ පමණ ඇත් දළ කොටස්ද සැකකරුවන් සමඟ අත්අඩංගුවට ගෙන තිබේ.මෙහි ප්‍රධාන සැකකරු අනුරාධපුර,සාලියපුර,මංගලගම ප්‍රදේශයේ වයස අවුරුදු තිස් අටක්(38) පමණ වන පුද්ගලයකු වන අතර එහි එක් සැකකරුවෙක් අනුරාධපුර ,පරසන්ගස්වැව ප්‍රදේශයේ පදිංචි අයෙකු හා අනෙක් තිදෙනා මන්නාරම,මඩු ප්‍රදේශයේ පදිංචිකරුවන් බවද පොලීසිය පවසයි. මේ ඇත් දළ ජාවාරම දීර්ඝ කාලයක් තිස්සේ කර ගෙන ගිය බවට මූලික පරීක්ෂණවලදී හෙළිවී ඇති අතර මේ සම්බන්ධව වැඩිදුර විමර්ශන කටයුතු අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශ නිලධාරින් විසින් සිදු කරනු ලැබේ.සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණ.



දසත

දස අත ම එක තැන

ඒ.ටී.එම්.ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

# නැගෙනහිර අධ්‍යාපන සේවයේ පුරප්පාඩු 139ක්

නැගෙනහිර පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඇතුළු කලාප අධ්‍යාපන කාර්යාල 17ක ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් 316ක් සිටිය යුතු වුවත් 139ක් පුරප්පාඩු ඇතැයි පළාත් අධ්‍යාපන ලේකම් ක්‍රිෂ්ටි ලාල් ප්‍රනාන්දු මහතා පැවසීය. නැගෙනහිර පළාතේ පළාත් පාසල් 1115ක් ඇති අතර ඉන් 480ක විදුහල්පති පුරප්පාඩු පවතින බවද ලෙක්ම්වරයා පෙන්වා දුන්නේය. මෙම පාසල් 480 තුළ ගුරු සේවයේ ගුරුවරු විදුහල්පති තනතුරුවල වැඩ බැලීම සිදුකරණ බවද කීය. මේ තත්ත්වය තුළ අධ්‍යාපන පරිපාලන කටයුතු සිදු කරගෙන යෑම ඉතා අසීරු තත්ත්වයකට පත් වී ඇතැයි කී පළාත් අධ්‍යාපන ලේකම් ක්‍රිෂ්ටි ලාල් ප්‍රනාන්දු මහතා යම් ප්‍රමාණයක් කඩිනමින් බඳවා ගැනීමේ අවශ්‍යතාවක් මතු වෙමින් පවතින බවද කීහ.

එස්. දීයගහගේ දකුණු පළාත් සංචාරක

# ගාල්ලේ සෞඛ්‍ය වෛද්‍යවරු දෙන්නා සේවයෙන් ඉවත්වෙලා:

## දරුවන්ගේ එන්නත් වැඩ ඇනහිටලා

ගාල්ල නගර සභාවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් දෙදෙනා මාර්තු 20 වැනි දින සිට නගර සභා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් කුඩා දරුවන්ට ලබාදිය යුතු එන්නත් ලබා දීමට නොහැකිවීම නිසා තමන්ට බලවත් අසාධාරණයක් සිදුව ඇතැයි මවුපියෝ පවසති. මේ නිසා මාස දෙක, මාස හතර සහ මාස හය මාස නමය යන වයස්වලදී විශේෂයෙන් ලබාදිය යුතු එන්නත් ලබා දීමට නොහැකිව ඇති අතර පළමු මාත්‍රාව ලබාදුන් බොහෝ දරුවන්ටද දෙවන මාත්‍රාව ලබාදීමට නොහැකිව ඇත. මේ පිළිබඳ වෛද්‍යවරයකුගෙන් විමසූ විට කියා සිටියේ කුඩා දරුවන්ට කක්කල් කැස්ස, ගලපටලය,පිටගැස්ම, පෝලියෝ, රුබෙල්ලා ,මොලේ උණ, .හෙපටයිටිස් ආදී රෝග සඳහා අනිවාර්යයෙන්ම එන්නත් ලබාදිය යුතු බවය. එයට අමතරව 10 වැනි ශ්‍රේණියේ සිසුවියන්ට ගර්භාෂ පිළිකා වැළැක්වීම සඳහා එන්නත් ලබාදෙන බවද එම වෛද්‍යවරයා පැවැසිය. මෙසේ දිය යුතුම එන්නත් ලබා නොදීම නිසා කිසියම් අවදානම් තත්ත්වයක් ඇති විය හැකි බවද එසේ වුවහොත් එය ඉතා භයානක තත්ත්වයක් බවද එම වෛද්‍යවරයා වැඩිදුරටත් පැවසිය. නගර සභා බල ප්‍රදේශයේ මධ්‍යස්ථාන 12කදී මසකට පවත්වනු ලබන සායන සංඛ්‍යාව 30කි.මේ වනවිට ඒවායේ එන්නත් ලබා දීම සම්පූර්ණයෙන්ම නතර වී ඇත. පසුගිය වසරේ දෙසැම්බර් 23වැනි දින නියෝජ්‍ය නගරාධිපතිවරයා නගර සභාවේ වෛද්‍ය නිලධාරි බර්ට්‍රම් ද සිල්වා මහතා ඇතුළු වෛද්‍ය නිලධාරින් දෙදෙනාට පරුෂ වචනයෙන් බැණවැදි තර්ජනය කළ බව පවසා වෛද්‍යවරුන් ඉකුත් 20වැනි දින සිට නගර සභාවේ රාජකාරිවලින් ඉවත්ව ගාලු දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට වාර්තා කර ඇත.

මේ සම්බන්ධයෙන් ගාල්ල නාගරික කොමසාරිස් රනිල් වික්‍රමසේකර මහතාගෙන් විමසූ විට කියා සිටියේ නගර සභාවට වෛද්‍යවරයෙකු ඉක්මනින්ම බඳවා ගැනීමට කටයුතු කරන බවය.

දයාරත්න බණ්ඩාර කෑගල්ල දිස්ත්‍රික් සමූහ

# අලුත් නුවර අලුත් සහල් මංගල්‍යයෙන්...

අලුත් නුවර කීර්ති ශ්‍රී රාජමහා විහාරය සහ අලුත් නුවර මහදේවාලය කේන්ද්‍ර කරගනිමින් සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව, නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය, සබරගමු පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ හිටපු සංවිධායක හර්ෂ සියඹලාපිටිය යන මහත්වරුගේ ප්‍රධානත්වයෙන් සිදු වුණු අයුරු.



සුමිත්‍රා කුමාරිහාමි කන්තලේ සමූහ

# සේරුවිල සිවිල් ආරක්ෂක මූලස්ථානයෙන් විශේෂ වගා වැඩසටහනක්

ඉකුත් තිස් අවුරුදු යුද සමයේ ඓතිහාසික සේරුවිල පුරවරය කොටි ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගැනීමට හා මුහුණට මුහුණ ලා ඔවුන් සමඟ සටන් කිරීමට පෙරමුණ ගත් සිවිල් ආරක්ෂක බළකායට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. එදා එලෙස රට ජාතිය වෙනුවෙන් සටන් කළ සිවිල් ආරක්ෂක බළකා නිලධාරීහු යුද්ධයට දුන් දායකත්වයට නොදෙවෙනි සටනක් රටේ ආහාර හා කෘෂි නිශ්පාදන උදෙසා ලබා දෙන්නේද මේ ලක් මෑණියන් වෙනුවෙනි. සේරුවිල සිවිල් ආරක්ෂක පළාත් මූලස්ථානය මේ වනවිට තම බල ප්‍රදේශ තුළ අක්කර සිය ගණනක් කෘෂි භෝග ව්‍යාපෘති රාශියක් පවත්වාගෙන යමින් හා අක්කර 5කට අධික වපසරියක පොල් වගා කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් ද ආරම්භ කර ඇත්තේ ඒ බව මොනවට ඔප්පු කරමින් ය. මාවිල්ආරු සොරොව්ව ආසන්න ප්‍රදේශයේ මෙම පොල් වගාව ආරම්භ කර ඇති අතර, සාමාන්‍ය පොල් වගාවන්ද අභිබවමින් යම් වර්ධනයක් දක්නට ඇති බව සේරුනුවර කෘෂි පර්යේෂණ නිලධාරි එස්. ගනේෂ නන්දන් මහතා පැවසීය. මෙම වගාව තුළ දී පොහොර, ජලය, නඩත්තුව නිරන්තරයෙන් ලැබෙන බැවින් හා විශේෂයෙන් කාබනික පොහොර භාවිතය හා ක්ෂේත්‍රයේ පැළ සිටුවීමට පෙර බිම් සැකසීම වැඩි වපසරියකින් යුතුව වළවල් කැපීම ද මෙම වර්ධනයට හේතුවන්නට ඇතැයි සේරුවිල සිවිල් ආරක්ෂක පළාත් භාර අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් සරත් ගුණසේකර මහතා පැවසී ය.

මේ වනවිට මෙම පළාත් කාර්යාලය හරහා ඊට අනුබද්ධ අනු කලාපයන් හි අන්නාසි, රටකජු,පැණි කොමඩු, වී, මුංඇට, එළවළු,අඹ, වගාවන්ද විශාල වශයෙන් වගා කිරීම ආරම්භ කොට ඇති අතර දෙවන වටයේදී තවත් පොල් අක්කර 15ක ව්‍යාපෘතියන් ඇරඹීමට දැනටමත් සැලසුම් සකස් කොට අවසන් බවද අණදෙන නිලධාරිවරයා පැවසීය. මේ අනුව වාන්ඇළ, පන්සල්ගොඩැල්ල, ආයිල්අඩි,සේරුවිල, සේරුනුවර, නීලපොල, දෙහිවත්ත යන ප්‍රදේශයන්හි මෙම වගාවන් ආරම්භ කොට ඇත.







මිහිර විජේසේකර-මාරවිල සමූහ

# සිරිපාදේ යන්න සල්ලි නැතිව ගෙදරක කුලියකට ගිහින් විදුලිසර වැදිලා

මහකුඹුක්කඩවල සෙම්බුකුලිය ප්‍රදේශයේ ආණමඩුව මධ්‍ය මහා විද්‍යාලයේ 17 හැවිරිදි සිසුවකු නිවසක අලුත්වැඩියා කටයුත්තක් සිදු කරමින් සිටියදී විදුලි සර වැදී මියගොස් තිබේ. පසුගිය 4 වෙනි දින මෙම අනතුර සිදුව තිබේ. මෙසේ මිය ගොස් ඇත්තේ මෙවර අපොස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සෙම්බුකුලිය ප්‍රදේශයේ පදිංචි කෞෂල්‍ය පැතුම් නමැති 17 හැවිරිදි පාසල් සිසුවකුය. මෙම සිසුවාගේ පියා මීට වසර 10කට පමණ පෙර හෘදයාබාධයකින් මරණයට පත් ඇති අතර මව මැද පෙරදිග රටක ගෘහ සේවයට ගොස් ඇත. මරණයට පත් සිසුවා මව විදේශ ගත වීමෙන් පසු පියාගේ මව සමඟ හැදී වැඩී ඇති බව ඥාතීහූ පවසති. මෙවර සිරිපා කරුණා කරන්නට යෑමට අවශ්‍ය මුදල් සොයා ගැනීමට මෙසේ මෙම සිසුවා අදාළ ප්‍රදේශයේ පෙදරේරුවකු සමඟ නිවෙසක අලුත්වැඩියා කටයුතු සිදුකරමින් සිටියදී මෙසේ විදුලි සර වැදී තිබේ.

සිසුවා සිරිපා වැඳිමට තවත් පිරිසක් සමඟ යෑමට සූදානම් වන බව විදේශ ගතව සිටින මවට ආරංචි වී තිබේ. අනතුරුව ඇය දරුවාට දුරකතන පණිවිඩයකින් එසේ නොකරන ලෙසද දන්වා තිබේ. පවුලේ අයද අකමැතිව සිටි නිසා ගමනට අවශ්‍ය මුදල් හා ඇඳුම් ලබා ගැනීමට මෙසේ දින කිහිපයක් පවුලේ අයගේ විරෝධය මත මෙම රැකියාවට ගොස් සිටියදී මෙම අනතුරට ලක් ව ඇත. විදුලි සර වැදීමෙන් පසු සිසුවා කඩිනමින් පුත්තලම මූලික රෝහලට ඇතුළත් කළද ඒ වන විටත් සිසුවා මරණයට පත්ව් සිටි බව කියයි. සිද්ධිය සම්බන්ධයෙන් ආණමඩුව පොලීසිය පරීක්ෂණ පවත්වයි.

සෝමදාස සමර ගුණරත්න ගිරාඳුරුකෝට්ටේ සමූහ

# ගස්-ගල් බෝක්කු යට සඟවා හෙරොයින් විකුණන අයෙක් අත්අඩංගුවට

මත්කුඩු පැකට් කර ඒවා ප්‍රධාන මාර්ගයේ ගස්වල,බෝක්කුවල, කිලෝමීටර් කණුවල සෙලෝටේප් භාවිතයෙන් අලවා ඊෂි කෑෂ් ක්‍රමයට මුදල් ලබාගෙන අදාළ ගනුදෙනුකරුවන්ට දුරකතන මාර්ගයෙන් ඒවා අලවා ඇති ස්ථාන පිළිබඳ දැනුම්දී ඔවුන්ට ඒවා ලබා ගැනීමට සලස්වා දීමේ ක්‍රමය භාවිත කරමින් මත්කුඩු අළෙවියේ යෙදෙමින් සිටි පුද්ගලයෙක් හෙරොයින් මිලි ග්‍රෑම්2110ක්ද සමඟ ගිරාඳුරුකෝට්ටේ පොලිස් වසමේ ගිරාලගොල්ල කොටසේදී අත්අඩංගුවට ගෙන තිබේ. ලබාගත් තොරතුරු අනුව උපාය දූතයෙක් ලෙස පොලිස් නිලධාරියකු යොදවා සැකකරු කොටුකර ගත් බව ස්ථානාධිපති පො.පරීක්ෂක.එම්.බී.ජී.එස් චතුරංග මහතා පැවසිය.

ඊට අමතරව ගසක අලවා තිබූ මත්කුඩු මිලිග්‍රෑම් 210ක පැකට්ටුවක්ද සොයාගෙන තිබේ.

ආර්.එම්.විජේරත්න- හාලිඇළ සමූහ

# හාලිඇළ සමුපකාර ඉන්ධනහල් සේවකයන්ගේ ජනවාරී දිරි දීමනාව තවම නැහැ

හාලිඇළ විවිධ සේවා සමූපකාර සමිතියේ ඉන්ධනහල් සේවක පිරිසට ඉකුත් ජනවාරි මාසයට අදාළව ලබාදිය යුතු ඉන්ධන දිරි දීමනාව මෙතෙක් ලබා නොදීම සම්බන්ධයෙන් විරෝධය පළකරමින් එම සේවකයෝ ඉන්ධන පිරවුම්හල වසා දමා උද්ඝෝෂණයක යෙදුණහ. මෙම ඉන්ධන හල අයත් ඉන්දියන් ඔයිල් සමාගම විසින් ලිහිසි තෙල් අලෙවිය දිරි ගැන්වීම පිණිස ඉන්ධන හල් සේවකයන් හට මාසික ඉන්ධන අලෙවියට අදාළව දිරි දීමනාවක් ලබාදෙන බවත් ඉකුත් ජනවාරි මාසයට අදාළ එම දීමනාව සමූපකාර සමිති බලධාරීන් විසින් මෙතෙක් තමනට ලබාදී නැති බවත් ඔවුහු පවසති. සේවකයන් 08 දෙනෙකු



මෙම විරෝධතාවයට එක්ව සිටියහ. එම ඉන්ධන හල් කළමනාකරු වන දිනුෂ පෙරේරා මහතාගෙන් මේ පිළිබඳ විමසීමේදී ඒ මහතා පැවසුවේ අදාළ සේවකයන්ට හිමි ජනවාරි මස දීමනාවට අදාළ මුදල පෙබරවාරි මාසය වන විට සමූපකාර සමිතියට ලැබී තිබූ නමුත් සමූපකාර අධ්‍යක්ෂ මණ්ඩලය එය සේවකයන්ට ලබාදීමට මෙතෙක් පියවර නොගත් බවයි. එසේම රුපියල් 283.00 ක පමණ ඉතා පහළ දෛනික මූලික වැටුපක් ලබන මෙම සේවකයන් මෙම දීමනාද නොලැබීමෙන් විශාල අසීරුතාවයකට පත්වන බවද ඔවුනට අවුරුදු අත්තිකාරම් මුදලක් හෝ මෙතෙක් ලබාදී නැති බවද හෙතෙම පැවසීය. මෙම සමිතියේ ආදායම් ලබන එකම ව්‍යාපාරය වන මෙම ඉන්ධන පිරවුම්හලෙන් මාසිකව රුපියල් ලක්ෂ 10ක පමණ දළ ලාභයක් සමිතිය ලබන බැවින් එම ආදායම උපයා දෙන මෙම ඉන්ධනහල් සේවකයන්ට හිමි දීමනා නිසි වේලාවට ලබාදීම සමූපකාර අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් හා යුතුකමක් බවද කළමනාකාරවරයා පැවසීය. ඌව පළාත් සමූපකාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් එම සමූපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී (වැඩබලන) නදීකා රසාංජලී මහත්මිය පැවසුවේ මේ සම්බන්ධයෙන් පළාත් සමූපකාර කොමසාරිස්වරයාගෙන් විමසූ අතර අදාළ සමාගම මඟින් ලබාදුන් මෙම දීමනාව සේවකයන්ට ලබාදීමේ වගකීම ඇත්තේ සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට බව කොමසාරිස්වරයා පැවසූ බවයි.

මේ පිළිබඳ විමසීමේදී හාලිඇළ විවිධ සේවා සමූපකාර සමිතියේ සභාපති ආර්.එස්.ඩී. සෝමසිරි මහතා පැවසුවේ මේ වන විට සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක් ඉල්ලා අස්වීමේ ලිපි භාරදී ඇති අතර එම ඉල්ලා අස්වීම පිළිගෙන නොමැති වුවත් සමිතිය අක්‍රීය තත්ත්වයට පත්ව ඇති බවයි. එබැවින් මේ පිළිබඳ තමනට තීරණයක් ගත නොහැකි බවද හෙතෙම පැවසීය.

දිසත - දස අත ම එක තැන

ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ

## අවුරුදු වසන්තය ළඟ ළඟම ....

බදුල්ලට අවුරුදු වසන්ත සමය උදාවීමත් සමඟ මේ දිනවල නගරය පුරා රොබරෝසියා ගස්වල මල් පිපී අවට පරිසරය පුරා දැකුම් කළු චිත්‍රයක් මවා තිබේ.

සෑම වසරකම අප්‍රේල් මාසය උදාවෙද්දී බදුල්ල නගරයේ තිබෙන රෝබරෝසියා ගස්වල මල් පීපි මලින් බරව උද්‍යානයක් බවට තිබේ.

බදුල්ල නගරයේ හා මුතියංගන පුදබිම, පිහිල්කඩේ හා නගරයේ පත්තිනි දේවාලයේ සහ සියලුම වීදීවල තිබෙන ගස් වල මේ මල් පිපී තිබෙනු දක්නට ලැබේ.





සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ

# රත්නපුරේ පාසල් නොයන දරුවන් පිරිස දහස ඉක්මවයි

## සමීක්ෂණයෙන් හෙළිවෙයි

රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් නොයන සහ කඩින් කඩ පාසල් යන සිසු පිරිස එක් දහස් හාරසිය තිහක් වන බව ළමා සංවර්ධන කමිටුවේදී අනාවරණය කෙරුණි. රත්නපුරේ පාසල් නොයන සහ කඩින් කඩ පාසල් යන ළමුන් විධිමත්ව පාසල් ගත කිරීමේ නව වැඩපිළිවෙළක් රත්නපුර දිසාපති උපදෙසින් ක්‍රියාවට නැංවීම බලගන්වමින් පවතින් බව එහිදී අනාවරණය විය.

රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් නොයන හා කඩින් කඩ පාසල් යන ළමුන් විධිමත්ව පාසල් ගත කිරීමේ නව වැඩපිළිවෙළක් රත්නපුර දිස්ත්‍රික් ලේකම් දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුවේ සභාපති මාලනී ලොකුපෝතාගම මහත්මියගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ක්‍රියාවට නංවා ඇත. මෙම වැඩපිළිවෙළ පිළිබඳ තොරතුරු පසුගියදා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවති රත්නපුර දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුවේදී අනාවරණය විය. ප්‍රථමයෙන්ම දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මියගේ උපදෙස් මත දිස්ත්‍රික්කයේ පාසල් නොයන සහ කඩින්කඩ පාසල් යන ළමුන් හඳුනා ගැනීමේ සමීක්ෂණයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කළ බව දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී බී.ඒ. හසන්ති තනුජා මහත්මිය සඳහන් කළාය. එහිදී අනාවරණය වූ තොරතුරු ලෙස ඇය පෙන්වා දුන්නේ පාසල් යන වයසේ පසුවන නමුත් කිසිදා පාසල් ගොස් නැති ළමුන් හතළිස් හය දෙනෙකු ද පාසල් නොයන ළමුන් දෙසීය අසූහතර දෙනෙකුද, කඩින්කඩ පාසල් යන ළමුන් එක්දහස් එකසියයක්දක්ද ලෙස දිස්ත්‍රික්කයේ සිටින පාසල් අධ්‍යාපනය සම්බන්ධ අවධානම් තත්ත්වයේ පසුවන දරුවන්ගේ එකතුව 1430ක් වන බවයි. එමෙන්ම මෙහිදී තවත් සුවිශේෂී කරුණක් කෙරෙහි ළමා කමිටුවේ අවධානය යොමු විය. එනම් දරුවාගේ නීතිමය තීරණයකින් තොරව මව්පියන් හෝ භාරකරුවන් වෙන්ව ජීවත්වන අවස්ථාවලදී දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් ගැටලු ඇතිවන බවයි.

මෙම අවස්ථාවට රත්නපුර අතිරේක දිස්ත්‍රික් ලේකම් ජී.ඩී.එල්. උදය කුමාරි මෙනවිය, රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් මහත්ම මහත්මීහු රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීහු සහභාගී වී සිටියහ.

ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

# නිවෙසක සඟවා තිබූ ජෙලටිනයිට් කූරු 82ක් සමඟ අයෙක් අත්අඩංගුවට

කුච්චවේලි පොලිස් වසමට අයත් ඉරක්කන්ඩි ප්‍රදේශයේ නිවෙසක සඟවා තිබූ ජෙලටිනයිට් කූරු 82ක් සමඟ පුද්ගලයකු පෙරේදා (04) පස්වරුවේ අත්අඩංගුවට ගැනීමට පොලීසිය සමත් විය.

නාවික හමුදාවෙන් ලබාදුන් බුද්ධි තොරතුරකට අනුව ක්‍රියාත්මක වූ කුච්චවේලි පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනක විතානගේ මහතාගේ මෙහෙයවීම මත උප පොලිස් පරීක්ෂක ඉලංගසිංහ පොලිස් කොස්තාපල් මේනක යන මහත්වරු වැටලීම සිදු කර මෙම සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු මෙම පුපුරණ ද්‍රව්‍ය මසුන් මැරීම සඳහා භාවිත කිරීමට සඟවා තබාගෙන ඇති අතර මොහු ධීවර කාර්මිකයකු බව පොලීසිය කියයි. සැකකරු ත්‍රිකුණාමල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනක විතානගේ මහතාගේ ප්‍රධානත්වයෙන් වැඩිදුර පරීක්ෂණ ක්‍රියාත්මක වේ.

පානදුර උපාලි ජයරත්න

## ජනතාවට සෙත්පතා ආශිර්වාද අධිෂ්ඨාන පූජාවක්

පානදුර අරුග්ගොඩ ශ්‍රී ඉන්ද්‍රසාරාම මහා විහාරස්ථ ධර්ම මන්දිරයේදී පසුගියදා මාර්තු මස (28) පුර පසළොස්වක දින ජනතාවට සෙත්පතා ආශිර්වාද අධිෂ්ඨාන පූජාවක් පැවැත්විණි. පානදුර ගල්ගොඩ ශ්‍රී මහා විහාරාධිපති කළුතර පානදුර දෙකොටමුණේ ප්‍රධාන සංඝනායක ර/ පොතුපිටියේ පඤ්ඤාසේකර නාහිමිපාණන් විසින් එම පූජාව පැවැත්වූ අයුරු ඡායාරූපයේ දැක්වේ. මහ අරුග්ගොඩ ලිය උදාන කාන්තා කාර්ය සංවිධානය සිය පළමු වැඩසටහන ලෙස මෙය සංවිධානය කර තිබිණි.



ජයසිරි මුණසිංහ

# මඩකලපුවේ හෙදියන්ටත් දත් ගලවන්න උගන්වයි



දන්ත වෛද්‍ය ක්‍රමයේ අලුතින් හඳුන්වා දී තිබෙන නවීන දැනුම හා තාක්ෂණික ක්‍රමවේද සම්බන්ධ මූලික හා අර්ධකාලීන දත් සිටුවීම් සම්බන්ධ දවස් තුනක් පුහුණු පාඨමාලා මඩකළපුව ඊස්ටන් ලැගූන් හෝටලයේ දී පසුගිය පැවැත්විණි.

මඩකලපු දිස්ත්‍රික්කයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ඒ කෂේත්‍රයේ වැඩ කරන හෙදියන් වෙනුවෙන් ඔරම් පෞද්ගලික ආයතනය විසින් මේ පුහුණු පාඨමාලා සංවිධානය කර ඇත. ඔරම් සමූහ පෞද්ගලික ආයතනයේ සමූහ සභාපති ජාබිර්සාලි, කළමනාකරණ අධ්‍යක්ෂ මුස්තාක් ජාබිර් යන අයගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වුණ මේ පුහුණු පාඨමාලාවේ ප්‍රධාන සම්පත් දායකයන් වශෙයන් දත් ශල්‍ය වෛද්‍ය විජයනායහම් තුදිහරන් සහභාගි විය.



ජේ.එම්. හාෆීස් - අකුරණ සමූහ

## මධ්‍යම පළාතේ ව්‍යවසායකයන්ට උපකරණ



මධ්‍යම පළාතේ අඩු ආදායම්ලාභී ව්‍යවසායකයන් සහ කාන්තා ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශයේ ආයෝජන උපකරණ බෙදා හැරීමේදීම පසුගියදා සිදු කෙරිණි.

එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ මහතා සහභාගී විය. ඊට මහන මැෂින් 161ක්, විදුලි උඳුන් 18ක්, ඕවර්ලොක් මැෂින් 30ක්, කොණ්ඩා මෝස්තර හා රූපලාවන්‍යාගාර පුටු 06ක් සහ සාමාන්‍ය මහන මැෂින් 9ක් ප්‍රතිලාභීන් 131 දෙනෙකු වෙත බෙදා දෙන ලදී.

ඩබ්ලිව්. විදානපතිරණ - ඇඹිලිපිටිය සංචාරක

## හැඩ තිබුණට වැඩ නැති ඇඹිලිපිටිය ඔරලෝසුව



ඇඹිලිපිටිය පල්ලේගම නගරයට මහත් අභිමානයක් ගෙනදුන් ඔරලෝසු කණුව වසර ගණනාවක සිටම වෙලාව නොයන අයුරු නගරයට යන එන හැම දෙනාටම සුපුරුදු දර්ශනයක් වී ඇත.

මෙම ඔරලෝසු කනුව සහ එම භූමිය මීට වසර දෙකකට පමණ ඉහත දී ඇඹිලිපිටිය සී.අයි.බී. පෞද්ගලික වෙළෙඳ ආයතනය මගින් අලංකාර කර තිබෙන අතර මීට වසරකට පමණ පෙර පරිසරයට හිතැති ඇඹිලිපිටිය තරුණ තරුණියන් පිරිසක් විසින් විචිත්‍ර වූ චිත්‍රවලින් තවත් අලංකාර කර ඇතත් එහි වෙලාවනම් අදාළ බලධාරීන් විසින් තවමත් සකස් කර නැත.

මෙම ඔරලෝසුවේ වෙලාව කඩිනමින් සකස් කර දෙන්නැයි ජනතාව අදාළ බලධාරීන්ගෙන් ඉල්ලති.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

## ගාල්ලේ දේශීය පැළ රෝපණය කිරීමේ වැඩපිළිවෙළක්

ගාල්ල දිසාවේ පයිනස් ගස් වගා භූමිවල යටිතල වගාවක් ලෙස දේශීය පැළ රෝපණය කිරීමේ වැඩපිළිවෙළක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබේ. මේ යටතේ තවලම ප්‍රදේශයේ පයිනස් ගස් වගා භූමියක යටිතල වගාවක් ලෙස හෙක්ටර්යාර 7 කි.මී හොර සහ ඇටඹ ඇතුළු තවත් දේශීය පැළ වර්ග කිහිපයක්ම දැනටමත් රෝපණය කර ඇතැයි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගාල්ල දිසා වන නිලධාරි ආචාර්ය වසන්ත ලියනගේ මහතා පැවසීය. මේ අතර ගාල්ල දිසාවේ තවත් පයිනස් වගා භූමි කීපයක දේශීය පැළ වර්ග රෝපණය කිරීමට කටයුතු යොදා ඇතැයිද වසන්ත ලියනගේ මහතා පැවසීය.

ඩබ්.ඒ. සරත් - ගිරිඋල්ල සමූහ

## ජන ක්‍රීඩා සංස්කෘතික වැඩසටහනක් පන්නලදී

අපේ පැරණි ජන ක්‍රීඩා හඳුන්වාදීමේ සංස්කෘතික වැඩසටහනක් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සංස්කෘතික අංශය සහ සමෘර්ධි සමාජ සංවර්ධන අංශයේ සංවිධානයෙන් පන්නල හුණුවිල ග්‍රාමයේදී සිදු කෙරිණි. අලි වැටකින් ආවරණය කළ ගෙවත්තක ගොවි පැළක් ඉදිකර එහි සිට මෙම ජන ක්‍රීඩා ඉදිරිපත් කෙරිණි. ගෘහස්ථ ක්‍රීඩා ලෙස නෙරෙංචි ඇදීම, පංච දැමීම වැනි ක්‍රීඩාත් එළිමහන් ක්‍රීඩා ලෙස කොලපත් ඇදීම, පොල්පිති ගොනා, පොල් කටු පැනීම, පොල් කොට කරත්තෙ වැනි ක්‍රීඩාත් මෙහිදී ප්‍රදර්ශනය කෙරිණි. හිටිවන කවි, පැල් කවි, ජන ගී ද ඉදිරිපත් කෙරිණි.



මෙම අවස්ථාවේදී පන්නල ප්‍රාදේශීය ලේකම් සමන්ත වික්‍රමරත්න බණ්ඩාර, පන්නල සංස්කෘතික නිලධාරිනී සීතා කුමාරි ලියනගේ සහාව ඇමතූහ. පැරණි ජන ක්‍රීඩා පිළිබඳ දේශනය පරිසරවේදී ආචාර්ය ගාමිණී දයාවංශ මහතා සිදු කළහ. පන්නල සංස්කෘතික සංවර්ධන නිලධාරීනියන් වන එස්.පී. චන්ද්‍රකා සහ පුෂ්පා රංජනී දෙපළගේ ආරාධනයෙන් විශාල පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

සබරගමුව සමූහ සහ කෑගල්ල සමූහ

## කෑගල්ලේ සංවර්ධන නිලධාරීන් 354කට ස්ථිර පත්වීම්

මීට වසර තුනකට පෙර 2019 වර්ෂයේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීමෙන් පසු නියමිත පුහුණුව අවසන් කළ අභ්‍යාසලාභීන් හට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම වතු සමාගම් ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (01) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

මේ අවස්ථාව සඳහා කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සුදත් මංජුල, කෑගල්ල දිසාපති/දිස්ත්‍රික් ලේකම් මහින්ද එස් වීරසූරිය, අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) චරිතා ඉලංගකෝන්, සහකාර දිස්ත්‍රික් ලේකම් විජයානි රත්නසේකර යන මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් ද එක්ව සිටියහ.

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

# අතරමැදියන් ගොවි-පාරිභෝගික දෙන්නම සූරා කනවා

## ජාතික ගොවිජන එකමුතුව කියයි

දශක ගණනාවක සිට මේ රටේ අහිංසක ගොවියා මෙන්ම පාරිභෝගිකයා ද අතරමැදියා විසින් අමානුෂික ලෙස සූරාකමින් සිටින බව ජාතික ගොවිජන එකමුතුවේ සභාපති අනුරාධ තෙන්නකෝන් මහතා සඳහන් කළේය. ජාතික ගොවිජන එකමුතුව පසුගිය සතිය පුරා අනුරාධපුර හා වව්නියා දිස්ත්‍රික්කවල ගොවිබිම්වල සංචාරය කරමින් ගොවි ජනතාවගේ ගැටලු පිළිබඳව සොයා බැලීමෙන් අනතුරුව ඊයේ (05) අනුරාධපුරයේදී මාධ්‍ය වෙත අදහස් දැක්වමින් මේ බව පැවසූ සභාපතිවරයා එහිදී තවදුරටත් මෙසේද පැවසීය.

“මේක කෘෂිකාර්මික රටක්. වැඩි පිරිසක් ගොවි ජනතාව. කලින් කෘෂි රසායන ද්‍රව්‍ය යෙදුවේ කුඹුරුවලට විතරයි. අද ගොවියෝ හේන්වලටත් ඒව යොදනවා. සේනා දළඹුවා එනකොට තෙල් ගහන්න වෙනවා. ඇයි එහෙම වෙන්නේ. බීජ ගේන්නේ පිටරටින්. මේක කවුරුත් දන්න ඒත් කතා කරන්න අකැමැති ජාවාරමක්. පිටරටින් බීජ එනවා. ඒ නැවට පිටිපස්සේ නැවේ ඒ බීජ පැළ වුණාම හැදෙන රෝගවලට ගහන්න කෘමිනාශක වල්නාශක එනවා. ඒ නැවට පිටිපස්සේ නැවේ ඒ ගස්වල හැදෙන විෂ සහිත ගඩා ගෙඩි කාලා මිනිස්සුන්ට හැදෙන ලෙඩ රෝගවලට බෙහෙත් එනවා. මේක තමයි 77න් පස්සේ විවෘත ආර්ථිකේ හින්ද අපට ලැබිච්ච දායාදේ. මේකට විකල්පයක් හැටියට අපි ගම්මානවලට ගොවියන් එක්ක සාකච්ඡා කරලා ආරම්භ කලා බීජ නිෂ්පාදන ගොවි සමිති. පිටරට බීජ වෙනුවට අපේ ගොවිබිම්විලම අපට අවශ්‍ය බීජ ඉදිරියේදී අපි හදනවා. ඒ සඳහා ගොවි ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් අපි ලබා දෙනවා.”

මෙහිදී අදහස් දැක්වූ ජාතික ගොවිජන එකමුතුවේ ජාතික සංවිධායක අනුරාධපුර නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවීර මහතා.

“අද ගොවියා කබලෙන් ළිපට වැටිලා ඉන්නේ. සාමාන්‍යයෙන් බඩඉරිඟු අක්කරයක් වගාකරන්න රුපියල් 65,000ක් 70,000ක් විතර මුදලක් යනවා. අක්කරයකින් දළ වශයෙන් බඩඉරිඟු කිලෝ 2,000ක් 2500ක් වගේ අස්වැන්නක් ලැබෙනවා. නමුත් විවිධ බාධා හින්ද මේ සැරේ ලැබුණේ අක්කරයකට බඩඉරිඟු කිලෝ 1,500කටත් අඩු අස්වැන්නක්. මීට මාස දෙක තුනකට ඉස්සෙල්ලා පෞද්ගලික වෙළෙන්දෝ කිලෝව රුපියල් 60ක් 70ක් වගේ මිලකට ගත්තා. නමුත් අද වෙනකොට ඒක රුපියල් 30, 40ට අඩුවෙලා. ගොවියා අන්ත අසරණ වෙලා ඉන්නේ. අපි ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ මේ අහිංසක ගොවීන්ගේ හඬට කන්දීලා ඔවුන්ගේ අස්වනුවලට සාධාරණ මිලක් ලබා දෙන්න කියලා.”

යනුවෙන් ජාතික සංවිධායකවරයා වැඩිදුරටත් පැවසීය.

# හඬක් නැත්තන්ට වේදිකාවක් තනන්නට මඟ පෙන්වන වොයිස්


එච්.එම්.වසන්ත පුෂ්පකුමාර (ප්‍රධාන විධායක අධ්‍යක්ෂ)


තරුණ වීදි නාට්‍ය කණ්ඩායම


ඇවිදින පුස්තකාලය


කාන්තා ප්‍රජා නායකයින්

**කේ.ප්‍රියංකර කළුපහන වනාතවිල්ලුව සමූහ**

දෙවන ලෝක සංග්‍රාමයේ අවසානයෙන් පසු, රාජ්‍ය නොවන සංවිධාන ජාත්‍යන්තරයේ පමණක් නොව මෙරටදී ද ඔවුන් නව සංවර්ධන ප්‍රවේශයක් කරා ගමන් කරමින් රටේ අනන්‍යතාව සුරකිමින් රටේ ජීවත් වන සිවිල් පුරවැසියන්ගේ ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික, ආර්ථික, සමාජීය, සෞඛ්‍ය සහ අයිතීන් සුරක්ෂිතව පවත්වා ගෙන යෑම සඳහා යුග මෙහෙවරක නිරායාසයෙන්ම නියැළෙති.මේ යන ගමනේ විශේෂයෙන් මානුෂීය ආධාර සහ දරිද්‍රතාව පිටුදැකීමේ ක්ෂේත්‍රවල ප්‍රමුඛස්ථානය ගෙන කටයුතු කරනු ලැබීම තුළින් රටක රාජ්‍ය පරිපාලනය හෝ දේශපාලනය විසින් ලබා දෙනු ලබන පැලැස්තර විසඳුම්වලට තිරසාර විසඳුම් ලබා දෙමින් දුප්පත් පොහොසත් යන සැමට එක ලෙස සමානාත්මතාවයෙන් යුතුව කටයුතු කිරීම රාජ්‍ය නොවන ආයතන ව්‍යුහයක ප්‍රධාන කාර්ය භාර්ය වේ. කහට කෝප්පයෙන් කුස පුරවා ගෙන දවස ගෙවන අන්ත අසරණ දිළිඳු පවුල් සේම විශේෂ අවශ්‍යතා ඇති අය වැන්නෝ අප සමාජ තලයේ හිඟ නොවෙති. ඔවුන්ගේ ජීවිත වටා වෙලා පවත්නා වූ අඳුරු අප්‍රසන්න වලා පටලය දිය වී යන්නේ කෙදිනකදැයි කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නාක් මෙන්, ඔවුන්ද දෑස් අයා සිටිති. ඒ ජීවිත වෙලා ගෙන ඇති අඳුර දුරුකරමින් සාර දිවියට පාර පෙන්වන මාලිමාවක් සිව් දෙස සිසාරා කැරකවෙන්නට පටන් ගෙන තිබේ. ඒ ළමුන් ඇතුළු සියලු පුරවැසියන්ගේ අයිතීන් තහවුරු කිරීම පදනම් කර ගත් වොයිස් ප්‍රාදේශීය සම්මේලනයේ ආරම්භයත් සමඟිනි. මෙම වොයිස් නම් වූ ආයතනය අද වන විට හෙට ලොව එළිය දකින අනාගතය විකසිත වන දරුවන්ගේ පරිපූර්ණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පෙළඹී ඇති අතර, එමගින් දරුවාගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කරන පවුල් සහ ප්‍රජා පද්ධති ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් දරුවාට ධනාත්මක හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට කටයුතු කරනු ලබයි. මෙම ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය බවට නතුව ඇත්තේ දරිද්‍රතාවයේ අයුක්තියට කල් පවත්නා විසඳුම් නිර්මාණය කරමින් සමාජයේ සියලු තලවල ජීවත් වන සැමට එක ලෙස ජීවත් වීමට අවශ්‍ය ගෞරවනීය ජීවිතයක් කරා ගෙන යෑමයි. මිනිසුන්ගේ ධෛර්යය හා විභවතාවන් පිළිබඳ නිරන්තරයෙන් සොයා බලන මොවුන් ඔවුන්ට ඇවැසි සෞඛ්‍ය සහ යටිතල පහසුකම් මෙන්ම පුරවැසි ප්‍රඥප්තීන් ආරක්ෂා කරමින් ශක්තිමත් ප්‍රජාවන් ගොඩනැගීම සහ දරුවන් සඳහා ධනාත්මක සමාජ වෙනස්කම් ඇති කිරීම සඳහා නිරායාසයෙන් නව ක්‍රමවේදයන් පසු පස හඹා යනු ලැබේ.

VOICE ආයතනය විසින් ළමුන්ට අවශ්‍ය අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන්, මාර්ගෝපදේශනය මෙන්ම ජීවනෝපාය සහාය සහ ආපදා අවදානම අවම කිරීම සඳහා ජීවනෝපායන් වැඩිදියුණු කිරීම, අසමානතාවයන් සමතුලිත කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ඒකාබද්ධ කිරීම, සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා සියලු දෙනා ඇතුළත් වන කණ්ඩායම් සවිබල ගැන්වීම මෙහිදී සිදුකරනු ලැබේ. VOICE ශ්‍රී ලංකාව තුළ සිටින දහස් ගණනකගේ ජීවිත ස්පර්ශ කරමින් දරිද්‍රතාවයට ලක්වූවන් නවමු ලොවක් කරා ගෙන යන ක්‍රියාන්විතයේ පෙර ගමන්කරුවකු ලෙස පැහැදිලිව නිර්වචනය කළ හැකිය. තිස් වසරක් පුරා පැවති සාපයේ විලාපය නැමති කුරිරු යුධ ගිනි දැල්වලින් වැසී ගිය ගිනි ගත් වාලුකාවට බලාපොරොත්තුවේ පොද වැස්ස වොයිස් ආයතනයේ පුනරාගමනයෙන් සනිටුහන් විය. ඕනෑම රටක සංවර්ධනය හීන වීමට බලපාන ප්‍රධාන සාධක අතරින් යුද්ධය සහ දේශපාලන අස්ථාවරත්වය, ජාතික ණය, වෙනස් කොට සැලකීම සහ සමාජ අසමානතාව සහ ස්වාභාවික විපත්වලට ගොදුරු වීමේ හැකියාව හේතුවෙන් දරිද්‍රතාවය ඉහළ යැමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. එකී දරිද්‍රතාව මිනිසුන් අතර සාධනීයව බෙදා යනු ලබන්නේ කාන්තාවන්, පිරිමින්, දරුවන්, වැඩිහිටියන්, ආබාධිත ප්‍රජාව ලෙසිනි. මෙහිදී වොයිස් ආයතනය ආබාධිතයන් කෙරෙහි වැඩි අවධානමක් සහ සැලකිල්ලක් ගෙන කටයුතු කරනු ලැබේ. එහිදී විශේෂයෙන් අවාසි සහගත හා අවදානමට ලක්විය හැකි ජනතාවගේ අයිතිවාසිකම් අවබෝධ කර ගැනීම සහ සහතික කිරීම වර්තමානයේ කේන්ද්‍රීය සංවර්ධන අභියෝගයක් ලෙස මොවුන් එහි බර සෘජුව කර මත පටවා ගෙන ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් හඬක් නැගීමට ඉඩ ප්‍රස්ථාව සකසා දීම සිදුකරමින් ඔවුන්ව සවි බල ගැන්වීම අගය කළ යුතුව තිබේ. අපමණ යුග මෙහෙවරක පෙර ගමන් කරුවකු වූ වොයිස් ආයතනය පොළොන්නරුව, අනුරාධපුර, මන්නාරම, මුලතිව්,නුවරඑළිය පුත්තලම ආදි දිස්ත්‍රික්ක තුළ ව්‍යාප්ත වෙමින් දැවැන්ත මෙහෙවරක ප්‍රධාන හවුල්කරුවෙක් සේම රටේ උන්නතියට මෙමගින් සෘජු දායකත්වයක් ලබා දෙමින් දරිද්‍රතාවට ලක්වූවන් වෙනුවෙන් තිරසාර විසඳුම් සොයන මෙහි ප්‍රධාන කාර්යාලය පුත්තලම දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති අතර එහි ප්‍රධාන විධායක අධ්‍යක්ෂ ලෙස එච්.එම්. වසන්ත පුෂ්පකුමාර මහතා කටයුතු කරනු ලැබේ. ඒ මහතාගේ නව සංකල්පයක් පෙරදැරි කර ගනිමින් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුෂ්කර ගම්මාන අතරින් අති දුෂ්කර ගම්මානවල පවුල් 3500ක් පමණ මෙම ආයතනය ඔස්සේ සෘජුවම ප්‍රතිලාභ ලබන්නන් බවට පත් කර තිබේ.

මේ යෝධ සංවර්ධනයේ නිම් වළලු පුළුල් කිරීම වේගවත් කිරීම පිණිස අතරමැදි හවුල් කරුවන් ලෙස රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ විදේශීය රටවල් මෙන්ම පෞද්ගලික ආයතනද අත්වැල් බැදගෙන තිබේ. තවද වොයිස් සංසදයේ ආරම්භයේ සිට මේ දක්වා ලද ප්‍රගමනයට CHILD FUND SRI LANKA ආයතනය පුරා වසර පහළොවක පමණ කාලයක් මූල්‍යමය හා තාක්ෂණික වශයෙන් නොමද සහායක් ලබා දී තිබේ. ළදරුවන් සදහා ක්‍රියාත්මක වැඩ සටහන් යටතේ ප්‍රමුඛතම කාර්ය වනුයේ ඔවුන්ගේ සෞඛ්‍ය හා පෝෂණය වර්ධනය කිරීමට මොවුන් සෘජු දායකත්වයක් සපයනු ලැබීමයි. එහිදී නායක මව්වරු සමඟ සිදුකරනු ලබන වැඩසටහන් සේම, පෝෂණ කඳවුරු, සෞඛ්‍ය උපදේශනය, ළදරු පෙර පාසල් දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආදි කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබේ. පාසල් යන වයසේ දරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇති අතර, එහිදී දරුවන්ගේ නැණස, බුද්ධිය, පරිකල්පනය, හා බැදුණු ක්‍රියාකාරකම් සමුදායක් තුළින් අධ්‍යාපනය නගා සිටුවීමට නිරායාසයෙන් කටයුතු කරන මොවුන් විසින් හදුන්වා දී ඇති ඇට්ලස් ව්‍යාපෘතිය මෙහි නව මුහුණුවරක් ගනු ලැබේ. ඒ තුළින් දරුවන්ගේ අධ්‍යාපනයට සෘජු දායකත්වයක් ලබා දෙන ගුරුවරුන් හට දරුවන්ට ඉගෙනීම් කටයුතු සිදුකරන අයුරු පිළිබඳ සකසුරුවම් පුහුණුවක් සහ මාර්ගෝපදේශන වැඩසටහන් මාලාවක් සිදු කිරීම සහ එයට සාපේක්ෂව එකී පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ගේ නිපුණතා මට්ටම ඇගයීමට ලක් කිරීමේ වැඩපිළිවෙළ මෙයට සමගාමීව සිදුවෙමින් තිබේ. මෙයට අමතරව ඩිජිටල් කරණයේ නව පිටුවක් අධ්‍යාපනට එක්කාසු කිරීමට සමත්වූ මොවුන් ස්මාට් ක්ලාස් රූම් නමැති අධ්‍යාපනික වැඩ සටහන හඳුන්වා දීම තුළින් ළමයා තුළ ඉගෙනිමට ඇති රුචිකත්වය ඉහළ දැමීමට කටයුතු කිරීම, ළමා කඳවුරු පැවැත්වීම, වැඩසටහන ක්‍රියාත්මක සෑම ගමකම දරුවන්ට ඉගෙනීම් කටයුතු සඳහා මධ්‍යස්ථාන ස්ථාපිත කර ඒ තුළ ළමා පුස්තකාල සේම අධ්‍යන කටයුතු සඳහා නිස්කලංක වටපිටාවක් බිහි කිරීමෙන් ළමයාට අවශ්‍ය දැනුම සහ ආකල්ප වර්ධනයට සේම ළමා මනසට මනා පිටුවහලක් වනු නිසැකය. එපමණක් නොව ගමට පොතක් අපට හෙටක් යන තේමාව යටතේ ක්‍රියාත්මක කර ඇති ඇවිදන පුස්තකාලය දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවලට මනා පිටුවහලක්ව තිබේ. ගමට තාක්ෂණය යන තේමාව යටතේ ව්‍යාප්ත කර ඇති නැණ සැරිය ව්‍යාපෘතිය තුළින් ඩිජිටල් කරණය හා ළමයා අතර ඇති සහ සම්බන්ධතාව ගොඩනගමින් නවීන තාක්ෂණය සමඟ මුසුවූ බුද්ධිමත් විචාරක දැනුමකින් හෙබි දරුවකු බිහි කිරීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. තරුණ දරුවන් ඉලක්ක කර ගනිමින් වෘත්තිය නිපුණතා හා මාර්ගෝපදේශන වැඩසටහන් මෙන්ම සම්මන්ත්‍රණ පැවැත්වීම, වීදි නාට්‍ය, ශ්‍රමදාන, පෙල පාලි, වෙරළ පිරිසුදු කිරීම් ආදි පොදු වැඩ සඳහා ළමයි පෙළඹවීම තුළින් ළමයා තුළ පොදු කටයුතු කෙරෙහි ඇති ඇල්ම සහ ආකල්ප වර්ධනය සේම සංස්කෘතිය, සමාජීය වශයෙන් පරිපූර්ණ දරුවකු බිහිවීමට ඇති අවකාශය සැකසීම, රැකියා සඳහා යොමුවන අය සදහා රැකියා අවශ්‍යතා වෙත යොමු කරමින් පිළිගත් උපදේශකවරු ලවා මනා පුහුණුවක් හා ප්‍රවේශ වන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම ඒ සඳහා අවශ්‍ය ශිෂ්‍යාධාර ලබා දීම සිදුවේ. තවද ලංකාවේ පිළිගත් හා ව්‍යාපාරික ස්ථාන සමූහයක එකමුතුවෙන් පවත්වනු ලබන රැකියා පොළ වැඩසටහන වෙත ළමයි සෘජුව යොමු කිරීම, ඒ තුළින් අවශ්‍ය අත්දැකීම් ලබා දීම, මෙන්ම නවෝත්පාදන සහ නව සොයා ගැනීම් මෙන්ම ස්වයං රැකියා සඳහා පෙළඹී ඇති තරුණ ළමයි ඉලක්ක කරගෙන අවශ්‍ය දැනුම, ප්‍රාග්ධනය ඇතුළු මූලික අංගයන් සපුරා දීම වොයිස් ආයතනයේ සෘජු දායකත්වයෙන් සිදු කරනු ලබයි. තවද ප්‍රදේශයේ තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ආපදා තත්ත්වයන් සඳහා මුහුණ දීමට ඇති පුහුණුව ලබා දීම සිදු කරනු ලබයි. ඒ තුළින් ක්‍රියාශීලි හා සකසුරුවම් පුද්ගලයකු නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ බවට පත්ව තිබේ. ඒ අනුව ආපදාවන්ට ලක්වන ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් එහි ආපදා සැලැස්ම හඳුනා ගැනීමට යොමු කිරීමෙන් පසු ඒ තුළ ආපදා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසනු ලැබේ. එහිදී බහුතරයක් පිරිස් මුහුණ පාන ප්‍රධාන අපදා තත්ත්වය ලෙස හඳුනාගෙන ඇත්තේ අධික වර්ෂාවත් සමඟ ඇති වන ගංවතුර තත්ත්වයන් හමුවේ අපාදා සැලැස්මට අනුව තෝරා ගත් ප්‍රදේශ වෙත කඩිනමින් අපාදාවට ලක්වූවන් රැගෙන යෑම සහ එහිදී ළමයි වෙනුවෙන් විශේෂිත වූ කඳවුරු ඉදිකර ඔවුන්ගේ සෞඛ්‍ය, අධ්‍යාපනය, සහ යටිතල පහසුකම් පිළිබඳ සොයා බැලීම සමස්ත ආපදා ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්ය භාර්ය බවට පත්ව තිබේ. මේ සියල්ල අභිබවමින් වොයිස් ආයතනය මුල්තැන ලබා දෙනු ලබන ප්‍රධාන කාර්ය නම් විශේෂ හැකියා සහිත පුද්ගලයන් කෙරෙහි දක්වනු ලබන අවධානයයි. සෑම රටකම මෙසේ පුද්ගලයන් කොට්ඨාසක් සිටියද, ඔවුන්ගේ අයිතිවාසිකම්, සොඛ්‍ය, අධ්‍යාපනය, ආර්ථිකය, සමාජීය යන කරුණු පිළිබඳ කිසිවකු කිසිවිටෙකත් නොසලකා හරිමින් සිටී. මෙවන් පිරිස් සඳහා කුඩම්මාගේ සැලකිලි ලැබෙන මෙවන් යුගයක වොයිස් ආයතන ලබා දෙන දායකත්වය අගය කළ යුතුව තිබේ. ඒ සඳහා විශේෂයෙන් ප්‍රදේශවල තරුණ ප්‍රජාව විශේෂ පුහුණුවකට ලක් කරමින් ආබාධිත පුරවැසියන් සඳහා අපාදාවකදී හෝ හදිසි අනතුරකදී ඔවුන්ව වෛද්‍යවරයෙකු වෙත රැගෙන යන තෙක් රැක බලා ගැනීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම, ආබාධ සහිත පුද්ගලයන් සිටින ස්ථාන හඳුනා ගැනීම, ඔවුන්ගේ පරිසර වට පිටාව පිළිබඳ නිරන්තර අවධානය ගැනීම, ඔවුන්ගේ අබාධයේ ස්වභාවය අනුව අවශ්‍ය උපකරණ සැපයීම, අබාධිත දරුවන් සඳහා පාසල් තුළ විශේෂිත අධ්‍යාපන ඒකක ස්ථාපිත කර අධ්‍යන කටයුතු සඳහා දරුවන් යොමු කිරීම, ආබාධිත අය ස්වයං රැකියා සඳහා යොමු කිරීම සහ ඔවුන්ට අවශ්‍ය මූලම්‍ය ප්‍රාග්ධනය, පුහුණුව, ව්‍යාපාර සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම, ආබාධිත පුරවැසියන් වෙනුවෙන් ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් හඬක් නැගීමට ඔවුන් සවිබල ගැන්වීම සහ අවශ්‍ය උපදෙස් ලබා දෙමින් අවශ්‍ය භූමිකාව නිර්මාණය කිරීම, ආබාධිත පුද්ගලයන් ගම්මාන මට්ටමෙන් පවත්වනු ලබන ස්වශක්ති සංවිධාන සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙමින් ඔවුන්ගේ අදහස් යෝජනා හඳුනා ගැනීමට කටයුතු කිරීම ඇතුළුව රජයේ පිළිගත් වෛද්‍යවරු ආශ්‍රයෙන් ආබාධිත පුද්ගලයන් විශේෂ සෞඛ්‍ය සායන වෙත යොමු කරමින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය සුරැකීම ආදි කටයුතුවල නිරත වෙති. ප්‍රජාවගේ මූලික අවශ්‍යතාවක් වන පානීය ජල ගැටලුවට තිරසාර විසඳුමක් ලෙස පානීය ජල ව්‍යාපෘති නොච්චියාගම, සාලියවැව, ආණමඩුව, මුරුක්කුවටවන ආදි ප්‍රදේශවල ස්ථාපිත කර දිළිඳු ප්‍රජාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරා දීමටද කටයුතු කරනු ලැබේ.


තරුණ නායකයින්


නායක මව්වරු කණ්ඩායම


නැණසැරිය ජංගම පරිගණක ඒකකය


වොයිස් සංසද මහා සභාව


සුහුරු පන්තිකාමරය

## දවසේ රාහු කාලය

දහවල් 12.12 සිට 01.44 දක්වා / අලුයම 12.12 සිට 01.41 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

## දින තත්ත්වය

මීන රවි 24 භාග මැදින් අව එකොළොස්වක තිථිය ලත් බුධ දින ඉර උදාව 06.06 ට ඉර බැසීම 06.19ට සුවණ නැකත අලුයම 02.37 න් ගෙවී දෙනට නැකත ලබයි. මැදින් අව දසවක තිථිය අලුයම 02.13න් ගෙවී අව එකළොස්වක තිථිය ලබයි. සාධ්‍ය යෝගය සවස 02.33 න් ගෙවී සුබ යෝගය ලබයි. විෂ්ටිකරණය අලුයම 02.13න් ගෙවී බවකරණය ලබා එය ද සවස 02.20න් ගෙවී බාලවකරණය උදා වේ.

විෂ කලාව - පතුල / අමෘත කලාව - ලිංග - යෝනි

මරු සිටින දිශාව - නිරිත / යෝගිනි - ගිනිකොන / සුබ දිශාව - දකුණ

## 2021 අප්‍රේල් 07 බදාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**

06.06 - 07.06 දක්වා - බුධ හෝරාව
07.06 - 08.06 දක්වා - සඳු හෝරාව
08.06 - 09.06 දක්වා - සෙනසුරු හෝරාව
09.06 - 10.06 දක්වා - ගුරු හෝරාව
10.06 - 11.06 දක්වා - කුජ හෝරාව
11.06 - 12. 06 දක්වා - රවි හෝරාව

**රාත්‍රී**

06.06 - 07.06 දක්වා - රවි හෝරාව
07.06 - 08.06 දක්වා - සිකුරු හෝරාව
08.06 - 09.06 දක්වා - බුධ හෝරාව
09.06 - 10.06 දක්වා - සඳු හෝරාව
10.06 - 11.06 දක්වා - සෙනසුරු හෝරාව
11.06 - 12. 06 දක්වා - ගුරු හෝරාව

**සවස**

12.06 - 01.06 දක්වා - සිකුරු හෝරාව
01.06 - 02.06 දක්වා - බුධ හෝරාව
02.06 - 03.06 දක්වා - සඳු හෝරාව
03.06 - 04.06 දක්වා - සෙනසුරු හෝරාව
04.06 - 05.06 දක්වා - ගුරු හෝරාව
05.06 - 06.06 දක්වා - කුජ හෝරාව

**අලුයම**

12.06 - 01.06 දක්වා - කුජ හෝරාව
01.06 - 02.06 දක්වා - රවි හෝරාව
02.06 - 03.06 දක්වා - සිකුරු හෝරාව
03.06 - 04.06 දක්වා - බුධ හෝරාව
04.06 - 05.06 දක්වා - සඳු හෝරාව
05.06 - 06.06 දක්වා - සෙනසුරු හෝරාව



**බබාට නමක්**

අලුයම 02.37 තෙක් සුවණ නැකත යෙදී ඇති නිසා ජු - ජෙ - ජො - ෂ අකුරු ද ඉන්පසු දෙනට නැකත යෙදෙන නිසා ග - ගි - ගු - ගෙ අකුරු ද දිනට අදාළව ට - ඩ - ණ අකුරු ද මුල් කොට බබාට නමක් දැමීම සුබ වෙයි.

අද සුබසෙත

## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - කාර්යබහුල දිනයක්

මේෂ ලග්නයට අනුව අද ඔබට යම් කාර්ය බහුලතාවයක් නිසා එදිනෙදා කටයුතු අඩාල වනු ඇත. එහෙත් තම ව්‍යාපාරික කටයුතු සාර්ථක වේ. නිවසින් බැහැර ගමන් බිමන් යෙදීම නිසා ගෘහ ජීවිතය ගැටලුසහගත වුවද තම කාර්යයන් සඳහා බොහෝ අයගේ අත්උදව් උපකාර හිමිවනු ඇත. යටි බඩ ආශ්‍රිත උවදුරු පෙනේ. හර්නියා - වකුගඩු රෝග පවතින අය ප්‍රවේසම් විය යුතු දිනකි.

### වෘෂභ ලග්නය - ආර්ථික ප්‍රතිලාභයක්

වෘෂභ ලග්නයට අනුව අද ඔබගේ ජීවිතයේ ඉතා සතුටුදායක අවස්ථාවකට මුහුණ දීමට හැකි වෙයි. ආර්ථික වශයෙන් ලැබීම් සහිතයි. දුර සිටින නෑයකුගේ පැමිණීමක් සිදු වෙයි. තම රැකියා ස්ථානගත අභිවෘද්ධිය අන් අයගේ ප්‍රසාදයට හේතු වන කරුණු යෙදේ. හිතට වධ දෙන කරුණකින් නිදහස් වීමට අවස්ථාව උදා වේ.

### මිථුන ලග්නය - සිතට විශාල සහනයක්

මිථුන ලග්නයට අනුව සත්ත්ව අවිහිංසාව සිතට දැනෙන දිනකි. ආගමික කටයුතුවලින් පසු සිතට විශාල සහනයක් දැනෙන දිනකි. මරණයට කැප වූ ගවයකු හෝ සිර කර තබා සිටින පක්ෂියකු නිදහස් කර හැරීමට උනන්දු වන දිනකි. ඔබගේ පැවති කරදර හිරිහැර අවසන් වනු ඇත. තම ආර්ථික පසුබිම යහපත් අතට හැරේ.

### කටක ලග්නය - හදිසි තීන්දු සාර්ථක වෙයි

කටක ලග්නයට අනුව අද ඔබට පින්බර සිතුවිලි සිතට නැගෙන දිනකි. විශේෂයෙන් තම දේපළ හිමිකම් හෝ තමාගේ අනාගත සැලසුම් සාර්ථක වීමට බලපාන දිනකි. තමා පාරේ තොටේ ගමන් කිරීමේදී හමුවන පුද්ගලයකු නිසා බොහෝ ආර්ථික ශක්තියක් ගොඩනගා ගැනීමට හැකි වන ව්‍යාපාරයක හවුල්කරුවකු වීමට පුළුවන. තමා හදිසියේ වුවද ගන්නා තීන්දු තීරණ සාර්ථක වනු ඇත.

### සිංහ ලග්නය - මිතුරු වෙසින් එන සතුරෝ වෙති

සිංහ ලග්නයට අනුව අද ඔබට තම ජයග්‍රහණයක් වෙනුවෙන් ප්‍රබල සටනක් කිරීමට සිදු වෙයි. හුදෙකලා වීමකින් වුවද සමාජයේ වැරදි කටයුතු වෙනුවෙන් තනිවම තර්ක විතර්ක කිරීමට සිදු වේ. තමා සිය ආර්ථිකය පිළිබඳව එතරම් නොසිතුව ද පොදු කටයුතු නිසා තරමක වියදම් අධික වීමේ තත්ත්වයක් පෙනෙන්නට තිබේ. ප්‍රවේසම් විය යුත්තේ මිතුරු වෙසින් එන සතුරන් පිළිබඳවයි.

### කන්‍යා ලග්නය - නොපසුබට උත්සාහය ඇති වේ

කන්‍යා ලග්නයට අනුව අද ඔබට සිතේ සතුටින් කටයුතුවල නිරතවීමට හැකිවේ. කොතෙකුත් බාධක ආවත් පසු නොබසින අරමුණු දැඩිව දැනෙයි. තම පියා - මව හෝ සහෝදරයකු සහෝදරියක විසින් තම කාර්ය සමාජගත කිරීමට උනන්දු වෙයි. ඒ නිසාම සිතේ ධෛර්යය වැඩි වනු ඇත. යටි බඩේ අසනීපයක් නිසා කටයුතුවලට බාධා වුවද සිතේ ශක්තිය නිසා ඒවා මැඩගැනීමට හැකිවේ.

### තුලා ලග්නය - ඉඩම් ලාභයක්

තුලා ලග්නයට අනුව අද ඔබට ව්‍යාපාර සඵල වීමක් නිසා නව ආයෝජනයකට අත තබන දිනකි. වාහන ලාභ, ඉඩකඩම් ලාභ, නිවාස ලාභ පෙන්වයි. තම මව් පාර්ශ්වයේ කෙනකු විසින් තම උරුමයන් පිළිබඳ පෙනී සිටින දිනකි. ඔබගේ පපුවේ ඇතිවිය හැකි අපහසුතාවක් නිසා හදිසියේ රෝහල්ගත වීමකට වුවද ඉඩ ඇතත් බිය විය යුතු නොවන තත්ත්වයක් උසුලයි. සැර, උෂ්ණ ආහාරපාන, මත්පැන් බැහැර කරන්න.

### වෘශ්චික ලග්නය - නොඉවසුම් බවක්

වෘශ්චික ලග්නයට අනුව තම එදිනෙදා කටයුතුවල අපිළිවෙළක් දක්නට ලැබේ. සිතේ පවතින නොසන්සුන්තා දැඩි වේ. ඉවසීමේ සීමාව ඉක්මවා යෑමෙන් තම රැකියා ස්ථානගත සහ විවාහ ස්ථානගත මත ගැටුම් ආරවුල් මතු කෙරේ. ඉවසීම සාමාන්‍යතාව හුරු විය යුතු වෙයි. තමා විසින් ගන්නා හදිසි තීන්දුවක් නිසා තම දරුවකුට ලැබෙන්නට තිබූ වරප්‍රසාදයක් අහිමි වන ලකුණු පෙනේ.

### ධනු ලග්නය - ජීවිතයේ අලුත්වීමක්

ධනු ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. රැකියා ප්‍රතිලාභ ආර්ථික සුබතාව මෙන්ම නව නිවෙසකට යෑමේ වාසනාව වාහනයක් මිල දී ගැනීමකට හැකිවීම පෙන්වයි. තම සේවා ස්ථානයෙන් දෙන උත්සව අත්තිකාරම් මුදලක් වැය කිරීමෙන් නිවෙසේ අලංකාරය සඳහා ද කටයුතු කරයි. අලුත් ඇඳුම් ආයිත්තම් මිල දී ගන්නා ලද දිනකි.

### මකර ලග්නය - ජීවිතයේ උදාසීන බවක්

මකර ලග්නයට අනුව පෙර දින කාර්ය බහුලතාව නිසා ද එක්කෝ නිදි වැරීම් හෝ නිසා කටයුතු අඩාළ කරනු ඇත. උදාසීන බව කම්මැලිකම නිසා කළ යුතු කටයුතු කල් දැමීමට පවා පෙළඹේ. නමුත් තම මව හෝ පියාගේ මුල්වීම නිසා අනාගත සැලසුමකට යොමු වීම සතුටුදායක වෙයි. එහෙත් තව පිටස්තර අයගේ ඇනුම් බැනුම්වලට මුහුණදීමට සිදුවේ.

### කුම්භ ලග්නය - අනාගත සැලසුමක්

කුම්භ ලග්නයට අනුව අද ඔබට හදිසි ධනයක් ලැබේ. එම ධනය නිසි මාර්ගයකට යොමු කිරීමට වෙහෙස ගන්නා දිනකි. දණහිස ආශ්‍රිත උවදුරක් නිසා එක තැන සිටීමට සිදු වන දිනකි. එහෙත් තමාගේ කටයුතු පහසු කර ගැනීමට බොහෝ හිතවතුන් ඔබට සහාය වනු ඇත. අනාගත සැලසුමකට ඉන් ඉඩ සැලසේ.

### මීන ලග්නය - පිටරට හිතවතකුගේ යහපත් ප්‍රතිචාර

**අංක 200, කිරුළ පාර, කොළඹ 05.**

**විමසීම්**
**ලේකම්, ප්‍රසම්පාදන කමිටුව,**
**දුරකථන : 0117706110, 0771056110, 0117706111**
**දුරකථන / ෆැක්ස් : 011-2588457**

# අමු තේ දළු ටෙන්ඩර් ක්‍රමය යටතේ අලෙවි කිරීම

## මැයි - ජූනි 2021

### ටෙන්ඩර් අංකය : SLSPC/PL/GreenLeaf/T- 77/2021

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් නුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති පහත සඳහන් වතුයායන්වල අමු තේ දළු මාස දෙකක කාලයක් සඳහා විකිණීමට මිල ගණන් කැඳවනු ලැබේ.

| වතුයායේ නම | ආපසු නොගෙවනු ලබන වන්දි මුදල (රු.) | ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල (රු.) |
|---|---|---|
| අලකොල රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| කොටගඟ රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| ගෝමර රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| හාගල රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| නිකලොය රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| වෛතලාව රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| වුඩ්සයිඩ් රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |
| ඕපල්ගල රාජ්‍ය වතුයාය | 5,000/= | 100,000/= |

ඉහත ටෙන්ඩරය සඳහා කොන්දේසි සහ මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා වූ පෝරම ඇතුළත් ලියවිලි රු. 5000/- ක මුදලක් ගෙවා 2021.04.07 වන දින සිට 2021.04.27 දින ප.ව. 4.00 දක්වා පන්විල පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාලයෙන් හෝ 2021.04.28 වන දින ප.ව.12.30 දක්වා නො. 21, මීරානියා වීදියේ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන්ද මිලදී ගත හැකිය.

ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල වන රුපියල් ලක්ෂයක මුදල (100,000/=) එක් එක් වතුයායක් සඳහා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මහජන බැංකු පළමු නගර ශාඛාවේ ගිණුම් අංක 046 1002 40000 933 හි තැන්පත් කිරීම හෝ මුදල් අයකැමි වෙත ගෙවා සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත සමග කුවිතාන්සියේ පිටපතක් අමුණා තිබිය යුතුය.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරම තැන්පතු රිසිට් පත් සමග කොළඹ 12, මීරානියා පාරේ පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2021.04.28 දින ප.ව. 1.00ට පෙර බහාලිය යුතුය.

2021.04.28 දින ප.ව. 01.30ට ටෙන්ඩර් විවෘත කිරීමේ කමිටුව ඉදිරියේ මිල ගණන් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ගැණුම්කරු හෝ ඔහුගේ නියෝජිතවරයකුට සහභාගි විය හැකිය. නියමිත දිනයේ නියමිත වෙලාවට නොලැබෙන මිල ගණන් පිළිබඳව සංස්ථාව වගකියනු නොලබන අතර, ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපතිතුමාගේ තීරණය අවසන් තීරණය වේ.

**සභාපති,**
**ප්‍රසම්පාදන මණ්ඩලය,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**21, මීරානියා පාර, කොළඹ 12,**

**2021.04.05**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහා මාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු කැඳවීමයි

## නැගෙනහිර, වයඹ, උතුරු මැද සහ දකුණු පළාත්වල මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලවලට තාපසුවිකාර්ය (THERMO PLASTIC) ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් නැගෙනහිර, වයඹ, උතුරු මැද සහ දකුණු පළාත්වල මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලවලට තාපසුවිකාර්ය (THERMO PLASTIC) ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.
2. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021.04.07** සිට **2021.04.27** දක්වා **පැය 09.00** සිට **පැය 15.00** අතර කාලය තුළ පහත පරිදි නැවත ගෙවනු නොලබන රු.9200.00 (වැට් සහිත) ටෙන්ඩර් ගාස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්, මාර්ග සංවර්ධන අධිකාරිය නමට ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ **ගිණුම් අංක 0000001943** ට ගෙවා අධ්‍යක්ෂ, ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, 4 වන මහල, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ලංසු ලේඛන මිලදී ගත හැකිය.

   ලංසු ලේඛන මිලදී ගන්නා විට ගෙවීම් පත්‍රිකාවේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.

| කොන්ත්‍රාත් අංකය | විස්තරය | ප්‍රමාණය | ලංසු ආරක්ෂණය (රු) | වැට් සමග ලංසු ලේඛන ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| RDA/DPR/RMEP/2021/79 | තාපසුවිකාර්ය (THERMO PLASTIC) ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම - නැගෙනහිර පළාත | සුදු කි.ග්‍රෑම් 125,000<br>කහ කි.ග්‍රෑම් 7,000<br>වීදුරු බීඩ් කි.ග්‍රෑම් 8,000 | 250,000.00 | 9,200.00 |
| RDA/DPR/RMNWP/2021/80 | තාපසුවිකාර්ය (THERMO PLASTIC) ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම- වයඹ පළාත | සුදු කි.ග්‍රෑම් 411,200<br>කහ කි.ග්‍රෑම් 36,000<br>වීදුරු බීඩ් කි.ග්‍රෑම් 25,050 | 850,000.00 | 9,200.00 |
| RDA/DPR/RMNCP/2021/81 | තාපසුවිකාර්ය (THERMO PLASTIC) ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම- උතුරු මැද පළාත | සුදු කි.ග්‍රෑම් 82,000<br>කහ කි.ග්‍රෑම් 13,250<br>වීදුරු බීඩ් කි.ග්‍රෑ 3,375 | 150,000.00 | 9,200.00 |
| RDA/DPR/RMSP/2021/82 | තාපසුවිකාර්ය (THERMO PLASTIC) ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම- දකුණු පළාත | සුදු කි.ග්‍රෑම් 474,000<br>කහ කි.ග්‍රෑම් 15,550<br>වීදුරු බීඩ් කි.ග්‍රෑම් 22,500 | 950,000.00 | 9,200.00 |

3. **අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, ප්‍රසම්පාදන අංශය, 4 වන මහල, මගනැගුම මහමැදුර, කොස්වත්ත, බත්තරමුල්ල** පිහිටි කාර්යාලයේදී කාර්යාල වේලාවන් තුළ නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.
4. එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙනම ලංසු ලේඛන කට්ටල නිකුත් කරනු ලැබේ.
5. ලංසු කැඳවීම අවසන් වන දිනයේ සිට **ලිත් දින 91ක්** ලංසු වලංගු විය යුතු අතර ඉහත සඳහන් මුදල් ප්‍රමාණයට සමාන ලංසු ආරක්ෂණයක් (**2021.08.25 දක්වා වලංගු**) සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු ආරක්ෂණයක් නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
6. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "**................................ පළාතට තාපසුවිකාර්ය ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම / කොන්ත්‍රාත් අංක RDA/DPR/........./2021/..........**" ලෙස සඳහන් කරන්න. (කොන්ත්‍රාත් අංකයට අදාළව වෙන වෙනම ලංසු ඉදිරිපත් කරන්න)
7. **2021.04.28** දින පැය **14.00** ට පෙර සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, **1 වන මහල, "මගනැගුම මහමැදුර"**, අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, වෙත පිටපත් දෙකකින් ලංසු එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ.
8. වැඩිදුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 011-2046482/ 011-2884790/ ඊමේල් : **procurement@rda.gov.lk** ඔස්සේ අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, මාර්ග සංවර්ධන අධිකාරිය අමතන්න.

**සභාපති,**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය,**
**1 වන මහල, "මගනැගුම මහමැදුර",**
**අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

# ප්‍රසම්පාදන දැන්වීම

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා භාණ්ඩ සහ සේවා ප්‍රසම්පාදනය

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් භාණ්ඩ සහ සේවාවන් සඳහා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටිනු ලැබේ.

| අනු අංක | ටෙන්ඩර් අනන්‍යතා අංකය | විස්තරය | ලංසු අවසන්වන / විවෘත කරන දිනය සහ වේලාව | නැවත නොගෙවනු ලබන ලංසු ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| 01. | AHQ/21/PUB/E/1001 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නවීනතම මගී වෑන් රථ දෙකක් (02) මිලට ගැනීම | 2021 මැයි 07, පැය 1030 | 6,000.00 |
| 02. | AHQ/21/PUB/E/1002 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නවීනතම උත්සව යතුරු පැදි තුනක් (03) මිල දී ගැනීම. | 2021 මැයි 07, පැය 1030 | 6,000.00 |
| 03. | AHQ/21/PUB/E/1003 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත මල නොබැඳෙන වානේවලින් යුත් නවීනතම ජල බවුසර දහයක් (10) මිල දී ගැනීම | 2021 මැයි 07, පැය 1030 | 14,500.00 |
| 04. | AHQ/21/PUB/E/1004 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නවීනතම ෆෝක්ලිෆ්ට් (ටොන් 05) එකක් (01) මිල දී ගැනීම | 2021 මැයි 07, පැය 1030 | 3,500.00 |
| 05. | AHQ/21/PUB/E/1005 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත රළු භූමිය සඳහා වන ටොන් 25 ක ක්‍රේන් එකක් (01) මිල දී ගැනීම. | 2021 මැයි 07, පැය 1030 | 20,000.00 |
| 06. | AHQ/21/PUB/MED/1002 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පුද්ගලික අංශයේ රෝහල් වල වෛද්‍ය පරීක්ෂණ පහසුකම් ප්‍රසම්පාදනය (2021 වසර සඳහා වාර්ෂික අනුපාත අනුමත පදනම මත) | 2021 මැයි 07, පැය 1030 | 2,000.00 |

2. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇති අතර ඉහත දක්වා ඇති ටෙන්ඩරය ද්විත්ව ලියුම් කවර ක්‍රමය අනුව සිදු කෙරෙනු ඇත.
3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෙබ් අඩවිය වන **www.airforce.lk** වෙතින් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය පරීක්ෂා කළ හැකි අතර **2021 අප්‍රේල් 07** සිට **2021 මැයි මස 06** වන තෙක් **පැය 1000** සිට **පැය 1400** දක්වා සෑම වැඩ කරන දිනකම කොළඹ, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ සරප් වෙත නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවා ප්‍රසම්පාදන අංශයෙන් (ටෙන්ඩර් අංශය) එය මිලදී ගත හැකිය. මෙම ගෙවීම් රිසිට්පත නොමැති ලංසු පිළිගනු නොලැබේ.
4. පිටපත් දෙකකින් යුතු මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**" වෙත එවිය යුතු අතර නැතහොත් අවසන් වේලාවට පෙර ප්‍රධාන ආරක්ෂක මැදිරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. සේවායන්ගේ අවසර ලිපි සහ ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණීමට අවසර දෙනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වීමෙන් පසුව කිසිදු ලංසුකරුවෙකුට හෝ නියෝජිතයෙකුට ලංසු විවෘත කිරීමට සහභාගි වීමට ඉඩ දෙනු නොලැබේ.
5. ලංසු ලේඛනයේ "මිල උපලේඛනය" තුළ දක්වා ඇති අයිතම සහ අදාළ ගාස්තු එහි දක්වා ඇති එක් එක් අයිතමය සඳහා දැක්විය යුතු ය. ඉදිරිපත් කරනු ලබන ගාස්තු කිසිදු හේතුවකින් වෙනස් නොකළ යුතු ය.
6. සැපයුම්, කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුරට සැපයිය යුතු අතර ලංසුකරුවන් අදාළ භාණ්ඩ සඳහා සියලු බදු සහ ගාස්තු මෙන්ම ප්‍රවාහන වියදම ද දැරිය යුතු ය. මිල උපලේඛනය තුළ අදාළ වැට් බද්ද වෙනම ම දැක්විය යුතු ය.
7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී **(දුර 011 - 2325468 දිගුව 23550)** හෝ ප්‍රසම්පාදන නිලධාරී ටෙන්ඩර **(දුර 011 - 2441553 හෝ 011 - 2441044 දිගුව 23569, ෆැක්ස් 011 - 2441553 සහ 011 - 2347694)** වෙතින් වැඩි දුර තොරතුරු ලබාගත හැකිය
8. ඉහත සඳහන් කළ ලිපිනය වන්නේ :

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ගුවන් හමුදාව,**
**ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,**
**තැ.පෙ. 1592,**
**කොළඹ 02**

**ගුවන් හමුදාධිපති**

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

# 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : **MON/WEL/LND/12/02**
ඉඩම් අමාත්‍යාංශයේ අංකය : **4/3/9/2014/IR/70 A**

අලිකොට ආර ජලාශයේ සිට බුදුරුවගල ජලාශය දක්වා ඇළ මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි

### ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්ලත්තාවල ගමේ පිහිටි, මොනරාගල මැනුම් අධිකාරී විසින් පිළියෙල කර ඇති පිඹුරු අංක 72, අතිරේක අංක 24, පත්‍ර අංක 24 හි දැක්වෙන ඉඩම්.

01. **කැබලි අංකයය**: 296
**ප්‍රමාණය** : හෙක් : 0.4977
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : ඩබ්ලිව්.එම්. කීර්තිරත්න

02. **කැබලි අංකය** : 297
**ප්‍රමාණය** : හෙක් : 0.3818
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : ඩබ්ලිව්.එම්. පොඩිමැණිකා, ඩබ්ලිව්.එම්. චන්දිමාලා තිලකරත්න, ඩබ්ලිව්.එම්. රේණුකා මල්කාන්ති.

03. **කැබලි අංකය** : 298
**ප්‍රමාණය** : හෙක් : 0.0013
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : ඩබ්ලිව්.එම්. කුමාරසිරි

04. **කැබලි අංකය** : 299
**ප්‍රමාණය** : හෙක් : 0.1633
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : ආර්.එම්. ජයතිලක

05. **කැබලි අංකය** : 300
**ප්‍රමාණය** : හෙක් : 0.0692
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : ඩබ්ලිව්.එම්. අනුලාවතී

06. **කැබලි අංකය** : 301
**ප්‍රමාණය** : හෙක් : 0.0083
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : ඩබ්ලිව්.එම්. සුනන්ද සිසිර

07. **කැබලි අංකය** : 302
**ප්‍රමාණය** : හෙක් : 0.0375
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : එස්.ඩබ්ලිව්. සෙනෙවිරත්න

08. **කැබලි අංකය** : 303
**ප්‍රමාණය** : හෙක් : 0.0610
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : එස්.ඩබ්ලිව්. කුලරත්න විජේනායක

09. **කැබලි අංකය** : 304
**ප්‍රමාණය** : හෙක් : 0.0142
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : ආර්.එම්. ජයතිලක

10. **කැබලි අංකය** : 305
**ප්‍රමාණය** : හෙක් : 0.0159
**ඉඩමේ නම** : දිඹුලමුරේ යාය
**හිමිකම් කියන්නේ** : මල්ලත්තාවල විහාරය

11. **කැබලි අංකය** : 308
**ප්‍රමාණය** : හෙක් : 0.0581
**ඉඩමේ නම** :
**හිමිකම් කියන්නේ** :

12. **කැබලි අංකය** : 311
**ප්‍රමාණය** : හෙක් : 0.0017
**ඉඩමේ නම** : තිකපිටිය
**හිමිකම් කියන්නේ** : එම්.එච්.ටී. ප්‍රේමලාල්

13. **කැබලි අංකය** : 313
**ප්‍රමාණය** : හෙක් : 1.6550
**ඉඩමේ නම** : තිකපිටිය
**හිමිකම් කියන්නේ** : රජය

14. **කැබලි අංකය** : 314
**ප්‍රමාණය** : හෙක් : 0.0377
**ඉඩමේ නම** : තිකපිටිය
**හිමිකම් කියන්නේ** : රජය

15. **කැබලි අංකය** : 317
**ප්‍රමාණය** : හෙක් : 0.0202
**ඉඩමේ නම** : තිකපිටිය
**හිමිකම් කියන්නේ** : (යූ.එම්. ජයවර්ධන) යූ.එම්. සුනිල් ශාන්ත

16. **කැබලි අංකය** : 318
**ප්‍රමාණය** : හෙක් : 0.3177
**ඉඩමේ නම** : තිකපිටිය
**හිමිකම් කියන්නේ** : යූ.එම්. ජයවර්ධන යූ.එම්. ජයන්ති ලතා

17. **කැබලි අංකය** : 319
**ප්‍රමාණය** : හෙක් : 0.0216
**ඉඩමේ නම** : තිකපිටිය
**හිමිකම් කියන්නේ** :

18. **කැබලි අංකය** : 320
**ප්‍රමාණය** : හෙක් : 0.0776
**ඉඩමේ නම** : තිකපිටිය
**හිමිකම් කියන්නේ** : (ආර්.ඒ. සුමනාවති) යූ.එම්. ඉන්ද්‍රරත්න

19. **කැබලි අංකය** : 323
**ප්‍රමාණය** : හෙක් : 0.0332
**ඉඩමේ නම** : කෝන්වැලැන හේන් යාය
**හිමිකම් කියන්නේ** : එම්.එච්.ටී. සරත්

20. **කැබලි අංකය** : 325
**ප්‍රමාණය** : හෙක් : 0.0073
**ඉඩමේ නම** : කෝන්වැලැන හේන් යාය
**හිමිකම් කියන්නේ** : එම්.එච්.ටී. සරත්

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවළුන් 2021 අප්‍රේල් මස 27 දින පෙ.ව. 9.00 ට වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2021 අප්‍රේල් මස 20 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ප්‍රාදේශීය ලේකම්,**
**වැල්ලවාය.**

**2021 මාර්තු මස 29 දින**
**වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.**

# ලංසු සඳහා ආරාධනයයි

## තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

**මහනුවර, කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විදුහලේ ක්‍රීඩා භූමිය වැඩිදියුණු කිරීම (ඉතිරි වැඩ) සඳහා වූ ලංසු ඉදිරිපත් කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා දැන්වීම**

**කොන්ත්‍රාත් අංකය : MOYS/PCM/PRO/09-2021**

01. ඉහත ප්‍රසම්පාදනය (2021.03.15 වන දින පළකරන ලද) සඳහා වූ ලංසු ඉදිරිපත් කිරීමේ කාල පරිච්ඡේදය, 2021.03.16 වන දින සිට 2021.04.30 වන දින දක්වා දීර්ඝ කරනු ලැබ ඇත.
02. ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලබන දිනය **2021.03.16 වන දින සිට 2021.04.29 වන දින දක්වා** පැය 09.00 සිට පැය 15.00 දක්වා වනු ඇත.
03. ලංසු සුරක්ෂණයේ වලංගු කාලසීමාව, ලංසු භාරගන්නා අවසාන දින සිට දින 105 ක් දක්වා **(දිනය : 2021.08.13)** වනු ඇත.
04. අනු පිටපතකින් යුක්තව, මුද්‍රා තබන ලද ලංසු, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් සලකුණු කර, **2021.04.30 වන දින** පැය 12.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ **පහත දැක්වෙන ලිපිනයට** භාරදිය යුතුය. (ලංසු තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ, ප්‍රසම්පාදන ශාඛාවේ - 3 වන මහලේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය) ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ. ලංසු, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.
05. 2021.03.15 වන දින පළකරන ලද ලංසු කැඳවීමේ සඳහන් අනිකුත් සියලු කොන්දේසි නොවෙනස්ව පවතී.

**ලේකම්,**
**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය,**
**ප්‍රසම්පාදන ශාඛාව,**
**3 වන මහල, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.**
**දුරකථන : 011-2670028**

# රා තැබෑරුම් රේන්ද විකිණීම 2021/ 2022 වර්ෂය

## පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය

2021 ජූලි මස 01 දින සිට 2022 ජූනි මස 30 දින දක්වා කාලය තුළ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා ටෙන්ඩර්පත් 2021.05.03 වැනි දින පෙ.ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

| | | |
|---|---|---|
| 1 | අනුක්‍රමික අංකය | :- 01 |
| 2 | කොට්ඨාසය | :- පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 3 | ග්‍රාමය | :- සේනකුඩිරිප්පුව |
| 4 | තැබෑරුම විවෘතව තබන වේලාවන් | :- පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට රාත්‍රී 9.00 දක්වා |
| 5 | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | :- 2021.05.03 පෙ.ව. 10.30 |
| 6 | ටෙන්ඩර් තැන්පත් මුදල | :- රු. 1,000/= |

02. වැඩි විස්තර සඳහා 2021.04.16 දින පළවන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය බලන්න.

**එස්. ඒ. වයි. ආර්. ජයතිලක,**
**ප්‍රාදේශීය ලේකම්,**
**පුත්තලම.**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය,**
**පුත්තලම.**
**2021 අප්‍රේල් මස 01 වන දින**

# කොළඹ මහා නගර සභාව

## නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

# ටෙන්ඩර් කැඳවීම

**දිරාපත් වූ කැලිකසළ මාදම්පිටිය කසළ බැහැරලීමේ අංගනයෙන් ඉවත් කිරීම (ගාස්තු අයකිරීමකින් තොරව) සඳහා ටෙන්ඩර් කැඳවීම**

දිරාපත් වූ කැලිකසළ ගාස්තු අයකිරීමකින් තොරව මාදම්පිටිය කසළ බැහැරලීමේ අංගනයෙන් ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

01. ලංසුකරු විසින්ම සපයනු ලබන සුදුසු අංගනයක් සඳහා සුදුසු කාර්යයක් සඳහා මාදම්පිටිය කසළ බැහැරලීමේ අංගනයෙන් දිරාපත් වූ කැලිකසළ ලංසුකරු විසින්ම ප්‍රවාහනය කළ යුතුව ඇත.
02. දිරාපත් වූ අපද්‍රව්‍ය මාදම්පිටිය කසළ බැහැරලීමේ අංගනයේ සිට ලංසුකරු විසින් තෝරාගත් ස්ථානය දක්වා ප්‍රවාහනය කිරීමට ලංසුකරු විසින්ම ටිපර් රථ සපයා ගත යුතුය.
03. මාදම්පිටිය බැහැරුම් ස්ථානයේ සිට දිරාපත් ඝන අපද්‍රව්‍ය ටිපර් වලට පැටවීම කොළඹ මහා නගර සභාව විසින් භාරගනු ලැබේ.
04. තෝරාගත් ලංසුකරු විසින් සිදුකරනු ලබන කාර්යයන් හේතුකොට ගෙන පැන නැගෙන කිසිදු කරුණක් වෙනුවෙන් කොළඹ මහා නගර සභාව විසින් වගකීමක් දරනු නොලැබේ.
05. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඊට සම්බන්ධිත කිසියම් පාර්ශවයක් විසින් සිදු කරනු ලබන අලාභ, හානි හා හිමිකම්පෑම් ආදියෙන් ලංසුකරු විසින් කොළඹ මහා නගර සභාව මුදගත යුතුය. කරුණාකර නම, ලිපිනය, සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක, දිනපතා සේවයේ යොදවන ටිපර් රථ සංඛ්‍යාව, අවශ්‍ය කෙරෙන කාලසීමාව, ප්‍රවාහනය කිරීමට අපේක්ෂිත අපද්‍රව්‍ය ප්‍රමාණය ආදිය සඳහන් කර නිසි පරිදි සම්පූර්ණ කර ලද ඔබගේ අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් **"නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07"** යන ලිපිනයට එවිය යුතු අතර, විෂය කරුණ වන **"දිරාපත් වූ කැලිකසළ මාදම්පිටිය කසළ බැහැරලීමේ අංගනයෙන් ඉවත් කිරීම (ගාස්තු අයකිරීමකින් තොරව) සඳහා ටෙන්ඩර් කැඳවීම"** යන්න කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කරන්න. අවශ්‍ය වන්නේ නම් අදාළ අංගනය පරීක්ෂා කර බැලීම අයදුම්පත ඉදිරිපත් කිරීමට ප්‍රථම යොදගත හැකිය.

වැඩි විස්තර සඳහා දුරකථන අංක 0771093131 / 0112691222 මගින් කරුණාකර අධ්‍යක්ෂ ඉංජිනේරු (ඝන අපද්‍රව්‍ය කළමනාකරණ), ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කොළඹ මහා නගර සභාව අමතන්න.

**නීතිඥ රෝෂනී දිසානායක,**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව,**
**පුරහල, කොළඹ 07.**

# ලංසු කැඳවීම

## අධිකරණ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීම**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය ස්ථාපිත කර ඇති උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිතව ඇත. එබැවින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙනත් ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීම සඳහා කොළඹ මහ නගර සභා සීමාව තුළ උපරිමාධිකරණ සංකීර්ණයට ආසන්නව පිහිටි සුදුසු ගොඩනැගිල්ලක් වසර දෙකක කාලයක් සඳහා කුලී පදනම මත ලබා දීමට කැමැත්තක් දක්වන ගොඩනැගිලි හිමියන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

***එම ගොඩනැගිල්ල පහත සඳහන් පිරිවිතරයන්ට අනුකූල විය යුතුය.***

- ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලා සඳහා මෙම ගොඩනැගිල්ල තුළ යාබඳ වැසිකිළි පහසුකම් ද සහිතව අවම වශයෙන් වර්ග අඩි 500 ක පමණ ප්‍රමාණයෙන් යුතු කාමර 17 ක් පැවතිය යුතුය.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ ශාලා සඳහා වර්ග අඩි 2000 ක පමණ ප්‍රමාණයෙන් යුත් පරිශ්‍ර 07 ක් පැවතිය යුතුය.
- කාර්යය මණ්ඩලය සඳහා වර්ග අඩි 9000 ක පමණ ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වේ.
- ලේඛනගාරය සඳහා වර්ග අඩි 14000 ක පමණ ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වේ.
- පුස්තකාලය සඳහා වර්ග අඩි 12000 ක පමණ ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වේ.
- අනෙකුත් පොදු පහසුකම් ස්ථාපිත කිරීම සඳහා වර්ග අඩි 4000 ට ආසන්න ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වේ.
- මෙම ගොඩනැගිල්ල සඳහා අදාළ කුලී මුදල රජයේ තක්සේරුවට අනුව මාසිකව ගෙවීමේ පදනම මත ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.
- එම දේපළ හිමි තැනැත්තා කිසිදු නඩුවක පාර්ශවකරුවකු නොවිය යුතුය.

02. එසේම ලංසු සඳහා ඉදිරිපත් කරන ගොඩනැගිලි සඳහා පහත පරිදි අනෙකුත් පහසුකම්ද අපේක්ෂා කෙරේ.

- ගරු විනිසුරුතුමන්ලාගේ සහ නීතිඥ වරුන්ගේ වාහන 40 ක් පමණ ආරක්ෂිතව ගාල් කර තැබීම සඳහා අවශ්‍ය පහසුකම් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සඳහා ජලය, විදුලිය හා දුරකථන පහසුකම් පැවතිය යුතුය.
- මෙම ගොඩනැගිල්ල සඳහා ගිනි සේවා දෙපාර්තමේන්තුවේ අනුමත ගිනි ආරක්ෂණ පද්ධතියක් සහිත විය යුතුය.
- ගෙඩනැගිල්ලේ මහල් සඳහා විදුලි සෝපාන පහසුකම් පැවතිය යුතුය.
- ප්‍රධාන පිවිසුම් මාර්ගය අඩි 12 ට නොඅඩු විය යුතුය.
- ගොඩනැගිල්ල වටා ආරක්ෂිත තාප්පයක් සහ අගුළු දැමිය හැකි ආරක්ෂිත ගේට්ටුවක් තිබිය යුතුය.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව පහත සඳහන් ලේඛනද සමග www.moj.gov.lk යන වෙබ් අඩවිය තුළින් බාගත කරගත් අදාළ ආදර්ශ අයදුම් පත්‍රයද සමග 2021.04.29 දින පෙ. ව. 11.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් **"ගණකාධිකාරී (සැපයුම්), අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12"** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෙනත් ආකාරයකින් හෝ විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කෙරෙන ලංසු භාරගනු නොලැබේ.

04. **අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ලේඛන**

- සියලු ලංසු, අවුරුදු දෙකක් සඳහා අදාළ ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා දීමට එකග වන බවට පිළිගත් ලිපියක්.
- අනුමත ගොඩනැගිලි සැලැස්මේ පිටපතක්. (Building Plan)
- ඉඩම සම්බන්ධ හිමිකම් ඔප්පුවේ සහතික කළ පිටපතක් සහ පිඹුරුපතේ (Survey Plan) සහතික කළ පිටපතක්.
- ප්‍රධාන මාර්ගය හා සම්බන්ධකර අඳින ලද ඉඩමේ සැලැස්ම (Plan) හෝ පිහිටීම දැක්වෙන දළ සැලැස්මක්. (Sketch)
- ගොඩනැගිල්ල සඳහා අදාළ පළාත් පාලන ආයතනයෙන් ලබාගත් අනුකූලතා සහතිකය. (COC)

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් සඳහා වැඩිදුර තොරතුරු අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වෙතින් ලබාගත හැක. දුරකථන අංකය 0718332180 / 0112320784

06. මේ සම්බන්ධව පූර්ව ලංසු රැස්වීමක් 2021.04.23 වන දින පෙ.ව. 10.00 ට අධිකරණ අමාත්‍යාංශයේදී පැවැත් වේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**අධිකරණ අමාත්‍යාංශය,**
**උපරිමාධිකරණ සංකීර්ණය,**
**කොළඹ 12.**

# දිසා මහා රෝහල - මුලතිව්

# ලංසු සඳහා ආරාධනයයි - 2021

01. උතුරු පළාතේ මුලතිව් දිසා මහා රෝහල වෙනුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත උපලේඛනයේ සඳහන් කර්මාන්තය සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.
02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
03. සුදුසුකම් අවශ්‍යතාවයන් ලංසු ලිපිලේඛනයේ 4 වන කොටසේ සඳහන් කර ඇත. අතිරේක තොරතුරු ලංසු ලිපිලේඛනයේ උපලේඛනයේ (5 වන කොටසේ) ලබා දී ඇත.
04. යෝග්‍යතාපූර්ණ සහ මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කාර්යාල වේලාව තුළදී මුලතිව් දිසා මහාරෝහල වෙතින් (021 2061423) ලබාගත හැකිය.
05. උනන්දුවක් දක්වන ලංසුකරුවන් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි "Application for Bid Documents" යන අයදුම්පත සම්පූර්ණ කර එක් එක් ප්‍රසම්පාදනය සඳහා ආපසු ගෙවනු නොලබන රු. 3,000/- ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන කට්ටලයක් 2021.04.07 වෙනි දින සිට 2021.04.27 වෙනි දින දක්වා රාජකාරී දිනයන් හි 09.00 පැය හා 15.00 පැය අතර ලබාගත හැකිය.
06. ලංසු, 2021.04.28 වෙනි දින 09.00 පැයට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ මුලතිව්, දිසා මහා රෝහලේ මුදල් ශාඛාවේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලිය හැකිය. මෙම ලංසු 2021.04.28 වෙනි දින පෙ.ව. 9.30 ට ලිඛිතව බලය පවරන ලද ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ මුලතිව්, දිසා මහා රෝහලේ සම්මන්ත්‍රණ ශාලාවේදී විවෘත කරනු ලැබේ.
07. පූර්ව ලංසු රැස්වීමක් මුලතිව් දිසා මහා රෝහලේ සම්මන්ත්‍රණ ශාලාවේදී 2021.04.19 වෙනි දින පෙ.ව. 9.00 ට පැවැත්වේ.
08. පහත උපලේඛනයේ සඳහන් ආකාරයේ ලංසු ඇපකරයක් ලංසු සමග අමුණා එවිය යුතුය.

| ලංසු හැඳුනුම් අංකය | වැඩ විස්තරය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන) | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | අවශ්‍ය ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|---|
| | | | | | වටිනාකම | වලංගු කාලය |
| DGM/Mu/PSDG/ 2021/01 | Improvement of Internal Road (635m) | 13.55 | දින 147 යි | සී 5 හෝ සී 6 | 140,000.00 | 2021.08.11 වන දින දක්වා |

**වෛද්‍ය ජේ. එම්. නිලක්ෂන්**
**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**දිසා මහා රෝහල, මුලතිව්.**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1519 දරන කුඹුක්ගහමුල්ල ග්‍රාම නිලධාරි වසමේ 587/1, කුඹුක්ගහමුල්ල, වැලිපැත්තගහමුල්ල යන ලිපිනයේ පදිංචි අංක 667560721V දරන ජාතික හැඳුනුම්පත හිමි මාතරගේ ජයලතා වන මම අද පටන් කුමුදිනී ජයලතා මාතරගේ යන නම භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයේ සියලු පුරවැසියන් වෙත දන්වා සිටිමි.

කුමුදිනී ජයලතා මාතරගේ

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න
දිනමිණ වත්සුව

## ටෙන්ඩර් දැන්වීම

උර, ගෝනි, යකඩ ඇතුළු අබලි ද්‍රව්‍ය විකිණීමට මිල ගණන් ලබා ගැනීමට ටෙන්ඩර්පත් කැඳවන බැවින් ටෙන්ඩර් පත් භාර ගැනීම 2021.04.20 දින ප.ව. 12.00 න් අවසන් වේ. අදාළ පෝරම සමිතියේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් ලෙස රු. 1,000 ක මුදලක් ද, ලිපි ද්‍රව්‍ය ගාස්තු ලෙස රු. 500 ක මුදලක් ද ගෙවිය යුතුය.

**සාමාන්‍යාධිකාරී,**
**සී/ස මීගමුව වි.සේ.ස. සමිතිය,**
**අංක 358, කෙලින් වීදිය, මීගමුව.**
**031-2222341**

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### දුම්රිය මූලස්ථාන කාර්යාලයේ ආපනශාලාව සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ 10, ඕල්කට් මාවතේ අංක 355 දරන ස්ථානයේ (කාර්මික විද්‍යාලය ඉදිරිපිට) පිහිටි දුම්රිය මූලස්ථානයේ ආපනශාලාව වසරක කාලයක් පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. මෙහි කාර්ය මණ්ඩලය 600 කට අධිකය. මේ සඳහා අදාළ ටෙන්ඩර්පත් රු. 1,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් දුම්රිය මූලස්ථානයේ සාහිත්‍ය හා සමාජ ආයතනය වෙත ගෙවා ප්‍රධාන ලේකම්ගෙන් ලබාගත හැකිය. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් අවශ්‍ය අනෙකුත් ලේඛන පිටපත් සමග කවරයක බහා මුද්‍රා තබා 2021/04/20 දින පෙ.ව. 10.00 ට පෙර ඉහත ස්ථානයේ සේවක සම්බන්ධතා ශාඛාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.


**මෙයට,**
**ප්‍රධාන ලේකම්,**
**දුම්රිය මූලස්ථාන සාහිත්‍ය හා සමාජ ආයතනය.**

## වාහන විකිණීමක්

| මෝටර් සයිකල් | | වර්ෂය | අංගනය |
|---|---|---|---|
| BFE-8044 | හොන්ඩා/නවී | 2016 | මහනුවර |
| **ත්‍රීරෝද රථ** | | **වර්ෂය** | **අංගනය** |
| ABJ-8998 | බජාජ් | 2016 | කුරුණෑගල |
| ABF-8801 | බජාජ් | 2015 | රාගම |
| ABD-4706 | බජාජ් | 2015 | රාගම |
| ABF-9983 | බජාජ් | 2015 | රාගම |
| AAR-7193 | බජාජ් | 2014 | මාතර |
| AAM-9133 | බජාජ් | 2013 | රාගම |
| AAF-8315 | බජාජ් | 2012 | පානදුර |
| AAC-1972 | බජාජ් | 2012 | මාතර |
| YX-3825 | බජාජ් | 2012 | රාගම |
| YI-9605 | බජාජ් | 2011 | මාතර |
| QU-0034 | බජාජ් | 2009 | රාගම |
| AAT-5788 | පියාජියෝ/අපේ | 2014 | රාගම |
| **මෝටර් කාර් රථ** | | **වර්ෂය** | **අංගනය** |
| CAC-2027 | මයික්‍රෝ/පැන්ඩා | 2014 | නුවරඑළිය |
| KD-3911 | ටාටා/ඉන්ඩිකා | 2006 | රාගම |
| **ද්විත්ව කාර්යය රථ** | | **වර්ෂය** | **අංගනය** |
| PW-6739 | මහින්ද්‍රා/මැක්සිමෝ ප්ලස් | 2013 | රාගම |
| ZA-9939 | මර්සිඩීස් බෙන්ස්/ඇක්ට්‍රෝස් | 2005 | රාගම |
| **මෝටර් කෝච්** | | **වර්ෂය** | **අංගනය** |
| NA-2199 | ටාටා | 2006 | රාගම |
| **මෝටර් ලොරි** | | **වර්ෂය** | **අංගනය** |
| LN-8985 | ඉසුසු / එල්ෆ් | 2016 | රාගම |

මෙම වාහන අපගේ වාහන අංගනයන්හිදි පරීක්ෂා කළ හැකි අතර වෙන්දේසි ක්‍රමයට විකිණේ.

| | | |
|---|---|---|
| රාගම 0113 288 893 | නුවරඑළිය 0114 346 723 | කුරුණෑගල 0374 943 738 |
| මාතර 0414 935 734 | මහනුවර 0812 051 010 | පානදුර 0773 610 142 කිලින්ට් |



දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න
අනුරාධපුර
හරිස්චන්ද්‍ර මාවත, බැංකු පෙදෙස
025 222 2370
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949


## ඒසියන් ටයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සියැට් කැලණි රේඩියල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා සමග ඒකාබද්ධ කිරීම

## ප්‍රසිද්ධ නිවේදනයයි

**2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව ඒසියන් ටයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (සමාගම් ලියාපදිංචි අංකය PV 89355) සියැට් කැලණි රේඩියල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් ලියාපදිංචි අංකය PV 784 හා සමග ඒකාබද්ධ වීම සම්බන්ධව එම පනතේ 244 වගන්තියේ උප වගන්තිය (3) (ආ) ප්‍රකාරව ප්‍රසිද්ධ දැන්වීමයි**

උක්ත කරුණ සම්බන්ධව, එනම් ඒසියන් ටයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සියැට් කැලණි රේඩියල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා සමග ඒකාබද්ධ වීම පිළිබඳව 2021 පෙබරවාරි මස 24 වන දින කොළඹ සංසරණය වන ඩේලි නිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල ද, ඒ සම්බන්ධව 2021 මාර්තු 26 වන දින රජයේ ගැසට් පත්‍රයේද කලින් පළවූ නිවේදනය හා සම්බන්ධවයි. එකී ඒකාබද්ධවීම දැන් සම්පූර්ණ වී ඇති බවත්, ඒකාබද්ධ වීම ක්‍රියාත්මක වීම බලපවත්වන දිනය ඒකාබද්ධ වීමේ සහතිකයේ සඳහන් පරිදි 2021 මාර්තු මස 31 වන දින බවත් මෙයින් දැනුම් දෙමි.

**සියැට් කැලණි රේඩියල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි,**
**අධ්‍යක්ෂවරුන්ගේ අණ පරිදි,**
**P.R. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
**ලේකම්වරු.**
**2021 අප්‍රේල් මස 5 වන දින දීය.**

## දැන්වීමයි

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### වේරහැර ආපනශාලා ටෙන්ඩරය 2021/2022

මෙම දෙපාර්තමේන්තුවේ වේරහැර කාර්යාල පරිශ්‍රයේ ආපනශාලාව පවත්වා ගෙන යාම සඳහා සුදුසුකම්ලත් ආයතන මගින් මිල ගණන් කැඳවනු ලැබේ.

I. ආපනශාලා පවත්වාගෙන යාම පිළිබඳව වසර 03 ක පළපුරුද්දක් සහිත දැනටමත් ප්‍රසිද්ධ ආපනශාලාවක් පවත්වාගෙන යන ආයතනයන්ට මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකිය. ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් මේස, පුටු, විදුලිය හා ජලය ආදිය දෙපාර්තමේන්තුව මගින් සපයා දෙනු ලැබේ.

II. තම ආයතනය නමින් ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ලබා දෙන ලෙස ආයතනයේ ලිඛිත ඉල්ලීමක් සමග මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට පිහිටි ප්‍රධාන කාර්යාලයට පැමිණ 2021.04.07 දින සිට 2021.04.28 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා කාලය තුළ රු. 2,000/-ක ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තුවක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් නමින් ප්‍රධාන කාර්යාලයේ (නාරාහේන්පිට) සරප් වෙත මුදලින් ගෙවා ලබා ගත් රිසිට්පතක් කොමසාරිස් (පාලක) වෙත ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන ලියවිලි ලබා ගත හැක. ප්‍රසම්පාදන අයදුම්පතක් සමගම මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති වාණිජ බැංකුවකින් ලබා ගත් රු. 25,000/- වටිනා 2021.08.25 දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් හෝ ඒ හා සමාන මුදලක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සියේ පිටපතක් මිල ගණන් සමග ඉදිරිපත් කළ යුතු වේ.

III. ඔබගේ ලංසු 2021.04.29 දින ප.ව. 2.00 ට හෝ ඊට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට එවීමෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ඉදිරිපත් කළ හැකිය. 2021.04.29 දින ප.ව.2.00ට මිල ගණන් විවෘත කරන අතර, ඉන් පසුව ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් කැඳවීමේ අවස්ථාවට ඔබ ආයතනයේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වේරහැර කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුවේ. වැඩි විස්තර සඳහා 011-2688825 / 2698316 අමතන්න.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,**
**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,**
**නො.341, ඇල්විටිගල මාවත,**
**කොළඹ 05.**

## ප්‍රසම්පාදන දැන්වීමයි

## ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

### බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

### බතික් මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා උපකරණ / අයිතම ප්‍රසම්පාදනය - මධ්‍යස්ථාන 160

**අංකය : SLITA / EQ / 03/ 2021**

01. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දීප ව්‍යාප්තව සියලුම දිස්ත්‍රික්කවල විසිර පවතින මධ්‍යස්ථාන 160 ක බතික් මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පහත ලැයිස්තු ගත කර ඇති උපකරණ / අයිතම සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.
   i. බතික් ඩයිකිරීම් සඳහා රසායන ද්‍රව්‍ය
   ii. බතික් සඳහා ආවුද මෙවලම් හා උපකරණ
   iii. බතික් ඩයි කිරීම් සඳහා ෆැබ්රික් රෙදි
   iv. ගෘහ භාණ්ඩ, බතික් රාමු, මේස හා මේස මතුපිට (Tops)
   v. ඩයි බාත් සහ අප - ජල පවිත්‍රතාරක ටැංකි
02. අභිලාෂී ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ අධ්‍යක්ෂක (මෙහෙයුම්) වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන පහත දැක්වෙන ලිපිනයේදී 2021 මාර්තු මස 08 වන දින සිට 2021 අප්‍රියෙල් මස 23 වන දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.
03. අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් පහත ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු ගෙවනු නොලබන රුපියල් 3,500/- ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව මිළදී ගත හැකිය.
04. ගෙවීම් 2021 මාර්තු මස 08 වන දින සිට 2021 අප්‍රියෙල් මස 23 වන දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා අතරතුර මුදලින් ගිණුම් අංශයට ගෙවිය යුතුය.
05. ලංසු, 2021 අප්‍රේල් මස 27 වන දින ප.ව. 2.00 ට හෝ ඉන් පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ප්‍රමාද ලංසු භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු 2021 අප්‍රේල් මස 27 වන දින ප.ව. 2.00 ට පහත දැක්වෙන ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග එක් එක් කාණ්ඩය සඳහා වෙන වෙනම රුපියල් මුදලින් සමස්ථ ලංසු වටිනාකමින් 1.5% ක් වන ලංසු සුරක්ෂණයක්ද ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය,**
**කඳවල වත්ත. අංක 2,**
**සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, රත්මලාන.**
**දුරකථන : 0112-632406**
**ෆැක්ස් : 0112-636337**

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

### ලංසු කැඳවීම (IFB)

### පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක සේවාව සඳහා මිල ගණන් කැඳවීමයි - 2021/2022

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (SEUSL) විසින් විශ්වවිද්‍යාලයේ පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක සේවාව සඳහා ලියාපදිංචි ආයතන මගින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. අයදුම්කරුවන් සඳහා අවුරුදු 05 ක අවම පළපුරුද්දක් තිබිය යුතු අතරම, එයින් අවම වශයෙන් අවුරුදු 02 ක කාලයක් රාජ්‍ය විශ්වවිද්‍යාලයක තෘප්තිමත් අයුරින් පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක සේවාව සැපයීම සම්බන්ධව අත්දැකීම් සහිත විය යුතුය.

2021.04.28 දින ප.ව. 3.00 දක්වා ලංසු භාරගනු ලබන අතර, ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. වැඩිදුර විස්තර සඳහා http://www.seu.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් ලිපිනයෙන් ලබාගත හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,**
**විශ්වවිද්‍යාල උයන, ඔලුවිල්.**

2021.04.07

## ලංසු කැඳවීමේ ආරාධනය

### පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

### සබරගමුව පළාත් සභාව

2021 වසර සඳහා සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා තාක්ෂණික ඇඳුම් හා ක්‍රීඩා පොදු ඇඳුම්, සැපයීමට සුදුසුකම් ඇති හා හැකියාව ඇති ලංසුකරුවන්ගෙන් සබරගමුව පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සංචාරක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

වැඩි විස්තර www.sg.gov.lk වෙබ් අඩවිය තුළ ඇති ආයතන තුළට ගොස් එහි ඇති පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශ වෙබ් පිටුවෙන් හෝ https://f.ls/wNDba Link එකට පිවිස ලබාගත හැකිය.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත් සභාව,**
**නව නගරය,**
**රත්නපුර.**

045-2223154

2021 අප්‍රේල් 07 දින.

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

### වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

### කෘෂිකර්ම පර්යේෂණය සඳහා වූ ජාතික විශිෂ්ටතා සම්මාන ප්‍රදාන උත්සවය - 2021

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සම්බන්ධව කැපී පෙනෙන ජයග්‍රහණ අත්කරගැනීම් අරභයා සම්මාන ප්‍රදානෝත්සව යෝජනා ක්‍රමයකට මුල පුරා ඇත. මෙකී යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ කෘෂිකාර්මික විද්‍යාඥයින්ට සිය පර්යේෂණ කටයුතුවල විශිෂ්ටත්වයන් සාක්ෂාත් කරගැනීම සඳහා දිරිමත් කර පොළඹවාලීමටත්, ඔවුන්ගේ වෘත්තීය අපේක්ෂා වැඩි දියුණු කර ගැනීමටත්, ජාතික කෘෂිකාර්මික සංවර්ධනය නංවාලීමෙහිලා කැපී පෙනෙන දායකත්වයක් දක්වාලූ අය හට පිළිගැනීමක් ලබාදීමටත්ය. එවැනි දායකත්වයන් පිළිබඳව විනිශ්චයන් ලබාදීමේ පදනම වන්නේ එහි නිර්මාණශීලී ස්වීයත්වය, විද්‍යාත්මක කුසලතා, ප්‍රතිදානය සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ එකී පර්යේෂණ කටයුතු මත හට ගැනෙන ඵල විපාක හා බලපෑම යනාදිය මතය.

**එම සම්මාන ප්‍රදාන පහත දැක්වෙන ප්‍රධාන අංශ තුන (03) මත සිදු කෙරෙනු ඇත**

(1) වනාන්තර ඇතුළත් වැවිලි සහ අපනයන කෘෂිකර්ම බෝග
(2) මල් වගාව ඇතුළු වැවිලි නොවන වගා
(3) පශු සම්පත් සහ ධීවර හා ජලජ සම්පත්

සම්මාන ප්‍රදාන පහත දැක්වෙන පරිදි එක් එක් අංශය සඳහා ත්‍යාග 3 ක් බැගින් පිරිනැමේ.

1 වන ත්‍යාගය : රුපියල් 300,000/-
2 වන ත්‍යාගය : රුපියල් 250,000/-
3 වන ත්‍යාගය : රුපියල් 200,000/-

**යෝග්‍යතාව :**

- රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ආයතනවල, විශ්වවිද්‍යාලවල සහ රාජ්‍ය නොවන සංවිධානවල සේවයේ නියුතු විද්‍යාඥයන්ට එනම් පුද්ගලයින්ට, කණ්ඩායම් වලට අයදුම්කළ හැකිය.
- 2018 සිට 2019 දක්වා වන කාල සීමාව තුළ සම්පූර්ණ කරන ලද පර්යේෂණයන් පිළිබඳ සලකා බලනු ලැබේ.
- ශ්‍රී ලාංකීය පුරවැසියන් හෝ දේශීය ආයතන විසින් ශ්‍රී ලංකාව තුළදී සිදුකරන ලද පර්යේෂණද සලකා බැලේ.

  (උදාහරණයක් වශයෙන් : විදේශීය සහභාගිත්වයක් ඇත්නම් එම කාර්යයන්හි වැඩි / ප්‍රමුඛ කොටසක් ශ්‍රී ලාංකීය විද්‍යාඥයෙකු / විද්‍යාඥයින් විසින් ඉටුකර තිබිය යුතුය).

අයදුම්පත් ෆෝරම,ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (SLCARP) වෙබ් අඩවිය (www.slcarp.lk) වෙතින් හෝ විද්‍යුත් තැපෑලෙන් : slcarpawards@gmail.com වෙත ඊමේල් පණිවුඩයක් එවීමෙන් ලබාගත හැකිය.

නියමිත ආකෘතිය අනුව සකසන ලද අයදුම්පත් 2021 මැයි මස 24 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 07, විජේරාම මාවතේ අංක 114/9 හි ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ, සභාපති වෙත ලේඛනගත කළ තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව,**
**114/9, විජේරාම මාවත, කොළඹ 07.**
**දුරකථන : 011-2698001 / 011-2697648 / 011-2697103**
**ෆැක්ස් : 011-2682951**

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පහත සඳහන් විභාග සඳහා වන ප්‍රවේශ පත්‍ර සහ කාලසටහන්, අයදුම්කරුවන් තම අයදුම්පත්වල සඳහන් කළ ලිපිනයන් වෙත තැපැල් කර යවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | විභාගය | විභාගය පැවැත්වෙන දින | විභාගය පැවැත්වෙන ස්ථානය |
|---|---|---|---|
| 01. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2020 (2021) | 2021 අප්‍රේල් මස 10 | කොළඹ ඇතුළු නගර 09 ක දී. |
| 02. | කුසලතා ධාරාව යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය – 2013 (2021) | 2021 අප්‍රේල් මස 10 සහ 11 | කොළඹ |

ප්‍රවේශ පත්‍ර නොලද අයදුම්කරුවන් හෝ යම් විමසීමක් කිරීමට අවශ්‍ය අයදුම්කරුවන් හෝ සිටී නම්, සම්පූර්ණ නම හා ලිපිනය සමග මෙම දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසන්න. ප්‍රවේශ පත්‍ර දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් (www.slexams.com) බාගත කළ හැකිය.

**දුරකථනය : 011-2785230 / 011-2786150**
**ෆැක්ස් : 011-2784232**

**5/5/2/AD/2021**
**ආයතනික විභාග සංවිධාන ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

**බී. සනත් පූජිත**
**විභාග කොමසාරිස් ජනරාල්.**

**2021 අප්‍රේල් මස 07 දින.**

# දකුණු පළාත් සභාව

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ලංසු සඳහා ආරාධනය

01. ගාල්ල, ඉහළ ඩික්සන් පාර, අංක08 හි පිහිටි දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටු සභාපති, පහත දැක්වෙන ඉදිකිරීම් සහ අලුත්වැඩියා කර්මාන්ත, යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් **(මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 04/2016(ii) අනුව දකුණු පළාත් කොන්ත්‍රාත්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ)** ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ තෝරාගෙන, ඔවුන් වෙත පැවරීමට, ලංසු ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කරයි.

**ලංසු භාරගන්නා අවසාන දිනය - 2021/04/28 දින පෙ.ව. 10.00**

| අනු අංකය | කර්මාන්තය | ඇස්තමේන්තු පිරිවැය | අවම සුදුසුකම් CIDA ශ්‍රේණිය | කොන්ත්‍රාත් කාලය (දින) | ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තු (රු.) | ආපසු ගෙවන ලංසු බැඳුම්කරය (රු.) |
|---|---|---|---|---|---|---|
| **ඒකාබද්ධ අරමුදල (CF) ජාතික පාසල්** | | | | | | |
| 01 | මාර/තිහගොඩ ජාතික පාසල – තෙමහල් තාක්ෂණික විද්‍යා පීඨය ඉදිකිරීම | 46,323,441.25 | C 5 | 360 | 8,000.00 | 460,000.00 |
| 02 | මාර/දෙවිනුවර ජාතික පාසල – විද්‍යාගාර ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව | 2,905,651.50 | C 8 | 90 | 1,000.00 | 29,000.00 |
| 03 | හ/ශ්‍රී ලංකා සිංගප්පූරු මිත්‍රත්ව ජාතික පාසල – ගුරු නිවස සඳහා කොන්ක්‍රීට් මාර්ගයක් සකස් කිරීම | 417,086.50 | C 9 | 60 | 500.00 | 4,000.00 |
| 04 | හ/මහානාග ජාතික පාසල – තෙමහල් තාක්ෂණික විද්‍යා පීඨය ඉදිකිරීම | 45,637,091.00 | C 5 | 360 | 8,000.00 | 450,000.00 |

**ඉහත කර්මාන්ත සඳහා**

01. ඉංජිනේරු හා තාක්ෂණික කාර්ය මණ්ඩලය
    - ඉහත අංක 01 සහ 04 කර්මාන්තය සඳහා
    - වැඩබිම් ඉංජිනේරු 01 – සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSC) හෝ සමාන සුදුසුකම් සමග වසර 03 ක පළපුරුද්ද
    - තාක්ෂණික නිලධාරීන් 01 – ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (සිවිල් – NDT) හෝ සමාන සුදුසුකම් සමග වසර 03 ක පළපුරුද්ද
02. ඉහත අංක 01 සහ 04 සඳහා පසුගිය තෙවසර තුළ ඉටුකරන ලද වාර්ෂික ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන්හි සාමාන්‍ය ධාරිතාවය අදාළ කර්මාන්තයේ ඇස්තමේන්තු පිරිවැය මෙන් දෙගුණයක් විය යුතුය.
03. යෝජිත ඉදිකිරීම් සඳහා අත්‍යවශ්‍ය ප්‍රධාන උපකරණ තම ආයතනය සතුව පවතින බව අදාළ ආයතනය විසින් සහතික කර තිබිය යුතුය.
04. මේ සඳහා උනන්දුවක් දක්වන හා සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් හට, 2021/04/08 දින සිට කාර්යාල වේලාවන් තුළ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගිණුම් ශාඛාවට පැමිණ ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කර බැලිය හැකිය.
05. ලංසු ලේඛන 2021/04/08 දින සිට 2021/04/27 දින ප.ව. 2.00 දක්වා දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදල් ගෙවන ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් කාර්යාල වේලාවන් තුළ දී ලබාගත හැක.
06. නියමිත ආපසු ගෙවන ලංසු සුරක්ෂණ ගාස්තු (Bid Security) දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදලින් ගෙවීම හෝ 2021/04/28 දින සිට 2021/08/28 දක්වා වලංගු වන, ලංසු ලේඛන සමග අමුණා ඇති ආකෘතියේ පරිදි සකස් කර ගත් බැංකු ඇපකරයක් (කොමර්ෂල් බැංකු ඇපකර පිළිගනු නොලැබේ) මගින් ඉදිරිපත් කිරීම කළ හැක. බැංකු ඇපකරයක් මගින් ඉදිරිපත් කරන්නේ නම් පහත සඳහන් ලිපිනයට එම බැංකු ඇපකරය ලබාගත යුතුය. මුදලින් ගෙවන්නේ නම්, රිසිට් පතෙහි ඡායාපිටපතක් ලංසුවට අමුණා තිබිය යුතුය.

   **ලිපිනය :**
   **දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,**
   **දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
   **ඉහළ ඩික්සන් පාර, ගාල්ල.**

07. ලංසු, මුල් පිටපත සහ අනු පිටපත වශයෙන් පිළියෙල කර වෙන් වෙන් වශයෙන් කවර වල බහා, නැවත එම කවර දෙක එක් කවරයක බහා, වම්පස ඉහළ කෙළවරේ අදාළ කර්මාන්තයේ නම සඳහන් කර මුද්‍රා තබා, 2021/04/28 දින පෙ.ව. 10.00 ට පෙර පහත ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දෙපාර්තමේන්තුවේ පළමු මහලේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ඉදිරිපත් කළ හැකිය.

   **ලිපිනය :**
   **සභාපති,**
   **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
   **දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
   **ඉහළ ඩික්සන් පාර, ගාල්ල.**

08. ලංසු විවෘත කිරීම 2021/04/28 දින පෙ.ව. 10.15 ට දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී සිදු කෙරෙන අතර, ලංසු ඉදිරිපත් කර ඇති කොන්ත්‍රාත්කරුට හෝ ඔහු විසින් බලය පවරා ඇති නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.
09. අංක 01 සහ 04 දක්වා කර්මාන්ත තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන (TEDP Project) සහ OFID (OPEC Funds for International Development) අරමුදල යටතේ ක්‍රියාත්මක වේ.
10. මේ පිළිබඳ වැඩි විස්තර දෙපාර්තමේන්තු දුරකථන අංක 091–2234234 ට ඇමතීමෙන් ලබාගත හැක.

**නිමල් දිසානායක**
**දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,**
**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
**ඉහළ ඩික්සන් පාර, ගාල්ල.**

**දිනය - 2021/04/05**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහා මාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු කැඳවීමයි

**ජාතික තරගකාරීත්ව ලංසු කැඳවීම**
**(තනි අදියර: ද්විත්ව ලියුම් කවර ලංසු පටිපාටිය)**

## මාර්ග සංවර්ධන අධිකාරියේ ඇස්ෆෝල්ට් අංගනවලට වසර එකක (01) කාලයකට මිශ්‍රණ ද්‍රව්‍යසැපයීම සඳහා නැවත ලංසු කැඳවීම 2021/2022 වසර

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් එහි ඇස්ෆෝල්ට් අංගනවලට වසර එකක (01) කාලයකට (2021/2022 මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව, ටෙන්ඩරය ලබාගැනීමට සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතු ය.

| # | කොන්ත්‍රාත් අංකය | විස්තරය | මිශ්‍රණ ද්‍රව්‍යවල ප්‍රමාණය (මිමී) | වාර්ෂිකව මුළු ප්‍රමාණය (මෙටො) | ලංසු ආරක්ෂණය (රු.) |
|---|---|---|---|---|---|
| 01. | RDA/MM/KEAG/2021/20 | කෑරගල ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 40,000 | 1,700,000.00 |
| | | | 5 – 12.5 | 27,500 | |
| | | | 12.5 - 19 | 20,000 | |
| 02. | RDA/MM/INAG/2021/21 | ඉංගිරිය ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 40,000 | 1,700,000.00 |
| | | | 5 – 12.5 | 27,500 | |
| | | | 12.5 - 19 | 20,000 | |
| 03. | RDA/MM/KOAG/2021/22 | කොටදෙණියාව ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 40,000 | 1,700,000.00 |
| | | | 5 – 12.5 | 27,500 | |
| | | | 12.5 - 19 | 20,000 | |
| 04. | RDA/MM/MEDAG/2021/23 | මැදයාය ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 40,000 | 1,700,000.00 |
| | | | 5 – 12.5 | 27,500 | |
| | | | 12.5 - 19 | 20,000 | |
| 05. | RDA/MM/KOTHAG/2021/24 | කොත්මලේ ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 40,000 | 1,700,000.00 |
| | | | 5 – 12.5 | 27,500 | |
| | | | 12.5 - 19 | 20,000 | |
| 06. | RDA/MM/AMAG/2021/25 | අඹන්පොල ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 40,000 | 1,700,000.00 |
| | | | 5 – 12.5 | 27,500 | |
| | | | 12.5 - 19 | 20,000 | |
| 07. | RDA/MM/MEAG/2021/26 | මැදවච්චිය ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 48,000 | 1,600,000.00 |
| | | | 5 – 12.5 | 21,500 | |
| | | | 12.5 - 19 | 17,000 | |
| 08. | RDA/MM/BAAG/2021/27 | බලංගොඩ ඇස්ෆෝල්ට් අංගනය වෙත මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම සඳහා නැවත ලංසු කැඳවීම | 0 - 5 | 40,000 | 1,700,000.00 |
| | | | 5 – 12.5 | 27,500 | |
| | | | 12.5 - 19 | 20,000 | |

3. ලංසු කැඳවීම **ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය (තනි අදියර: ද්විත්ව ලියුම් කවර පටිපාටිය)** අනුව සිදු කෙරෙනු ඇත.

4. උනන්දුවක් දක්වන සැපයුම්කරුවන්ට නඩත්තු කළමනාකරණ අංශය, 6 වන මහල, මගනැගුම මහමැදුර, මාර්ග සංවර්ධන අධිකාරිය, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙතින් වැඩි දුර තොරතුරු ලබාගත හැකි අතර (දුරකථනය:011-2882196, ෆැක්ස්:011-2882195) ඉහත කාර්යාලයේදී ගාස්තුවකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021/04/07** සිට **2021/04/27** දක්වා පැය **09.00** සිට පැය **15.00** අතර කාලයේදී එක් එක් කොන්ත්‍රාත්තුව වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ **ගිණුම් අංක 0000001943 ට රු. 12,000.00 ක ලංසු ලේඛන මුදලක් ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය, අධ්‍යක්ෂ (නඩත්තු කළමනාකරණ), මාර්ග සංවර්ධන අධිකාරිය, 6 වන මහල, "මගනැගුම මහමැදුර" ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** වෙතින් ලබා ගත හැකිය. ලංසු ලේඛන මිලදී ගන්නා විට ගෙවීම් පත්‍රිකාවේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.

6. **2021 අප්‍රේල් 21** දින, පැය **10.00** ට නඩත්තු කළමණාකරන අංශය 6 වන මහල, "මගනැගුම මහමැදුර" ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල හිදී පූර්ව ලංසු රැස්වීම පැවැත්වෙනු ඇත.

7. ලංසුකරුවන් තාක්ෂණික ලංසුව සහ එහි පිටපතක් සහිත එක් මුද්‍රා තැබූ ලියුම් කවරයක්ද මිල ලංසුව හා එහි පිටපතක් සහිත තවත් මුද්‍රා තැබූ ලියුම් කවරයක්ද වන ලෙස සකසා එම ලියුම් කවර දෙකම එක් මුද්‍රා තැබූ ලියුම් කවරයක බහා **2021/04/28** දින පැය **14.00** ට පෙර එක් වරම අධ්‍යක්ෂ (නඩත්තු කළමණාකරන), මාර්ග සංවර්ධන අධිකාරිය, 6 මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ගෙනවිත් භාරදිය යුතු ය. තාක්ෂණික ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ. තාක්ෂණිකව සුදුසුකම් ලබන ලංසුකරුවන්ගේ මූල්‍ය ලංසු පසු දිනයකදී විවෘත කෙරෙන අතර එම දිනය ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ (ලංසුවට අදාළ පරිදි) **"ඇස්ෆෝල්ට් අංගනය සඳහා මිශ්‍රණ ද්‍රව්‍ය සැපයීම (ඇස්ෆෝල්ට් අංගනයේ නම) සඳහා නැවත ලංසු කැඳවීම"** යනුවෙන් සඳහන් කරන්න.

9. ලංසුව, ලංසු කැඳවීමේ අවසන් දිනයේ සිට ලිත් දින 91 ක් වලංගු විය යුතු ය. **සෑම ලංසුවක්ම ඉහත දක්වා ඇති මුදලට සමානව 2021.08.25 දක්වා වලංගු ලංසු ආරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු අතර තාක්ෂණික ලංසුව සමග අමුණා ඉදිරිපත් කළ යුතු ය.** ලංසු ආරක්ෂණයක් නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මෙම ලංසු ඇරයුම යටතේ කැඳවන ලංසු සඳහා (ලංසු 08) ලංසුකරුවන්ට එක් හෝ වැඩි ගණනකට ලංසු ඉදිරිපත් කළ හැකිය. **කෙසේ වෙතත් එක් ලංසුකරුවෙකුට කොන්ත්‍රාත් දෙකකට වඩා ප්‍රමාණයක් පිරි නමනු නොලැබේ.**

සේවායෝජකයාට අවම පිරිවැය සංයෝජනයක් ලබා ගැනීම සඳහා **සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්තු හෝ කොන්ත්‍රාත්තු එකතුවක් මත මිල ගණන් ඇගයීමට හා සංසන්දනය කරනු ඇත.**

**සභාපති**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,**
**මාර්ග සංවර්ධන අධිකාරිය**



### ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනයයි

1. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන්, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු (04 කලාපය) සභාපති විසින් යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| | වැඩ විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය VAT රහිතව (රු. මි) | ඉදිකිරීම් කාලය (දින) | CIDA ශ්‍රේණිය | ලංසු සුරක්ෂණය (රු.) | ආපසු නොගෙවන ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 1 | වාලච්චේන සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආබාධිත දරුවන් සඳහා වන වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ මායිම් තාප්පය, වැට, දියවල ඕවර්හෙඩ් ටැංකිය සහ කොන්ක්‍රීට් පාර ඉදිකිරීම. **කොන්ත්‍රාත් අංක : BD/Z4/2021/02** | 9.42 | දින 49 | C7 සහ C6 | 140,000.00 | 4,000.00 |
| 2 | කුච්චවේලි පොලිස් ස්ථානයේ අලුත්වැඩියා / නවීකරණ කටයුතු **කොන්ත්‍රාත් අංක : BD/Z4/2021/03** | 17.62 | දින 154 | C6 සහ C5 | 264,000.00 | 5,000.00 |

2. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය අනුව සිදු කෙරේ. මෙම ප්‍රසම්පාදනයේ සම්පූර්ණ ඇස්තමේන්තුගත වියදම රු.මි. 50 ට අඩු නිසා ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක. 04/2016(ii) සහ 03/2020 හි දක්වා ඇති පරිදි අදාළවේ.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී තිබිය යුතු අතර, ලංසු භාරදීමේ අවසාන දිනය දක්වා වලංගු, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C8, C7, C6 හෝ C5 ශ්‍රේණිවල ලියාපදිංචි වී සිටිය යුතුය. තවද, කොන්ත්‍රාත් ප්‍රදාන දිනයේදී ද එම ලියාපදිංචිය වලංගු විය යුතුය.
4. ලංසුකරු, 1987, අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුකූලව ශ්‍රී ලංකා පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ද ලියාපදිංචි වී සිටිය යුතුය. ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත (PCA-03) ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. PCA-03 සහතිකය ඉදිරිපත් නොකරන කිසිදු ලංසුකරුවෙක් හට මෙම ප්‍රසම්පාදනය ප්‍රදානය කරනු නොලැබේ.
5. අභිලාෂී ලංසුකරුවන් හට මේ පිළිබඳව වැඩිදුර විස්තර, "ප්‍රධාන ඉංජිනේරු (04 කලාපය), ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මන්මුනෙයි උතුරු පරිශ්‍රය, මඩකලපුව" යන ලිපිනයෙන් ලබාගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂාව, එම ලිපිනයේදීම ඕනෑම රාජකාරි දිනයකදී 09.00 වන පැයත් 16.00 වන පැයත් අතර පරීක්ෂා කළ හැක.

   දු.ක. අංක : 065-2229808 ෆැක්ස් : 065-2229807
6. ඔබට, ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, "ප්‍රධාන ඉංජිනේරු (04 කලාපය), ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මන්මුනෙයි උතුරු පරිශ්‍රය, මඩකලපුව" යන ලිපිනයට ලිඛිත අයදුම්පත්‍රයක් සහ ඉහත වගුවේ සඳහන් පරිදි ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීම මගින් 2021.04.06 සිට 2021.04.19 දක්වා, 09.00 පැයත් 15.00 පැයත් අතර, ලබාගත හැක.
7. ලංසු, ලියාපදිංචි තැපැල් මාර්ගයෙන්, "සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව (04 කලාපය), ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මන්මුනෙයි උතුරු පරිශ්‍රය, මඩකලපුව" යන ලිපිනයට 2021.04.20 දින 10.00 වන පැයට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, එම ලිපිනයේදීම එදිනට පැමිණෙන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී ලංසු විවෘත කෙරේ.
8. ලංසු භාරගන්නා අවසාන දිනයේ සිට දින 77 ක කාලයක් දක්වා හෝ ඕනෑම දීර්ඝ කරන ලද කාලසීමාවක් දක්වා ලංසු වලංගු විය යුතුය.
9. සෑම ලංසුවක්ම,
   - ලංසු ලේඛනයේ 9වන කොටසේ ඇතුළත් පෝර්මයේ,
   - ගොඩනැගිලි අධ්‍යක්ෂ ජෙනරාල් නමින්,
   - ඉහත වගුවේ සඳහන් වටිනාකමට,
   - 2021.08.02 දක්වා වලංගු
   - උපලේඛනයේ ලංසු දත්තවල දක්වා ඇති එක් ආයතනයක් මගින් නිකුත් කළ

   ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතුය.

**ඉංජිනේරු ඩබ්. ඒ. ඩබ්. අභයවර්ධන මිය,**
**අධ්‍යක්ෂ ඉදිකිරීම් (1 කලාපය),**
**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,**
**දෙවන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.**

---

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
### මහාමාර්ග අමාත්‍යාංශය
### මාර්ග සංවර්ධන අධිකාරිය

# පුවත්පත් දැන්වීමට කෙරෙන සංශෝධන

**කොන්ත්‍රාත්තුවේ නම: වරකාපොල අතුරු මාර්ගයේ (By Pass Road) බෝක්කු පාර අංක 01 (Viaduct No. 01) ඉදිකිරීම**

**කොන්ත්‍රාත්තු අංකය : RDA/DC/SAB/IR-GOSL/2021/32**

**2021 මාර්තු 23** වන දින දිනමිණ පුවත්පතේ පල කරන ලද කොන්ත්‍රාත්තුවේ නම: වරකාපොල අතුරු මාර්ගයේ (By Pass Road) බෝක්කු පාර අංක 01 ඉදි කිරීම, **කොන්ත්‍රාත්තු අංකය: RDA/DC/SAB/IR - GOSL/2021/32** හි **7,8,9,10** වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**වගන්ති අංක 7**

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **පළාත් අධ්‍යක්ෂ (සබරගමුව), මාර්ග සංවර්ධන අධිකාරිය, රත්නපුර හෝ අධ්‍යක්ෂ (ඉදිකිරීම්) 3 වන මහල, "මගනැගුම මහමැදුර", 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** වෙතින් **2021.03.22** දින සිට **2021.04.23** තෙක් **පැය 09:00** සිට **15:00** දක්වා නැවත ගෙවනු නොලබන ගාස්තුව ගෙවූ වලංගු මුදල් තැන්පතු පත්‍රිකාව ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

**රු.37,800.00ක්** වන නැවත ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව (වැට් සහිත) පහත ගිණුමට තැන්පත් කළ හැකි ය.

| | | |
|---|---|---|
| අ) ගිණුමේ නම | : | අධ්‍යක්ෂ ජනරාල් - මාර්ග සංවර්ධන අධිකාරිය |
| ආ) ගිණුම් අංකය | : | 0000001943 |
| ඇ) බැංකුවේ නම | : | ලංකා බැංකුව - ආයතනික ශාඛාව |

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව, ටෙන්ඩරය ලබාගැනීමට සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතු ය.

**වගන්ති අංක 8**

සෑම ලංසුවක්ම **රු.4,300,000.00 ක** ලංසු ආරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතු ය. ලංසු ආරක්ෂණ **2021.08.24** දක්වා වලංගු විය යුතු ය.

**වගන්ති අංක 9**

ලංසු, පිටපත් දෙකකින් යුතුව, **2021.04.27** දින **පැය 14:00** හෝ එදිනට පෙර **සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, මහාමාර්ග අමාත්‍යාංශය, 7 මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ.

**වගන්ති අංක 10**

ලංසු **2021.07.27** දක්වා වලංගු විය යුතු ය.

පුවත්පත් දැන්වීමේ අනෙකුත් වගන්ති නොවෙනස්ව පවතී.

**සභාපති**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව**
**මහාමාර්ග අමාත්‍යාංශය,**
**ප්‍රසම්පාදන අංශය, 7 වන මහල, "මගනැගුම මහමැදුර",**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

---

# ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

# ලංසු සඳහා ආරාධනය

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට අයත් ඉදුරණ පුහුණු මධ්‍යස්ථානයේ ගබඩාකරණ පද්ධතිය (බැටරි) සහිත සෝලාර් PV (රූෆ්ටොෆ්) සැලසුම්කිරීම, සවිකිරීම, ක්‍රියාත්මක කර පෙන්වීම සහ නඩත්තු කිරීම

**ප්‍රසම්පාදන අංකය : SEA/PD/RMP/13-2021**

01. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට අයත් ඉදුරණ පුහුණු මධ්‍යස්ථානයේ ගබඩාකරණ පද්ධතිය (බැටරි) සහිත සෝලාර් PV (රූෆ්ටොප්) සැලසුම්කිරීම, සවිකිරීම ක්‍රියාත්මක කර පෙන්වීම සහ නඩත්තු කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.
02. මෙම පද්ධතිය ප්‍රධාන වශයෙන් භාවිතා කරනු ලබන්නේ විශ්වවිද්‍යාල සිසුන්, කාර්මිකයන් සහ ඉංජිනේරුවරුන්හට බැටරි ගබඩාකරණ පද්ධති සහ හයිබ්‍රිඩ් ඉන්වර්ටර් (Hybrid Inverter) පිළිබඳ පුහුණුව ලබාදීමට සහ ඉදුරණ පුහුණු මධ්‍යස්ථානයේ පවත්නා වීදි ආලෝක ගැටළුව විසඳීම සඳහාය. එම නිසා සැපයුම්කාර පාර්ශවය සතුව නවීන බැටරි ගබඩාකරණ උපාංග පිළිබඳව අංගසම්පූර්ණ පුහුණුවක් සහ ලිපිලේඛන ලබාදිය හැකි මෙන්ම වීදි ආලෝක විසඳුම් පිළිබඳ පළපුරුද්ද සහිත නිපුණ අයවළුන් සිටිය යුතුය. බලශක්ති අංශයේ ප්‍රවීණයන්ට පැහැදිලි කිරීම් සිදුකිරීමට, ප්‍රායෝගික පරීක්ෂණ සිදුකිරීමට සහ සේවාස්ථ පළපුරුද්ද ලබාදීමට පද්ධතියට හැකිවිය යුතුය. හැකි අවස්ථාවල දේශීයව නිෂ්පාදනය කළ සහ / හෝ අගය එකතු කළ උපකරණ භාවිත කිරීම අප විසින් උනන්දු කරනු ලැබේ. බලශක්ති ගබඩාකරණ පද්ධති (බැටරි) සහිත රූෆ්ටොප් සෝලාර් PV හෝ බිම සවිකරණ සෝලාර් PV හෝ ජාලයෙන් පිටත (Off-grid) සෝලාර් PV සැලසුම්කිරීම, ඉංජිනේරු කාර්යය සිදුකිරීම, සැපයීම, සවිකිරීම, ක්‍රියාත්මකකර පෙන්වීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳව හෝ සමාන කාර්යය පිළිබඳ පළපුරුද්ද සහිත ලංසුකරුවෝ ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබති. ලංසු ප්‍රදානය කළ පසු එම දිනයේ සිට මාස තුනක් ඇතුළත පද්ධතිය සැලසුම්කිරීම, සැපයීම, සවිකිරීම සහ ක්‍රියාත්මක කර පෙන්වීම සිදුකළ යුතුය.
03. අභිලාෂී ලංසුකරුවන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සෝලාර් සැපයුම්කරුවන් විය යුතු අතර, ඔවුනට www.energy.gov.lk නිලවෙබ් අඩවිය වෙතින් ලංසු ලිපිලේඛන නොමිලයේ පරීක්ෂා කළ හැකි අතර, එම වෙබ් අඩවිය වෙතින් සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ඉංග්‍රීසි බසින් ලබාගත හැකිය. ටෙන්ඩර් ලිපිලේඛන සඳහා ශ්‍රී ලංකා රු. 1,000/- ක ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවිය යුතු අතර, ගෙවීම් ලංකා බැංකුවේ (සංකේත අංක 7010) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පොදු ගිණුම් අංක 0074944408 ටොරින්ටන් ශාඛාව (සංකේත 453) වෙත ප්‍රසම්පාදන යොමු අංකය SEA/PD/RMP/13-2021 පැහැදිලිව සඳහන් කොට සිදුකළ යුතුය. ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවෙහි මුදල් තැන්පතු ලදුපත හෝ e-ලදුපත (ඔන්ලයින් පැවරුම් සඳහා) ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. ගෙවීම් ලදුපතෙහි පිටපතක් නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ලිපිලේඛනයේ විස්තර කරන පරිදි පෙර ලංසු රැස්වීමක් 2021 අප්‍රේල් මස 20 වන දින පෙ.ව. 10.30 ට පැවැත්වේ.
04. මුද්‍ර, තබන ලද ලංසු බහාලන ලිපිකවරයේ "**ගබඩාකරණ පද්ධති (බැටරි) සහිත සෝලාර් PV**" යනුවෙන් සඳහන් කොට **2021 අප්‍රේල් 29** වන දින පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ, 1 වන මහලේ බ්ලොක් 5 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රසම්පාදන අංශය වෙත අතින් ගෙනවිත් භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවසන් වේලාව ඉකුත් වූ විගස ඔන්ලයින් මගින් ලංසු විවෘත කරනු ලැබේ. සෑම ලංසුවක් සමගම ලංසු ලිපිලේඛනයේ සඳහන් පරිදි 2021 ජූලි 19 වන දින තෙක් වලංගු ශ්‍රී ලංකා රු. 20,000/- ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.
05. රටේ පවත්නා කොවිඩ් තත්ත්වය හේතුවෙන් ලංසු විවෘත කිරීම සහ මිල ගණන් ප්‍රකාශයට පත්කිරීම ලංසුකරුවන්ගේ භෞතික සහභාගිත්වයකින් තොරව "Google Meet" මගින් සිදුකරනු ලබන අතර, ලංසු විවෘත කිරීම 2021 අප්‍රේල් 29 වන දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. මෙම ඔන්ලයින් විවෘත කිරීමට සහභාගීවීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් ලංසු බහාලන ලිපිකවරයේ පිටත ඊමේල් ලිපිනයක් සහ දුරකථන අංකයක් සඳහන් කළ යුතුය.
06. වැඩිදුර විස්තර ඒ. කටුගහ මිය වෙත ලිඛිතව දැනුම් දීමෙන් දුරකථන අංක 0112677445 හෝ 0112676515 දිගුව 211 මගින් ලබාගත හැකිය. apsara.katugaha@gmail.com.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය,**
**බ්ලොක් 5, පළමු මහල, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,**
**බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව.**

**දු.ක. 94(0) 112677445 ෆැක්ස් : 94(0) 112682534**
**ඊමේල් : info@energy.gov.lk Web : www.energy.gov.lk**

**2021 අප්‍රේල් 07**

---

# ලංසු සඳහා ආරාධනා කිරීම

### මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය

## මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා යෝජිත නව ගොඩනැගිල්ල ඉදිකිරීම - 2 අදියර

මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කර්මාන්තය ඉටු කිරීම සඳහා සුදුසුකම් ඇති ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් පහත වගුවේ සඳහන් සුදුසුකම් (CIDA) සපුරා තිබිය යුතු අතර, අසාධු ලේඛනගත නොවී තිබිය යුතුය.
02. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පහත ලිපිනයේ ගණකාධිකාරී වෙතින් කාර්යාල වේලාව තුළදී ලබාගත හැකිය. අදාළ ලියකියවිලි නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර, නියමිත ගාස්තු ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ සම්පූර්ණ ප්‍රසම්පාදන ලියවිලි කට්ටලයක් 2021.04.07 සිට 2021.04.27 දක්වා රජයේ වැඩකරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැකිය.
03. මේ සම්බන්ධයෙන් පූර්ව ලංසු රැස්වීම 2021.04.22 දින පහත ලිපිනයේ සඳහන් අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී පෙ.ව. 10.00 ට පැවැත්වේ.
04. සම්පූර්ණ කර මුද්‍ර, තබන ලද ලංසු පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා නම් කර මුද්‍ර, තබා එක් කවරයක බහා වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම හා අංකය සඳහන් කර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, අංක 1060, ගැටඹේ, පේරාදෙණිය ලිපිනයට 2021.04.28 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම මගින් භාරදීම සිදු කළ හැක.
05. නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත ලංසු භාරදීමේ කාලය නිමාවීමත් සමගම ලංසු විවෘත කිරීම, සහභාගි වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේදී සිදු කෙරේ.
06. පහත වගුවේ සඳහන් වටිනාකමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් නමින් වගුවේ සඳහන් කාලසීමාවට වලංගුවන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් හෝ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) මගින් හෝ ලබාගත් ලංසු සුරක්ෂණයක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතු වේ.
07. ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ප්‍රසම්පාදන කමිටුව සතුය. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.
08. සෑම ලංසුවකම වටිනාකම රුපියල් මිලියන 5 ඉක්මවන අවස්ථාවන්හිදී කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා විසින් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 ඡේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන සහතිකය ඉදිරිපත් කළ යුතුය.
09. මෙම ලංසු ආරාධනය ජාතික තරගකාරී ලංසු කැඳවීමේ (NCB) ක්‍රමයට ක්‍රියාත්මක කරනු ලැබේ. මේ යටතේ ප්‍රසම්පාදනය කරනු ලබන කර්මාන්තවල බදු රහිත ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 50 ට අඩුවන අතර, 2021.02.18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 04/2016 (iii) අනුව CIDA ශ්‍රේණි සඳහන් කිරීම සහ ප්‍රාදේශීය ලංසුකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීම සිදු කරනු ලැබේ.

| ලංසු අංකය | කර්මාන්තය | අරමුදල් මූලාශ්‍රය | ඉංජිනේරුමය ප්‍රමාණ පත්‍ර දළ වැට් රහිත වටිනාකම (රු.මි.) | අවශ්‍ය ලියාපදිංචිය (CIDA) | ආපසු ගෙවන ලංසු ඇපකරයේ වටිනාකම (රු.) | කොන්ත්‍රාත් කාලය (දින) | ලංසු ඇපකර වලංගු කාලය (දින) | ලංසු ලියකියවිලි ගාස්තු (ආපසු නොගෙවන) (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| CPC/PID/3/1/IRRI/B/01/2021 | මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා යෝජිත නව ගොඩනැගිල්ල ඉදිකිරීම් - 2 අදියර පල්ලෙකැලේ, කුණ්ඩසාලේ | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 30.92 | C3 හෝ C4 | 300,000.00 | 196 | 2021.08.26 | 5000.00 |

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය,**
**අංක 1060, ගැටඹේ, පේරාදෙණිය.**

**දු.ක. 081-2388336**

**2021.04.07**

# රැකියා ඇබෑර්තු



දශක ගණනාවක ලුහුඬු දැන්වීම්කරුවන්ගේ විශ්වසනීය වෙළඳපොළ
සිළුමිණ වටපිට
ලුහුඬු දැන්වීම්
පල දරන්න - පළ කරන්න
පියුමි - 011 2 429 383 / ගයනි - 011 2 429 342
රමණි - 011 2 429 347 / සුසන්ත - 011 2 429 343

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# පුරප්පාඩු

## කාර්මික නිළධාරී, ප්‍රමාණ සමීක්ෂක, සහකාර ප්‍රමාණ සමීක්ෂක, ප්‍රමාණ සමීක්ෂක සහකාර, පර්යේෂණ සහකාර සහ සැලසුම් ශිල්පී තනතුරු

**මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහත දැක්වෙන තනතුරු සඳහා ශ්‍රී ලංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

ඉහත දැක්වෙන තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් පහත පරිදි වේ.

### 01. කාර්මික නිළධාරී (සිවිල්)

**වැටුප් පරිමාණය** : MA 2-2(B) – රු.33,660 - 350x6 - 600x14 – 44,160/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

මොරටුව විශ්වවිද්‍යාලයෙන් ජාතික තාක්ෂණ (සිවිල් ) ඩිප්ලෝමාව (NDT – Civil) ලබා තිබීම

හෝ

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ (NAITA) වසර හතරක විශේෂ ආධුනිකත්ව /සිවිල් ඉංජිනේරු විද්‍යා පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙතින් තාක්ෂණ (සිවිල්) ඩිප්ලෝමාව ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) ඉංජිනේරු උසස් ජාතික පාඨමාලාව (සිවිල්) හෝ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කළ ජාතික වෘත්තීය සුදුසුකම (NVQ Level – 6) මට්ටමට සමාන සුදුසුකමක් ලබා තිබීම

### 02. ප්‍රමාණ සමීක්ෂක

**වැටුප් පරිමාණය** : MM 1-1 – රු. 53,175 –10x1,375-15x1,910-95,575/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනයෙහි (IQSSL හි) උපාධි සාමාජිකත්වය තිබීම

හෝ

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) වෙතින් ප්‍රතීතනය කල, ප්‍රමාණ සමීක්ෂක ක්ෂේත්‍රයේ උපාධියක් දරණ උපාධිධරයෙක් වීම.

හෝ

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) සමග වලංගු අන්‍යෝන්‍ය ගිවිසුමක් සහිත විදේශ ප්‍රමාණ සමීක්ෂක වෘත්තීය ආයතනයක ජන්ද අයිතිය සහිත පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගනු ලබන ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 120 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ උපාධියක් තිබීම.

### 03. සහකාර ප්‍රමාණ සමීක්ෂක

**වැටුප් පරිමාණය** : MA 2-2 (B) – රු.33,660 - 350x6- 600x14 – 44,160/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනයෙහි (IQSSL හි) තාක්ෂණික සාමාජිකත්වය තිබීම

හෝ

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) මගින් පිළිගනු ලබන ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 90 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂක ක්ෂේත්‍රයේ උපාධියක් තිබීම,

හෝ

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ VII වන මට්ටමේ ප්‍රමාණ සමීක්ෂක සුදුසුකම් තිබීම.

හෝ

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 60 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂක උසස් ඩිප්ලෝමාව සහිතව විදේශ ප්‍රමාණ සමීක්ෂක වෘත්තීය ආයතනයක ජන්ද අයිතිය සහිත පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

හෝ

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ VI වන මට්ටම සහිතව ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් විදේශ ප්‍රමාණ සමීක්ෂක වෘත්තීය ආයතනයක ජන්ද හිමිකම සහිත පූර්ණ සාමාජිකයෙකු වීම.

### 04. ප්‍රමාණ සමීක්ෂක සහකාර

**වැටුප් පරිමාණය** : MA 2-2 (A) – රු.30,310 - 300x18 - 35,710/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ IV වන මට්ටමේ ප්‍රමාණ සමීක්ෂක සුදුසුකම සහිතව ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනයෙහි (IQSSL හි) ලියාපදිංචි සාමාජිකත්වය තිබීම.

හෝ

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 30 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂක ඩිප්ලෝමාවක් තිබීම.

හෝ

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ V වන මට්ටමට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ සුදුසුකමක් තිබීම.

හෝ

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ IV වන මට්ටමේ ප්‍රමාණ සමීක්ෂණ සුදුසුකම සහිතව ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 30 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ පශ්චාත් උපාධිය ලබා තිබීම.

### 05. පර්යේෂණ සහකාර

**වැටුප් පරිමාණය** : MA(1-2) – රු.27,910 – 300x14 – 32,110/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

මව්බස සහ ගණිතය ඇතුළු විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් විෂයන් 06 ක් සමත්ව තිබීම

සහ

රසායන විද්‍යාව සහ සංයුක්ත ගණිතය/ භෞතික විද්‍යාව විෂයන්ට සම්මාන සාමාර්ථ 2ක් සහිතව එක් වරක දී අ.පො.ස.(උ/පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

පිළිගත් ආයතනයක අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා තිබීම

### 06. සැලසුම් ශිල්පී

**වැටුප් පරිමාණය** : MA 2-2(A) – රු.30,310 – 300x18 – 35,710/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

මව්බස සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය සහිතව එක් වරකදී අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් විෂයන් 06 ක් සමත්ව තිබීම සහ එක් වරකදී අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් විෂයන් 3ක් සමත්ව තිබීම.

සමග

රජයේ කාර්මික විද්‍යාලයකින් අධුනිකත්ව සැලසුම් ශිල්පී සහතිකය/ ජාතික ඉංජිනේරු සැලසුම් ශිල්පී සහතිකය ලබා තිබීම

සමග

පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ ඔටෝකැඩ් සැලසුම්කරණය සම්බන්ධ වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම

**වයස් සීමාව** - අපේක්ෂකයාගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**රැකියා කොන්දේසි** - පත්වීම කොන්ත්‍රාත් පදනමින් සිදු වේ.

**වෙනත් ප්‍රතිලාභ** - අධිකාරිය විසින් 12%ක් සහ සේවකයා විසින් 8%ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කරන අතර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට 3% ක දායකත්වයක් සහ රජයේ අනුමත දීමනාවන් ගෙවනු ලැබේ.

**වැදගත්**

- අයදුම්කරුවන් විසින් අයදුම් කරන තනතුරට අදාල අයදුම්පත්‍රය මාර්ග සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවිය වන **rda.gov.lk** වෙතින් භාගත කරගත යුතුය.
- අයදුම් කරන තනතුරට අදාල අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල සහතික කල ජායා පිටපත් අදාල අයදුම්පත්‍රයට ඇමිණිය යුතුය.
- අයදුම්කරුගේ තොරතුරු දැන ගැනීම සඳහා තොරතුරු විමසිය හැකි ඥාති නොවන දෙදෙනෙකුගේ විස්තරද සඳහන් කර තිබීම අනිවාර්ය වේ.
- අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත්, නිසි ආකෘතියට අනුකූල නොවූ සහ ඉහත නිර්ණායකයන්ට අනුකූලව අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ අදාල ලේඛණ ඇතුළත් නොවන අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2021.04.21** දිනට පෙර **අධ්‍යක්ෂ (පාලන), මාර්ග සංවර්ධන අධිකාරිය, "මගනැගුම මහ මැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑඩුව මාවත, කොස්වත්ත , බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
- රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරිවල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතු වේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**මාර්ග සංවර්ධන අධිකාරිය**
"මග නැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත,
බත්තරමුල්ල.
ඊමේල් : headoffice198621@gmail.com

සිළුමිණ වටපිට | Sunday Observer adz | தினகரன் வாரமஞ்சரி

ඔබගේ ලුහුඬු දැන්වීම් ළඟම ඇති අපගේ ශාඛා කාර්යාලය වෙත භාරදෙන්න

ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු... (වචන 15ක් සඳහා)

| ඕනෑම එක් පුවත්පතක් සඳහා | ඕනෑම පුවත්පත් දෙකක් සඳහා | පුවත්පත් තුනම සඳහා |
| --- | --- | --- |
| රු. 300/- * තිනකරන් වාරමන්ජරි හැර | රු. 500/- * තිනකරන් වාරමන්ජරි හැර | රු. 650/- |

අනුරාධපුර - TEL : 025 22 22 370 FAX : 025 22 35 411 / මහනුවර - TEL : 081 22 34 200 FAX : 081 22 38 910
කතරගම - TEL : 047 22 35 291 FAX : 047 22 35 291 / මරදාන - TEL : 011 2 429 336 FAX : 011 2 429 335
මාතර - TEL : 041 22 35 412 FAX : 041 22 29 728 / නුගේගොඩ - TEL : 011 2 828 114 FAX : 011 4300860 / යාපනය - TEL : 021 22 25 361 FAX : 021 22 25 361

2021 අප්‍රේල් 07 බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.


දිනමිණ
සාර භූමියේ හරිතානන්දය
පැලැස්ස
2021 අප්‍රේල් 07 බදාදා
හුදෙකලාව
ඡායාරූපය - සුනන්ද කෝදාගොඩ

අවිස්සාවේල්ල රත්නපුර මහා මාර්ගයේ කුරුවිට නගරයට නුදුරු හිග්ගස්හේන නගරයෙන් වමට හැරී, කීරගල මාර්ගයේ කිලෝමීටර කිහිපයක් ගමන් කළ විට හමු වන්නේ ඉතා සොඳුරු පරිසරයක්.

සබරගමු පළාත අලංකාර කරන සුන්දර දියඇලි ලාලනියක මේ පරිසරයට එක් කරන්නේ අපූර්වත්වයක්. වැඩිම ජන ආකර්ෂණයක් දායාද කර ගත් මේ සුදෝ සුදු දිය ඇලි රජන 'බෝපත් ඇල්ල'යි.

වෙනත් දිය ඇලි අංගනාවන්ට වඩා ඇය සතු සුන්දරත්වය මීටර දෙසීයක් තරම් ඈත සිට වුව ඉතා හොඳින් දැක ගැනීමට පුළුවන.

සීතල ජලයේ බැස නාගන්න අවැසි නම් දිය ඇල්ලේ පහළ ජල දහර දිගේ ලොකු කුඩා ගල් ගෙඩි මතින් සීරුවෙන් පය තබමින් මීටර සියයක් පමණ දෙපයින් ගමන් කළ යුතුයි.


කොළොම්පුරේ සිට මෙය නැරඹීමට යන කෙනකුට පැය දෙකහමාරක පමණ ගමනකින් පසු මෙහි ළඟා විය හැකියි.

මෙම දිය ඇල්ලට 'බෝපත් ඇල්ල' යන නාමය ලැබී තියෙන්නේ ගල් දෙබොක්කාවක සිට පහළට කඩා හැලෙන සුදු දිය දහරාව බෝ කොළයක හැඩය ගන්නා බැවිනි.

චිත්‍රපට විශාල සංඛ්‍යාවක පසුබිමේ රඟපා තිබෙන මෙම දිය ඇලි අඟන සිත්තර තෙළිතුඩට මෙන්ම කවියන්ගේ පෑන් තුඩට ද කැමරා කාවයනට ද අනේක වාරයක් සිය ජලමය රංගන ලතාව පෙන්වා තිබීමෙන් ලැබී තිබෙන ප්‍රසිද්ධිය සුළුපටු නොවේ. දෛනිකවම මෙහි පැමිණෙන දෙස් විදෙස් සංචාරකයෝද බොහෝය. නිවාඩු දිනවල මේ අවට පවතිනුයේ හැබෑම තදබදයකි.

මේ දිය ඇල්ල නිසා අවට ගම්වල සැලකිය යුතු පිරිසකට කඩල, බයිට්ස්, පලතුරු, විසිතුරු බඩු යනාදිය අලෙවි කර අමතර මුදලක් උපයා ගන්නත් අවස්ථාව ලැබී තිබෙනවා.

කුරුවිට ප්‍රාදේශීය සභාවටත් මෙය අමතර ආදායම් මාර්ගයක් බව පෙනී යනවා. එම ප්‍රාදේශීය සභාව මඟින් වරින් වර මෙහි යම් යම් නඩත්තු කටයුතු ද සිදු කෙරෙනවා.





# සුදු දිය ඇල්ලේ මුදු පෙණ අතරේ



බෝපත් ඇල්ල අවට පරිසරය ඇල්ලේ දෝංකාරමය හඬ හැරුණු විට තරමක් නිහඬයි. දෙපස වඩා උස් නොවූ ලඳු කැලෑව තුළ, දං, හිඹුටු ආදි පඳුරු සහ තුරුලතා ආශ්‍රිතව කුඩා කුරුලු වර්ග ගී ගයමින් කුස පුරවා ගන්නා දසුන දැක ගන්න ද හැකියි. ඇල්ලේ මහ ජල කඳ පතිත වන ස්ථානයෙන් විහිදෙන මීදුම ගත හිරිගඩු නංවන තරමටම සීතලය.

සිරිපා හිමයේ සිට ගලා බසිනා සීත ගඟුල සහ කුරුගඟ බෝපත් ඇල්ලේ මව්පියන් සේය.

ඇල්ලේ සුන්දරත්වය වගේම යම් යම් අද්භූත කතන්දර ද මෙය වටා ගෙතී තිබේ. කලකට පෙර තම පෙම්වතා විසින් දරු ගැබක් ද සහිතව අත්හැර දමන ලදැයි කියන රූමත් යුවතියක තම සිත් වේදනාව දරා ගත නොහැකිව ඇල්ලට පැන සිය දිවියෙන් සමු ගත් අතර ඇයගේ භූතාත්මය මෙහි නිල් පැහැයෙන් වරින් වර දිස් වන බව ද පැවසෙනවා. ඇල්ලේ ඉහළ දෙබොක්කාව හරහා පනින්නට ගොස් පය ලිස්සා යෑමෙන් ද, ඉහළ ගල් තලාවේ දී පය ලිස්සා යෑමෙන් ද සැලකිය යුතු පිරිසකට අකාලයේ දිවි අහිමි වී තිබෙනවා. එම මෘත ශරීර තිහකට ආසන්න ගණනක් අඩි තිහක්, හතළිහක් ගැඹුරට කිමිද ගොඩට ගෙනා වීර තරුණයකු ගැන ද කීරගල ගම්මානයෙන් අසන්න ලැබෙනවා. වරෙක සිය පෙම්වතා ද සමඟ මෙහි විනෝද වීමට පැමිණි ප්‍රසිද්ධ ටෙලි සහ සිනමා නිළියක් හදිසියේ ජල මට්ටම ඉහළ ගිය අවස්ථාවක ඇල්ල මැද මහ ගලක් මත සිරවී සිටියදී කුරුවිට පොලීසියේ නිලධාරීන් විසින් බේරා ගත් පුවතක් ද කියවෙනවා.

මෙහි පැමිණෙන විනෝදකාමීන් ඉවක් බවක් නැතිව ඉවත දමන බෝතල් සහ පොලිතීන් බෑග් යනාදිය තැන් තැන්වල දකින්නට ලැබෙනවා. වරෙක නඩයක් සමඟ මෙහි පැමිණි තරුණියකගේ රන් මාලයක් කඩා ගෙන අසල කැලෑවට රිංගූ තරුණයකු ගැන ද කියවෙනවා. ඒ නිසා මෙහි පැමිණෙන අය මේ පසුබිම ගැන ද දැනුම්වත් වී එනවා නම් වඩාත් සුදුසුයි.

**නිමල් විජයතුංග**



# සිඳු රැලි කැරැලි නඟන නෝර්ත්ගේ බංගලාව

එකල විදේශිකයන්ගේ ආක්‍රමණයනට හසුව යටත්විජිතයක් බවට පත් වූ අප රටේ තිබූ වටිනාම සම්පත් ඔවුන් විසින් කොල්ලකෑ බව නම් කිව යුතුමයි. එහෙත් මොවුන් මෙරට පාලනය කළ සමයේදී ඉදි කළ දැවැන්ත ගොඩනැගිලි අදටත් කෞතුක වස්තූන් ලෙස දෙස් විදෙස් සංචාරකයන්ගේ නෙත් සිත් පිනවන්න සමත්ව තිබීමත් අගය කළ යුතුයි.

ඉංග්‍රීසීන් හා ලන්දේසීන් එකල යුද පරාක්‍රමයෙන් මෙරට අත්පත් කර ගෙන සිටි කාල වකවානුවලදී ශ්‍රී ලංකාවේ තිබූ මැණික් රැගෙන ගිය බව පැරණි පතපොත අදටත් සාක්ෂි දරනවා. ඊට හොඳම නිදසුන ලෙස සඳහන් කළ හැක්කේ මන්නාරම කොන්ඩච්චි බොක්කේ මුතු කැණීමය.

කොන්ඩච්චි බොක්කේ මුතු කැණීම් සිදුව ඇත්තේ බ්‍රිතාන්‍ය ජාතික ෆ්‍රෙඩ්රික් නෝර්ත් මහතාගේ අධීක්ෂණය යටතේ බවට පැරණි පොතපත සාක්ෂි සාධක සහිතව සනාථ කරනවා.

ෆ්‍රෙඩ්රික් නෝර්ත් මහතා ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වන අතර ඔහු වෙනුවෙන්ම නිවෙසක් ඉදි වී තිබුණු බව පැවසෙනවා. සැබවින්ම මේ නිවෙස අංගසම්පූර්ණ මන්දිරයක්ව තිබූ බවට මෙහි ඉතිරිව ඇති සාක්ෂි ප්‍රමාණවත්.

එකී මන්දිරය මන්නාරම සිලාවතුර ප්‍රදේශයේ මහ සයුරට නුදුරුව ගල් පර්වතයක් මත ඉදි කර ඇති ආකාරය එහි යන කොයි කාගේත් නෙතට එක් කරන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රෞඪත්වයයි.

එම මහල් මන්දිරයේ පහළ මහල කාමර හතරකින් සමන්විතව තිබූ අතර ඉහළ මහලට ගමන් කිරීමට පිය ගැට පෙළක් එකල තිබූ තාක්ෂණයෙන් ඉදි කර තිබීම මවිතය ගෙන දෙන්නකි. ආණ්ඩුකාරවරයාගේ නිඳන කාමරය හා විශාල කෑම කාමරය ද තිබී ඇත්තේ ඉහළ මහලේ බවට පුරාවිද්‍යා ගවේෂණ මඟින් අනාවරණය කර ගෙන ඇති බව කියයි.

ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාට නැඟුණු සිතුවිල්ලක සිත්තමක් ලෙස ඉදිව ඇති මේ දෙමහල් මන්දිරය ඔහුගේම ගෘහ නිර්මාණ සැලසුමක් බවයි සඳහන් වන්නේ. මෙය ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රමයට ආවේණික වූ මනරම් කලා නිර්මාණයක්ව තිබීම එහි විශේෂත්වයක්. ක්‍රිස්තු පූර්ව 1804දී ඉදි කර ඇති මේ මන්දිරයේ ඉහළ මහලේ සිට කොන්ඩච්චි මුතු කැණීම් අධීක්ෂණය සිදු කර ඇති බව සඳහන්. එම සියවසේ ඉංග්‍රීසීන්ගේ ප්‍රබල ආදායමක් බවට මෙම මුතු කැණීම් සිදුව ඇති බවද කියයි.

පුරාවිද්‍යා තොරතුරු අනුව මේ මන්දිරය ඉංග්‍රීසීන් විසින් ඉදි කළ මනරම් මන්දිරයක් බවට 1807දී ජේම්ස් කොඩිනර් පියතුමන් විසින් රචිත ඩිස්ක්‍රිප්ෂන් ඔෆ් සිලෝන් කෘතියේ සඳහන්. ඉංග්‍රීසි පාලනයෙන් පසුව මෙරට ඉතිරිව ඇති නටබුන් අතරින් මෙම මන්දිරයට සුවිශේෂ ස්ථානයක් හිමිව ඇති අතර, මේ වන විට 1940 අංක 09 දරන පුරාවිද්‍යා ආඥා පනතින් ප්‍රකාශිත පුරාවිද්‍යා ස්මාරකයක් බවට මේ ගොඩනැගිල්ල පත්ව තිබීමෙන් එයට එක් කරන්නේ වටිනාකමක්.

එහෙත් මේ වන විට දෙස් විදෙස් සංචාරකයන්ගේ පුදුමය දනවන්නක්ව තිබෙන මෙම මන්දිරය කාලයේ ඇවෑමෙන් සමුදුරු දිය රැලි සිඹ ගනිමින් දිනෙන් දින බාදනයට නතුව තිබේ.

මේ මන්දිරය නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගේ ගත සිත පුබුදුවන මනරම් දසුන් පසෙකින් පිහිටා ඇති මහ සයුර නිරූපණය කරන්නේ ස්වභාව ධර්මයාගේ අපූර්වත්වයය.

ගොදුරු ලොබින් සැරි සරන මුහුදු ලිහිණියන්ගේ තියුණු හඬ සහ ඔවුන්ගේ පියාසර විලාසය නරඹන්නකු වෙනම ලොවක් කරා රැගෙන යන්නේ නිරායාසයෙනි.

මෙහි තරප්පු පෙළ මතින් ඉහළ මහලට ගමන් කරන ඕනෑම අයකුට පහසුවෙන් සහ ඉක්මනින් මන්නාරම මුහුදු තීරය තුළ සිදු වන ඕනෑම සිදු වීමක් ඉතා සජීවීව නැරඹීමේ ඉඩ ප්‍රස්තාව ද ලැබෙනවා.

මන්නාරම සංචාරක පුරවරයක් බවට පත්ව ඇත්තේ අද වන විට මෙම මන්දිරය ඇතුළුව තවත් සුවිශාල නැරඹුම් ස්ථාන රැසකගේ අත්දැකීම් සම්භාරයක එක්කාසුවෙනි. ඒ අතරේ ප්‍රමුඛස්ථානයක් ගන්නා ඩොරික් බංගලාව, අලි ගස, ආදම්ගේ පාලම, මන්නාරම බළකොටුව, මන්නාරම ප්‍රදීපාගාරය, අති රමණීය පේසාලේ මුහුදු තීරය ඇතුළු තවත් බොහෝ දැක දැක ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව බොහෝය.

කේ. ප්‍රියංකර කළුපහන




















ඔබගේ අදහස් හා යෝජනා පමණක් නොව,
ලිපි හා ඡායාරූප ද පහත ලිපිනයට අප වෙත එවිය හැකියි.
'පැලැස්ස', දිනමිණ, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10
pelessa@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය
චතුමි
පිටිපන



# හරිතාගාර වගා ක්‍රමයෙන් වසර පුරා හොඳ අස්වැන්නක්





උඩරට අතරමැදි කලාපයට අයත් වැලිමඩ හා බණ්ඩාරවෙල ප්‍රදේශවලින් ආරම්භ කළ හරිතාගාර (ආරක්ෂිත ගෘහ) වගා ක්‍රමය අද වන විට දිවයින පුරා ව්‍යාප්තව තිබේ. මෙයට හේතුව කුඩා ඉඩමක පවා වගා කිරීමට හැකි වීමයි. ගොවිතැනින් ඉවත් වන තරුණ පිරිස කෘෂි කර්මාන්තයේ රඳවා ගැනීමට හරිතාගාර වගා ක්‍රමය ඉවහල් වී තිබේ. එහෙත් මෙම හරිතාගාර තුළ පවතින දැඩි උණුසුම වගාකරු මුහුණ දෙන ප්‍රධානම ගැටලුවක් වේ. එයට විසඳුම් ලෙසින් උණුසුම පාලනය කර ගැනීමට හැකි වන සේ නිපදවන ලද සිසිලන උපකරණ පද්ධතියක් හඳුන්වා දීමට බණ්ඩාරවෙල කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානය පියවර ගෙන ඇති අතර එම සිසිලන පද්ධතිය සූර්ය බලශක්තියෙන් ස්වයංක්‍රියව ක්‍රියාත්මක විම වගාකරුට විශාල වාසියක් බව එහි නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ.පී. සෝමචන්ද්‍ර මහතා පවසයි.

වාණිජ එළවළු වගා ක්‍රමය ආරම්භ විමත් සමඟම වගාවට ඉඩම් සීමා වීම, කෘෂි කර්මාන්තයට අවශ්‍ය ජලය සීමාකාරි සාධකයක් බවට පත්වීම මෙන්ම පාරිසරිකව සිදු වන අනපේක්ෂිත ගැටලු ද මතු විය හැකිය. එසේම අස්වනුවලට ලැබෙන මුදල අවම වීමත්, ශ්‍රමිකයන් හිඟවීමත් යන කාරණා හේතුවෙන් තරුණ පිරිස් ගොවිතැනින් ඉවත්විම ද දක්නට ලැබිණි. මෙම ප්‍රධාන ගැටලුකාරි කරුණුවලට විසඳුම් ලෙසින් සම්ප්‍රදායික වගා ක්‍රමය වෙනුවට හරිතාගාර (ආරක්ෂිත ගෘහ, දැල් නිවාස) වගා ක්‍රමය ගොවීන්ට හඳුන්වා දෙන ලදි. මෙම වගා ක්‍රමය අද වන විට තරුණයන් අතර අතිශය ජනප්‍රිය බවට පත්ව ඇත. මෙයට හේතු වන්නේ කුඩා බිමක ඉදි කර ගත හැකි ආරක්ෂිත ගෘහයක් තුළ අඩු මිනිස් ශ්‍රමය හා සංචාරක හෝටල් ඉලක්ක කර ගනිමින් ඉහළ ආදායම් ලබා ගත හැකි බෙල්පෙපර්, තක්කාලි, පිපිඤ්ඤා, ආහාර රසකාරක, මාළු මිරිස්, සලාද වර්ග, මල් ගෝවා, සාම්ප්‍රදායික නොවන සුකිනි පවොයි යන එළවළු සමඟ ස්ට්‍රෝබෙරි වැනි පලතුරු වගාවන් සිදු කිරීමට හැකි වීමය. විවෘත භූමියක මාස 3ක් වයසැති තක්කාලි ගසකින් කිලෝ ග්‍රෑම් එකහමාරක අස්වැන්නක් ලබා ගැනීමට පිළිවන. එහෙත් දැල් නිවාසයක තක්කාලි ගසකින් මාස 3න් කිලෝ ග්‍රෑම් 7-9 අතර ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි වීම විශේෂත්වයකි. මේ වගාවලට අමතරව කැපූ මල් ද දැල් නිවාස වගාවක් ලෙසට ඉතාමත් සාර්ථකව සිදු කර ගත හැකිය.

හරිතාගාර වගාව හඳුන්වා දී ඇත්තේ ශීත කාලයේ භෝග වගා වර්ධනයට අවශ්‍ය උණුසුම් පරිසරයක් නිර්මාණය කිරීමේ අටියෙනි. ආරක්ෂිත ගෘහයේ සැකිල්ල ආවරණය වන ලෙස ඝනකමින් වැඩි හා පාරජම්බුල කිරණවලට ඔරොත්තු දෙන පොලිතින් යෙදීමෙන් ඒ තුළ උෂ්ණත්වය වැඩිවීමක් නිතැතින් සිදු වේ. එවිට බාහිර පරිසරය ශිත වුවද ඇතුළත උණුසුම නිසා වගාව නිසි ලෙස වර්ධනය වේ. එහෙත් ශ්‍රී ලංකාවේ වසර පුරා පවතින අධු වැඩි උණුසුම් පරිසරයක මුළුමනින් ආවරණය කර ඇති ආරක්ෂිත ගෘහ තුළ සිදු වන උණුසුම වගාවට දරා ගත නොහැකි තරම් වේ. එවන් අවස්ථාවල අපේක්ෂිත අස්වැන්න නොලැබී යෑමෙන් ආර්ථිකයට දැඩිව බලපායි. එනිසා උණුසුම අවම වන පරිදි හරිතාගාර ඉදිකිරීමට වග බලා ගත යුතුය.

මෙම උණුසුම පාලනය කර ගැනීමට යොදා ගන්නා ජනප්‍රිය ක්‍රම කිහිපයක් ඇත. එනම්, ගෘහයේ වහලයට පමණක් පොලිතින් යොදා අනෙක් කොටස් කෘමීන් ඇතුළු වීමට නොහැකි වන ලෙස දැල්වලින් ආවරණය කිරීම, කෘමින් ඇතුළු වීමට නොහැකි වන සේ ආරක්ෂිත දැල් යොදා මුදුන් වා කවුළු යෙදීම, ගෘහය තුළ මීදුම් අකාරයට ජලය විසිරවිය හැකි උපකරණ (Foggers) සවි කිරීම, ගෘහයේ ඇතුළතින් හෝ පිටතින් සෙවණ දැල්වලින් ආවරණ කිරීම හා උෂ්ණත්වය වැඩි දිවා කාලයේ ගෘහයේ වහලයට පිටතින් ජලය යෙදීම ද වේ. මෙම ක්‍රම තුළ යහපත් හා අයහපත් අංග පවතින බව පෙනේ. ගෘහය වටා දැල්වලින් ආවරණ කිරීමේදී මයිටාවන් වැනි කුඩා කෘමීන් ගෘහය තුළට පැමිණීමට හැකි අවස්ථා වැඩිය. එසේ ඇතුළු වන මයිටාවන්ගේ වේගවත් බෝ වීමත් සමඟ සිදු කරන හානිය ද විශාලය. පිළිබෝධ හානිය පාලනය ද අසීරුය. ආරක්ෂිත ගෘහයේ මුදුන් වහලයේ වා කවුළු යෙදිමෙන් උණුසුම පාලනය කිරීමට හැකි වුව ද කවුළුවේ ප්‍රමාණය හා දිසාව ගැන සැලකිලිමත් වීම වැදගත්ය. එසේ නොවුණ හොත් සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගැනීම අසීරු වේ. ගෘහය තුළ ජලය විසිර වීමෙන් කඩිනමින් උණුසුම අඩු කිරීම කළ හැකි වුව ද නියමාකාර ප්‍රමිතියකින් යුක්ත උපකරණ යොදා නොගැනීමෙන් වගාවට දිලීර රෝග වැළඳීමේ අවදානමක් ද ඇති විය හැකිය. සෙවණ දැල් යොදා ගැනීමෙන් අභ්‍යන්තර උණුසුම අඩු වුව ද නිසිලෙස හිරු එළිය කපා හැරීමකට ලක් වීම භෝග වර්ධනයට අහිතකර ලෙස බලපායි.

මෙම ගැටලුවලට විසඳුම් ලෙසින් උණුසුම පාලනය කළ හැකි තාක්ෂණික ක්‍රම දෙකක් දැනට ලංකාවේ ද නිර්මාණය කර තිබේ. මින් සරල හා අඩු වියදම් ක්‍රමය වන්නේ කෘමි ආරක්ෂිත දැල්වලින් ආවරණය කර මුදුන් වා කවුළු යෙදූ ආරක්ෂිත ගෘහයේ වහලයට යෙදූ පොලිතිනයට පිටතින් රිදී පැහැති දැලක් යෙදීම (Aluminet) වේ. මෙම ක්‍රමයෙන් සැලකිය යුතු ප්‍රමාණයකට උණුසුම පාලනය කර ගත හැකිය.

දෙවන ක්‍රමය භාවිත කිරීමේදී වියදම මඳක් වැඩි වුව ද සාර්ථකව උණුසුම පාලනය කිරීමේ හැකියාව තිබේ. මෙය පිටකුරු පංකා (Exhaust Fans) සහ තෙත් කළ හැකි තිරයක් වැනි කොටසක් (Wet Pad) යොදා ගෙන නිර්මාණය කොට ඇති Fan and pad cooling system ලෙස හඳුන්වන ක්‍රමය වේ. මෙහිදී ආරක්ෂිත ගෘහයේ මුදුන වා කවුළුවලින් තොර මුළුමනින්ම පොලිතීන්වලින් ආවරණය කොට ඉදි කෙරේ. එහි පළල එක් පැත්තක බිත්තියකට Wet pad සවි කරන අතර ඊට ප්‍රතිවිරුද්ධ දිශාවේ පිහිටි බිත්තියේ පිට කුරු පංකා දෙකක් සවි කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවලදී Wet pad තෙත් කිරීම සඳහා විදුලියෙන් ක්‍රියාත්මක ජල පොම්පයක් සවි කරනු ලැබේ. අනවශ්‍ය ලෙස උෂ්ණත්වය ඉහළ නඟින අවස්ථාවලදී ගෘහය තුළ සවි කළ කුඩා උෂ්ණත්ව සංවේදකයක් මඟින් අදාළ පද්ධතිය ස්වයංක්‍රියව ක්‍රියාත්මක වී ගෘහය සිසිල් බවට පත් කරයි.

මෙවැනි ආරක්ෂිත ගෘහයක් බණ්ඩාරවෙල කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට අන්තර්ජාතික කෘෂි කර්මාන්තය සඳහා වූ කොරියානු ව්‍යාපෘතියේ ශ්‍රී ලංකා ශාඛාව මඟින් සපයා දී තිබේ. එම ගෘහයේ ඇති විශේෂත්වය වන්නේ ඉහත සඳහන් කළ සිසිලස පද්ධතියේ උපාංග සියල්ල ක්‍රියාත්මක වනුයේ සූර්ය බල ශක්ති විදුලියෙන් වීමය. මෙම සූර්ය බල ශක්ති විදුලිය මඟින් වටකුරු පංකා, ජල පොම්පය හා ජලය සපයන පද්ධති සියල්ල හා වගාවට දියර පොහොර යොදනු ලබන උපකරණ ක්‍රියාත්මක වේ. එම නිසා ජල විදුලියට වියදමක් දැරීමට සිදු නොවීම මත ඊට වැය වන අතිරේක මුදල ද ඉතිරි කර ගත හැකි වේ.

මෙම ආරක්ෂිත ගෘහයක් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ඉදි කර සාර්ථක වගාවක් කිරීමට හැකියාව තිබේ. මෙය ඉදි කිරීමට මූලික වියදම යම් ඉහළ මට්ටමක පවතී. එහෙත් හරිතාගාර වගා අස්වනුවලට ඉහළ ඉල්ලුමක් පවතින සංචාරක හෝටල් ඉලක්ක කර ගනිමින් ඉහළ වටිනාකමක් මෙන්ම කෙටිකාලීනව අස්වනු නෙළාගත හැකි සලාද වර්ග වගා කරන්නේ නම් මේ නව ආරක්ෂිත ගෘහය ඉදි කිරීමට වැය කළ මුදල කෙටි කලකින් පහසුවෙන් උපයා ගැනීමට හැකි වීම වාසිදායකය.

කේ.ආර්.ආර්. රාජමන්ත්‍රී



දිනමිණ සස්‍රීක

ශූර ගොවියන්ගේ රාජධානිය



# බුලත් පීදුණු අතු තරහ වෙලා ද?

බුලත් වවන බොහෝ ගොවීන්ට ඇති වන ප්‍රශ්නයක් ලෙස බුලත් වැලෙහි අතු නොපීදීම හඳුන්වනන් පුළුවන්. ඒ නිසා මුදල් වියදම් කරලා බුලත් වවන ගොවීන් පත් වන්නේ ලොකු අපහසුතාවකට. බුලත් අතු පීදෙන්නෙ නෑ කියන්නේ බුලත් වැලෙහි හරස් අතු හැදෙන්නෙ නැහැ කියන එක. හරස් අතු නෑ කියන්නෙ පීදුණු කොළ හැදෙන්නෙ නැහැ කියන එකයි. බුලත් වැලක් පීදෙන්නෙ නැහැ කියන්නෙ බුලත් අස්වැන්න හොඳටම අඩු වන සිද්ධියක්. එතකොට අස්වැන්න විදිහට නෙළන්න තියෙන්නෙ කඳ කොළ විතරයි.

මේ නිසා ගොඩක් බුලත් ගොවීන් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න විදිහක් නැතිව පීඩාවට පත් වනවා. කාගෙන් ඇහැවුවත් නිවැරදි පිළිතුරක් ලැබෙන්නෙත් නැහැ. මෙහෙම වුණාම සාමාන්‍යයෙන් දීර්ඝ කාලයක් බුලත් වවන ගොවීන් කරන්නෙ බුලත් වැල් කප්පාදු කරන එක. ඒත් වැල් කප්පාදු කළත් හරස් අතු හැදෙන්න නැති අවස්ථාත් තියෙනවා. එතකොට ආයෙත් ගොවි මහත්වරුන් ලොකු අමාරුවකයි වැටෙන්නේ.

බුලත් වැල් නොපීදීම කාරණා කිහිපයක්ම නිසා වෙන්න පුළුවන්. එක කාරණාවක් තමයි අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි සෙවණක් යටතේ බුලත් වගා කිරීම. ඒ වගේම අවශ්‍ය ප්‍රමාණයට ක්ෂුද්‍ර පොහොර ප්‍රමාණයන් නොලැබීමත් මේ තත්ත්වයට හේතුවක් වෙන්න පුළුවන්. ලොකුම හේතුව තමයි අලුතෙන් පැළ කර ගැනීමට තරම් සුදුසු නොවන බුලත් දඬුවලින් නැවත පැළ කරගෙන තිබීම.

මුල් කාරණා දෙකම බුලත් වගාවේ බාහිර සාධකයන් ලෙස සලකන්න පුළුවන්. එහෙත් තුන්වන කාරණාව බුලත් වැලෙහි අභ්‍යන්තර සාධකයක්. ඒ කියන්නේ පැළ කිරීමට ගත් දඬු කැබැල්ල අයත් බුලත් වැලට ආවේණික ලක්ෂණයක්. සමහර විට එවැනි ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට යන්න පුළුවන්. එහෙත් එවැනි ලක්ෂණ පූර්වයෙන් හඳුනා ගෙන ඒවා පැළ කිරීම සඳහා නොගෙන සිටීමට හැකියාවක් නැහැ. ඒ නිසා එවැනි වැල්වලින් ලබා ගත් දඬුවලින් පැළ කර ගත් ඒවා නොපීදේ නම් ඉන් අනතුරුව එම වැලෙන් පැළ කිරීම සඳහා දඬු නොගත යුතුයි.

ඕනෑම ශාකයක් එහි අභ්‍යන්තරයේ අඩංගු රසායනිකයක් නිසා සූර්යාලෝකය සොයා ගෙන ඉහළට ගමන් කිරීම එම ශාකයේ ලාක්ෂණිකයක්. බුලත් වැලෙහි අඩංගු ඔක්සින් නම් හෝමෝනය නිසා ද බුලත් වැල නිරත්තරයෙන් ඉහළට ගමන් කරමින් සූර්යාලෝකය කරා ඉහළට ඇදෙනවා. බුලත් වගාව සඳහා සාමාන්‍යයෙන් 30%-40%ක පමණ සෙවණක් අවශ්‍ය වුවත් ඊට වඩා සෙවණ ඇති පරිසරයකදී බුලත් වැල හිරු එළිය සොයමින් වඩා ශීඝ්‍රයෙන් ඉහළට ගමන් කරන්නේ ඔක්සින් හෝමෝනය සක්‍රිය වීමෙන්. මේ නිසා එහි අතු බෙදීමට හේතු වන සයිටොකයිනින් නම් හෝමෝනයේ සක්‍රියතාව හීන වීමෙන් අතු බෙදීම සිදු නොවී වැළ ඉහළට ගමන් කරනවා. බුලත් වැල පීදෙන්නෙ නැතැයි ගොවීන් චෝදනා කරමින් කණස්සලු වෙන්නේ මෙන්න මේ අවස්ථාවේදීයි.

ඕනෑම ශාකයක සෛල බෙදීමට හේතු වන්නේ සයිටොකයිනින් නම් හෝමෝනයයි. සයිටොකයිනින් හා ඔක්සින් හෝමෝනයන්ගේ සක්‍රියතාව සඳහා ශාකයට ලැබෙන ක්ෂුද්‍ර පොහොර මට්ටම බලපානවා. ඒ නිසා බුලත් ගොවීන් තම වගාවට යොදන පොහොරවල අඩංගු දෑ ගැන සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය කරුණක්.

බුලත් වගාවේ අතු බෙදීම හෙවත් පීදුණු තත්ත්වය ඇති වීමට නම් ප්‍රමාණවත් සෙවණ මට්ටම නොඉක්මවන පරිසරයක වගාව කළ යුතුයි. ඒ කියන්නේ සාමාන්‍යයෙන් සෙවණ 30%-40%ක මට්ටම නොඉක්මවන්නට ගොවීන් උනන්දු විය යුතුයි. එසේම බුලත් වැල අතු නොබෙදී ඉහළටම ගමන් කරන්නේ නම් අග්‍රස්ථ ප්‍රමුඛතාව (Apical dominance) අහෝසි කරවීම සඳහා බුලත් දල්ල කැඩිය යුතුයි. එවිට ඔක්සින් හෝමෝනයේ සක්‍රියතාව අහෝසි වී, පාර්ශ්වික අංකුරයන්ගේ ක්‍රියාකාරිත්වය වර්ධනය වීමෙන් හරස් අතු ඇති වීමට ඇත්තේ ලොකු ඉඩකඩක්.

යම් බුලත් වගාවක පීදුණු තත්ත්වය ඇති නොවන්නේ නම් වගාව ඇති පරිසරයේ සෙවණ තත්ත්වය අඩු කිරීම අත්‍යවශ්‍ය සාධකයක්. එසේම අග්‍රස්ථ ප්‍රමුඛතාව අවම කිරීම සඳහා දල්ල කැඩීමත් කළ යුත්තක්. මේ උපායන් දෙකම අසාර්ථක නම් කළ යුත්තේ පොළොව මට්ටමේ සිට පුරුක් තුනක් ඉතුරු කර බුලත් වැල කප්පාදු කිරීමයි. එවිට අලුතෙන් දලු ලා ඉහළට ඇදෙන බුලත් වැල පීදීමට ඇත්තේ ලොකු ඉඩකඩක්. එසේම ක්ෂුද්‍ර පොහොර අඩංගු සත්ත්ව මල හෝ කොම්පෝස්ට් හෝ වගාවට එකතු කිරීමත් සතුටුදායක ප්‍රතිඵල ඇති කිරීමට හේතු වන්නක්.

මේ සියල්ල කළ පසුව ද බුලත් වැලෙහි අතු නොබෙදේ නම් එම වැල පැළ කිරීම සඳහා ලබා ගත් දඬු කැබැල්ල ලබා ගත් මව් ශාකය පැළ සකස් කර ගැනීම සඳහා නුසුදුසු වූවක් ලෙස හඳුනා ගන්න පුළුවන්. එවිට කළ යුත්තේ ඒ මව් ශාකයෙන් දඬු ලබා ගෙන පැළ ලබා ගෙන සිටුවීමෙන් වැළකීමයි.

**කේ.පී.පී. ශාන්ත**
**සහකාර අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල**
**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**





# හෙළ රසට මුල්තැන දෙන නන්දනගේ අලුත් කෑම

දේශීය ඖෂධ අඩංගු ආහාර පාන පරිභෝජනයට මේ දිනවල බොහෝ දෙනෙක් යොමුව සිටින්නේ කොරෝනා වසංගතයත් සමඟිනි. ඒ සමඟම දේශීය දෑ නිපදවන්නන් බොහෝ දෙනෙක් පෙළැඹී සිටිති. මින් ඉඟුරුවලට ඇත්තේ ප්‍රමුඛස්ථානයකි. සීනි සමඟ ඉඟුරු වියලා ක්ෂණික ලෙස ආහාරයට ගත හැකි පරිදි සකස් කර දේශීය වෙළෙඳපොළට මෙන්ම විදේශීය වෙළෙඳපොළටත් සපයන පානදුර ප්‍රදේශයේ පදිංචි නන්දන සම්පත් කුමාර ප්‍රනාන්දු තවත් එවැනිම ආහාරයට ගත හැකි ඖෂධීය වර්ගයන් කිහිපයක්ම සකස් කරන්නෙකි.



**මොනවද ඔබ කරන්නේ?**

සුදු ලූනු මී පැණි මිශ්‍රණය, කුරුඳු මී පැණි මිශ්‍රණය, සීනි මිශ්‍ර ඉඟුරු සහ රට ඉඳි එළඟි තෙල් මිශ්‍ර කොට ආහාර වර්ග කිහිපයක්ම සකස් කරනවා.

**මේවා සකස් කරන්නේ කොහොම ද?**

මට වෙනම නිෂ්පාදනාගාරයක් තිබෙනවා. එහිදී සුදු ලූනු සියල්ල යන්ත්‍රානුසාරයෙන් සුද්ධ කරනවා. ඊට පස්සේ ඒවා මී පැණිවල පල් වෙන්න දානවා. හොඳට පදම් වුණාම බෝතල් කරනවා. රට ඉඳිත් ඒ වගේමයි. රට ඉඳි ටික එළඟි තෙල්වල දාලා මාසයක් පමණ වහලා තියනවා. ඊට පස්සේ බෝතල් කරනවා. ඉඟුරු නම් සීනි මිශ්‍ර කරලා විජලන යන්ත්‍ර මඟින් විජලනය කරනවා.

**ඔබ මේවා සකස් කරන්නේ දේශීය වෙළෙඳපොළට ද? විදේශීය වෙළෙඳපොළට ද?**

දෙකටම. ශ්‍රී ලංකාවේ නම් සුපිරි වෙළෙඳසල්වලට තමයි දාන්නේ. විදෙස් රටකට කියලා යවන්නේ තවම හොංකොංවලට විතරයි.

**ඔබට මෙවැනි දෙයක් කරන්න අඩිතාලම වැටුණේ කොහොම ද? බොහෝ දෙනෙක් හදන්නේ එළවළු සහ පලතුරු වැනි දේයි.?**

මුලින්ම මම හැදුවේ සුදු ලූනු මී පැණි මිශ්‍රණය. මේක කොලෙස්ටරෝල්වලටත් ගොඩක් හොඳ නිසා මම හිතුවා මේක හැදුවොත් හොඳට මාර්කට් කරන්න පුළුවන් වෙයි කියලා. වෙළෙඳපොළේ තිබෙන දේවල්වල රසකාරක සහ කල් තබා ගන්නා දේ දාලා කෘත්‍රිම විදියට සකස් කර තිබෙන්නේ. මට ඕනෑ වුණේ ස්වාභාවික ලෙස මේවා හදන්න. ඊට පස්සේ රට ඉඳි එළඟි තෙල් මිශ්‍රණය හැදුවා. ඒක ශරීර සෞඛ්‍යයට ගොඩක් හොඳයි. කොරෝනා වසංගතය ආවාම තමයි ඉඟුරු සීනි මිශ්‍රණය හැදුවේ. අපේ ඇගේ ප්‍රතිශක්තිකරණයට වගේම සෙමටත් ඉඟුරු ගොඩක් ගුණදායකයි.



නන්දන සම්පත් කුමාර ප්‍රනාන්දු

**ඔබගේ මේ නිෂ්පාදනවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගන්නේ කොහෙන් ද?**

බණ්ඩාරගම ප්‍රදේශයේ ඉඟුරු වගා කරන අය සිටිනවා. ඒ අයගෙන් මම ඉඟුරු ගන්නවා. මට මී පැණි දෙන අය ඉන්නේ බුත්තල. ඒ අය අනුරාධපුරයෙන් සහ මොනරාගලින් එකතු කරලා මට එවනවා. රට ඉඳි නම් පිටරටින් ගේන ඒවා තමයි ගන්නේ.

**එම අමුද්‍රව්‍ය සපයන ගොවියන්ට ඔබ හොඳ මිලක් ගෙවනවද?**

ඔව්. වෙළෙඳපොළේ පවතින මිලට වඩා වැඩි මිලකට මම ඔවුන්ගෙන් අමුද්‍රව්‍ය මිලට ගන්නවා. සමහර කාලවල මිල අඩු වැඩි වෙනවා.



**මේවායේ ගුණාත්මකභාවය ගැන ඔබට වගකීමක් තිබෙනව ද?**

මගේ හැම නිෂ්පාදනයක්ම මම අයි.ටී.අයි. එකට දාලා පරීක්ෂා කරනවා. එස්.පී.එස් වාර්තා එහෙමත් අරගෙන තිබෙන්නේ. මීට අමතරව මම මී පැණි වෙනම පරීක්ෂා කරනවා. හැම නිෂ්පාදනයකම පෝෂණ තත්ත්වය සහ ගුණාත්මකභාවය පිළිබඳව ලේබල්වල සඳහන් වෙනවා.

**මේ සම්බන්ධව ඔබ කිසියම් පාඨමාලාවක් හැදෑරුවා ද? කොහොමද මේ ගැන දැනුම්වත් වුණේ?**

මේ වැඩේ කරන්න පටන් අරගෙනම තමයි මම ඒ ගැන ඉගෙන ගත්තේ. රත්මලානේ අයි.ඩී.බී එකේ පුහුණුවකට ගියා. ඒ වගේම මම කාලයක් ඩුබායි හිටියා. එහිදී ආහාර හා සනීපාරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා එකක් කළා.

**ඔබ සමඟ තව කී දෙනෙක් මේ වැඩේට සම්බන්ධ වෙලා සිටිනව ද?**

මං ළඟ වැඩිය සේවකයන් නැහැ. ගොඩක් දේවල් කරන්නේ මැෂින්වලිනුයි. සේවකයන් හතර දෙනෙක් පමණ සිටිනවා.

**මේ නිෂ්පාදනවලට හොඳ ඉල්ලුමක් තිබෙනව ද? ඒ වගේම ඔබට හොඳ ආදායමක් ලැබෙනව ද?**

රට ඉඳි එළඟි තෙල් මිශ්‍රණයට වැඩි ඉල්ලුමක් තිබෙන්නේ අපේ රටේ යුද හමුදාවේ අයගෙන් සහ ක්‍රීඩා කරන අයගෙන්. හොංකොංවල වැඩි ඉල්ලුමක් තිබෙන්නේ ඉඟුරු සීනි මිශ්‍රණයට.

පසුගිය කාලයේ නම් හොඳ ආදායමක් තිබුණා. නමුත් කොරෝනා නිසා ටිකක් අඩු වුණා. දැන් ආයෙමත් ටික ටික හරි යනවා. ගිය සතියේ Made in Sri Lanka සන්නාමයත් මට ලැබුණා.

**මේ සඳහා ඔබට උදව් කරන අය?**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් උදව් කරනවා. අපිව පුහුණු වැඩමුළුවලට යොමු කරනවා වගේම Made in Sri Lanka සන්නාමය ගන්නත් මට උදව් කළා. ඒ වගේම සම්මාන උළෙලවලට වගේම ප්‍රදර්ශනවලටත් අපව යොමු කරනවා.

ඔබටත් නන්දන සම්පත් කුමාර ෆර්නෑන්ඩු මහතාගෙන් කිසියම් උපදෙසක් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් helarasaprducts@gmail.com ඊ මේල් ලිපිනය ඔස්සේ ඔහු හා සම්බන්ධ විය හැකියි.

චතුමී පිටිපන

2021 අප්‍රේල් 07 කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.